උම්මග්ග ජාතකය

ගැටපද විවරණය සහිතයි

උම්මග්ග ජාතකය.

සුබපදවිවරණය

සහිතයි.

ඩී. එච්. ඇස්. අභයරත්න මහතුමා

විසින්

ශුබෝකාට සකස්කරණලදී.

THE

UMMAGGA JATAKA:

BEING A STORY OF

A BIRTH OF BODHISATWA.

EDITED BY

D. H. S. ABAYARATNA.

PUBLISHED BY

U. D. CORNELIS.

PRINTED AT THE

LANKABHINAWA VISSRUTA PRESS,

COLOMBO.

1905

පටුන.

පිට		පිට	
1	ප්‍රාරම්භ කථාව	32	මෙණ්ඩක ප්‍රශ්නය
4	අතීතකථාව	37	සිරිමන්ද ප්‍රශ්නය
9	මාංස ප්‍රශ්නය	44	ඡන්නාපථ ප්‍රශ්නය
,,	ගොන් ප්‍රශ්නය	46	යන්ති ප්‍රශ්නය
11	ගණ්ඩී ප්‍රශ්නය	51	බලෙජාපණ ප්‍රශ්නය
12	සූත්‍ර ප්‍රශ්නය	53	භූරි ප්‍රශ්නය
,,	පුත්‍ර ප්‍රශ්නය	56	මාතෘ ප්‍රශ්නය
14	කාල ගෝල ප්‍රශ්නය	57	බාල පරාය ප්‍රශ්නය
15	රථ ප්‍රශ්නය	58	අඹු සැමි ප්‍රශ්නය
17	දණ්ඩක ප්‍රශ්නය	,,	ශ්‍රමණබ්‍රාහ්මණ ප්‍රශ්නය
18	ගීතී ප්‍රශ්නය	59	පඤ්ච පණ්ඩිත ප්‍රශ්නය
,,	අග්ගි ප්‍රශ්නය	70	චූලනි කෝවට්ට කුමාරප්‍රශ්නය
19	කුක්කුට ප්‍රශ්නය	72	ශුකපොතක කථාව
,,	මණි ප්‍රශ්නය	74	යුධිරම්භ
20	විජයන ප්‍රශ්නය	78	මාෂක විනිශ්චය
,,	ඔදන ප්‍රශ්නය	84	ධම්ම යුධිය
21	වාලුකාප්‍රශ්නය	92	විවාහ ගිවිසීම
,,	තඩාග ප්‍රශ්නය	102	ගිරා සැලිලිගිණි පුවත
22	උද්‍යාන ප්‍රශ්නය	141	උමඟ කම්මාන්තය
23	ගදුභ ප්‍රශ්නය	122	පණ්ඩිත සම්මතය
27	පුෂ්කරණි ප්‍රශ්නය	158	උදක රාක්ෂස ප්‍රශ්නය
28	කකණ්ටක ප්‍රශ්නය	163	චූලනි රාජ චරිතය
29	සිරිකාලකන්නි ප්‍රශ්නය		

ශුද්ධිපත්‍රය.

පිට	පෙළ	අශුද්ධ	ශුද්ධ
1	2	නම්සෙතසෙම්	නම්සතසෙම්

උම්මඟ්ග ජාතකය.

"නමත්ථෙතත්ථෙම හනවතෙතීතෙ
සම්මක් සම්බුධාස."

ප්‍රාරම්භ කථාව.

එක් සමයෙක්හි ශාක්‍යසිංහවූ සමන්තභද්‍රවූ අසමසමවූ ත්‍රෛලොක්‍යතිලකවූ ත්‍රිභුවන චූඩාමාණික්‍යවූ කරුණානිධානවූ මෛත්‍රී නිවාසවූ ප්‍රඥාවට වලලහවූ සාගරයසේ අවිනත්‍ය ගුණඇති මහපොළවසේ නිශ්චල ගුණඇති මහාමෙරුවසේ උස්වූ ගුණඇත් දැ රහම්ණක් සේ නිම්මලවූ ගුණ ඇති මාගේ සවාමිදරුවූ සම්මා සම්බුදු රජානන් වහන්සේ ක්ෂීරසාගරයෙන් නැඟි තරඟගමාලාවසේ සුධාධවලප්‍රාකාර වලයෙන් පරික්ෂිප්තවූ කනක රජතාදීන් හොබනාවූ විසිතුරු සැදුම් ලද මාලිගා ගෙවල් හා ප්‍රෙරටු ආදියෙන් යුක්තවූ, සල් සපු නා පනා අඹ දෙඹ ආදිවූ ඵලපල්ලවයෙන් සඤ්ඡන්න තරුවරශතයෙන් හොබනා විසිතුරු උද්‍යානයෙන් හා පස්පියුමෙන් සැදුම්ලද නිමල ජල සම්පූර්ණපුෂ්කරණී ශතයෙන් හොබනාවූ, නානාභරණ විභූෂිත නරනාරි ගණාකීර්ණවූ සැවැත්නම් නුවර නිසා, නඳුන්වනයට අපහාසකරන්නාක් වැනිවූ සියලු සිරිසරින් සාරවූ වඩ්ක්‍රමණ පරිවෙණාදි විහාරශතයෙන් හොබනාවූ ජෙතවනනම් උයන්හි, මෛත්‍රී කරුණා මුදිතොපෙක්ෂා සඞ්ඛ්‍යාත සතර් ආර්‍යවිහාරයෙන් දවස් යවනසේක්, තමන්වහන්සේගේ භවයෙන් සැහවී තුබූ ප්‍රඥාපාරමිතාව අරභයා මේ ජාතකය වදාළසේක.

කෙසේදයි යත්හොත්? එක් දවසක් හිරු අස්තපර්වත ගතවෙලෙහි ශීලසමාධිප්‍රඥාදි ගුණාඞ්ගසඞ්ගත ප්‍රවර භික්ෂුසඞ්ඝයාවහන්සේ, තමන්වහන්සේ වසන රාත්‍රිස්ථානයෙන් අවුත්, සුඛභූමියකට රැස්වන්නාවූ සුවිනීත යොධමුළුක්සේද, මැණික් සන්නාහ සන්නද්ධ නානාලඞ්කාරයෙන් සැදුම්ලද ගඳැන්මුළුක්සේද, ඒකචර සිංහ සමූහයක්සේද, සඳවලාබදුවූ සුරකානවර පවුල්පෙරව, ගන්ධද්‍රම පුෂ්පද්‍රමාවලම්බිත කනකරජත මණි තාරකායෙන් විචිත්‍ර විතානඇති, නානාප්‍රභාසමුදය සමුජ්ජ්වලිත අලඞ්කෘත ධර්ම්මසභායෙහි, ශක්‍රාගමනයබලමින් සුධර්ම්මානම් දිව්‍යසභායෙහි රැස්වූයේ දිව්‍යසමූහයාසේ, ධර්ම්මරාජන්වූ ධර්ම්මාධිපතිවූ ධර්ම්මස්වාමිවූ ත්‍රිලෝගුරු බුදුරජානන් වහන්සේ

වඩනා පෙරමග බලබලා ධර්මාසනය පිරිවරාගිඳ බුදුන්ගේ නුවණපෙරුම් වර්ණනාසේක්;-"ඇවැත්නි බුදුහු ශීලස්කන්ධාදියෙහි පවත්නා මහත්වූ නුවණගතියක් ඇතිසේක; මුහුදුපිට ඉසි සුවදතෙලක්මෙන් දහයුතුවූ සියළුධර්මයන් කෙරෙහි පැතිරපවත්නාවූ නුවණගතියක් ඇතිසේක; සියලු ධර්මයන්කෙරෙහි තුෂ්ටි බහුලව පවත්නා නුවණගතියක් ඇතිසේක; සියලු ක්ලේශමණ්ඩලයෙහි ජවන හංසගතියක්මෙන් දිවන්නාවූ නුවණගතියක් ඇතිසේක; අර්ථධර්ම නිරුක්ති ප්‍රතිභානාදියෙන් දිරාගිය පරඬලාපතෙක නොපැකිළී යන්නාවූ දවසක් මුළුල්ලෙහි රත්කළ යහුලක්මෙන් සියුම්ව දුවන්නාවූ නුවණගතියක් ඇතිසේක; අතුල්තලයෙහි තුබූ දූරඟම්ණක්සේ සියලු ධර්මයන් සිහිකාරයෙන් විනිවිද දක්නාවූ නුවණගතියක් ඇතිසේක; දෘෂ්ටිජාලානුගත අන්‍යතීර්ථක ජනයන්ගේ ශාශ්වතොච්ඡේදාදි වාදමර්දනය කරණසේක්; තමන්වහන්සේගේ අසාධාරණවූ විදුරුනුවණින් **කූටදන්ත බ්‍රාහ්මණ වෙරඤ්ජ බ්‍රාහ්මණාදිවූ** අනෙක බ්‍රාහ්මණශතයන්ද, **සඞ්ඝිය පරිබ්‍රාජක බාහියපරිබ්‍රාජකාදිවූ** පරිබ්‍රාජක සමූහයන්ද, **අඞ්ගුලිමාල** ආදිවූ චණ්ඩපරුෂ බොහෝ සොරුන්ද, **ආලවකාදිවූ** මනුෂ්‍යමාංස භක්ෂණයෙහි දක්ෂවූ යක්ෂයන්ද, ඉසුරුමදයෙන් ප්‍රමාදව තුන්පුරුවන් කෙරෙහි ජනිතප්‍රසාද විරහිතවූ **ශක්‍රදේවේන්ද්‍රයා**ආදිවූ දේවතාවන්ද, ශාශ්වත දෘෂ්ටිජාලානුබද්ධව අමංගල්‍යප්‍රතිපන්න **බ්‍රහ්මාදිවූ**බ්‍රහ්මයන්ද (මැඩ)තමන්වහන්සේගේ අසාධාරණවූ සිහිඳ මහිමයෙන් ඔවුන්ගේ මානමර්දනයකොට පාපනැමති විෂ විනාශකොට වදාළසේක. තවද මේ බුදුරජානන්වහන්සේවිසින් කායවාරාදියෙහි සම්‍යක්ප්‍රතිපත්තින් සිඳකොට සවඟමොක්ෂ භාවයහා ප්‍රව්‍රජ්‍යාවසාදී බොහෝදෙනා සතරමග සතරඵලයට පමුණුවනාලදහ. ඇවැත්නි, මෙසේ බුදුහු උක්ත ප්‍රකාර මහනුවණ ඇතිසේකැයි බුදුන්ගේ ශීලසමාධ්‍යාදි අනෙකප්‍රකාරගුණවර්ණනාකොටකොට දම්සභා මණ්ඩපයෙහි රැස්වහුන්සේක.

ඉක්බිති සතරාමර ලොකවූඩාමණි මරිචිමඤ්ජරී පුඤ්ජපූජිතචරණාම්බුජ ඇති ලොකඥාම්වූ ලොකනායකවූ ජගදනන්දලොචනවූ මාගේ සවාමිදරුවානන්වහන්සේ, දම්සභාමණ්ඩපයෙහි උපන් කථාඨවරූපය ගඳකිළි පිරිවෙණෙහි වැඩඋන්සේක්, දිවකණින් අසාවදුරා වරරුචිර ගන්ධකුටීවාසය මහාකරුණාවෙන් දුරුකොට සමාපත්තීන් නැඟී, ලාඤ්ඡාරසයෙන් තෙත්වූ මුරුත මල්කලඹක්හාසමානවූ අඳනා සිවුර ත්‍රිමණ්ඩල ප්‍රතිච්ඡාදනයෙන් සංවිධානකොට හැඳ සබ්‍යාඤ්ජන වලාවෙක ගසනලද සියරැලි විදුලියක් සමානවූ පවිධානුන්වහන්සේ ඊමත්තේබැඳ, ඝනරන්දගැබක් රත්පලඟකින් වයන්නාක්හුමෙන්ද අටලොස්රියන් රන්ඇගැයකට පබළුදැලක් දමන්නාක්හුමෙන්ද, විඝ කූටපර්වතය බඳුවද මල්දමකින් වටකරන්නාක්හුමෙන්ද, රන්ගල් මුදුනෙහි සුපක්ව ලාඤ්ඡාරස වත්කරන්නාක්හුමෙන්ද, මේරුමන්දර

දීන් එකපැහැර කම්පාකෙරෙමින් සුපහ විලිකුණු කුඟ ඵලයෙක පැහැ බඳුවූ සුගත් මහාපාංශුකූල චීවරය පෙරව, සුප්‍රතිෂ්ඨිත පාදතා දිවූ දෙතිස් මහාපුරුෂලක්ෂණයන් කරණකාවිණෙණ විළිවෙලිණි ගොතා තුබූ සුවර්ණමණ්ඩලයන් දෙනිස්දෙහෝකුගේද, චක්‍රවර්තීන් දෙනිස්දෙනෙකුගේද, මහාබ්‍රහ්මයන් දෙනිස්දෙනෙකුගේද, ශ්‍රීවිභූති අභිභවමින් අශිනි අනුව්‍යඤ්ජන බ්‍යාමප්‍රභා කෝටිසහස්‍රාලඞ්කාරයෙන් විරාජමානව අනන්තකාලයක් මුලුල්ලෙහි පුරණලද ත්‍රිවිධ්‍රාත්‍රිශාව යෙන් තෙමේ තමාට අරණලද දෙර ඇති ගදකිළි පිරිවෙණින් සමඟ කූටයකින් පිටත්වන නිරුමඩලක්සේද, වලාපටලයකින් පිටත්වූපුන් සඳමඬලක්සේද, රන්ගල් ගුහායෙකින් කෙසරු සලා විදහානික්මෙන අසීත කෙසර සිංහරාජයෙකුසේද, නික්ම තමන්වහන්සේ ජාතිජාති යෙහි බුඩාදී නුවණැත්තන් සම්පයට නුකුසිතව එලඹි කුසල මහිම යෙන් පොළොවපලාගෙණ නැඟී සත්බුමු මහපියුම් මත්තෙහි අටතු රාසියක් මගුල් ලකුණෙන් සැදුම්ලද ශ්‍රීපාදයුගලය තබ තබා වියදඹු පමණෙක හෙළනලද්දුවූ නෙත්‍රකාන්තිනි මහිකාන්තාවට අමෘතාභි ෂෙක දෙමින්, අනන්තවූ බුඩවිලාසයෙන් දම්සභාමණ්ඩපයට වැඩ, නීලපීතාදි සවණක් රැසින් සකල දම්සභාව එකපැහැර බබුලුවිමින්, ඝනරන් මාලිගාවෙක දිලියෙන ඉදුනිල්මිණි කවුළුසඟළක් වැනි මෙහෝ, නොහොත් රන් දැගැබක්සේ බබලන මුහුන නැමති පියුම් ගැබෙහි හැසිරෙන බඹරයුගලක් හා සමානවූ, දිගු පුළුල් පස්පෑ දිස්නා ඇස්සඟල විදහා, සත්රුවන් නැවක්මෙන්ද, පිපී වැහීගිය රත්පියුම් වනයක්මේ, නොහොත් රන්දැගැබක් වටකොට පුදනලද මල්කළඹක් හා සදෘශවූ සඞ්ඝරාජයන් බලා වදාරා "මේ මහණපිරිස දැමුනු ඉඳුරන් ඇත්තාහ; නිවුනාවූ චිත්තසන්තාන ඇත්තාහ; කයින් වචසින් මනසින් යන්හුන් ඉන්‍ද්‍රියයන් ඇත්තාහ; එහෙයින් මම් පළමුකොට කථාවක් නොකෙළෙමි නම්, මට පෙරටුකොට බැණ නැගෙණ මහණෙක් නැතැ"යි සිතාවදාරා, අනල්ප කල්පකෝටි ශත සහස්‍රයන් මුළුල්ලෙහි පුරණලද කායවාක් සුචරිතයෙන් ඒක සුග න්ධව නිබෙන මුඛපදමය විදහා, "මහණෙනි මා එන්නාට පූර්වභාග යෙහි කවරනම් කථාවකින් යුක්තව උනුද? තොපට නොදැනෙන කථාවක් තොප සිත උපන් සැකයෙක් ඇත මට කියව, මම මාගේ අසාධාරණවූ බුදු නුවණැසින් පිරිසිඳ දැන කියමි"යි වදාරා ධම්මයට මූබදි තූෂ්ණීම්භූතව වැඩඋන්සේක.

එවේලෙහිසඞ්ඝයාවහන්සේ "ස්වාමිනි බුදුන්විසින් නොකියන්ට වදාළ රාජකථා චොරකථාදීවූ දෙතිස්කථාවෙන් යුක්තව නුන්නමිහ; බුදුන්ගේ සුවිශුඩ ත්‍රිඝණ ප්‍රඥගුණ රසායචාදයෙන් පිණ පිණාඋන් නම්හ"යි කී කල්හි "මහණෙනි දැන් මතුනොවෙයි බුදුහු මහ නුව

ණෑත්තෝය; පූර්වයෙහිත් සසර සිටිනාකල නුඹකළු නුවණෙහිසිව, මෙම සර්ව්ඥතාඥානය සිඩකරණ පිණිස පාරමී ධර්ම්මයන් පුරා ඇවිදිනා කාලයෙහි නුවනැත්තෝ වේද"යි වදරා, මුවෙන් නොබැණ වැඩහුන් කල්හි;—

එක්කෙණෙහුන්වහන්සේ විසින් හැමදෙනාවහන්සේගේ අනුමතියෙන් සිවුරු එකස්කොට පෙරව, ඇදිලි බැඳසිට දන්වන්නාහු "බුදුන් මහනුවණ ඇතිසේ ප්‍රසූත හෙයින් ඇහෙයි, පූර්ව්ජන්ම්යෙහි නුඹකළ නුවණින්සිට පාරම්ධර්ම්මයන් පුරණකල්හි, මහනුවණඇති පරිදි භවයෙන් සැහවී නිබෙයි, එහෙයින් යවාම්දරුවානෙනි, අපට නොහැහෙයි වදාළහොත් යහපතැයි"යි ආරාධනාකළකල්හි, කඩතුරා තුරාවක් පහකොට විචිත්‍රකර්ම්මාන්තයක් දක්වන්නාක්හුමෙන් අතීත කාලයෙහි ප්‍රවෘත්තවූ කථාස්වරූපය ගෙණහැරදක්වා වදාළසේක;—

හේ කෙසේදයත් ?

අතීත කථාව.

යටගිය දවස මියුලුනුවර **වේදේහනම්** රජ්ජුරු කෙණෙහුන් රාජ්‍යයකරණ සමයෙහි උන්ට අර්ථයෙන් ධර්ම්මයෙන් අනුශාසනා කරණ **සේනකඝ, පුක්කුසඝ, කාවින්දඝ, දේවින්දඝ,** යන පණ්ඩිත වරු සතර දෙනෙක්වූහ. එසමයෙහි වේදේහ රජ්ජුරුවෝ පුරණලද පාරමිතා ඇති බුඩාඩ්කුරවූ මහබෝසතාණන්වහන්සේ මවකුය පිළිසිඳගන්නා දවස් අලුයම් වේලෙහි මෙබඳු සිහිනයක් දුටහ. "සෙණඹු වාළුව ඇතුළෙහි සතරපවර කොණ නාඹ තල්කඳසා ගිනිකඳ සතරෙක් පවරෙහි තලක්කවිටුව උසටනැඟී දිලියෙන්නේය. ඒගිනිකඳ සතරට මධ්‍යයෙහි කඳෝපැණියෙකු සා ගින්පුපුරක් නැඟී, එම ඇසිල්ලෙහි සතරකොණ සිටි ගිනිකඳ සතරෙහි ආලොක මැඩගෙණ, බඹලොව උසට මුළුලෙවහි ආලොක පතුරුවම්න් දිලිහුණේය. යටත් පිරිසෙසින් බිම හුණු සෂීප මාත්‍රයකුදු පෙණෙන්නේය. සියලු දෙව මිනිසුන් සහිත ලොවැස්සෝ ගඳින් මලින් පූජාකෙරෙමින්, ඒ ගිනිදැල් ඇතුලේම වැද ඇවිදිනාහුය. එසේගිනිදැල් ඇතුලෙහිම ඇවිදිනා උන්ගේ ඇඟින් රෝමකූපමාත්‍රයකුදු හුණුනොවන්නේය.

වේදේහ රජ්ජුවෝ මේ සිහිනය දුටු වේලෙහි පටන් මරණ භයින් භයපත්ව, නොනිදා ඉඳ පහන්කලහ. උදෑසනක්සේ සේනකාදී පණ්ඩිතවරු සතරදෙන රජගෙට ගොස් රජ්ජුරුවන් වැඳ, රෑ දවස සුවසේ නිදිලන්සැපි විචාරා, රජ්ජුරුවන්විසින් "මට සුවයෙක් නම්කොයින්ද? මෙබඳු සිහිනයක් දුටිම්" කී කල්හි, පණ්ඩිතවරු සතර දෙනාගෙන් සේනක පණ්ඩියෝ-දේවයන්වහන්ස නොබව මැනව මේතෙම මඟුලසිහිනය, එසේ හෙයින් නුඹවහන්සේට වැඩෙක් වන්නේය"යි කියා කවරකාරණයකින්දැයි රජ්ජුරුවන් කීකල්හි "අප

පණ්ඩිතාවරුන් සතරදෙනාම අභිභවා, අපගේ නුවණ යටකොට, අනික් නුඹවහන්සේට පස්වන පණ්ඩිතකෙනෙක් උපදනාහ; අප සතරදෙනා මේරාජඔහනයෙහි සතරකොණ නැගී ගිනිකඳ සතරක් වැන්නාම්හ; මධ්‍යයෙහිනැගි ගිනිකදමෙන් පස්වන පණ්ඩිතයෝ උපදනාහ; සියලු දෙව් මිනිසුන් සහිත ලෝකයෙහි අසමානවූ නුවණැත්තාහ; සියලු ගුණයෙන් අසදෘශයහ''යි කියා දැන්වූහ. ''දැන් කොයිදැ''යි රජ්ජුරුවන් කී කල්හි ''දේවයන්වහන්ස අද උන්ගේ මව්කුස පිළිසිඳගැන්ම හෝ මව්කුසින් බිහිවීම හෝ වන්නේයයි තමන්ගේ ශාසනබලයෙන් දිවඇසින් දුටු කෙණෙකුන්මෙන් සිනයෙහි අසූඑ රජ්ජුරුවන්ට කීහ.

රජ්ජුරුවෝ එදා පටන් ඒ වචනය සිහිකළහ. **මිඝුළුනුවර** වනාහි වාසල් සමීපයෙහි දකුණු යවමැදුම්ගමය, බටහිර යවමැදුම් ගමය, උතුරුයවමැදුම්ගමය, නැගෙණහිර යවමැදුම්ගමයයි නියමගම් සතරෙක්වූය. ඒගම් සතරින් නැගෙණහිර යවමැදුම්ගම **සිරිවඩ්ඪන** නම් සිටානකෙණෙක්වූහ. උන්ගේ ඇඹනියෝ **සුමනාදේවී** දේවිකෙණෙක. මහබෝසතාණන්වහන්සේ එදවස් රජ්ජුරුවන් සිනයදුටු වේලෙහිම තවනිසා දෙවලොවින්චුතව, **සිරිවඩ්ඪන** සිටාණන්ගේ සුමනාදේවීන් කුස පළිසිඳගත්සේක. අනිකුත් දිව්‍යපුත්‍රයෝ දෙයෙක් එම දෙවලොවින් චුතව, නැගෙණහිර යවමැදුම්ගම බලා, වැඩිමහළු සිටුවරුන්ගේ ගෙවල පිළිසිඳගත්හ.

සුමනාදේවි පිරිහුන් දයමසඟින් අඟිනව චන්ද්‍රරේඛාවසේ හේ හෝ නොහොත් ඝනරන් පිළිමයක් බඳුවූ රන්වන් පුතනුකෙණෙකුන් වැදූහ. ඒ ඇසිල්ලෙහි යක්දෙවරජානෝ මිනිස්ලොව බලන්නාහු, මහබෝසතාණන්වහන්සේ මව්කුසින් නික්මුණුබව දැන ''මේ බුඩඬ්කුරයන් දෙවිමිනිසුන් සහිත ලෝකයෙහි ප්‍රසිඬකොට ලනබව සුදුසුය''යි සිතා, උන්වහන්සේ මව්කුසින් බිහිවෙනවේලෙහි නොපෙණෙන ශරීර ඇතිව අවුත්, ඔබ අත රන්වන් සඳුන් ගැටයක් තබා තමන් වසන ශක්‍රභවනයට ගියහ.

මහබෝසතාණෝ ඒගත් සඳුන්ගැටය මිටින්ගත්සේක. මහබෝසතාණන්වහන්සේ මව්කුසින් බිහිවෙන වේලෙහි මැනියන්දැට මද විලිවේදනාවකුත් නොවී, ඩබරාවකින් වැහෙන දියත්තක්මෙන්ද, ධම්මාසනයකින් බස්නා පඬිරුවක්මෙන්ද, සුවයෙන් නික්මුණුසේක මැනියන්දෑ උන්වහන්සේ අතතුබූ සඳුන්ගැටය දැක ''පුතණඬ තොප අත කිම්දැ''යි කීදුය; ''මැනියන්වහන්ස මහෞෂධයකැ''යි කියා දිව යඳුන්ගැටය මැනියන්දෑ අතතබා වදාළසේක. ඖෂධය මැනියන්දැ අතටදී ''මැනියන්වහන්ස මේ ඖෂධය හැරගෙණ, යම් කිසි රෝගයකින්පීඩාකෙණෙකුට දෙවවමැනව'යි කියා, මැනියන්දැට වදාළසේක

මැනියන්දූත් තුටුපහටුව, **සිරිවඩ්ඪන** සිටානන්ට කීහ. ඒසිටානන්ට වනාහි සත් අවුරුද්දක් මුළුල්ලෙහි පහරණ හිසරුජාවක් ඇත්තේය. තුමූ තුටුපහටුව "මේ කුමාරයා මවිකුසින් බිහිවන්නේ මහෞෂධයක් අතින්ගෙණය, උපන් ඇසිල්ලෙහිම මැනියන්හා කථාකෙල්ය, මෙබඳුවූ පිණැත්තහු දුන්විසින් මේ බෙහෙද මහත්වූ ආනුභාවඇත්තේය"යි සිතා, බෙහෙද අතටගෙණ, සඳුන් සණ*මදක් ගහා නළලගැල්වූහ. සත්අවුරුද්දක් පබඬයෙහි පහළ ඉසරුජාව නෙළුම්පතෙකනොඇලී, රුරාගෙණයන දියත්තක්සේනැනිවහියේය සිටානෝ මහානුභාව ඇති ඖෂධයකැයි සොම්නසට පැමිණියහ.

මහබෝසතානන්වහන්සේ මහෞෂධයක් අතින්ගෙණ මවිකුසින් බිහිවූ නියාව හැමතැනම ප්‍රසිද්ධවිය. කාසශවාසාදිවූ ඉරාගයෙන් පීඩිත කිසි මිනිස්කෙණෙක්ඇද්ද, ඒසියල්ලෝම සිරිවඩ්ඪන සිටානන්ගේ ගෙටගොස්, මහෞෂධය ඉල්වති; සිටානෝ ඒසඳුන්ගැටය සඳුන් සණ ගහා, කල්ක සුහක් ගෙණ, පැනැ කලතා හැමදෙනාටම දෙන්නාහ. දිව්‍යමයවූ ඖෂධය ශරීරයෙහි වැහි පමණින්ම, සියලුව්‍යාධීහු යන්සිඳෙන්නාහ. සන්හුන්නාවූ රෝගඇති මනුෂ්‍යයෝ "සිරිවඩ්ඪන සිටානන්ගේ ගෙයි ඖෂධය මහත්වූ ආනුභාව ඇත්තේය"යි වණ්ණනාකෙරෙමින් යන්නාහ. මහබෝසතානන්වහන්සේට නම් තබනා දවස් පියානෝ "මාගේපුතනුවන්ට මුතුන්මිත්තන් ආදින්ගේ නමින් ප්‍රයෝජන නැත. මහෞෂධ නම්ම වෙත්ව"යි කියා, උන්වහන්සේට **"මහෞෂධ කුමාරයෝය"යි** නම් තැබූහ. තවද ඒසිටානන්ට "මාගේපුතනුවෝ පින්ඇත්තෝය, ඒහෙයින් උදකලාවනුපදනාහ. මුන්හා සමග උපන්දරුවන් නවත් ඇතමැනවැයි මෙසේවූ සිතෙක් ඇතිවිය. මෙසේ සිතා, ඔහුතුමූ තමන්ගේ මිනිසුන්යවා ගම ගෙයක්පාසා බලවා, එකද උපන් කුමරුවන් දහසක් දුටුබව අසා, සිටානෝ හැම දෙනාටම කුමාර පළඳනාදී ඍරිමවූන් යැවූහ. මහබෝසතානන්වහන්සේ හාසමග උපන්නන්ටත් සියලු මගුල්කළහ, කුමාරවරුන් දහස සරහා දවස දවස මහබෝසතානන්වහන්සේ ලහට ගෙණෙන්නාහ; බෝසතානන්වහන්සේ උන්හා එක්ව කෙළිමින්, සත්හැවිරිදි කල්හි ඝනරන් පිළිමයක්මෙන් මනාරූවූසේක; ඉක්බිති කුමාරවරුන් හා කැටිව ගම මැදදී කෙලෙනා උන්වහන්සේගේ කෙළිමඬුව ඇතුන් අසුන් ආදිය වැසි ආකල්හි මැකෙන්නේය; අව සුලං දැඩිවේලෙහි කුමාරවරු මිරිකෙන්නාහ.

එක් දවසක් උන් කෙළිමින් සිටියදී, නොකල්වැස්සක් නැගීය වැසි නගන්නා දැක, ඇත්සමාන බලඇති මහබෝසතානන්වහන්සේ දිවමින් ගොස් එක්ගේකට වන්සේක. සෙසු කුමාරවරු පසුපස්සේ දිවන්නාහු, ඔවුනොවුන් පය † පැකිළි වැටී ගී, දනබිදිමි ලේ ලිම්

* සලඳය යනු පුරාණ උමඳාවෙහි, † ඇඟ,

ආදියට පැමිණියෝය. මහබෝසතාණන්වහන්සේ "මෙතන කෙළ නට ගෙයක් කරවනබව සුදුසුය, එසේකල්හි නොම්රිකෙම්හ"යි සිතා, ඒ කුමාරවරුන්ට "මේ සථානයෙහි සුලං අමනකල්හිවේවයි, වැසිවස්නා කල්හි වේවයි, අව පහරණකල්හිවෙවයි, නොම්රිකී ඉඳී නට සිටිනට වැදහෝනට යෝග්‍යකොට ගෙයක්කරවම්හ; එකි එකී මස්සක්බැඟින් ගෙණෙව"යි වදාළසේක උයිත් වදාළ ලෙසම කළහ.

ඒ මසුදහසගෙණ, බෝධිසත්වයන්වහන්සේ වඩු ආචාරියෙකු ගෙන්වා "මෙතැන ගෙයක්කරවයි" මසු දහස දුන්සේක. වඩුආචාරි යාත් "යහපතැ"යි මසුදහසගෙණ, බිම සමකරවා කණුගස්වා රණ* දික්කොට හෙළාලීය. බෙදනනියාට මහබෝසතාණන්වහන්සේගේ සිත් නොගත්තේය. බෝසතාණන්වහන්සේ වඩු ඇදුරාට රණ ලන සැටිය වදාරණසේක් "මෙලෙස රණනොලා, මනාකොට රණදික්කර ව"යි වදාළසේක. "සවාමිනි මේමාගේ ශාසත්‍රය ඇතිමට්ටම් රණඑළිම් මිටවඩා අනික්සැටියක් නොදනිමි"කීය. මෙපමණකුත් නොදන්නේ අප සිත්හෙණ කෙසේකෙරේදැයි විචාරා "මෙසේ රණ ගෙණලා ගෙය බෙදුදිලම්"යි රණ ගෙන්වාගෙණ, තමන්වහන්සේ දික්කළසේක. විශ්වකර්මදිව්‍යපුත්‍රයා විසින් රණ එළාලූකල්හිමෙන් ගෙයබෙදිගියේය

ඉක්බිති වඩුවා "මෙසේ රණ එළාලියහෙද"යි විචාළසේක. "නොපිළිවන සවාමිනි"යි වඩුවාකීය. මා කීසැටියේ හෙය කළහෙයි දැයි වදාළසේක. "වදාළ ලෙයකට කළහෙමි"කීය.

මහබෝසතාණන්වහන්සේ ඒ සාලාවෙහි යම් පරිද්දකින් දුප්ප තුන් වසනතැන එක් සථානයක් විද, එසේම දුප්පත් ගැණුන් වදන තිඹිරි ගෙය එක්තැනක, ආගන්තුක බමුණන් වසන තැන, සෙසු ආගන්තුක මිනිසුන් වසනතැන, ආගන්තුක වෙළඳුන්ගේ බඩු තබ නතැන, මෙපරිද්දෙන්ම සියලු සථානයන් පිටතින් දොරකඩ තබා, සාලාව විධානකොට කරවූසේක. කීපදවසකින් නිමියාවූ ශාලාවෙහි සිත්තරුන් ගෙන්වා තමන්වහන්සේ විධානකොට ඇලුම් කටයුතු සිත්තම් කරවූසේක. ඒ ශාලාතොමෝ සුධර්මාව හා සමානවිය. ඉක් බිති "මෙපමණකින් මේගෙය හොබනේ නොවෙයි, පොකුණක් කර වනබව සුදුසුය"යි පොකුණක් කරවා, උළුවඩුවන් ගෙන්වා, තමන් වහන්සේ මිළදී විධානකොට, දහසක් වක් ඇති මනහර පියගැට පන්තීන් යුක්තවූ සියක්තොට ඇති පොකුණක් කරවූසේක ඒපොකු ණතොමෝ පස්පියුමෙන් සැදුම්ලද්දිය. නන්‍දනම් පොකුණමෙන්විය නැවත ඒ පොකුණුතෙර අඹ, දෙඹ, නා, පනා, සපු, දුනුකේ, ඇසළ පුවඟ ආදිවූ මල්පල්ලෙන් සැදී සිටිනා නොයෙක් ගස් රෝපණය කරවූසේක. නඳුන්උයන හා උයන කරවූසේක. එම සාලාව නිසාම

* ග්‍රුය.

ධාම්මික මහණබමුණන්ටද, බැහැරින් අවුත් ඒයාලාවේ ලඟනන්ටද, එහි ලැග බැහැර යන්නන්ටද, යෙසු දුප්පතුන් ආදීන්ටද, දන්වැට තැබ්බවූහ. ඒ මහතානන්වහන්සේගේ ක්‍රියාතොමෝ සියලුතන්හි පතලේය. බොහෝ මිනිස්සු ඒසවරුපය අසා එතනට එළඹෙන්නාහ මහබෝසතානන්වහන්සේ සාලාවෙහි වැඩහිද, ආ කෙණෙකින්ට කළමනා යුකුති අයුකුති විචාරණසේක. මෙසේ මහබෝසතානන් වහන්සේ, බුදුන් ලොව පහළවූ කල්හිමෙන් පහළවූසේක.

එසමයෙහි වේදේහරජ්ජුරුවෝ සිනදුටු සත්අවුරුද්දක් ගියකල "පණ්ඩිතවරුන් සතරදෙනා අභිභවාපස්වැනි මහනුවණ ඇතිපණ්ඩිතකෙණෙක් උපදනාහ"යි කිහ. "දැන් ඒපණ්ඩිතයෝ කොයිදැ"යි සිහිකොට "උන්වසන තැන් දනුව"යි සතරවාසලින් ඇමතියන් සතර දෙනෙකු යැවූහ. සෙසු වාසල්තුනින් නික්මුනාවූ අමාත්‍යයෝ තුන්දෙන මහබෝසතානන් නුදුටුහ. නැගෙණහිරි වාසලින් නික්මුණු අමාත්‍යතෙමේ නැගෙණහිරි යවමැදුම් ගමටගොස්, බොධිසත්වයන් වහන්සේ විසින් කරවනලද සාලාදිය දැක "නුවණැති කෙණෙකුන් මේ ගෙය තමන් හෝ කළමැනව, අනුන් ලවා හෝ කරවූව මැනව, මේගෙය කවර වඩුවෙකුවිසින් කරවණලදදැයි"යි විචාළේය. මිනිස්සු කියන්නෝ "මේගෙය වඩුවෙකු තමා නුවණබලයකින් කළදෙයෙන් නොවෙයි, සිරිවඩ්ඪන සිටානන්ගේ පුතනුවූ මහෞෂධපණ්ඩිතයන් ගේ විධානයෙන් උන්කීසැටියේ කරණලදැ"යි කීහ. "ඒපණ්ඩිතයෝ කී හැවිරිදිදෝදැ"යි විචාළේය. "පිරහුණු සත්හැවිරිදියේකැයි"කීවුය.

ඇමති "රජ්ජුරුවන් සීනය දුටුදු, පටන්ගෙණ සීනය දුටුනියාව සරිමය, සේනක පණ්ඩිතයන්ට පස්වනු පහළුවන පණ්ඩිතයෝනම් මූය"යි සනිටුහන්කොට, රජ්ජුරුවන්ට "දේවයන්වහන්ස නැගෙණ හිරි යවමැදුම්ගම සිරිවඩ්ඪන සිටානන් පුතනුවෝ මහෞෂධ පණ්ඩිතකෙණෙක්, සත්හැවිරිදි වයස් ඇත්තාහු, මෙබඳු සාලාවක්ද, පොකුණක්ද, උයනක්ද කරවූහ; මේ පණ්ඩිතයන් ගෙනෙම්දැ"යි මෙහෙවර කරන්නෙකු යැවූහ. රජ්ජුරුවෝ එපවත් අසා සතුටුසිත් ඇතිව සේනක පණ්ඩිතයන් ගෙන්වා එපවත් උන්ට කියා, "කිමෙක්ද සබඳ සේනක පණ්ඩිතයෙනි, පණ්ඩිතයන් ගෙන්නමෝදැ"යි විචාළහ. ගුණමකුවූ ඒ සේනකයා "දේවයිනි ගෙවල් ආදී කරවාපිපමනකින් පණ්ඩිතනම් නොවෙති යම්කිසි කෙනෙක් ඒකරවාපියන්නාහ ඉතා සුවලදය"යි කිය. වේදේහ රජ්ජුරුවෝ උන්ගේ බස් අසා මෙයින් එක් කාරණයෙකැයි * නුවෙන් නොබිණුහ; "එම ගම් හිද පණ්ඩිතයන් විමසව"යි මෙහෙවර කරන්නෙකු යවූහ.

එබස් අසා, ඇමති ඒ නියම්ගම වසන්නේ පණ්ඩිතයන්වහන්සේ පරීක්ෂාකෙළේය. මේමහෞෂධ පණ්ඩිතයන්වහන්සේ මත්තෙහි විමසූ පැණයෙහි යඩ්ඝෝපයෙන් කී බසි.—

---

* උදුසිනව

"මාංසං ගොණො ගණ්හිසුහාතං පුහාතං ගොලී රථෙනව
දණ්ඩා සිසං අගිවෙව කුකකුටො මණ්ඩ විජායනං
ඔදනං වාලුකඤ්ඤවාපි තලාකුය්‍යානං අථ ගද්‍රහො මණ්ඩ"

මාංශ ප්‍රශ්නය.

එහි පළමුවන මාංශ ප්‍රශ්නය කෙසේදයත්? එක්දවසක් බෝධි සත්වයන්වහන්සේ කෙළිමඩලට වඩනා වේලෙහි, එක් උකුස්සෙක් අහාරයේ මස්කොළඹුවක්හි මස්වැදුල්ලක් ගසාගෙණ, ආකාශයට පැන නැංගේය. දහයක් කුමාරවරු ඒ දැක "මස්වැදුල්ල එලවම් හ"යි උකුස්සා ලුහුබැඳගෙණ දිවන්නාහ. උකුස්සාත් ඇන්මැත් බලා පියාහඹන්නේය. කුමාරවරු උඩබලමින් උකුස්සා පසුපස් සෙනි දිවන්නාහු, කැබිලිති ගල්ආදියෙහි පැකිල පීඩාවන්නාහ. ඉක් බිති මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ "මේ මස්වැදුල්ල එලවාපියම් දූ"යි ඒ කුමාරවරුන් විවාළසේක. "එලෙවිව මැනව යවාමිනි"කිහ. "එසේවිනම් බලව"යි පණ්ඩිතයන්වහන්සේ උඩනොබලාම, පවන වබඳුවේගයෙන් දිව, උකුස්සාගේ ඡායාව මැඩගෙණ, අත්ලෙන් අත් ලගසා, මහත්වූ නාදකළසේක. ඒමහතානන්වහන්සේගේ ආනුභාව යෙන් ඒනාදය උකුස්සාගේ ලෙන්ඇනී පිටින් නැගෙන්නාසේවූයේය ඒ උකුසු භයපත්ව මස්වැදුල්ල හෙළිය. මහබෝසතානන්වහන් සේ, ඔහු ඒ මස්වැදුල්ල හෙළන්නාවූ ඡායාව දැක "බිම වැටිය නො දෙමි" කියා අල්වාගත්සේක. ඒආශ්චය්‍යය දැක, බොහෝදෙන ඔල් වරසන් දුන්නාහ, අත්පොළසන්දුන්නා, මහානාදකළාහ, ඒඅමාත්‍ය තෙම එපවත්දැන, රජ්ජුරුවන්ට "මහෞෂධ පණ්ඩිතයෝ මේ උපා යෙන් උකුස්සා ගසාගත් මස්වැදුල්ලක් එළුහ. මේ අරුමය දේවයන් වහන්ස දන්නාසේක්වයි කැඩපත්යැවිය, රජ්ජුරුවෝ එපවත් අසා "සේනක පණ්ඩිතයෙනි කිමෙක්ද මහෞෂධ පණ්ඩිතයන් ගෙන්ව මෝදැයි විවාළහ. සේනක පණ්ඩිතයෝ "උන් මේතුවරට ආ තැන් පටන් අපි හිරු දුටු කඳෙපැණියන්සේ නිෂ්ප්‍රභාවයමිහ, රජ්ජුරුවෝ අප ඇති බවත් නොදන්නාහ. එසේ හෙයින් උන් මෙයට ගෙණ එනු නුදුන මැනව"යි සිතා, තමා ගුණමකු බැවින් "දේවයන් වහන්ස මෙපමණෙහින්ම පණ්ඩිතනම් නොවෙත්මය, මේ ඉතාම අල්පදෙයකැ"යි කිහ; රජ්ජුරුවෝ මධ්‍යස්ථව "එහිම හිඳ විමසන් නේයයි"යි නැවත අසුන් යැවූහ.

ගොන් ප්‍රශ්නය.

නැවත ගොන් ප්‍රශ්නය කෙසේදයත්? යවමැදුම්ගම වසන පුරුෂ යෙක් "වැසිදිය එලාලූකල සිසාම්" අසල් ගමකින් ගොන්ගෙයක් මීළයට ගෙණ අවුත්, තමාගේ ගෙයිම ලග්ගවා දෙවන දවස් තණ

කවන පිණිස තණබිමට ගෙණගොස්, ගොණෙකුපිට ඉද තණ කව මින් විඩාව, ගොණු පිටින් බැස ගසක් මුල හිඳ නිදන්ට වන; ඒ ඇසිල්ලෙහි එක් සොරෙක් ගොන් ගෙය ඇරගෙණ නැගී ගියේය; ඒ පුරුෂයා පිබිද ගොස්, ගොන් ගෙය නොදැක, ඔබමොබ බලා ඇවිදින්නේ, ගොන් ගෙය ඇරගෙණ යන සොරු දැක, වහා දිවගොස් "මාගේ ගොන් කොයිගෙණයෙහිද" යි ඇසීය, සොරා කියන තැනැත්තේ "මාගේ ගොන් මාකැමති තැනකට ගෙණයෙමි" කිය උන් දෙන්නාගේ කලහඅසා, බොහෝදෙන රැස්ව ගියාහ. පණ්ඩිතයන් වහන්සේ උන්දෙන්නා ඛබරකොටගෙණ, සාලාවදෙරකඩින් යන්න වුන්ගේ කලහ ශබ්දය අසා, දෙන්නාම ගෙන්වා, ඔවුන්දෙන්නාගේ එන සැටි ගමන දැක "මේ සොරාය මේ ගොන් හිමි තැනැත්තේය" යි දන්නාසේ කුදු "කුමක් හෙයින් ඛබරකරවිදැයි" විචාළසේක. ගොන් ඇතිතැනැත්තේ "පණ්ඩිතයන්වහන්ස මම ගොන්ගෙය අසවල්ගම මේ නම් තැනැත්තවූ අනින්, මිළදි හැරගෙණ අවුත් රෑ ගෙයි ලඟහා ලා, උදැසන තණබිමට තණ කවන්ට ගෙණගියෙම්, එතනදි මාගේ ප්‍රමාදයක් දැකලා මේ තෙමේ ගොන්ගෙය ඇරගෙණ පලාගියේය; ඒ මම ඔබ මොබ බලන්නෙම් ගොන් දෙන්නා බැඳගෙණ යන මේ සොරා දැක, ලුහුබැඳ අල්වා ගනිම්, අසවල් ගම ඇත්තෝ; මේ ගොන් ගෙය ගත්නියාව දනිති" කිය. සොරා කියන්නේ "මේමාගේ වදුවඩා ගත් ගොන්ගෙයය, මේකා බොරුකිය" යි කිය. ඉක්බිති පණ්ඩිතයන් වහන්සේ ඔවුන් දෙන්නාගේම බස් අසා "මම තොපට යුකතිය දැහැමෙන්ම විනිශ්චයකොටලම්, මා කි යුකතියෙහි සිටිවදැයි විචාරා "සිටුම්හසි" කි කල්හී "බොහෝදෙනා ලඟන්වා යුකතිය පසිදිනා බව සුදුසුය" යි පළමුකොට සොරුකැඳවාලා "තෝ මේ ගොන් ගෙය කුමක් කවා පොවා වැඩිද" යි විචාලසේක.

සොරා කියන්නේ "උළුකැන් පොවා, තලමුරුවට හා උදුකවන ලදැ" යි කිය. ඉක්බිත්තෙන් ගොන් ඇති තැනැත්තහු කැඳවා "තෝ කුමක් කවා වැඩිදැයි විචාළකල්හි, ඒ කියන්නේ "ස්වාමිනි මා දුක් පත් තැනැත්තවුට උළුකැන් හා තල ආදිය කොයින්ද? තණම කවනලදැ" යි කිය, පණ්ඩිතයන්වහන්සේ දෙන්නාගේ බස්අසා, සහා වෙහි උන්නවුන් ගිවස්වා, පුවතුකොල ගෙන්වාගෙණ, කොටා පැන් මඩවා ගොන් පෙවූසේක, ගොන් තණම නැගුහ. පණ්ඩිතයන්වහන්සේ බොහෝදෙනාට "මේබලව" යි පැ, "සොරෙහිද නොයොරෙහිදැ" යි විචාළසේක; ඒ තෙම "සොරෙමි" කිය. "එසේවීනම් මෙතැන් පටන් සොරකම් නොකරව" යි අවවාදකොට "මෙබඳු නොකට යුත්තක් නොකරව" යි වදාළසේක. බෝධිසත්වයන්වහන්සේගේ පුරුෂයෝ වනාහි, ඔහුළුතනින් පිටිපස්සට ගෙණ, අතින් පයින් තලා දුවිලකළහ, ඉක්බිති පණ්ඩිතයන්වහන්සේ ඔහුගෙන්වා "මේජන්මයෙහිම මෙසා දුකකට පැමිණියෙහිය, පරලොව වනාහි නරකාදියෙහි

ඉපිද, බොහෝ දුක් අනුභව කරන්නෙහිය, මෙතැන් පටන් සොර කම් නොකරවයි"යි අවවාදකොට, පන්සිල්දුන්හ. අමාත්‍යයා එප වත් අසා, තත්ත්වය පෙර පරිද්දෙන් රජ්ජුරුවන්ට කියා යවිය. රජ්ජු රුවෝ සේනකයන් විචාරා "දේවයෙනි ගොන්ග්‍රහණයනම්, යම් කිසි කෙණෙක් පසිඳපියති; තවද ඇම්මුණ මැන්වැ"යි කීකල්හි රජ්ජුරු වෝ මඛ්‍යස්ථව, පෙර පරිද්දෙන් අමාත්‍යයාට කියා යවූහ.

අමාත්‍යයා රජ්ජුරුවන්ට කියා යවන නියාවද, රජ්ජුරුවන් සේනකයන් විචාරණ නියාවද, සේනකයන් වලකන නියාවද, රජ්ජු රුවන් අමාත්‍යයාට කියා යවන නියාවද, හැම පැණෙහිම මෙම ලෙයයයි දතයුතුයි.

—o—

ගණ්ඨි ප්‍රශ්නය.

නුවද තුන්වැනිවූ ගැමහු පළඳනාවේ විනිශ්චය කෙසේදයන්? එක් දුක්පත් ගැණියක්, නීලපිතාදි නානාවණිහුයින් ගැටගසා, කර ණලදගැටහු පළඳනාවක් කරින්ගලවා, කඩමත්තේ තබා, පණ්ඩිත යන්වහන්සේ විසින් කරවනලද පොකුණෙන් නහන්නටවන, අනික්ලදුරි බාලඑකක් ඒ පළඳනාව දැක ලොභ උපදවා ඔසවාගෙණ "මැනියෙනි මේ පළඳනාව ඉතාහොබනේය, කවරකෙණෙක් විසින් කරණලදිදේද? මමත් මට මෙසේම පළඳනාවක් කෙරෙම් කරපැලඳ පමණ බලාපියමිදැ"යි විචාරා; වඤ්චකසිතක් නැති **සත්‍ය** විසින් "යහ පත යෙහෙළිනියනි පමණදැන පියව"යි කී කල්හි කර පැලඳගෙණ නැගී ගියාය, පළඳනාව ඇති තැනැත්ති දැකලා, වහා ගොඩනැගී, කඩ ඇදගෙණ ලුහුබැඳගොස් "මාගේ පළඳනාවඇරගෙණ මකොයියේ දැ"යි එකුරුතුපට ගත. අනිත් තැනැත්ති "තොපගේ පළඳනාවක් මම නොගනිම්, මා කරලන පළඳනාව"යි කීය. ඒ කලහ අසා, බොහෝදෙන රැස්වූහ. පණ්ඩිතයන්වහන්සේ කුමාරවරුන්හා සමග කෙළනාසේක්, ඒ ගැණුන් දෙන්නා ඩබරකොටකොට සාලාව දෙරින් යන්නවුන්ගේ කලහශබ්දය අසා, "කුමණ අරගලෙක්ද"යි විචාරා, දෙන්නාගේ කලහ කාරණාඅසා; දෙන්නාමගෙන්ඌ, එනසැටියෙන් මමෝ සෙරය මෝ පළඳනාව ඇතිතැනැත්තිය"යි දැන ඩබරකාරණා විචාරා "මාගේ යුක්තියෙහි සිටිවදැ"යි විචාරා, දෙන්නා "එසේය සවා මිනි සිටුමිහ"යි කී කල්හි, පළමුකොට සොරතැනැත්තිය "නෝ මේ පළඳනාව පළඳිනෙයි, කවර සුවදක් ගැල්වී "යි විචා සේ.ා. ඕ "මම නිරන්තරයෙන් සඞ්ඝාරක නම් සුවදක් ල්වම්"කිව. සඞ් ඝාරක සුවදනම්, සියලු සුවද එක්කොට කරණලදය, ඉක්බිත් පළඳනාවඇති තැනැත්තිය විචාළකල්හි, ඔ "ස්වාමිනි මා දුක්පත් නැනැත්තියට සඞ්ඝාරක නම් සුවද කොයින්ද? නිරන්තරයෙන්ම

පුවතු මලෙහි සුවඳ කටමි'' කිව. පණ්ඩිතයන්වහන්සේ පැන් තලියක් ගෙන්වාගෙණ; ඒ පළඳනාව පැන්තලියෙහි ලවා, ඔසඳ වටු වෙතු ගෙන්වා ''මේ තලියෙහි පැන් සිඹ ''අසවල් සුවඳයයි දැනැ,,ධි වදුලසේක. ඔසදවටුවා පැන් සිඹ, හුදු පුවතු මලෙහි සුවඳ නියාව දැන; ගාථාවකින් * සච්සංහාරක සුවදෙක් මෙහි කොයින්ද? පුවතු මලෙහි සුවඳ අමන්නේය, මේ ලදුරි බාල ධූතීන සත්‍රිය බොරු කිව, මැහැලි තැනැත්තිය කියේ සැබෑය''යි කිය. මහබෝසතානෝ ඒ කාරණාව බොහෝ දෙනාට හඟවා ''තෝ සෙරෙහිද නොසෙරෙහිද'' යියා සෙරනියාව ගිවිස්සූසේක එතැන් පටන් මහබෝයතානන් වහන්සේගේ පණ්ඩිතභාවය බොහෝ දෙනාට ප්‍රසිඩවිය.

——o——

සුනු ප්‍රශනය.

සතරවතු ගුවටයෙහි විනිශ්චය කෙසේදයත්? කපු සේනක් රක්නා එක් සත්‍රියෙක් කපු රක්නී, තමා රක්නා සේනෙහි යවස පිපි කපු කඩාගෙණ, සකස්කොට කඩා පොලා වළුකොට සීන්හූ කැට, වැටිකොට, ඒ හූවට ඉන තබාගෙණ ගමටඑන්නී, මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ විසින් කණවනලද පොකුණෙන් ''නහම්'' කඩ ගලවා ගොඩතබා, කඩමත්තේ හූවැටිය තබා, නහන්නට දියට බට; අනික් සත්‍රියක් හූවැටිය දැක එහි ලොල්වූ සිත්ඇතිව ඒ අතටගෙණ ''අහ ඉතා යහපත හූයෙහි සීන, ඇත නැගනියෙනි තොප විසින්ම කටනාලදදු''යි ආශ්චයර්‍යමත්ව බලන්නියකමෙන් ඉන තබාගෙණ නැගී ගියාය. පෙර ගැටහූ පළඳනායෙහි පරිද්දෙන්ම කලහ කොට කොට සාලාව සමීපයෙහි යනදෙදෙනා ගෙන්වා, විචාරා තමන්වහන්සේ කී යුකතියෙහි ''සිටුම්හ''යි කී පසු බෝධිසත්ත්වයන්වහන්සේ තෝ මේ හූවැටිය කරන්නී කුමක් ඇතුළේ ලා කළාද,,යි සොරතැනැත්තිය විචාළේය; සොරතැනැත්තී කියන්නී ''ස්වාමිනි කපු ඇටක් ඇතුළේ ලා වටකෙළෙමි''කිව. ඇගේ බස්අසා, හූවැටිය ඇති නැනැ තතිය ''තෝ කුමක් ඇතුළේ ලා, වටකළාදැ''යි විචාළසේක. ඕ ''නිඹිරිඇටක් ඇතුළේ ලා වටකෙළෙමි'' කිව. දෙන්නාගේ බස් අසා, සභාවෙ උන්නවුන් ගිවිස්වා හූවැටිය ගලවා, ඇතුළේ තුබූ නිඹිරි ඇටය දැක ඇසෙරබව ගිවිස්වූසේක. බොහෝදෙනා යුකතිය පසුන් නියාවට තුටුපහටුව දහස්ගණන් සාධුකාර පැවැත්වූහ.

——o——

සුනු ප්‍රශනය.

පස්වතු සුනු ප්‍රශනය කෙසේදයත්? එක් සත්‍රියක් පුතෙකු වඩා ගෙණ පණ්ඩිතයන්වහන්සේගේ පොකුණට ගොස් ආදිකොට පුතු

* සබ්බ සංහාරකෝ නත්ථි, සුඩං පියඹුවායති
අලිකං භාසි ධූත්තාසා, සච්චමාහ මහලලිකා,,

නාහවා, තමාගේ කඩමත්තේ හිඳුවා, නොමෝ ඉස්සොර නහන්ට බට ඈ නාන්නටබට ඇසිල්ලෙහි යකින්නියක් ඇගේ පුතුදැක කනුකැම තිව ගැණුවෙසක් ගෙණ දරුවන් සමීපයට අවුත් "යෙහෙළිය මේ දරුවෝ ඉතා හොබනාහ. මූ නොපගේ දරුකෙනෙක්දැ"යි විචාරා, "එසේය යෙහෙළියෙනී" කීකල්හි, මේ දරුවන් කිරිපොවම්දැයි කී කල්හි, මැනියන් විසින් "යහපතැ"යි කී කල්හි; ඕ දරුවන් වඩා ගෙණ මදක් කිරි පොවාලා, වඩාගෙණ පලාගියාය. මැනියෝ තමන් ගේ දරුවන් ඇරගෙණ ඝන්නිය දැක, දිවගෙණ ගොස් "මාගේ පුතු කොයි ගෙණයේදැ"යි අල්වාගත. යකින්නි කියන්නී "නී කොයින් ලත් පුතෙක්ද? මූ මාගේ පුතනුවෝය,,යි භයක් නැතුව කිය. ඔහු දෙන්නා කලහ කෙරෙමින් යාලාව දෙරකඩින් ඝන්නාහ. මහබෝ සතාණන්වහන්සේ කලහශබ්දය අසා, දෙන්නාම ගෙන්නා "මේ කුම ණ්ඩබරදැ,,යි අසා, ඇස් නොමරණ බැවින්ද, ඔලිඳැට දෙකක්සේරත්ව නිබෙන බැවින්ද * "මේ යකින්නිය"යි දැන "මාකි යුක්තියක සිටිවි දැ"යි විචාරා "එසේය සිටුම්හ"යි කී කල්හි, බිම හිරක් අඳා, හිරමැද දරුවන් හොවා, යකින්නියලවා දූතහා මැනියන්ලවා දෙපය ගන්වා, "දෙන්නාම ඇදගණුවයි ඇදගත් එකෙකුටය පුතනුවෝ"යයි වදාළ සේක. දෙන්නාම දරුවන් ඇදගත්හ. දරුවෝ දෙන්නා විසින් අදනු ලබන්නාහු දුකට පැමිණියහ. මැනියෝ ලය පැළුනුකලක් මෙන් ශොකයට පැමිණ, දරුවන් අතහැර අඩමින් සිටියාය. බෝස තාණන්වහන්සේ "දරුවන් කෙරෙහි වැදුවන්ගේ ලය මොලොක්ද නොහොත් නොවැදුවන්ගේ ලය මොලොක්ද"යි බොහෝදෙනා විචාළසේක. බොහෝදෙනා පණ්ඩිතයන්වහන්ස වැදුවන්ගේ ලය වේද මොලොක්වන්නේ"යයි කීවාහුය. ඒ අසා පණ්ඩිතයන්වහන් සේ "කිමෙක්ද දැන් දරුවන්වඩාගෙණ සිටිතැනැත්තිය මැනියනැයි වැටහේද? හැරපියා සිටි තැනැත්තිය මැනියනැයි වැටහේද"යි හැම දෙනාම විචාළසේක. හැමදෙනම "දරුවන් හැර සිටි තැනැත්තෝ වෙද්ද පණ්ඩිතයන්වහන්ස මැනියෝය"යි කිහ. "කිමෙක්ද තොපි හැම දරුසෙර දනුදැ"යි විචාළසේක. හැමදෙනම "නොදනුම්හ පණ්ඩිතයන්වහන්සැයි කී කල්හි "එම්බා මෝ යකින්නක, දරුවන් කන පිණිස ගතැ"යි වදාළසේක. "කෙසේ දත්සේක්ද පණ්ඩිතයන් වහන්සැ"යි කීහ. "ඇසිපිය නොමරණ බැවින්ද ඇස්දෙක රත් බැවින්ද කිසිකෙණෙකුන් කෙරෙහි සැකයක් නැති බැවින්ද දයා වක්නැති බැවින්දැයි මෙතෙක් කාරණයෙනැ"යි වදාළසේක. ඉක් බිති මෙලෙස වදාරා "තෝ කවරෙහිදැ"යි යකින්න විචාළසේක. "යකින්නකිමි යහමිනි" කිව. "කුමක් පිණිස මේ කුමරුවා ගත්හි දැ"යි වදාළසේක. "කන පිණිසය යහමිනි"කිව. "නුවණනැත්තිය පෙරත් තෝ අකුසල්කොට යකින්නව උපන්නෙහිවෙද, දැන් වනාහී නැවතත් අකුසල් කරන්නෙහිද වී, අහ නුවණනැත්තිය" කියා

* ඕයාව නැති ගෙයින්ද.

අවවාදකොට, ඉක්බිති ඈ පන්සිල් පිහිටුවා යැවූසේක. කුමරුවාගේ මැනියෝ "බොහෝකලක් ජීවත්වුවමැනව සාමිනි"යි මහබෝසතා නන්වහන්සේට සතුති කොට පුතනුවන් වඩාගෙණ නැගී ගියාහ.

කාල ගෝල ප්‍රශ්නය.

සවනුව කාලනෝල ප්‍රශ්නයකෙසේදයත්? මිටිහෙයින්*ගෝළයයි කියාද, කලුපැහැති හෙයින් කාලයයි කියාද ලබනලද නම්වූ එක් මිනිසෙක් වනාහි සත් අවුරුද්දක් ගෙයි කඹුට අඹුවකලද. ඕ නමින් දික්තල නම. ඒ පුරුෂයා එක් දවසක් තමාගේ අඹුව බණවා "යොදුර දෙමව්පියන් බලා පියමිහ. කැවුම් පෙවුම් ඉදිකොටලව"යිකියා ඈ විසින් "මවපියන්ගෙන් කාරිය කිම්ද? නොබැණැ"යි ප්‍රතික්ෂේප කරණලද්දේ, තුන්වරදක්වා කියා, තුන්වෙනි වාරයෙහි ගිවිස්වා, කැවුම් පිසවාගෙණ, පලා බත් ආදී මාගෝපකරණද කැවුම් ආදී දෙමව්පියන්ට ගෙණයායුතු පඬුරුද ඇරගෙණ; ඒ අඹුව හා සමග මගට පිළිපන්නේ, අතරමග පැනිර දිය යවා හොයක් දිවී. නොගැඹුරුවූවත් ගහදියට ඔහුදෙදෙනම බාහාහ. එසේ හෙයින් ඒගහින් එතරවයාගත නොහෙන්නාහු ගංතෙර සිටියහ. එවේලෙහි දික්පිටියායවා නමක්ඇති එක් දුක්පත් පුරුෂයෙක් † ඒ ගංතෙර ඇවිදිනේ, උන්දෙන්නා සිටි තැනට පැමිණියේය. ඉක්බිති උහු දැක "යහලු" මේ ගඟ ගැඹුරු හෝ නැද්ද"යි පිළිවිස්සහ. ඒ තෙමේ "උහු දියට බාහාහ"යි දැන මේ ඉතා ගැඹුරුය කිඹුළන් හා දැතිමුවර ආදිවූ චණ්ඩ මත්ස්‍යයන්ගෙන් ගහණය"යි කිව එබස් අසා "සබඳ තෙපි කෙසේ එතරවවිද"යි විචාළහ. මේගඟ කිඹුළන් හා දැතිමුවර ආදිවූ චණ්ඩ අයහා අපහා පුරුදුකම් ඇත. එහෙයින් අප නොකන්නාහ"යි කිව. "එසේවීනම් සබඳ අපත් එතරකරව"යි කිවුය. ඒ පුරුෂයාත් "යහපතැයි" ගිවිස්සේය. ඔහු ගිවිසිකල දෙමහල්ලෝ කනබොනදූ ඔහට දුන්හ. ඒ පුරුෂයා කරණලද ආහාරකෘත්‍ය ඇත්තේ "සබඳ කවුරුන් පළමුකොට ගෙණයෙමිද"යි විචාළේය. එබස් අසා කාලගෝළයා "තොපගේ බැදූනියන්ද පළමුකොට ගෙණයව, මා පසුව ගෙණව"යි කීය. ඒ පුරුෂයාත් "යහපතැ"යි දික්තල කරහිඳුවාගෙණ සියලුම මාගෝපකරණත් කැවුමුත් අරගෙණ ගඟට බැස මඳක් නැන් ගොස් කෙළිල්ලෙන් බැස හිඳ හිඳ ගියේය. කාලගෝලයා ගංතෙර සිටියේ "මේ ඉතා ගැඹුරුය, මෙසේ උස්තැනැත්තවුට පවා මෙතෙක් දියමාරු නොවන්නේය"යි සිතිය. දික්පිටියාද දික්තල ගඟ

---

* ලකුණටක.
† බිලිබාදෙයෝ.

මැදට ගෙණගොස් "සොඳුර මම තොප රක්ෂාකෙරෙම්, හැඳ පැළඳ දෙවඟනක්සේ කැමති පරිද්දෙන් සැරසී දැසිදස්සන්විසින් පිරිවරණ ලදුව ඇවිදුව, තොපට මේ අතුටුම්පියා කුමණපොෂ්‍යයක් තමා දිලිය හෙන්නේද? මාගේ බස් ගිවිසුව" යි කීහ. ඔතොමෝ දික්පිටියා කී බස් අසාම සත්අවුරුද්දක් තමා නිසා ගෙයි කඹුළු තමාගේ සැමියා කෙරෙහි සෙනහ සිඳ, ඒ ඇසිල්ලෙනිම එකී දික්පිටියා කෙරෙහි පිළිබඳ සිත්ඇතිව "ස්වාමිනි ඉදින් මා නොහරුනම්, මම තොප කිවා කෙරෙම්" යි ගිවිස්සීය. ඔහු දෙදෙනම එතර ගොස් විශෙෂයෙන්ම සන්තුෂ්ටව කාලගෝළයා හැරපියා "තෝ එසේ සිටුව" යි කියා, ඔහු බල බලා සිටියදිම කැවුම් කකා යන්ටවන්හ. කාලගෝළයාත් උන් දෙන්නාගේ ක්‍රියාව දැක "මුන්දෙන්නා එක්වගෙණ මා ඇරපියායෙති" සිතමින්, ඇත් මැත් බලා දිවන්නේ, මදක් දියට බැස හයින් ගොඩට නැඟි නැවත උන්දෙන්නාකෙරෙහි කෝපයෙන් "මියෙම්වා රැකෙම්වා" ගහට පැණ දියට බටුයේය. දිය මදනියාව දැන ගෙන් එතරව දික්පිටියාකරා පැමිණ "කොල දුෂ්ටවූ සොර, මාගේ අඹුවන් කොයි ගෙණයේදැයි විචාළේය. දික්පිටියාද "කොල අතුටුම්පිය තට අඹුවෝ කොයින්ද" යි කියා කාලගෝළයා කරඅල්වාගෙණ ඒදික්තල අත අල්වාගෙණ "තෝ නොසිට කොයියේද" සත්අවුරුද්දක් ගෙයි කඹුට ලත් මාගේ අඹු වේදැ" යි කියා දික්පිටියා හා සමග කලහකෙරෙමින් සාලාව සමීපයෙන් යන්නාවූය. බොහෝදෙන කලහ ශබ්දය අසා රැස්වූහ. මහබෝසතානන්වහන්සේ "මේ කුවණ අරගලෙක්ද" යි විචාරා, උන් දෙන්නාම ගෙන්වා දෙන්නාගේ ඔවුනොවුන්ට කියන බස්අසා "මාකී යුක්තියෙහි සිටුදැ" යි කියා සිටුමිහ" යි කීකල්හි පළමුකොට දික්පිටියා බණවා "තෝ කිනම්ද" යි විචාළසේක. "දික්පිටියා නම් ස්වාමිනි" කීය. අඹුවන්ගේ නම කිම්ද" යි විචාළසේක ඇගේ නම නොදන්නේ අනික් නමක්කීය. "තාගේ මැනියෝ පියා නෝ කිනම්මුද" යි විචාළසේක; "මේ මේ නමැ" යි කීය. "තාගේ අඹුවන්ගේ මැනියෝ පියානෝ කිනම්මුද" යි විචාළසේක. ඒ නොදන අනික් නමක්කීය, ඉක්බිත්තෙන් ඔහුගේ බස් සහායෙහි උන්නවුන් ගිවිස්වා, ඔහු එතනින් පිටත්කරවා, කාලගෝළයා ගෙන්වා, පෙර පරිද්දෙන්ම හැමදෙනාගේම නම් විචාළසේක. ඒ වූ පරිද්දෙන්ම දන්නේ නොවරදවාම කීය. ඔවුන් එතනින් පිටත්කරවා දික්තල ගෙන්වා "තෝ කිනම්ද" යි විචාළසේක. ඕ "මම ස්වාමිනි දික්තල නම්" කිව. "නිගේ සැමියා කිනම්දැයි විචාළසේක. ඕ සොර සැමියාගේනම නොදන්නී අනික් නමක්කිව. "නිගේ මැනියෝ පියානෝ කිනම්මුද" යි විචාළසේක. ස්වාමිනි අසවල්නම්මු" යයි කිව. "නිගේ සැමියාගේ මව් පිය දෙන්න කිනම්මුද" යි විචාළසේක. ඕ නන් දෙඩන්නියකමෙන් අනිකක් කිව, මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ දික්පිටියා හා කාලකොළයා හා දෙන්නා ගෙන්වාගෙණ "මෑගේ

බස් හා දික්පිටියාගේ බස් සමඳ කාලගෝළියාගේ බස් සමඳ"යි බොහෝදෙනා විචාළසේක. හැමදෙනම පණ්ඩිතයන්වහන්ස කාල ගෝළියාගේ බස් හා සමය"යි කීහ. ඉක්බිති "මේ කාලගෝලයා මැගේ සැමියාය දික්පිටියා සොර සැමියා"යි කියා ඔහු විචාරා සොර සැමියා නියාව ගිවිස්සූසේක.

———o———

රථ ප්‍රශ්නය.

✓ **සන්වනු රථ ප්‍රශ්නය කෙසේදයන්?** එක් පුරුෂයෙක් රථයක ඉඳ මුහුන සෝදන පිණිස නික්මුනේය. ඒ ඇසිල්ලෙහි සක්දෙව් මහ රජනෝ මනුෂ්‍යලොකය බලන්නාහු මහෞෂධ පණ්ඩිතයන්වහන් සේදැක "මේ මහෞෂධ බුඩාඩ්කුරයාගේ ප්‍රඥානුභාව ප්‍රකාශ කරවම් සිතා; මිනිස්වෙසින් අවුත් පුරුෂයා පදිම්න්සිටි රථයෙහි පසුකඩඅල් වාගෙණ යන්නාහු රථයෙහි උන් පුරුෂයා "කුඩෙනි කුමණ කටයුක් තක් නිසා අවුදැ"යි විචාරා "නුඹදැ සම්පයෙහි සිටිනා නිසා ආම්"කී කල්හි "යහපතැ"යි ගිවිස රථයෙන්බැස ශරීරකෘත්‍ය සපයනපිණිස ගියේය. ඒක්ෂණයෙහි ශක්‍රයෝ රථයට පැණනැඟී වහා රථය පද නාහ. රථය ඇති පුරුෂයා ශරීරකෘත්‍ය කොට නික්මුනේ, රථය හැරගෙණ යන්නාවූ සක්දෙව් රජහු දැක, යුහුව ගොස් "සිටුව සිටුව රථය කොයිගෙණයේදැ"යි කියා "තොපගේ රථය අනිකෙක් වන් නේය. මේ වනාහි මාගේ රථය වන්නේය"යි කීකල්හි ඔහු හා සමග කලහ කෙරෙමින් සාලාව දෙරට පැමිණියේය. පණ්ඩිත යන්වහන්සේ "මේ කුමක්දැ"යි බැණ, එන්නාවූ දෙන්නාම දැක කිසි භයක් නැති බැවින්ද ඇස් නොමරණ බැවින්ද "මේ ශක්‍රයාය මේ රථ සවාමියාය"යි දත්සේක. එසේ වූවද කලහ කාරණා විචාරා "මාගේ යුක්තියක සිටුදැ"යි විචාරා "සිටුම්හ"යි කීකල්හි "මම රථය පදවම්; තොප දෙන්නම රථය පස්සෙන්ගණුව; රථය ඇතිතැනැත් තෝ නොහරනෝය"යි කියා, තමන්දැගේ පුරුෂයෙකුට "රථය පදු ව"යි වදාළසේක. ඒ යුහුව රථය පදනටවන; ඔහු දෙන්නත් රථය පස්සෙන් අල්වාගෙණ යන්නාහ; රථය හිම් තැනැත්තේ මදතෙනක් ගොස් රථය පස්සෙන් දිවියනොහෙන්නේ රථය හැරපියා සිටියේය. ශක්‍රයා රථය හා සමග දිවන්නේ, පණ්ඩිතයන්වහන්සේ රථයපැදීම් නවත්වා මිනිසුන්ට "මේ පුරුෂයා මදක් ගොස් රථය හැරපියා සිටි යේය. මේ වනාහි රථය හා සමගම දිවීය, මොහුගේ ශරීරයෙහි ඩබින්දුවකුත් පමණනැත, ඇණිමකුත් නැත්තේය, නොමරණලද ඇස් ඇත්තේය, මේ තෙමේ සක්දෙව්රජය"යි වදාළසේක. ඉක් බිත්තෙන් ඕහට "තෝ දිව්‍යරාජයෙනිදැ"යි විචාරා එසේයයි කී කල් හි, කුමක් නිසා මේ මනුෂ්‍යලොකයට අවිදැයි විචාරා "නුඹවහන්සේ ගේ නුවණ ප්‍රකාශ කිරීම පිණිසය පණ්ඩිතයන්වහන්සැයි කීකල්හි

"එසේවිනම් මෙබන්දක් මතුනොකරව"යි වදරා අවවාදකළසේක; සක්දෙව්රජතෙමේත් තමන්ගේ ශක්‍රානුභාවය දක්වමින් ආකාශයෙහි සිට "නුඹවහන්සේ විසින් රථයුක්තිය යහපත්කොට පසිඳිනාලදුයි පණ්ඩිතයන්වහන්සේට සතුනිකොට තමන් වසන දිව්‍යලොකයටම ගියාහ; එදවස් වේදේහ රජ්ජුරුවන් විසින් පණ්ඩිතයන්ගේ නුවණ පරීක්ෂාකරවයි කියා නැගෙණහිරි යවමැදුම්ගම සිටුවනලද ඒඇමති තෙම රජ්ජුරුවන් සමීපයට ගොස්, "දේවයන්වහන්ස මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ විසින් රථයුක්තියක් මෙසේ පසිඳිනාලද, ඒ පණ්ඩිතයන් විසින් සක්දෙවරජ්ජවා පරදවනලද, කුමක් හෙයින් පුරුෂවිශේෂය නොදන්නාසේක්ද? දේවයන්වහන්ස"යි කිය. රජ්ජුරුවෝ සේනකපණ්ඩිතයන් "කිමෙක්ද පණ්ඩිතයෙනි, මහෞෂධ පණ්ඩිතයන් ගෙන්වාගණුමෝද"යි විචාළහ. දේවයන්වහන්ස, මෙපමණෙකින්ම පණ්ඩිත නොවන්නාහ, තවත් බැලුවමැනව පරීක්ෂාකොටපියා දන්නමෝදැ"යි කිය.

දණ්ඩක ප්‍රශ්නය.

අටවනු කිහිරිදණ්ඩන් විමසූ ප්‍රශ්නය කෙසේදයත්? ඉක්බිත්තෙන් එක්දවසක් පණ්ඩිතයන් විමසම්හයි කිහිරිදණ්ඩක් ගෙන්වා, එයින් වියතක් පමණගෙණ තත්තකාරයෙකු ගෙන්වා සකස්කොට ලියවා, නැගෙණහිරි යවමැදුම්ගම වසන පුරුෂයෝ නුවණැත්තෝල මේ කිහිරිදණ්ඩහි මේ අගය මේ මුලය දනිත්වයි, ඉදින් නොදනිත් නම් දහසක් දඩයයි කියා යවූහ; ගම්වැස්සෝ රැස්ව කිහිරිදණ්ඩහි අග මුල දැනගත නොහෙන්නාහු සිරිවඩ්ඪන සිටාණන්ට "කිසිසේත් මහෞෂධ පණ්ඩිතයෝ දැනගන්නාහ. උන්ගෙන්වාගෙණවිචාරව"යි කිවෝය. සිටාණෝ ඒ පණ්ඩිතයන් කෙළිමඩලෙන් ගෙන්වා එපවත් කියා, "පුත, අපිහැම කිහිරිදණ්ඩහි අග මුල දැනගන්ට නොපොහොසතුම්හ, කිමෙක්ද පුත තෙපි පොහොසතුදැයි විචාළහ. පියානන් කිබස් අසා පණ්ඩිතයන්වහන්සේ "රජ්ජුරුවන්ට මේ කිහිරිදණ්ඩෙහි අයින් වෙවයි මුලින් වෙවයි ප්‍රයෝජනයක් නැත, මා විමසනු පිණිස එවනලද්දේවන්නේය"යි සිතා, "හෙණෙව කුඩාවරුනි, මම පොහොසත්මි"යි ගෙන්වාගෙණ, කිහිරිදණ්ඩ අතින් අල්වාගෙණ මේ අගය මේ මුලයයි දැන, බොහෝදෙනා සිත්ගන්නා පිණිස පැන්තලියක් ගෙන්වා, කිහිරිදණ්ඩමැදින් හුලනුවකින් බැඳ අග අල්වාගෙණ කිහිරිදණ්ඩ දියපිට තබාලූසේක. මුල බරබැවින් පලමුකොට දියේ ගැලිණ. ඉක්බිත්තෙන් "ගසෙහි නම් මුල බරවේද, නොනොත් අග බරවේදැ"යි බොහෝදෙන විචාළසේක. හැමදෙනම පණ්ඩිතයන් වහන්ස, මුල බරවේදැයි කිහ. එසේහෙයින් කිහිරිදණ්ඩෙහි පළමු

කොට ගැලුනු අත මුලයයි මේ සලකුණෙන් අගත් මුලත් වදාළසේක ගම්වැස්සෝද "මේ මුලය මේ අගය"යි රජ්ජුරුවන්ට කියා යවූහ; රජ්ජුරුවෝ සතුටුව "මේ අග මුල කවරෙක් දත්තේදැ"යි විචාරා සිරි වඩ්ඪන සිටානන් පුතනුවෝ මහෞෂධ පණ්ඩිතයෝය"යි අසා සතුටුව, "කිමෙක්ද සේනකය මහෞෂධ පණ්ඩිතයන් ගෙන්වමෝදැ"යි විචාළහ. ඉවසුව මැනව දේවයන්වහන්ස, අනික් උපායකිනුත් විම සම්හයි නැවතුහ.

ගිජී ප්‍රශ්නය.

නවවැනිව ගැණු ඉසක්හා පිරිමි ඉසකින් විමසූ ප්‍රශ්නය කෙසේදයන්? ඉක්බිත්තෙන් එක් දවසක් ගැණියකුගේද පිරිමියෙකුගේද හිස් දෙකක් ගෙන්වා "මේ ගැණුහිසය මේ පිරිමිහිසයයි දනිත්වයි, නොදන්නාහුනම් දහසක් දඩ දෙන්නාහුය"යි නැගෙණහිරි යව මැදුම්ගම් වැස්සන්ට යැවූහ; ගම්වැස්සෝ විභාග නොදන්නාහු හිස් දෙකගෙණ බෝසතානන්වහන්සේ විචාළහ. උන්වහන්සේ හිස්දෙක දැකලාම "මේ ගැණු හිසය මේ පිරිමි හිසයයි දත්සේක. පිරිමි හිස මැස්ම වක්නොව ඉදිව යන්නේය; ගැණු හිස මැස්ම වක්වන්නේය. බෝසතානන්වහන්සේ මේ සලකුණෙන්, මේ ගැණු හිසය මේ පිරිමි හිසයයි ගම්වැස්සන්ට වදාළසේක. ගම්වැස්සෝ රජ්ජුරුවන්ට ඉස් දෙක තෝරාදුන්හ. රජ්ජුරුවෝ විචාළනියාවද සේනකපණ්ඩිතයන් වැලකූ නියාවද පෙරසේමැයි.

අහි ප්‍රශ්නය.

දසවැනිවූ සපියන්දෙන්නාගෙන් විමසූ ප්‍රශ්නය කෙසේදයන් නැවත එක් දවසක් නුවණැති හා සැපින්නකු ගෙන්වාගෙණ, "මේ සපියාය මේ සැපින්නයයි දනිත්වයි, නොදන්නාහුනම් දහසක් දඩ යයි, නැගෙණහිරි යවමැදුම්ගම් වැස්සන්ට යවූහ; ගම්වැස්සෝ නොදන්නාහු පණ්ඩිතයන්වහන්සේවිචාළහ. පණ්ඩිතයන්වහන්සේ දැකලාම දැනගත්සේක. සපියාගේ නගුට මහත්වන්නේය, සැපින්නගේ නගුට සිහින්වන්නේ; සපියාගේ හිස මහත්වන්නේය; සැපින්නගේ හිස දික්වන්නේය; සපියාගේ ඇස් වටවන්නේය, මහත්වන්නේය; සැපින්නගේ ඇස් දික්ව ඝුඩා වන්නේය; සපියාගේ පෙණය * හාත් පසින් සම්පූර්ණව තිබෙන්නේය; සැපින්නගේ පෙණය එක් දියාව කින් සැහැපුවාසේ අඩිව තිබෙන්නේය; මේ සලකුණෙන් මේ "සපියාය මෝ සැපින්නය"යි වදාළසේක-සෙස්ස යටකියනලද්දාවූ ක්‍රමයයි

* සොවැත්ත.

කුකකුට ප්‍රශ්නය.

එකොළොස්වන කුකුලාඟෙන් විමසූ ප්‍රශ්නය කෙසේදයත්? ඉක්බිත්තෙන් එක් දවසක් "නැඟෙණහිරි යවමැදුම් ගම් වැස්සෝ සමීඛයෙන් ධවලවූ පය අංඇති, ඉස මොළ්ලියක් ඇති, කාලත්‍රය නොයික්මවා හඬන්නාවූ ගොණෙකු එවත්වයි, ඉදින් නේවුනම් දහසක් දඩය"යි කියා යවූහ. ඒගම්වැස්සෝ ප්‍රශ්නයෙහි විභාග නොදන්නාහු පණ්ඩිතයන්වහන්සේ විචාළහ. පණ්ඩිතයන්වහන්සේ "රජ්ජුරුවෝ නොප අතින් හැළි කුකුලෙකු ගෙන්වති" වදාළසේක. ඒ කුකුලා වනාහි පය පොරකටු ඇති බැවින් පය අං ඇත්තේ නම, ඉසමල්ඇති බැවින් ඉස මොල්ලියක් ඇත්තේ නම, හ්‍රස්ව දිඝ්‍ර පලුත* යන තුන්කාලයට උච්චාරණ ශුද්ධකොට හඬනඟණහෙයින් කාලත්‍රය නොයික්මවා හඬන්නේනම; එසේහෙයින් මෙබඳු කුකුලෙකුයව"යි වදාළසේක. ගම්වැස්සෝ එබඳු කුකුලෙකු යවූහ.

මණි ප්‍රශ්නය.

දෙළොස්වැනිවූ මැණිකින් විමසූ ප්‍රශ්නය කෙසේදයත්? ශක්‍ර දේවෙන්ද්‍රයන් විසින් කුසරජ්ජුරුවන්ට දුන් මැණිකතෙම අටතැනකින් වක්වූයේය. ඒ අටවක් මැණිකෙහි ශක්‍රයන් ඇවිඳුණු පුරාතන හුය දිරාගොස් කැඩි ගියේය. පරණ හුය හැරපියා අලුත් හුයක් අවුණාලන්ට කිසිකෙණෙක් නොපොහොසත්හ. එක්දවසක් "මේ මැණිකෙහි පරණ දිරාගිය හුය ඇරපියා අලුත් ලනුවක් ලව"යි කියා යව මැදුම්ගම වැස්සන්ට වේදේහ රජ්ජුරුවෝ යවූහ. ගම්වැස්සෝ පරණ හුය අරින්ටත් අලුත් හුය ලන්ටත් නොහැක්කාහු තමන්ට නොපිළිවන්හ. මහෞෂධපණ්ඩිතයන්වහන්සේ "නොපිනොසිනව, මිටිකක් ගෙන්වාගණුව"යි කියා ගෙන්වාගෙණ, මැණිකෙහි දෙකෙළවර සිදුරෙහි මී බින්දු ගල්වා පලස් හුයින් ලනුවක් අඹරා, ලනු අග මියෙහි ගලා, මදක් මැණිකේ සිදුරට වද්දලා, කුහුඹුවන් නික්මෙණ කුහුඹු බිලයක තබාලූසේක. කුහුඹුවෝ මියෙහි ගඳින් බිලයෙන් නික්ම, මැණිකෙහි දිරාගිය පරණ හුය කාගෙණ පලස්හුඅග ඇගෙණ යටින් අදනාහු, අනික් අලුයෙන් පිටත්කොටපිහුය. පණ්ඩිතයන්වහන්සේ මැණිකෙහි ලනුව ඇමිණිගිය බැව් දැනගෙණ "රජ්ජුරුවන්ට දෙව"යි කියා ගම්වැස්සන්ට මැණික දුන්සේක. ගම්වැස්සෝ රජ්ජුරුවන්ට යවූහ. රජ්ජුරුවෝ ලනුව ඇවිඳුණු උපාය අසා සතුටුවූහ.

---

* නොනොත් උදයනය, දවාලය, සවසය යනු පුරාණ පොතෙහි.

විජායන ප්‍රශ්නය.

කෙලෙස්වන විජායන ප්‍රශ්නය කෙසේදයත්? එක් දවසක් වනාහි රජ්ජුරුවන්ගේ මගුල්ගොණු, උදු බොහෝකොට කවා බඩ මහත්කොට හං සකස්කොට සවිඩහයෙහි තෙල් ගල්වා කසා නාවා නැගෙණහිරි යවමැදුම්ගම ඇත්තන්ට "තොපි නුවණැත්තෝල, මේ රජ්ජුරුවන්ගේ මගුල්ගොණුය, පිහිටි දරුගැබ් ඇත්තේය, මොහු වද වාපියා වස්සා සහිනකොට එවව, එසේ නොඑවොත් දහසක් දඩ ය"යි යවූහ. ගම්වැස්සෝ "මේගොණු දරුවන් වදන්ට නොපිළිවන, කුමක්කරමෝදෝහෝ"යි පණ්ඩිතයන්වහන්සේවිවාළහ. උන්වහන් සේ සමාන පැණයකින් විසඳිය යුතුයයි සලකා, රජ්ජුරුවන් හා සමග කියන්ට එක්බුහුටි පුරුෂයෙකු කැඳවූහ. ඉක්බිත්තෙන් මහබෝසතා නන්වහන්සේ "එව පින්වත් පුරුෂය, තෝ තාගේ ඉසකේ පිටමැද හෙළා ගෙණ නොයෙක් පරිද්දෙන් විහවිලාප හඬහඬා රජගෙයි වාස ලටයා. සෙස්සවුන් විචාරණලදුයෙහි කිසිවක් නොකියාමහරජ්ජුරු වන්විසින් ගෙන්වාගෙණ හඬනාකාරණා විචාරණලද්දෙහි "දේවයන් වහන්ස, මපියාතෝ වදුහනනොහි අදට විලිපහරණේ සද්දවසය, මට පිළිසරණ උවමැනව, වදන උපායෙක් වදුළුමැනව"යි කියා රජ්ජුරුවන් විසින් කිමෙක්ද නන්දෙඩයිද? මේ කාරණයෙක් නො වෙයි, පිරිමින් වදන්නාහු, නැනැයි කී කල්හි, "දේවයන්වහන්ස, එසේවිනම් නැගෙණහිරි යවමැදුම් ගම්වැස්සෝ කෙසේ මගුල්ගොණා වදවද්දැයි විචාරව"යි වදුළුසේක. ඒ පුරුෂයාත් මහබෝසතානන් වදුළු වචනය පිළිගෙණ, වදුළ පරිද්දෙන්ම කෙළේය. රජ්ජුරුවෝ "සමාන ප්‍රශ්නය කා විසින් සිතනලදදැ"යි විචාරා මහෞෂධ පණ්ඩි තයන් විසිනැයි අසා සතුටුවූහ.

ඔදන ප්‍රශ්නය.

තුදුස්වැනිව පැසිඛනීන් විමසූ ප්‍රශ්නය කෙසේදයත්? එක් දව සක් "පණ්ඩිතයන් විමසම්හ"යි කියා නැගෙණහිරි යවමැදුම්ගම්වැස් සෝ අපට අටකාරණයකින් සමන්විතවූ පැසිබන් පිසළුවන්වයි, පැසි බන කියන්නේ මේ අටකාරණයයි;–සාලිනුත් නොපිසුවමැනව, දියෙ නුත් නොපිසුවමැනව, සැළියෙනුත් නොපිසුවමැනව, ගින්නෙනුත් නොපිසුවමැනව, දර උදුනලාත් නොපිසුවමැනව, මෙසේවූ පැසිබන ගැණිය අතත් නොඑවව මැනව, පිරිමියකු අතත් නොඑව්ව මැනව, මගෙකත් නොඑව්වමැනව; මේ අටකාරණයෙන් යුක්ත පැසිබන නොඑව්වහොත්, දහසක් දඩයයි"කියා යවූහ. ගම්වැස්සෝ ඒ කාර

ණය නොදන්නාහු පණ්ඩිතයන් විචාළහ. උන්වහන්සේ "නොසිත ව"යි කියා, නොසාල්නම් සුන්සාල, නොදියනම් පිනිදිය ගෙණ, නොසැළියනම් අනික් බිදනක් ගෙණ, නොඋදුනනම් අලුත් කණු ගසා, නොඉනිනම් පියවිගිනි හැර දළුඬන් හෙලූ ගිනි ගෙණ, නොදරනම් පරඩලා ගෙණ, පැසිබත පිසවා සැළියකලා අස් ඔබා, නොගැණු නොපිරිමියෙකුනම් නපුංසකයෙකු ඉස තබාලා, නොමඟින් නම් මාවත හැරපියා හසරකින් රජ්ජුරුවන්ටයව"යි යවූසේක. රජ්ජුරුවෝ ප්‍රශ්නය කාවිසින් විසඳනාලදදැ"යි විචාරා මහෞෂධ පණ්ඩිතයන් විසිනැයි අසා සතුටුවූහ.

—o—

වාලුකා ප්‍රශ්නය.

පයලොස්වන වැලිඇතින් විමසූ ප්‍රශ්නය කෙසේදයත්? එක් දවසක් පණ්ඩිතයන්වහන්සේ විමසනු පිණිස, යවමැදුම් ගම් වැස්සන්ට අස්නක් යවූහ. ඒ කෙසේවූ අස්නෙක්දයත්;- රජ්ජුරුවෝ, "ඕවිල්ලෙහි කෙළෙනා කැමැත්තෙමි, පරණ වැලියොත කැඩිහියේය, එක් වැලියොතක් අඹරා එවන්වයි, නොඑවුනම් දහසක් දඩයයි"කියා යවූහ. ඒ ගම්වැස්සෝ අර්ථය නොදත්හ, පණ්ඩිතයන්වහන්සේ "මේපැණියත් සමාන පැණයකින්ම විසඳිය යුතුය"යිසිතා "ගම්වැස්සෙනි, නොසිතව"යි අස්වසා, කිමෙහි බිණිමෙහි දක්ෂවූ පුරුෂයන් දෙතුන්දෙනෙකු ඛණවා, "යව ගොස් රජ්ජුරුවන්ට කියව "දේවයන්වහන්ස, ගම්වැස්සෝ වැලියොතෙහි සින වේවයි දළි වේවයි පමණ නොදන්නාහ. පරණ වැලියොතින් වියතක් පමණ රණමාල්ලක් එව්ව මැනව, ඒ වැලිරණ පොල්ල බලා, ඒ සින දළ පමණින් වැලියොතක් අඹරන්නාහයි කියව, ඉදින් නොපටරජ්ජුරුවෝ "අපගේගෙහි වැලියොතක්නම් කිසිතලෙකත්නොවූවිරිය"යි කියත්නම්, එසේ කී රජ්ජුරුවන්ට, වැලි "දේවයන්වහන්ස, ඉදින් එසේවීනම් යවමැදුම් ගම්වැස්සෝ කෙසේ වැලියොතක් අඹරා එවද්දැයිකියාලව"යි කියා යවූසේක. ඒපුරුෂයෝ මහබෝසතාණන් වහන්සේ වදාළලෙසම කළහ; රජ්ජුරුවෝද ඒ අසා, "මේ සමාන පැණය කාවිසින් සිතනලදදැ"යි විචාරා "මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ විසිනැ"යි අසා සතුටුවූහ.

—o—

තඩාග ප්‍රශ්නය.

සොළොස්වැනිවූ පොකුණකින් විමසූ තටාග ප්‍රශ්නය කෙසේදයත්? එක්දවසක් "රජ්ජුරුවෝ දියකෙළිනාකැමැත්තෝය, රක්ෂා,

නීල, ශ්වේතාදී පස්පියුමෙන් ගැවසීගත් පොකුණක් එවත්වයි, එසේ නොඑවුනම් දහසක් දඩය"යි ගම්වැස්සන්ට කියා යවූහ. ඒ අර්ථය නොදුන පණ්ඩිතයන්වහන්සේට දැන්වූහ. උන්වහන්සේ "මෙයින් සමාන ප්‍රශ්නයකින් විසඳිය හැක්කැ"යි සිතා, "මුඛරිවූ මිනිසුන් කීප දෙනෙකුන් කැඳව"යි කියා, ගෙණාකල්හි ඒ පුරුෂයන්ට මෙසේ කිවුය. "තෙපි දියකෙළ, ඇස ඔලිඳැටසේ රත්කොට, නෙත් හිසකේ ඇතිව, අඳනාලද නෙත් පිළී ඇතිව මඩ වැකුණු ශරීර ඇතුව, වියදඬු කැවිටි බහන් කැටමුගුරු ගත් අත්ඇතිව, රජගෙයි වහසලට ගොස්, වාසලෙහි සිටිබැව් රජ්ජුරුවන්ටකියා යවා, රජ්ජුරුවන්විසින් "එන්නේය"යි කියනලද අවකාශ ඇතිව රජගෙට වැද, "දේවයන් වියන්ස, නුඹවහන්සේ විසින් වනාහි, යවමැදුම් ගම්වැස්සෝ පොකුණක් එවත්වයි කියා යවනලද හෙයින් අපි නුඹවහන්සේට දියකෙළ නට සුදුසුවූ පස්පියුමෙන් සැදුනු පොකුණක් ඇරගෙණ ආමිහ; ඒ පොකුණ, තමා වෙනෙහි වැසහත් බැවින් නුවර දැක අව්වාල පවුරු පදනම් අගලහා වාසල්ආදිය බලා වෙවුලා, භයින් බහන් කඩාගෙණ ගොස් වලට ගියාය, අපි කැට මුගුරු ආදින් මරන්නේවේද නවතා ගත නුහුනම්හ, නුඹවහන්සේවිසින් ගියදවස වලින් ලද පොකුණක් එවුවමැනව, ඒ පොකුණ හා එක්කොට යොදා ගෙණෙම්හයි කියා, රජ්ජුරුවන් විසින් "කිසිකලෙකත් මා විසින් පොකුණක් නොගෙන් වනලද විරිය, කිසිවක්හට මා විසින් එක්කොට යොදා ගෙණෙන පිණිස පොකුණක් නොඑවනලද විරිය"යි කිකල්හි; "ඉදින් දේව යන්වහන්ස, එසේවූනම් නැගෙණහිර යවමැදුම් ගම්වැස්සේ කෙසේ පොකුණක් නුඹවහන්සේට එවද්ද"යි කියවයිකියා යවූසේක. උයින් බෝසතාණන්වහන්සේ වදාළ ලෙසම කළහ. රජ්ජුරුවෝ ඒ මිනිසුන් අතින් "කවුරුන් විසින් විමසනලදද"යි විචාරා පණ්ඩිතයන් විසිනැයි අසා සතුටුවූහ.

උද්‍යාන ප්‍රශ්නය.

සනලෝස්වැනිවූ උයනින් විමසූ ප්‍රශ්නය කෙසේදයත්? නැවත එක් දවසක් "අපි උයන්කෙළිමකලුනා කැමැත්තම්හ, අපගේඋයන පරණව ගියේය. යවමැදුම් ගම්වැස්සෝ චම්පකාශොක වකුල නිල කාදින් සුපුෂ්පිත තරුවරාකීර්ණ අලුත්උයනක්එවත්ව"යි කියාගයවූහ පණ්ඩිතයන්වහන්සේ මෙයින් සමාන පැණයකින්ම විසඳියයුතුය'යි ගම්වැස්සන් අස්වසා, මුඛරිමිනිසුන් කීපදෙනෙකුන් යවා පෙර පොකුණට කියා යවූ පරිද්දෙන්ම කියා යවූසේක. එදවසත් රජ්ජුරුවෝ සතුටුව සේනකපණ්ඩිතයන්ට කියන්නාහු "පණ්ඩිතයන් ගෙන්වා

ගණුමෝදැ”යි විචාළහ; එතෙමේ ලාභ මාත්‍සර්‍ය්‍ය නිසා “මෙපමණෙ කින්ම පණ්ඩිතනම් නොවෙති, ඇම්මුණ මැනව”යි කීය.

ඒ සේනකයාගේ බස් අසා රජ්ජුරුවෝ “මහෞෂධ පණ්ඩිතයෝ තුමූ වැලිකෙළියෙහි පටන් පසිඳි, මාංශ ප්‍රශ්නය ආදිවූ ප්‍රශ්න සතොළසින්ම ජයගත්හ. මෙබඳු උන්ගේ දැඩිවූ පැණ විසඳීමෙහිද අප විසින් යවන ලද්දාවූ ප්‍රශ්නවලට සමානවූ ප්‍රශ්න චින්තනයෙහිද, උන්ගේ ප්‍රශ්න විසඳීනය බුදුකෙණෙකුන්වහන්සේගේ ප්‍රශ්නවිසඳීනයක් හා සමානය, සේනකයා මෙබඳුවූ පණ්ඩිතයන් ගෙන්විය නොදෙයි, සේනකයාගෙන් මට කාරිය කිම්දැයි ඒ්‍ මහෞෂධ පණ්ඩිතයන් ගෙණෙම්”යි මහත්වූ හත්‍ථාශ්වාදි පරිවාරයෙන් යුක්තව, පණ්ඩිතයන් වසන නැගෙණහිරි යවමැදුම්ගමට යන්ට නික්මුණාහ මගුලසු නැගීගෙණ යන්නාවූ රජ්ජුරුවන්ගේ මගුලසුගේ පය පැකිලී වලක වැටී බිඳිගියේය. රජ්ජුරුවෝ එනසිට නැවත නුවරට වන්නාහ. ඉක්බිත්තෙන් අතර මග සිට ආ වේදේහ රජ්ජුරුවන් සමීපයට සේනකපණ්ඩිතයෝ එළඹ, “දේවයන්වහන්ස, මහෞෂධ පණ්ඩිතයන් ගෙණෙන්ට යවමැදුම් ගමට වැඩිසේක්වේදැ”යි විචාළහ. “එසේය පණ්ඩිතයෙනි” රජ්ජුරුවෝ කීහ. “දේවයන්වහන්ස, මා අවඩකොට දත්සේක, නවත් ඇම්මුණ මැනව”යි කියදිත් ඉතා ඉක්මන්වගොස්, ආදිම යන ගමනේ මගුලසුගේ පය බිඳිගියේවේදැ”යිකිහ

රජ්ජුරුවෝ සේනකපණ්ඩිතයන් කී බස් අසා, තුෂ්ණීම්භූතව, නැවත එක්දවසක් සේනකයන් හා සමග “සේනකපණ්ඩිතයෙනි, මහෞෂධ පණ්ඩිතයන් ගෙන්වමෝදැ”යි විචාළහ.

එසේවීනම් දේවයන්වහන්ස, නුඹවහන්සේ නොගොස්, “පණ්ඩිතයෙනි නොපගේ සමීපයට එන්නාවූ අපගේමගුලසුගේ පයබිඳීගියේය අඟුතරයෙකු හෝ ශ්‍රෙෂ්ඨතරයෙකු හෝ එව”යි මෙහෙවර කරන්නෙකු යවුවමැනව, ඉදින් අඟුතරයෙකු එවත්නම් තුමූම එන්නාහ ශ්‍රෙෂ්ඨතරයෙකු එවත්නම් පියානන් එවන්නාහ; මේතෙමේ අපට ප්‍රශ්නයෙක් වන්නේමය”යි කීහ. රජ්ජුරුවෝ යහපතැ”යි ගිවිස, සේනකයන් කී ලෙසම කියා මෙහෙවර කරන්නෙක්සැවූහ.

ගද්‍ය ප්‍රශ්නය.

පණ්ඩිතයන්වහන්සේ මෙහෙවර කරන්නවුගේ බස් අසා, රජ්ජුරුවෝ මාද මපියාණන්වහන්සේද දක්නා කැමැත්තෝය”යි සිතා පියානන්වහන්සේ සමීපයට ගොස් වැඳලා “පියානන්වහන්ස, රජ්ජුරුවෝ නුඹවහන්සේද මාද දක්නාකැමැත්තෝය,? නුඹවහන්සේපළමු

කොට, සිටුවරුන් දහසක් පිරිවරා වැඩියමැනව; වඩනාසේක්ද සිස තින් නොගොස්, අලුත් හෙලඟිතෙල් පිරුණු සදුන් කරඬුවක් හැර ගෙණ වැඩිය මැනව; රජ්ජුරුවෝ නුඹවහන්සේ හා සමග පිළිසඳර කථාකොට සුදුසු අස්නක්බලා හිඳුවයි"යි කියති, නුඹවහන්සේඑබදු අස්නක් පරීක්ෂාකොට හුනමැනව; නුඹවහන්සේ කථාකොටකොට හුන් වේලෙහි මමඑම්, රජ්ජුරුවෝ මා හා සමග පිළිසඳර කථාකොට පණ්ඩිතයෙනි සුදුසු අස්නක් බලා හිඳුවයි කියති, ඉක්බිත්තෙන් මම නුඹවහන්සේගේ මූන බලම්, ඒ සලකුණෙන් හුනස්නෙන් නැඟී "පුත මහෞෂධ පණ්ඩිතයෙනි මේ අස්නේ හිඳුවයි වදාළමැනව, එසේ කල්හි එක් පැණයෙක් අපට වන්නේය"යි වදාළසේක.

සිටානෝ යහපතැයි හිඟිස, පුතනුවැන්දෑ කි සැටියේම ගොස්, තමන්වාසල සිටිබව රජ්ජුරුවන්ට කියා යවා, එන්නේයයි කියා යවූ කල්හි රජගෙට වැද රජ්ජුවන් වැද එකත් පස්ව සිටියහ; රජ්ජුරු වෝ සිටානන් හා සමග කථාකොට, "සිටානෙනි, නොප පුතනුවෝ මහෞෂධ පණ්ඩිතයෝ කොයිදැ"යි විචාළසේක. පස්සෙහි එනි දේව යන්වහන්සෑ"යි කිහ. රජ්ජුරුවෝ එහි යනු අසා සතුටු සිත් ඇතිව "නොපට සුදුසු අස්නක් බලා හිඳුවයි කිහ. සිටානෝ තමන්ට සුදුසු අස්නක් බලා, එකත්පස්ව හුන්නාහ. මහබෝසතානන්වහන්සේද සවිලඞ්කාරයෙන් සැරහුනුසේක් කුමාරවරුන් දහස විසින් පිරිවර ණලදුව සරහනලද උතුම් රථයක හිඳ නුවරට වදනාසේක්, අගලපිට තණ කන එක් කොටළුවෙකු දැක, ශක්තිසම්පන්න පුරුෂයන්ට "මේ කොටළුවා ලුහුබඳවාගෙණ යම් පරිද්දකින් ශබ්දනොකෙරේද එප රිද්දෙන්ම ඔහුගේ මුඛය බඳිනයකොට එක් පරක්කුවෙකින් කර තබා නොපෙන්නා ගෙණඑව"යි වදාළසේක. ඒ මානවකයෝ බොධි සත්වයන් වදාළ ලෙසම කළහ. බෝධිසත්වයන්වහන්සේ මහත් පිරිස කින් යුක්තව ශක්‍රදේවේන්ද්‍රලීලායෙන් නුවරට වන්සේක.

බොහෝදෙන "සිටිවඩින නසිටානන් පුතනුවෝ මහෞෂධපණ්ඩි තයෝනම්මුල, උපන්නාහු බෙනෙත්ගුලියක් අතින්ගෙණ උපන්නෝ මුල, විමසූ මෙනෙක් ද්‍රශනයන්ගේ අර්ථවිභාගය දක්නාලද්දෙහෙවත් පැණ විසඳුවෝමුල"යි මහබෝසතානන්වහන්සේට සතුතිකරන්නාහු නෘප්තියටනොපැමිනෙන්නාහ. පණ්ඩිතයන්වහන්සේ රජගෙයිවාස ලටගොස්, තමන්වහන්සේ ආපවත් දෙරටුපාලයාඅත කියා යැවූසේක රජ්ජුරුවෝ ඇසූ පමණින්ම තුටුපහටුව, "මපුතනුවෝ මහෞෂධ පණ්ඩිතයෝ වහා එත්ව"යි කිහ. බෝසතානෝ කුමරුන් දහස පිරි වරා පහයට නැඟී, රජුවැඳ එකත්පසෙක සිටිසේක. රජ්ජුරුවෝ ඔහු දැක සොම්නසට පැමිණ මිහිරි කථාකොට පණ්ඩිතයෙනි, සුදුසු අස් නක්බලා හිඳුව"යි කීහ; පණ්ඩිතයන්වහන්සේ පියානන්දෑ මූණබැලූ සේක. ඉක්බිත්තෙන් උන්වහන්සේගේ පියානෝ බැලූ සලකුණෙන්

අස්නෙන් නැගී පණ්ඩිතයෙනි, මේ අස්නේ හිඳුවයි කීහ. පණ්ඩිත යන් වහන්සේ ඒ අසුන්හි පියානන් හුන් අස්නෙහි වැඩඋන්සේක.

පියානන් හස්නෙන් නගාපියා ඒ අස්නෙහි උන්නාවූ පණ්ඩිත යන් දැකලා සේනක පුක්කුස කාවින්ද දේවින්ද යන පණ්ඩිතවරු සතරදෙනද, පෙසු නුවණැත්තාහුද, අත්ලෙන් අත්ල ගසා මහත් කොට සිනාසී, "මේ නුවණ නැත්තහු නුවණැතැයි කියති, ඒතෙම පියානන් අස්නෙන් නගාපියා, තෙමේ ඒඅස්නෙහි උන්නේය, මොහු නුවණැතැයි කියන්ට යුක්ත නොවන්නේය"යි වෙහෙසුය; රජ්ජුරුවෝද දුම්මුබවූහ.

ඉක්බිත්තෙන් මහබෝසතානන්වහන්සේ දුම්මුබව උන්රජ්ජුරුවන්වහන්සේට "කිමෙක්ද දේවයන්වහන්ස, කනස්සළුසේක්ද"ඊ විචාළසේක. "එසේය පණ්ඩිතයෙනි කණස්සල්ලෙමි, තොපගේ සව රූප ඇසීමෙන් සිත්ගත, දැක්ම සිත් නොගතැ"යි කීහ. මාගේ සව රූප ඇසීමෙන් සිත් ගත්තෙත් දැක්මෙන් සිත් නොගත්තෙත් කුමක් නිසාද"යි විචාළසේක. පියානන් අස්නෙන් නගා හුන්සෙයිනැයිකිහ "කිමෙක්ද දේවයන්වහන්ස, නුඹවහන්සේ ඇමතැන්හිම පුතුන්ට වඩා පියෝ උතුම කියනසේක්ද"යි වදාළසේක. රජ්ජුවෝ එසේය පණ්ඩිතයෙනි කීහ. ඉක්බිත්තෙන් මහබෝසතානෝ රජ්ජුරුවන්ට "දේවයන්වහන්ස, නුඹවහන්සේ විසින් අපට අශ්වතරයෙකු හෝ ශ්‍රේෂ්ඨතරයෙකු හෝ එවන්නේයයි අසුන් යවනලද්දේය"යි කියා උන් අස්නෙන් නැගී කොටළුවා ගෙණා මානවකයන් මූණ බලා නොප විසින් ගන්නාලද කොටළුවා ගෙණෙවයි ගෙන්වාගෙණ රජ්ජුරුවන්ගේ පාමුල හොවාලා "දේවයන්වහන්ස, මේ කොටළුවා කෙතෙක් අගීද"යි විචාළසේක. රජ්ජුරුවෝ "ඉදින් උපකාර ඇත්තේ විනම් අටමස්සක් අගනේය"යි කීහ. "මු නිසා සෙණ්ඩව කුලෙහි වේළඹ බඩ උපන් අජානීය අශ්වයා කෙතෙක් අගීද"යි විචාළසේක. 'පණ්ඩිතයෙනි, අගය නැතැ'යි කීහ. දේවයන්වහන්ස, කුමක්හෙයින් එසේ කියනසේක්ද? නුඹවහන්සේ විසින් දැන් ඇමතැන්හිමපුතුන්ට වඩා පියෝ උත්තමයයි කියනලද්දවේද, ඉදින් ඒ සැබෑවිනම් නුඹවහන්සේගේ වාදයෙහි ආජානීය අශ්වයාට වඩා කොටළුවා උතුම් වන්නේය; කිමෙක්ද දේවයන්වහන්ස, නුඹවහන්සේගේ පණ්ඩිතවරු මෙපමණකුත් දැනගන්ට අසමර්ථව අත්ලෙන් අත්ල ගසා පෙන්නාහුද? නුඹවහන්සේගේ පණ්ඩිතවරුන්ගේ නුවණ විශේෂය ආශ්චර්‍යය; නුඹවහන්සේ කොයින්මුන් අත්පත්ගා ලත්සේක්දැයි පණ්ඩිතවරුන් සතරදෙනාටම පරිභවබැණ, රජ්ජුරුවන්ට ගදභ ප්‍රශ්නයෙහි එම කාරණා ගාථාවකින් කියා, "දේවයන්වහන්ස, පුතනුවන්ට වඩා පියානෝ උතුම්නම්, මපියානන් නුඹවහන්සේට වැඩ පසස්නාපිණිස ගතමැනව, ඉදින් පියන්ට වඩා පුත්‍රයෝ උත්තමයෝනම්, මා නුඹ

වහන්සේ සමීපයෙහි රඳවාගතමැනව"යි වදාළසේක. රජ්ජුරුවෝ සොම්නස්වූහ. සියළු රාජපණිත් පණ්ඩිතයන් විසින් ප්‍රශ්නය මනා කොට කියනලදැ"යි ඔල්වරහඬ ගසමින් සාධුකාර ශබ්ද පැවැත්වූහ; අසුරුසන්ද පිළි දහස්ගණන් ඉස නැටවීම්ද පැවැත්වූහ. සේනකාදි පණ්ඩිතවරු සතරදෙන දුම්මුඛවූහ.

මව්පියන් ගුණ දන්නාට බෝධිසත්වයන්වහන්සේ හා සමානකෙණෙක් නැත. වැලි මුන්වහන්සේ කුමක් නිසා පියානන්වහන්සේ අස්නෙන් නගා ඒඅස්නෙහි වැඩහුන්සේක්දයත්? පියානන්දුට අවමානක් පිණිස නොවෙයි, රජ්ජුරුවන්විසින් අශ්වතරයෙකු හෝ එවන්නේය ශ්‍රේෂ්ඨතරයෙකු හෝ එවන්නේයයි අසුන් යවනලදහෙයින් ඒ පැණයත් විසඳන පිණිස තමන්වහන්සේත් නුවණැතිබව අහවන පිණිස සේනකාදි පණ්ඩිතවරුන් සතරදෙනාගේ නුවණින් බැබලීමත් නැතිකරණ පිණිසයි. රජ්ජුරුවෝ ගද්‍යහප්‍රශ්නයාගේ විසඳීන යෙහි සතුටුව සුවඳ පැන් පිරූ රන්කෙණ්ඩිකාව * අතින්ගෙණ "නැගෙණහිරි යවමැදුම්ගම පමුණුකොව අනුභවකරව"යි සිටානන් අන පැන් වන්කොට "යෙසු දැසක් සිටුවරු සිරිවඩ්ඪන සිටානන්ට සම්මතවෙත්ව"යි කියා මහබෝසතානන්ගේ මැනියන්දුට සිරිකන් නෝඩු තැලිවැල් පවිටකාර පාසලඹ පාදජාලාදිවූ සියලු සත්‍රී ආභරණ යවා කොටළු පැණයෙහි පහන්ව, මහබෝසතානන්වහන්සේ දරුකොට වඩාගන්නා පිණිස මහ සිටානන්ට "සිටානෙනි මහෞෂධ පණ්ඩිතයන් මට දරුකොට දෙව"යි කීහ.

සිටානෝ "දේවයන්වහන්ය දරුවෝ තවම ලදරුවෝය, අද දක්වාත් දරුවන් තුඩ කිරිසුවඳ අමයි, වැඩිගත්කල නුඹවහන්සේ සමීපයෙහි වසන්නේය"යි කීහ. "සිටානෙනි මෙවක්පටන් පණ්ඩිතයන් කෙරෙහි ආලය හරුව මූ අදපටන් මපුතනුවෝය, මම මාගේ පුතනුවන් රක්නට පොහොසත්මි තෙපියව"යි සිටානන් ගමටයන්ට සමුදුන්හ. සිටානෝ රජ්ජුරුවන් වැඳ පුතනුවන් මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ සිපගෙණ ලෙහි හොවාගෙණ ඉස සිඹ පුතනුවන්ට අවවාද දුන්හ. උන්වහන්සේ සිටානන් වැඳ, "පියානන්වහන්ස නොසිතුවමැනවයි කියා පියානන් යැවූසේක. රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ "ඇතුළතදී කව්ද? නොහොත් පිටතදී කව්දැයි විචාළහ. උන්වහන්සේ "මාගේ පරිවාර බොහෝය මාවිසින් පිටතදී බත් අනුභවකිරීම සුදුසුයයි සිතා "පිටතදී අනුභවකෙරෙමි වදාළසේක; ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ පණ්ඩිතයන්වහන්සේටසුදුසු ගෙයක්දී කුමාරවරුන් දහසආදිකොට සියලුපරිවාරයට වියදම්දෙවා සියලු උපකරණ ගෙහි ලා දෙවූහ. පණ්ඩිතයන් වහන්සේ එනැන්පටන් කොට රජ්ජුරුවන් සමීපයෙහි අනුශාසනාකරමින් සිටිසේක.

---

* සුවණ්ණ භිඬකාරය.

පුෂ්කරණී ප්‍රශ්නය

රජ්ජුරුවෝ පණ්ඩිතයන්වහන්සේ විමසනු කැමතිවූහ. එසේ කල්හි නුවර දකුණු වාසලට නුදුරුවූ නැන්හි පොකුණුතෙර එක් තල්ගසෙක උඩ කවුඩුකැදුල්ලෙක මිණිරුවණෙක් වූයේය; ඒමැණි කෙහි ඡායාව පොකුණෙහි පෙණෙන්නේය. "පොකුණෙහි මැණිකැ"යි රජ්ජුරුවන්ට දැන්වූහ. රජ්ජුරුවෝ සේනකයන් කැඳවා පොකුණෙහි මිණිරුවණෙක් පෙණේල, ඒමැණික කෙසේ ගණුමෝදැ"යි විචාරා, සේනකයන් විසින් "පැන් ඉස්සවාපියා ගන්නාබව සුදුසුය"යි කී කල්හි "එසේවිනම් එලෙසම කරව"යි සේනකයන්ට භාර කළහ; සේනකයෝත් බොහෝ මිනිසුන් රැස්කරවා පොකුණෙහි දියත් මඩත් අරවා බිම කැණ මැණික නුදුටුවාහ; නැවත පොකුණෙහි දිය පිරිහියකල්හි මැණිකෙහි ඡායාව පෙණෙන්නේය; සේනකයෝ දියත් මඩත් අරවා බිමත් කණවා මැණික නුදුටුවාහුය.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ කැඳවා "පොකුණෙහි මැණිකෙක් පෙණෙන්නේය. සේනකයෝ දියත් මඩත් අරවා බිම බිඳ මැණික නුදුටුවාහ. පොකුණෙහි දිය පිරිහියකල නැවත පෙණෙයි; මෙය ගන්ට පොහොසතුදැ"යි විචාළ සේක. උන්වහන්සේ "දේවයන්වහන්ස ඒ බැරිනොවෙයි වැඩිය මැනව නුඹවහන්සේට මැණිකපාමී වදාළසේක. රජ්ජුරුවෝ "මැණික පාම්හයි කී බසින් සතුටුව "අදපණ්ඩිතයන්ගේ නුවණෙහි බල දකුම්හයි බොහෝදෙනා විසින් පිරිවරණලදුව පොකුණු තෙරට ගියාහ. මහබෝසතාණන්වහන්සේ පොකුණු තෙර සිට මැණික බලනසේක් "මේ මැණික පොකුණෙහි නොවෙයි. මේ තල්ගස උඩ වියයුතුය"යි දැන "දේවයන්වහන්ස පොකුණෙහි මැණික නැතැයි" කියා "පෙණෙන්නේ මැණික නොවේදැයි කිකල්හි පැන්තළියක් ගෙන්වා "බැලුව මැනව දේවයන්වහන්ස මේ මැණික පොකුණෙහි මතු පෙණෙන්නේ නොවෙයි. නළියෙහිත් පෙණෙන්නේයයි කියා රජ්ජුරුවන් විසින් "පණ්ඩිතයෙනි මැණිකකොයි වියයුතුද"යි කී කල්හි "දේවයන්වන්ස පොකුණෙහිත් නළියෙහිත් ඡායාවම පෙණෙන්නේය. මැණික පොකුණෙහි නොවෙයි; මැණික වනාහි මේ තල් ගස උඩ කවුඩු කැදුල්ලේය; මිනිසෙකු නංවා බාවාගත මැනව"යි වදාළසේක; රජ්ජුරුවෝ බොධිසත්වයන්වහන්සේ වදාළ ලෙසම මිනිසෙකු නංවා මැණික බැවූහ; පණ්ඩිතයන් වහන්සේ ඒ මැණික තමන් අතට ඇරගෙණ රජ්ජුරුවන් අතතැබුසේක. බොහොදෙන පණ්ඩිතයන්වහන්සේට සාධුකාරදී සේනකපණ්ඩිතයන්ට බණන්නාහු "මැණික තල්ගස උඩ තිබෙද්දි සේනකයා, දුන්නක් දමාගිය එකක්හු කලයෙහි අතගානාසේ ශක්තිමත් පුරුෂයන් ලවා පොකුණම බිඳවිය, නුවණැතිවතොත් මහෞෂධ

පණ්ඩිතයන්සේ වියයුතුය”යි මහබෝසතාණන්වහන්සේට සතුති කළහ. රජ්ජුරුවෝ බොධිසත්වයන්වහන්සේට සතුටුව තමන් කර පැළඳි රන්ලක්ෂයක් පුස්නා මුත්හරයදි කුමාරවරුන් දහසට මුතුපට දුන්නාහ. “රාජසේවයට එනවිට මේ පැළඳගෙණ එන්නේය”යි මහබෝසතාණන්වහන්සේටද කුමාරවරුන් දහසටද සම්මතකළහ.

මාංස ප්‍රශ්නය ආදිවූ පැණ දසකවයනිමි.

කකණ්ටක ප්‍රශ්නය.

නැවත එක් දවසක් රජ්ජුරුවෝ පණ්ඩිතයන්හා සමග උයනට ගියාහ. එදවස් එක් බොහොඩෙක් තොරණ අග වසන්නේය. ඒතෙම රජ්ජුරුවන් දැක තොරණ අගින් බැස බිම වැදහොත්තේය. රජ්ජුරුවෝ ඒ බොහොඩාගේ ක්‍රියාව බලා “මහෞෂධ පණ්ඩිතයෙනි මේ බොහොඩා කුමක් කෙරේදැ”යි විචාළහ. දේවයන්වහන්ස නුඹවහන්සේ සේවයකරන්නේය”යි වදාළසේක. රජ්ජුරුවෝ “ඉදින් එසේවී නම් අපට කරණ සේවය සිස්නොවෙයි, ඔහට වසතුවක් දෙව”යිකිහ. බෝසතාණන්වහන්සේ “දේවයන්වහන්ස ඕහට වසතුවෙන් ප්‍රයෝජන නැත, කැයුතුදෙයක් ඇත්නම් පමණය”යි වදාළසේක. මේතෙමේ කුමක් කන්නේදැ”යි රජ්ජුරුවෝ කීහ. “දේවයන්වහන්ස මස් අනුභවකරන්නේය”යි වදාළසේක. “කෙතෙක් දෙය ලැබියුතුදැ”යි විචාළහ. “දේවයන්වහන්ස වියට සමාරක් පමන රත්රන් පුස්නා මස”යි වදාළසේක. රජ්ජුරුවෝ එක් පුරුෂයෙකුට රජ්ජුරුවන්දෙන දෙයනම් වියට සමාරක් පමණ නුසුදුසුය”යි කියා මෝහට රන් දෙවියට සමාරක් අගනා මස් නිබඳව ඉගණහැරදෙවයි කියා නියෝග කළහ. ඒ පුරුෂයාත් “යහපතැ”යි කියා එනැන්පටන්කොට රජ්ජුරුවන් විධානකළ ලෙසටම මස් ගෙණහැර බොහොඩාට දෙන්නේය

ඒපුරුෂයා එක් දවසක් උපොසථ දිනයෙහි රාජසම්මත හෙයින් පණිවාකලිවුන් නැති කල්හි නුවර මුළුල්ලෙහි මස් සොයා නොලැබ එම දෙවියට සමාරක් පමණ රන් මැදින් විද අමුණා බොහොඩාගේ කරේ බැන්දේය. ඉක්බිත්තෙන් ඒ බොහොඩාට රත්රන් දෙවියට සමාර නිසා මානයෙක් උපන්නේය. එදවස් රජ්ජුරුවෝ නැවත උයනට ගියහ. ඒ බොහොඩතෙමේ රජ්ජුරුවන් එන්නවුන් දැක, වසතු නිසා උපන් මානය කරණකොටගෙණ “වේදේහයෙනි, තෙපිම නොව මහත් වසතු ඇත්තෝය මමත් වසතු ඇත්තෙමි”යි රජ්ජුරුවන් හා සමග තමා සමකරන්නේ තොරණ අගින්නොබැස තොරණ අගම හිඳ හිස සලමින් වැදහොත්තේය. රජ්ජුරුවෝ ඔහුගේ ක්‍රියාව

දැක "මහෞෂධ පණ්ඩිතයෙනි මේතෙමේ පෙර දිටු පරිද්දෙන් අද නොබස්නේය, කවරකාරණයකින් ඒ තද මානය ඇතිවිද්ද"යි ගාථාව කින් විචාළහ. පණ්ඩිතයන්වහන්සේ "පොහෝදවස් පණිවා නොකිරීම නිමිත්තකොටගෙණ, මස් නොලබන්නාවූ රාජපුරුෂයා විසින් තමා කරබැඳි රත්රන් දෙවියට සමාර නිසා උපදනා ධානය ඔහුට විය යුතුය"යි දැන, එම කාරණය ගාථාවකින් කියනසේක් "නොලත් විරූ අඩිමාෂක සම්මතවූ වස්තුවක් ලදින් මේතෙමේ මියුලු නුවරහේ කොට ඇත්තාවූ හෝ, නොහොත් දැන ප්‍රියවචන අඤ්ඤවස්ථා සමානා තඤ්ඤා සඤ්ඤාත සතර සඞ්ගහ වස්තුවෙන් ජනයා සිත් ගන්නාවූ වේදේහරජ නොපි නොප පමණට වස්තු ඇත්තාහ; මමත් මා පමණට වස්තු ඇත්තෙමි; එසේහෙයින් නොපට මා අඩු කිමෙක්ද"යි ඉක්ම සිතන්නේය හෙළාදක්කේය"යි * මේ කකණ්ඩක ප්‍රශ්නය විසඳූ වදාළසේක. රජ්ජුරුවෝ කටුසු බොහොඩාට මස් ලන්ට නියම කළ පුරුෂයා ගෙන්වා "පණ්ඩිතයන් කීවා සැබෑද"යි විචාළහ. ඒවූ පරිද්දෙන්ම කියේය. රජ්ජුරුවෝ කිසිකෙණෙකුන් නොවිචාරාම සියල්ල බුදුකෙණෙකුන්වහන්සේ විසින් දත් අදහසමෙන් පණ්ඩිතයන් විසින් බොහොඩාගේ අදහස දන්නාලදැයි වඩාලා පැහැද පණ්ඩිතයන්වහන්සේට සතර වාසලින් නිමන සුන්වත් අය දුන්හ. බොහොඩාට වනාහි රජ්ජුරුවෝ කිපි තමන් තුබූ වෘත්තිය අරවන්ට වන්හ. පණ්ඩිතයන්වහන්සේ වනාහි "නබාලූ වෘත්තිය හරවාපිම සුදුසු නොවන්නේය"යි වැළකූසේක.

සිරි කාලකන්නි ප්‍රශ්නය.

ඉක්බිත්තෙන් මියුලු නුවර වැසි පිඬුහත්තරනම් ලදරුවෙක්† තක් සලාතුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් සමීපයෙහි ශිල්ප උගන්නේ වහාම උගත. ඒතෙමේ උගත් ශිල්ප වණපොත්දී "මම සමුගණිමි"යි ආචාරීන්ට කීය. ඒ ආචාරීන්ගේ කුලයෙහි වනාහි "ඉදින් වැඩිවිය පැමිණි දියනිකෙණෙක් ඇත්නම් වැඩිමාළු අනවැස්සානන්ට දිය යුත්නාහ"යි පැවතෙන වතෙක් ඇත. ඒ ආචාරීන්ගේ දෙවහනක් සමානවූ විශිෂ්ට රූ ඇති එක් දියනිකෙණෙක් ඇත්නාහ. ඉක්බිත්තෙන් ඒ දියනියන් "පුත තොපටදෙමි උන් හැරගෙණ යව"යි ආචාරිකීහ.

---

* මේ සම්පත්නම් නිකාඟවූ තිරිසනුන් පවා මානයට පමුණුවන්නේය. මිනිසුන්ට වූකලි කෙසේනම් මානයට නොපමුණුවාද? එබැවින් නුවණැත්තවුන් විසින් මෙලෙස මන් වඩා අනාර්‍යයට පමුණුවන්නාවූ සැපත ලන් විගසම ඒ නිසා වන්නාවූ අනාර්‍යයෙන් දුරුව පරලොව අහිවෘඩ්ඨියකවූ තුණුරුවන් විෂයෙහි පරිත්‍යාග කටයුතුයි,

† ගඞ්ගාර දෙශයෙහි.

මානවකයා වැඳගෙන්පින්නැත්තේය කාලකන්නිය; කුමාරිකාතොමෝ මහපින් ඇත්තීය. ඕහට ඒ කුමාරිකාව දැක සිත නොඇළුනේය. ඒ මානවකුයා කුමාරිකා නුරුස්නේම "ආචාරීන්ගේ බස මරුත්තු නොකෙරෙමි" කියා සිතී. බමුණාතෝ මානවකයාට තමන්ගේ දියනි සත් දුන්නාහ. ඒ නුමේ රාත්‍රිභාගයෙහි සකස්කොට අතුරණලද ශ්‍රී යහනෙහි සැතපිනා, කුමාරිකාඅවුත් ඇඳට නැගෙන්නාහාම, තතන මින් ඇඳින් බැස බිම්හෙව වැදහොත්තේය. ඒ කුමාරිකාද හැඳින් බැස ඒමානවකයා සමීපයට ගියාය. එතනින් නැගිසිට නැවතහැඳට පුණ්‍යාංගුණේය. නැවත ඒකුමාරිකාද හැඳට නැංගාය. ඒතෙම නැවත ඇඳින් බටුයේය. කාලකන්නියානම් ශ්‍රී කාන්තාව හා සමග අහසට පොළවසේ ලඟනොවන්නේය. එසේ හෙයින් කුමාරිකා යහනෙහිම සැනපුනිය; ඒ කාලකන්නියා බිම වැදහොත්තේය. නැවත මෙසේ සතියක් දවස් යවා කුමාරිකාව කෙරෙහි සෙනහ නැතිවත් ආචාරීන්ගේ බස මරුත්තුකොට ගතනොහි හැරගෙණ ආචාරීන්වැඳ සමුගෙණ තමාගේ නුවරට නික්මුනේය. අනරමග පෙර පසු කථා*පමණකුත් ඔවුනොවුන් හා නැත්තේය. නොකැමැතිවම ඔහු දෙදෙන මියුලුනුවරට පැමිණියාහ. පිඬුහුත්තරනම් මානවකයා නුවර සමීපයෙහි පලගත් දිඹුල්ගසක් දැක සාදුකින් පිඬිනවූයේ ගසට නැගිලා දිඹුල් කඩාගෙණ කන්ටවන. කුමාරිකාද සාදුකින් පෙළනි මටත් දෙව'යි කිව. 'හැයි තට අත්පා නැද්ද? නොමෝත් ගසට නැගී දිඹුල් කඩාගණ කා'යි කිය. සාදුකට වඩාදුකක් නැතිහෙයින් කුමාරිකා නොමෝම නැගී දිඹුල් කඩාගෙණ කන්ටවන. මානවකයාත් ඇ ගසට නැගි බව දැන, වහවහා ගසින් බැස ගස වට කටුගසාලා "කාල කන්නිය කෙරෙන් මිදිනිම්" කියාලා නුවරට නැගීගියේය. කුමාරිකා ගසමුල කටුහෙයින් බැස පියන්ට නොපිළිවන්ව උඩම හුන්නීය.

ඉක්බිත්තෙන් රජුරුවෝ එදවස් දවල් උයන්කෙළි කෙළ සර හනලද ඇතෙකුපිට නිඳ සවස්වේලෙහි නුවරට වදනාහු, දිඹුල්ගස උන් කුමාරිකාව දැක පිළිබඳ සිත්ඇතිව පුරුෂයන් ඇත්ත නැත්ත විචාරා යවූහ. කුමාරිකාන් "සාමිනි මාගේ දෙමව්පියන් විසින් පාවා දෙනලද සමුනන්දකෙණෙක් ඇත, මා මේ ගස උඩ ඉඳුවා හැරපියා පලාගියෝය"යි කිව. විචාරන්ටගිය අමාත්‍යයා එපවත් රජුරුවන්ට කීය; රජුරුවෝ ඒ අසා 'හිමියන් නැති වසතුනම් රජුරුවන්ටපැමිණෙන්නේය'යි කියා කුමාරිකාව ගසින් බස්වා ඇතුපිට නංවාගෙණ මාලිගාවට ගොස් රුවන් රැසක්පිට සිටුවා අගමෙහෙසුන් කළහ. ඒ බිසව් රජුරුවන්ට ප්‍රියයෝය මනවඩවත්; දිඹුල්ගසදී දුටුබැවින් උදුම්බරා දේවියයි ප්‍රසිඩවූහ. ඉක්බිත්තෙන් රජුරුවෝ උයන්කෙළියට යන පිණිස වාසල්කඩ ගම්වැස්සන් ලවා මාගිය ඉදිකරවූහ. පිඬුහුත්තරයාද රාජසම්මතයෙන් මෙහෙවරකරන්නේ කැසපට කවාගෙණ

* අල්ලාප සල්ලාප කථා—

උදුල්ලකින් සසින්ටවන. මාරීයසරහා නොනිමනතුරු, රජ්ජුරුවෝ උදුම්බරාදේවීන් සමග උතුම්රථයකට නැගී උයන්කෙළියට මහපෙළ හරින් නික්මුණාහ. උදුම්බරාදේවී "මග සසිමින් සිටි ඒ කාලකන්නියා මෙබඳු සම්පත්තියක් ධරාගත නුහුනුයේ"යි ඌ දිසාවබලමින් සිනාසුනාහ. රජ්ජුරුවෝ බිසවුන් සිනාසෙන්නාදැක කිපී "කුමක් පිණිස සුනුහිදූ"යි විචාළහ. "දේවයන්වහන්ස මේ මගසසිනාම්නිසා මා ආදියෙන් රක්ෂාකළ මිනිසාය, මා දිඹුල්ගසට නංවා මුල කටු ගසා ගියේ මොහුය, මම මූ බලා මෙබඳු ශ්‍රියක් ධරාගත නුහුනුයේ මේ කාලකන්නියායයි සිනාසිනිමි"යි කිය. රජ්ජුරුවෝ "නී කියන්නේ බොරුය, අනික් කිසි පුරුෂයෙකු දැකය නී සුනුයේයි, නී මරම්"කඩුව කොපුවෙන් ඇදගත්නාහ; බිසව් භයපත්ව "දේවයෙනි යලි පණ්ඩිත වරුන් විචාළමැනවැ"යි කිහ, රජ්ජුරුවෝ "මෑ කී බස් අදහවිදූ"යි සේනකයන් විචාළහ. සේනකයෝත් "නොඅදහම් දේවයන්වහන්ස, කවරෙක් නම් මෙබඳු ගැණියෙක් හැරපියා නැතියේද"?යි කිහ. බිසව් සේනකයන්ගේ බස් අසා වඩාලාම භයවූහ.

ඉක්බිත්තෙන් "සේනකයා කුමක් දනිද මහෞෂධපණ්ඩිතයන් විචාරම්"සිතා; ගාථාවකින් පණ්ඩිතයන්වහන්සේ විචාරන්නාහු, මහෞෂධ පණ්ඩිතයෙනි ස්ත්‍රියක් නොමෝ අධික රූ ඇත්තීවූවද ආචාරසීලයෙන්ද යුකතවූව, ඒස්ත්‍රිය පුරුෂයෙක් නොකැමැත්තේලු; නෙපි ඒ අදහවිදූ"යි විචාළහ. එබස් අසා "දේවයිනි මම අදහමි, පුරුෂයා දෙවනැත්තේවීනම්, ශ්‍රීකාන්තාද කාලකන්නිද යනමොහු දෙදෙනා මුද එතරමෙතරසේ එක්නොවන්නාහ"යි වදාළසේක. රජ්ජුරුවෝ මහතානන් වදාළකාරණය සිතටනගා සන්හුන් සිත්ඇතිව පණ්ඩිතයන්වහන්සේට සතුටුව පණ්ඩිතයෙනි ඉදින් නෙපි මෙතන නැන්නාහුනම්, අද මේ නුවණ නැති සේනකයාගේ බස් ගෙණ මෙබඳු ගැණුරුවනක් නොලද්දෙමි; දැන් නොප නිසාය මේ බිසවුන් ලද්දේය"යි කියා පණ්ඩිතයන්වහන්සේට මස්සෙන් දහසක් පූජා කළහ. ඉක්බිත්තෙන් බිසව රජ්ජුරුවන් දැක "දේවයන්වහන්ස පණ්ඩිතයන් නිසාය, මා දිවි ලද්දේ, මුන් මම මල් තනතුරෙහි තබන්නට වර ඉල්වම්"යි කිහ. රජ්ජුරුවෝ "යහපත දේවිනි නොපඉල්ලූ වරය දෙමි ගණුව"යි කීහ. දේවයන්වහන්ස මම අද පටන් මාගේ මලනුවන් හැරපියා කිසි මිහිරි රසයක් අනුභවනොකරම්, මෙතැන් පටන් වේලකවත් නොවේලකවත් වාසල්දොර හරවා පණ්ඩිතයන්ට මිහිරි රසයක් යවන්ට ලබන වරයක් ගණිමි"යි කිහ. "යහපත සොඳුර ඒ වරගණුව"යි කියා රජ්ජුරුවෝ දුන්නාහ.

———oo———

මෙණ්ඩක ප්‍රශ්නය.

එක් දවසක් රජ්ජුරුවෝ දහවල් මෙහෙ නිමවා සඳැල්ලෙහි * සක්මන් කරන්නාහු සිවමැදුරු කවුළුවෙන්, එක් එළුවෙකු හා බල්ලෙකු මිත්‍රසම්භවය කරන්නා දුටුහ. එළු වනාහි ඇත්හල ඇතුට ඉදිරියෙහි ලාලූ තණ නොකනතුරු කන්නේය. ඉක්බිත්තෙන් ඇත්හලයෝ ඔහු තණ කන්නා දැක මරා පලාපිහ. අඩහසාගෙණ යන්නාවූ ඔහු දැක එක්, ඇත්හලයෙක් ලුහුබැඳ ගොස්, දණ්ඩකින් පිට අවුරා පහරක් ගැසිහ. ඒ නෙමේ පිට නමනමා වේදනාවෙන් වෙවිලමින් ගොස්, රජගෙයි මහබිතක්කණ නිසා පිට පදනම වැදහොත්තේය. එදවස්ම රජ්ජුරුවන්ගේ මුළුතැන්ගෙයි ඇට හා මස් ආදිවූ දෙය† කා වැඩි බල්ලෙක්, අරක්කැමියා බත් මාළුපිස වසුන්කොට ගෙන්පිටත සිට ඇහ ඩාදිය සිදිමින් සිටියදී, මත්‍ස්‍යමාංසයෙහි ගඤ්ඡය ඉවසාගත නොහි මුළුතැන්ගෙට වැද, වලන් වැසූ මලා ආදිය හෙළා මාංස අනුභවකෙළේය. අරක්කැමියා වලන්හුනු හඬ අසා ඇතුළු ගෙට වැද මාළු කමින් සිටි බල්ලාදැක, දෙරපියාලා කැටමුගුරු ආදින් තැළීය. ඒ නෙමේ තමා කෑ මාළු නායෝයා හඬාගෙණ දිවගත. අරක්කැමියා ඔහු දිවගත්බව දැක ලුහුබැඳ දණ්ඩකින් පිට අවුරා ගැසීය. එයින් පිට නමන්මා, කෙතෙක් ගැසුවත් පයක් වක්කිරීම් බල්ලන්ගේ සුභාවයක් හෙයින් එක්පයක්ම ඔසවාගෙණ එළුවා වැදහොත් නෙනටම ගියේය. ඉක්බිත්තෙන් එළුනෙමේ "සබඳ නොපි පිට නමනමා එන්නෙහි කිමෙක්ද, නා පිට රුජාවෙක් පහරිද්ද"යි බල්ලාවිවාළේය. හේ බල්ලාද "නොපිත් පිට නමාගෙණ වැදහොත්නෙහි කිමෙක්ද, නොපපිටරුජාවෙක්පහරිද්ද'යි එළුවාඅතින්විවාළේය. එළුවානමාගේසවරූපබලලාටකීය, බළු එළුවාට තමාගේ සවරූපකීය. ඉක්බිත්තෙන් එළුවා බල්ලාට කිමෙක්ද නෝ නැවත මුළුතැන්ගෙට යන්ට පොහොසත්ද"යි විවාළේය. බළු 'නොපොහොසතිමි, ගියොත් මාගේදිවිනැහැ'යි කීය. "නෝ වනාහි ඇත්හලටයන්ට පොහොසත්ද"යිකිහ. එළුවා 'මා විසිනුත් ඇත්හලට යන්ටනොපිළිවන; ගියොත් මාගේ දිවිනැහැ'යි කීය. ඔහු දෙන්න, "කෙසේ අපිදෙන්නා ජීවත්වමෝද්ද"යි උපායෙක් සිතුහ. ඉක්බිත්තෙන් එළුනෙමේ "ඉදින් දෙන්නම සමගිවගත හෙමෝනම් එක් උපායක් ඇත"යි කියා බල්ලාවිසින්, එසේවිනම් කිය ව"යි කී කල්හි "සබඳ නෝ වෙතැන්පටන් ඇත්හලට යා; බල්ලන් තණ නොකනහෙයින් 'මේ තණනොක'යි කියා ඇත්තලයෝ තා කෙරෙහි සැක නොකෙරෙති; නෝ සහවා මට තණ කැරැල්ලක් ඩැහැගෙණවුත් මහබිතක්කණෙහි තබව; මමත් මුළුතැන්ගෙට යෙමි, එළුවන් මස් නොකනහෙයින් 'මේ මස් නොකයි, කියා අරක්කැමියා මා කෙරෙහි සැක නොකෙරෙයි; මමත් නට මස්කන්ට ඩැගෙණ එමි"යි කීය. "මේ උපායනෙමේ අප දෙන්නා ජීවත්වීමට ඇත"යි දෙන්නම ගිවිස බළු ඇත්හලට ගොස් තණ කැරැල්ලක් ඩැගෙණ අවුත් මහබිතක්කණ පිටපදනම තබයි. එළුද මුළුතැන්ගෙටගොස් මස් කැබෙල්ලක්

* මතුවහල් නඩයෙහි. † කුකුරු පරායෙහි පටන්—

ඩැහැගෙණවුත් එහි තබයි. මේ උපායෙන් දෙන්නාම සැපසේ වෙසෙති.

රජ්ජුරුවෝ උන් දෙන්නාගේ මිත්‍රධර්මය දැක "මා විසිනුත් නුදුටු විරූ කාරණයක් දක්නාලදැ, මොහුදෙන්න ඔවුනොවුන්ට පසම්තුරුවත් සමගව වාසයකෙරෙති, මේ කාරණය අල්වා පැණයක්කොට පණ්ඩිතවරුන් පස්දෙනා විචාරම්, මේපැණය නොදත් කෙණෙකුන් රටින් යවමි, දත් කෙණෙකුන්ට මෙබඳු පණ්ඩිතකෙණෙක් නැතැයි උපකාරකෙරෙමි, අද වේලා මදවහියේය, සෙට සේවයට ආකල විචාරමි"යි සිතූහ. මෙසේ සිතා රජ්ජුරුවෝ අනික්දවස පණ්ඩිතවරුන් සේවයට අවුත් උන්කල්හි ප්‍රශ්න විචාරන්නාහු ගාථාවක් කියා "මේ සත්වලොකයෙහි යම් සත්කෙණෙකුන්ගේ විශ්වාසයෙක් කිසිකලෙකත් සත්පියවරකුත් පවානොවූවිරූද, එසේපසම්තුරුවූ දෙදෙණෙක් සබඳවූහ, සබඳවත් අදහාගෙණ හෙවත් මිත්‍රසන්‍ථවයකොට ඇවිදිනාහ, එයට කරුණු කිමෙක්ද"යි කිහ. මෙසේද කියා නැවත මේ ගාථාවකින් "අද පෙරවරුවේලෙහි ඉදින් මේ පැණය මට කියන්ට නොපොහොසත්හුවුනම් තොප හැමදෙනම රටින් නෙරපමි, නුවණ නැත්නවුන්ගෙන් මට ප්‍රයෝජන නැතැයිකිහ. සේනකයෝ මුල්හස් නෙහිහුන්හ. මහෞෂධ පණ්ඩිතයෝ කෙළවර හස්නෙහි වැඩහුන් සේක. උන්වහන්සේ ඒ පැණය පරීක්ෂාකෙරෙමින් අඬී නොදුක 'මේ රජතෙම බොලද ගුණ ඇත්තේය, මේ පැණය සිතාගෙණ දැනගන්ට නොපොහොසත, ඔහුවිසින් කිසිවක් දක්නාලදැ"යි සිතා "එකදවසකට අවසර ලබන්නේවීනම් මේ පැණය දැනගණිම්, සේනකයෝ කිසි උපායකින් අද එක දවසක් පමණ රඳවාපියනි"යි සිතූසේක.

සේනකාදී පණ්ඩිතවරු සතරදෙනද අදුරු ගබඩාවකට වන්නවුන්මෙන් කිසිවක්නුදුටුවාහ. සේනකයෝ මහෞෂධපණ්ඩිතයන්ගේ ප්‍රවෘත්ති කිමෙක්දෝහෝ"යි මහබෝසතාණන්වහන්සේ දෙස බැලූහ. සේනකයෝ බෝධිසත්වයන්වහන්සේ තමන්බැලූ ආකාරයෙන්ම උන්වහන්සේගේ සිත දැන "පණ්ඩිතයන්ට පැණය නොවැටහුනුයේය. එසේහෙයින් එක් දවසකට අවසර ඉල්වන්නා කැමැත්තෝය, උන්ගේ මනදෙළුපුරමි" රජ්ජුරුවන්හා සමග විශ්වාසයෙන් මහත්කොට සිනාසී "දේවයන්වහන්ස අප ඇමදෙනා පැණය කියාගත නුහුනහොත් රටින් යවනසේක්ද? අපි මේ පැණය කියන්ට නොපොහොසතු මෝ නොවම්හ, එතකුදු උවත් මදක් ගැටමුසු පැණය, බොහෝදෙනා මැදයෙහි කියන්ට නොපිළිවන, තනිව ඉඳ සිතා පසුව නුඹවහන්සේට කියම්හ, අපට අවසරයක් දුනමැනව"යි කිහ. මහබෝසතානන් සලකා ගාථාවකින් කිහ, 'මහජනයාගේ රැස්වීමෙහි ජනයාගේ දැඩි කෝලාහලයෙන් එකපැහැර අරගල කළකල්හී විසුරුණු සිත් ඇතියමෝ හෙවත් නානාලම්බනයෙහි පැවති සිත් ඇතියමෝ, මේ පැණය කියන්ට නොපොහොසතුම්හ. ජනප්‍රධානය, විවේකයටකියාවූ

එසේහෙයින් එක්හවු සින් ඇති පණ්ඩිතවරු පස්දෙන එකි එකී දෙන වෙන වෙන තනිවහිඳ පරීක්ෂාකොට ප්‍රශ්නාර්ථයන් සිතාපසුව කියති"යි කිහ. රජ්ජුරුවෝ සේනකයන්ගේ බස්අසා නොසතුටුවූවද "යහපතැ"යි සිතා පියා "මේපැණය කිය නුහුනුහොත් රටන්යවමි" භයගැන්වූහුමය. සේනකාදි පණ්ඩිතවරු සතරදෙන මාලිගාවෙන් බටහ. සේනකයෝ අනික් තුන්දෙනාට "රජ්ජුරුවෝ සියුම්පැණයක් විවාළේය, පැණය කිය නුහුනුහොත් මහා අලාභ වන්නේය, නෙපි තුන්දෙන සැප අහර අනුභවකොට මනාකොට පරීක්ෂාකාරීවව"යි කියා තමන් තමන්ගේ ගෙට ගියාහ.

මහෞෂධපණ්ඩිතයෝද හුනස්නෙන් නැඟී උදුම්බරාදේවීන් සමීපයට ගොස් "දේවීන්වහන්ස අද වේවයි ඊයේ වේවයි රජ්ජුරුවෝ බොහෝවෙලාවක් කොතන සිටියෝද"යි විචාළසේක. මල ඉඩ සිව් මැදුරුකවුළුවෙන් පිටත බලමින් නඩයෙහි සක්මන්කළහ"යි බිසව් කිහ. ඉක්බිත්තෙන් පණ්ඩිතයන්වහන්සේ "රජ්ජුරුවන් විසින් මේ දිසාවෙන් කිසිවක් දක්නාලද වන්නේය"යි සිතුසේක. ඒ ස්ථානයට ගොස් පිටත බලා එළුවාගේ හා බල්ලාගේ ක්‍රියාව දැක "රජ්ජුරුවන් විසින් පැණයක් සලකණලදැ"යි සනිටුහන්කොට ගෙට වැඩිසේක; පුක්කුසාදිවූ අනික් තුන්දෙනාත් ප්‍රශ්නයෙහි අර්ථ කල්පනාකොට කිසිවක් නොදැන සේනකපණ්ඩිතයන් සමීපයටනියාහ. සේනකයෝ නොප විසින් පැණයෙහි අර්ථ දක්නාලදදැ"යි විචාළහ. නොදක්නා ලදැ"යි කිවුය. "එසේනම් නොප රවින්නෙරපති කුමක්කෙරෙද්දැ"යි කිකල ආචාරීනි තොපු විසින් දන්නාලදදැයි කිහ. "මමත් අනේක ලෙස සලකා පැණයෙහි අර්ථ නුදුටිමි"කිහ. තුන්දෙනම "නුඹවහන්සේ පැණයෙහි අර්ථ නොදක්නාකල අපි කෙසේ දනුමෝද්ද"යි කිහ. මෙසේ සේනකාදි සතර්දෙනම ප්‍රශ්නයෙහි අර්ථ නොදැක "රජ්ජුරුවන් සමීපයේදී "එක දවසකට අවසර ලදුමෝනම් සලකා ප්‍රශ්නය විසඳම්හ"යි සිංහනාද පැපියා ආම්හ, පැණය නොකීකල්හි රජ්ජුරුවෝ කිපෙති, කුමක් කරමෝද්ද"යි සිතා උකටලීව "පණ්ඩිතයෙනි මේ පැණය අප විසින් හවුරුද්දෙක් හිඳ සිතුවත් දක්නට නොපිළිවන. එසේහෙයින් (මහෞෂධ පණ්ඩිතයන් විසින් මේ පැණය ඉන සහශ්‍ර ගුණයෙන් සිතා නිමවනු ලැබෙයි) නවීව නොයිද උන් සමීපයට යමිහ"යි උන් සතරදෙනා ගොසින් භාමන් අවුත් සිටි බව කියා යවා "එන්ට කියවයි"යි කීකල මාලිගාවට වැද සිහිකටයුතු සුවදුක් දෙඩා එකත්පස්ව සිටියාහු, මහෞෂධ පණ්ඩිතයෙනි නුඹවහන්සේ විසින් පැණය සිතනලදදැ"යි මහබෝසතාණන් විචාළහ.

උන්වහන්සේ "මා පැණය නොසිතනකල මේභූවනත්‍රයෙහිඅනික් කවරෙක් සිතන්නේද? එසේය පැණය සිතනලදැ"යි වදාළසේක. පණ්ඩිතවරු සතරදෙන එසේවීනම් අපටත් වදාළමැනව"යි කිහ. සියලුසතුන් කෙරෙහි පතළ කරුණායෙන්යුක්තවූ මහතානෝ 'ඉදින්

මම මුන් සතරදෙනාට පැණය නොකියෙම්නම් රජ්ජුරුවෝ 'මේ ජඩ කොල්ලන්ගෙන් කාරියකිම්ද'යි මුන්සතරදෙනාම රවින් නෙරණාහ 'මෙවැනි පණ්ඩිත රුවනක් නැතැ'යි මට සත්රුවනින් පූජාකරන්නාහ. එසේ වන්නාට ඒමාගේ කරුණාවට තරම්නොවෙයි. මේ අඤ්ඤායෝ මා වැනි පණ්ඩිතකෙණෙකුන් ඇත්ව ඉන්දදි නොනසින්ව'යි උන් කෙරෙහි පතළ කරුණායෙන් "පැණය උන්ට කියමි"සිතා, සේනකාදි පණ්ඩිතවරුන් මිටි අස්නෙහි හිඳුවා තමන්වහන්සේ දිසාවට සතරදෙන දෙහොත් මුදුනේ තබා වැඳගෙණ ඉදිනා නියායෙන් සම්මතකොට රජ්ජුරුවන් දුටු නියාව නොහගවා 'රජ්ජුරුවන් විචාළ කල මෙලෙස කියව'යි සතරදෙනාටම ගාථා සතරක්බැඳලා, ඒගාථාවල අර්ථ නුගන්වා පාළිය පමණක්ම උගන්වාලා යැවූසේක. ඔහු සතරදෙනද මහබෝසතානන්වහන්සේද අනික් දවස රාජසේවයට ගොස් රජ්ජුරුවන් දැක පණවනලද අසුන් මත්තෙහි උන්නාහ.

රජ්ජුරුවෝ "සේනකයිනි පැනය දන්නාලදදැ"යි සේනකපණ්ඩිතයන් විචාළහ. සේනකයෝත් "දේවයන්වහන්ස මාපැණය නොදක්නාකල අනික්කවරෙක් දකිද"යි වැදුවන්ඉදිරියේ කොළොඹුලන්නාසේ බෝධිසත්වයන් මධ්‍යයෙහි තමන්තේ වියත්කම අහවා "එසේවිනම් කියව"යි රජ්ජුරුවන් කිකල්හි "ඇසුවමැනව දේවයන්වහන්සැ"යි කියා පණ්ඩිතයන්වහන්සේ උගන්වාලූ සැටියේම ගාථාව කීහ. එහි අර්ථ මෙසේ දතයුතු-"ප්‍රසිඩ අමාත්‍යපුත්‍රයන්ට එළුමස් ප්‍රියය මනවඩි, අමාත්‍යපුත්‍රාදිහු බලුමස් අනුභවනොකරන්නාහ; එසේවූද එළුවා හා බල්ලා සමඟි සඛ්‍යතා විශ්වාසයවී" ගාථාව කී බවක්මුත් සේනක පණ්ඩිතයෝ අර්ථනොදන්නාහ. රජ්ජුරුවෝවනාහි තමන්ට ප්‍රත්‍යක්ෂ විසින් අර්ථ දක්නාවූ "සේනකයන් විසින් පැණයදක්නාලදය ප්‍රක්කුසයන් විචාරමි" දෙවනුව උන් ප්‍රක්කුසයන් විචාළහ. ඒ ප්‍රක්කුසයෝ රජ්ජුරුවන්ට 'කිමෙක්ද මම නොපණ්ඩිතයෙම්ද"යි උගත් සැටියේ ගාථාව කීහ; එහි අර්ථ මෙසේ දතයුතු;-"අසුපිට ආස්තාරණසුව පිණිස එළුවාගේ සම් නගන්නාහ, එසේ ආස්තාරණසුව කැමති ජනයෝ බල්ලන්ගේ සම් අසුපිට නොවතුරන්නාහ; එසේද උවත් එළුවාගේ හා බල්ලාගේ හා සමඟිසමාගම සඛ්‍යතා විශ්වාසයවී" ඒ ප්‍රක්කුස පණ්ඩිතයා ගාථාවෙහි අර්ථ නොදන්නේමය. රජ්ජුරුවෝ තමන්ට අර්ථ ප්‍රගුණහෙයින් "මුන් විසිනුත් පැණය දක්නාලදදැ"යි සිතා තුන්වැනිවහුන් කාවින්ද පණ්ඩිතයන් විචාළහ. එයිත් තමන් උගත් ගාථාවකීහ. ගාථාවෙහි අර්ථ මෙසේ දතයුතු;-"එළුතෙම ඇඹරිනිය අං ඇත්තේය බල්ලාගේ හං නොම ඇත්තේය, එළු තණ කන්නේය, එසේ උවත් එළුවාගේ හා බල්ලාගේ හා සමඟි විශ්වාසයවී." රජ්ජුරුවෝ "මුන් විසිනුත් පැණයදන්නේය"යි සතරවැනිවහුන් දේවින්ද පණ්ඩිතයන් විචාළහ. උයිත් තමන් උගත් ගාථාව කීහ. එහි අර්ථ මෙසේ දතයුතු-"එළුතෙමේ තණ හා කොල කන්නේය, වැලි බලුතෙමේ තණකොල

නොකන්නේය, වැලි කුමක් කන්නේදයත් බලුනෙමේ සාවුන් හා බළලුන් කන්නේය. එසේදඋවත් එළුවා හා බල්ලා හා සමඟි සමාගම සඩ්ඛ්‍යාත විශ්වාසයවී."

මේ සේනකාදි සතරදෙන තමන් තමන් උගත් ගාථාපමණක් කී කල්හි රජ්ජුරුවෝ තමන්ට අර්ථය ප්‍රකාශහෙයින් ගාථාවල අර්ථ උන් අතින් නොවිචාරා පස්වැනිව හුන් අසරණසරණ කරුණා නිධාන ජනමුනීන්වූ මහෞෂධ පණ්ඩිතයන් අතින් "පණ්ඩිතයෙනි තෙපි පැණය දනිව්ද"යි විචාළහ. "දේවයන්වහන්ස අවිවියෙහි පටන් භවාග්‍රය දක්වා මා විනා අනික් කවරෙක් මේ පැණය දනිද"යි සිංහ නාද කළසේක. රජ්ජුරුවෝ "එසේවිනම් කියව"යි කීහ. "ඇසුවමැනව දේවයන්වහන්ස"යි කියා එළුවාගේහා බල්ලාගේ ක්‍රියාව තත් වූපරිද්දෙන් දත්බව ප්‍රකාශකරණසේක් ගාථා දෙකහින් කීසේක. ඒ ගාථාවල අභිප්‍රායනම් "පා අටෙක් ඇති, හෙවත් සතරපයෙහි අට කුරෙක් ඇති එළුතෙමේ මස් ගන්නා වේලෙහි කිසිකෙණෙකුන්ට නොපෙණී මේ බල්ලාට මස්ගෙණෙන්නේය; මේ බල්ලාද එළුවාට තණ ගෙණෙන්නේය, බල්ලාගේද එළුවාගේද යන මොවුන් දෙන්නාගේ ගොචර පිණිස ඔවුනොවුන්ට මෙහෙවරකරණ පෙරළිය ජන ප්‍රධානවූ වෙදෙහනම් රාජෝත්තමතෙම ප්‍රාසාදයෙහි සිටියේප්‍රත්‍යක්ෂ කොට දිවිල"යි වදාළසේක. රජ්ජුරුවෝද මහබෝසතාණන් නිසා සේනකාදි පණ්ඩිතවරුන්සතරදෙන පැණය දත්බැව් නොදැන "මෙබඳු පණ්ඩිතවරහු යම්බදුවූ මාගේකුලයෙහි වෙසෙද්ද එසේහෙයින් ඒකාන්තයෙන් මට වූයේ බොහෝ ලාභයකැ"යි කීහ. "මෙසේ පණ්ඩිතවරුන්ගේ ප්‍රශ්නව්‍යාකරණයෙහි සතුටුවූ මා විසින් උන්ට උපකාර කළමනාවේද"යි උපකාර කරන්නාහු "සුවිනිශ්චිත ප්‍රශ්නවිසර්ජනය කරණකොටගෙණ වෙසෙසින්ම සතුටුසිත් ඇත්තෙමි, පණ්ඩිතවූ තොප හැමදෙනාට ආජානීය අශ්වයන් යෙදූ එකි එකී රථයක්ද වස්ත්‍රාභරණ ධනධාන්‍යයෙන් සමෘඩ්ධවූ එකිඑකි ගම්වරෙක්ද දෙමි"යි කියා මෙකී සියල්ල පණ්ඩිතවරුන් පස්දෙනාට දෙවූහ.

උදුම්බරාදේවි වනාහි සේනකාදි පණ්ඩිතවරු සතරදෙනාම මහෞෂධ පණ්ඩිතයන් නිසා ප්‍රශ්නය දත්බව දැන "රජ්ජුරුවන්වහන්සේ විසින් මුංහා උදුහා වෙනසක් නොකරන්නාක්හුමෙන් පස්දෙනාටම උපකාර සමයේ කළහ, මාගේ මලනුවන් මහෞෂධ පණ්ඩිතයන්ට විශෙෂකොට සත්කාරකරණබව සුදුසුමවේද"යි රජ්ජුරුවන්සමීපයට ගොස් "දේවයන්වහන්ස නුඹවහන්සේට පැණය කාවිසින් කියනලදැ"යි විචාළහ. සොදුර පණ්ඩිතවරුන් පස්දෙනා විසිනැයිකීහ. "දේවයිනි සේනකාදී පණ්ඩිතවරුසතරදෙන ඒපැණය කානිසාදන්හයි සිතූසේක්ද"යි විචාළහ. "සොදුර නොදනිමි"කීහ. "දේවයන්වහන්ස ඒ සේනකාදි සතරදෙන කුමක්දනිද්ද? මහෞෂධ පණ්ඩිතයෝ වනාහි 'මේඅඥානයෝ නොනසින්ව'යිසිතා පැණය ඉගැන්වූහ; නුඹවහන්සේ

හැම දෙනාටම සමසමයේ උපකාරකළසේක. ඒ අසුකතිය මහෞෂධ පණ්ඩිතයන්ට වැඩියක් උපකාරකරණබව සුදුසු"යි කීහ; රජතුරුවෝ "තමන් නිසා පැණය දන්බව නොකිවුය"යි මහෞෂධ පණ්ඩිතයන්වහන්සේට සතුටුව වඩා උපකාරයක් කරණු කැමැත්තෝ "වන්නාටය මපුතනුවන් එක් පැණයක් විචාරා ඒ පැණය කීකල මහත් සත්කාර කෙරෙමි"යි සිතූහ.

සිරිමන්ද ප්‍රශ්නය.

මෙසේ සිතා ඊට සුදුසු පැණයක් සිතන්නාහු සිරිමන්ද ප්‍රශ්නය සිතූහ. ඒප්‍රශ්නය චින්තනයකොට එක්දවසක් පණ්ඩිතවරුන් පස් දෙනා සේවයට අවුත් පිළිසඳර කථායෙන් සුවසේඋන්කල්හි සේනක පණ්ඩිතයන්ට "සේනක පණ්ඩිතයෙනි පැණයක් විචාරම්"කීහ. දේවයන්වහන්ස විචාළමැනවයි කීහ. රජතුරුවෝ සිරිමන්ද ප්‍රශ්නයෙහි පළමුවන ගාථාවෙන් "නුවණ ඇති සම්පත් නැති හස්ත්‍යශ්වාදි පරිවාර සම්පත් ඇති නුවණ නැති මුන් දෙන්නා අතුරෙන් නුවණැත්තෝ කවුරුන් උතුමැයි කියද්ද? සේනකයිනි එකෙක් පොළව හා සමාන නුවණ ඇත්තේය දිළිඳුය, එකෙක් පරිවාර සම්පත්ඇත්තේය අඥනය; මුන් දෙන්නාගෙන් කවුරු උත්තමයයි නොපට වැටහේද? මේ කාරණය කියාලව"යි කීහ. මේ පැණය චනාහි සේනක පණ්ඩිතයන්ගේ පරම්පරාවෙන් පැවත ආයේය. එසේ හෙයින් ඒ සිරිමන්ද ප්‍රශ්නය වහාම රජතුරුවන්ට කීහ. කෙසේවූදයත්? "ජනප්‍රධානවූ රජතුරුවෙනි ඒකාන්තයෙන් නුවණැත්තෝද, නුවණනැත්තෝද හස්ත්‍යශ්වාදි ශිල්පයෙන් යුක්තයෝද කිසි ශිල්පයක් නොදන්නාහුද ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදි උතුම් ජාති ඇත්නාහුද යන සියල්ලෝම ජාතින්ගෙන් හීන උවත් සම්පත්ඇති නැනැත්තවුට කී නොකී දෙය කොට සේවාව යටත්වන්නාහ. මේකාරණය දැන මමකියමි නුවණැති නැනැත්තෝ යටත්මය සම්පත් ඇති නැනැත්තෝම උතුමැ"යි කීහ.

රජතුරුවෝ සේනකයාගේ බස්අසා පුක්කුසාදි තුන්දෙනාගෙවී චාරා පස්දෙනාට කෙළවර උන් මහෞෂධ පණ්ඩිතයන්වහන්සේට, අලාමකවූ නුවණැති සියලු ධර්මයන් සවිඥාණයෙන් දන්නාවූ මහෞෂධ පණ්ඩිතයෙනි නොප විචාරම්; නුවණැති පරිවාර සම්පත් නැති පරිවාර සම්පත් ඇති නුවණ නැති මේදෙදෙනා අතුරෙන් නුවණැත්තෝ කා උතුමැයි කියද්ද කියා බලව"යි කීහ. ඉක්බිත්තෙන් මෙසේ විචාළ රජතුරුවන්ට "අසුවමැනව දේවයන්වහන්ස" යි ගාථාවකින් "සර්වාර්ථාදි කිසි ලාභයක් සම්පත්තියක් ලදින්ම මේ උතුමැ"යි සිතන්නාවූ අඥනතෙමේ පාණාතිපාතාදි පාපධර්මයන් කරන්නේය, එසේහෙයින් මේලොව බලන්නේ ඓශ්වර්‍යමදයෙන් ප්‍රමාදව කළාවූ

පාපකර්ම බලයෙන් නරකාදියෙහි අනන්ත දුකඛයට භාගීවන්නේ යයි. මෙසේ උපෙක්ෂා පූර්වාඞ්ගමවූ චින්තාවක් නැතිව පරලොව නොබ ලන්නේ දෙලොවෙහිම හෙවත් ඉසුරුමදයෙන් පව්කොට නරකාදි යෙහි උපදනේ පරලොවද නැවත එයින් චුතව දිළිඳුකුලයෙහි නොයෙක් දුකට භාජනව උපදනේ මේලොවදැයි මෙසේ දෙලෙව්හිම නුවණ නැති නැනැත්තේ පරාජයක් ගන්නේය හෙවත් විනාශයට පැමිණෙන්නේය; මේ කාරණය දැක මම නුවණැත්තේම උතුම, යස සින් යුක්තවූ නුවණ නැති නැනැත්තේ උතුම් නොවෙයි කියමැ"යි වදාළසේක.

මෙසේ බෝසතාණන්වහන්සේ විසින් වදාළ කල්හි රජුරුවෝ සේනකයන් මූහුන බලා "මහෞෂධ පණ්ඩිතයෝ නුවණැත්තා උතු මැයි කියති කෙබඳුද ආචාරිනී'යි කිහ. සේනකයෝ 'දේවයන්වහන්ස මහෞෂධ පණ්ඩිතයෝ ලදරුවෝය අද දක්වාත් උන්ගේ මුඛය කිරි සුවද අමයි, මේ බාලදරුවෝ කුමක් දනිද්දැ"යි කියා ගාථාවකින් කාරණයක් දක්වන්නාහු "මේ ශිල්පතෙමේ හෙවත් නුවණතෙමේ ධනධාන්‍යාදිවූ භොගසම්පත් සිඹනොකරන්නේය, පුත්‍රදාරාදිවූ නැයෝද රූපසම්පත්තියද, ධනධාන්‍යාදිවූ සම්පත් සිඹනොකරන්නාය ඒව දැඟානන්ත කවරේදැයි යනහොත්? කෙළනොලුවූ හෙවත් අනවරතයෙන් දෙකොළින් බස්නා කෙලධාරා ඇති රූපසම්පත්තියක් නැති හස්ත්‍යශ්වාදි පරිවාරයෙන්හා ධනධාන්‍යාදි සම්පත්තීන් යුක්තව සුවවිඳිනා මේ ගොරිමඳනම් සිටුහු ශ්‍රීකාන්තා සෙවුනිය; දේවයන්වහන්ස බලා වදාළමැනව. මේ කාරණයදැක නුවණැතිවත් දිළිඳු නැනැත්තේ උතුම් නොවෙයි, නුවණ නැතිවත් ඉසුරුමත් නැනැත්තේ උතුමැයි මම කියම්යි කීහ.

ඒ ගොරිමඳ සිටානෝ වනාහි කෙසේවූ කෙණෙක්දයත්? ඒම්යුලුනුවර අසූකෙළක් සම්පත් ඇති සිටාන කෙණෙක; උන්ගේ බැලිය යුතු රූපයකුත් නැත්තේය; පුත්‍ර කෙණෙක් නැත්තේය, දියනි කෙණෙකුත් නැසිය කෙණෙකුත් නැත්නාහ. කිසි ශිල්පයකුත්නොදන්නාහ, බැණ නැඟි කල්හි ඒ ගොරිමඳ සිටානන්ගේ දෙකොළින් කෙළධාරාත් වැගිරෙන්නේය; එසේ වැහෙන්නාවූ කෙලධාරාවන් දෙවහණන්හා සමානරූඇති සර්වාලඞ්කාරයෙන් සැරහුනු ගැණුදෙන්නෙක් සුපිපි නිලුපුල් කලබ් දෙකක් ගෙණ දැලයෙහි සිට නිලුපුල්ම ලින් පිස මල්විවියට දමන්නාහ; රාසොඬහුද රාහලට* ය්න්නාහු නිලුපුලින් ප්‍රයෝජනයක් ඇති කල්හි ඒ ගොරිමඳ සිටානන්ගේ ගෙදෙරට ගොස් සාමිනි ගොරිමඳ සිටානන්වහන්සැ"යි කියන්නාහ; ඒ සිටානෝ රාසොඬුන්ගේ බස් අසා සිවිමැදුරු කවුළුව සම්පයේම සිට 'කිමෙක්දදරුවෙනි' කියන්නාහ; ඉක්බිත්තෙන් බැණනැංගාවුන්ගේ දෙකොළින් කෙළධාරා වැහෙන්නේය; නිලුපුල්මල් ගත් අත් ඇතිව සැරහී දූලයෙහි සිටි ගැණුදෙන්නා මලින් කෙළපිස මල් අතුරු වීවි

* අවනට

යට දමන්නාහ; රාජොඩහු ඒ මල්ගෙණ දියෙහි සලාපියා පැළඳගෙණ රාහලට වදනාහ, ඒ ගොරිමඳ සිටානෝනම් මෙබඳු සම්පත් ඇත්තාහ. සේනකයෝ මේ දෘෂ්ටානතකොට රජ්ජුරුවන්ට කිහ.

සේනකයන් කී බස් අසා රජ්ජුරුවෝ "පුත මහෞෂධ පණ්ඩිත යෙනි"කිහ. මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ "දේවයන්වහන්ස සේනකයෝ කුමක් දනිද්ද? බත්හුළු වැඟිර ගියතෙන අවුලා කන කපුටුවෙකු වැන්නේය, ඉස හෙන මුගුරු නොබලා දී බොන්නටවත් බල්ලෙකු වැන්නේය, මේලෝ විදගන්නා සම්පත්බලයි, ඉස වැටෙන අපාදුක් නැමති මහමුගුරු නොබලයි, ඇසුව මැනව දේවයන්වහන්සැ"යි ගාථාවකින් කාරණයක් දක්වනසේක් "නුවණනැත්තේ සුව යක් ලදින් එහිම ඇළෙනේ කුශලකර්මයෙහි පමාවන්නේය, ප්‍රමාද ප්‍රත්‍යයෙන් පවිකරන්නේය, ඤාතිව්‍යසනාදිවූ අනෙකප්‍රකාරවූ දුකින් මඩනාලද්දේ විශෙෂයෙන්ම මුළාබවට පැමිණෙන්නේය, අමුතු අමු තුවක්ක්‍රියාකාරයෙන් පවත්නාවූ සුවදුකින් පිඩිතවූයේ ග්‍රීෂ්මකාලයෙහි දියෙන් ගෙණහැර අව්වෙහි ලූ මසොකුමෙන් වෙව්ලන්නේය. මේ කාරණයදැක මම නුවණැත්තෝ උතුම ඉසුරුමත් නැනැත්තෝ උතුම් නොවෙති කියම්"යි වදාළසේක.

මහබෝසතාණන්වහන්සේ වදාළ කාරණය අසා රජ්ජුරුවෝ "කෙබඳුද ආචාරීනි" කිහ. සේනක පණ්ඩිතයෝ "දේවයන්වහන්ස මූ කුමක් දනිද? මිනිස්සු සිටිත්වා හෙවත් මිනිසුන් තබා වල හට ගත් ගසක් ඵලසම්පන්නවීනම් එසේවූ ගසටම පක්ෂිහු එළඹෙන් නාහ"යි කියා ගාථාවකින් එම උපමාව දක්වන්නාහු "වල හටගත් මියුරු පක් ඇති වෘක්ෂයට අනෙක ප්‍රකාරවූ ශාරිකා ශකුනාදී ලිහිණියෝ හාත්පසින් යම්සේ අවුත් රැස්වෙද්ද, එපරිද්දෙන්ම පොහොසත්වූ රත්රන් අමුරන් ආදි ධන සහිතවූ අවශෙෂ උපභොග පරිභොග වසතු ඇති මෙබඳු පුරුෂයා බොහෝදෙන තමන්ට වැඩපිණිස සෙවිනාහ; මේ කාරණය දැක මම නුවණැතිවත් දිළිඳු නැනැත්තේ උතුම් නොවෙයි, නුවණ නැතිවත් ශ්‍රීමත් නැනැත්තේ උතුමැයි කියම්"යි කිහ.

සේනකයන් කී කාරණයඅසා රජ්ජුරුවෝ 'කිමෙක්ද පුත මහෞෂධ පණ්ඩිතයෙනි, කීහ. මේ සේනක පණ්ඩිතයෝ කුමක් දනිද්ද? ඇසුව මැනව දේවයන්වහන්සැ"යි කාරණයක් දක්වන නැනැත්තෝ ගාථාවකින් "පවත්වනලද අණසක ඇති නුවණ නැත්තෝ උතුම් නොවෙති; කුමක් හෙයින්දයත් නාඩන බඹනාදී නොයෙක් දරුණුකමින් ජනයන්ට දුක්දී වසතු ලබන්නේය, එසේවූ අඥානයා බලවත් පශ්චාත්තාප දුකඛයෙන් අභිභූතව හඬන්නාම භයානකවූ නරකයට යමපල්ලෝ නොකමැතිසේම අදනාහ, හෙවත් නරකයෙහි බොහෝ දුකට පැමිණෙන්නේය. මේ කාරණයද දැක මම දිළිඳුවත් නුවණැත්තේම උතුම ඉසුරුමත් වත් නුවණ නැත්තේ උතුම් නොවෙයි කියම්" වදාළසේක.

නැවත රජ්ජුරුවන් විසින් "කිමෙක්ද සේනකයිනි" කී කල්හි ගාථාවකින් කාරණයත් දක්වන්නාහු "ඇල හෝ කඳුරැලි ආදී කිසි ජලාශය කෙණෙක් නිම්නව ගොස් ගහට අඩා බසිද්ද, ඔහු හැමදෙ නම තමතමන්ගේ යථොක්තවූ, හොය ඇල යනාදි නම් ගොත් හර ණාහ, ඒඇල හෝ ආදින්ගේ ප්‍රවෙශයට ආධාරවයෙන් ගඩගාතොම මහමුහුදට වදනාලබන්නි ගඩගාය යන ව්‍යවහාර නැතිව ගොස් මුහුද හා එක්වීමෙන් මුහුදයයි යන ව්‍යවහාරයට යන්නේද, එපරිද්දෙන් ලෝවැස්සෝ තුමූ සම්පත් ඇත්තහුම පිහිටකොට ඇත්නාහ, හෙවත් මහනුවණැත්තෝද ඉසුරුමත් නැනැත්නවුන් කරා පැමිණ මුහුදට වන් ගහක්සේ තේජස් නැතිහෙයින් ප්‍රසිඩව නොපෙණෙන් නෝය, මේ කාරණය දැක මම නුවනැත්තෝ උතුම් නොවෙති ඉසුරුමත් නැනැත්තෝ උතුමැයි කියමි"කීහ.

නැවත රජ්ජුරුවෝ "කිමෙක්ද මහෞෂධ පණ්ඩිතයෙනි" කිහ. පණ්ඩිතයන්වහන්සේ "ඇසුව මැනව දේවයන්වහන්සැ"යි කියා ගාථාවකින් කාරණයක් වදාරණසේක් "මහත්වූ සාගරයෙක් උපමා කොරෙද්ද ඒ සාගරයට ගඩගා යමුනා අචිරවත් ආදිවූ අනෙකප්‍රකාර ගංහෝ හැමකල්හිම මෙතෙක් ගඟ මෙතෙක් හොයයන ප්‍රමාණයක් නැතිව නොයෙක් දිගින් හඩා බසිද්ද සමුද්‍ර සඩ්ඛ්‍යානවූ ඒ සාගරය තෙමේ අනවරතවූ සියදහස් ගණන් මහත්වූ රළුවෙග ඇත්තේ වෙරළු ඉක්මගතනොහි වෙරළම ගැසි බිඳේද, එපරිද්දෙන්ම නුවණ නැත්තහුගේ තෙපුල් නුවණැත්තවූ ඉක්ම නොපවත්නේය. කිසියම් අඥානඥයෙක්හි උපන් සැකයෙක් ඇත්නම් ඉසුරුමත්හුද නුවණැත්තහුකරා ගොස් දිළිඳුවත් නුවණැත්තහු කරා පැමිණ නිශ්චය වන්නේය. මේ කාරණය දැක මම නුවණැත්තේ උතුම ඉසුරුමත් නුවණ නැත්තේ උතුම් නොවෙයි කියමි" වදාළසේක.

බෝසතාණන්වහන්සේ වදාළ කාරණය අසා රජ්ජුරුවෝ කිමෙක්ද සේනකයිනි, කීහ. "ඇසුව මැනව දේවයන්වහන්සැ"යි ගාථාවකින් කාරණයක් දක්වනු පිණිස "කායාදි සංයමයක් නැතිවත් යමෙක් පරිවාර සම්පත් ඇත්තේවීනම් එබදු ඉසුරුමත් පුරුෂතෙම මහපිරිස පිරිවරා අධිකරණයෙහිහිඳ අනුන්ටමේලොවින් පරලොවින් වැඩක්වන කාරණයක්වත්, අවැඩවන කාරණයක්වත් කියන්නේවී නම්, තේජස්වී හෙයින් සභාමඩ්‍යයෙහි ඔහුගේ බසම නැගෙන්නේය ඉසුරුමත් තැනැත්තේ හිමියන් නොහිමිකිරීම් ආදිවූ අවැඩට සුදුසු බසකුදු කිවහොත් සභාවට ඇදහියයුතුබව ශ්‍රීකානතම රක්නීය, ප්‍රඥ නොමෝ එසේකොට ලියනොහෙන්නීය. මේ කාරණයද දැන මම නුවණැත්තෝ යටත්හුමය ශ්‍රීමත් ඇත්තෝම උතුමැයි කියමි"කීහ.

නැවත රජ්ජුරුවන් විසින් කිමෙක්ද පුන මහෞෂධපණ්ඩිතයෙනි කීකල්හි පණ්ඩිතයන්වහන්සේ "මේ කෙළනොලු සේනකයා කුමක්

දනීද”යි වදරා ගාථාවකින් කාරණයක් වදරණසේක් “මදනුවණැති බාලතෙමේ අනුන් නිසාවත් තමා නිසාවත් බොරු බෙණෙයිනම් හේසහාමැද නින්දත් ලබයි පරලොව අපායගාමිද වෙයි. මේ කරුණත් බලා නුවනැත්තේ උතුම නුවණ නැති ඉසුරුමත් තැනැත්තේ උතුම්නොවෙයි මම කියමි”කිහ.

ඉක්බිත්තෙන් සේනක පණ්ඩිතයෝ ගාථාවකින් කාරණයක් දක්වන්නාහු “වී නැළියක් සාල්නැළියක් වෙල්හැල්නැළියක් පමණවත් නැති අකක් මස්සක් වසතුවක්නැති, එසේහෙයින් ඒ වේලෙන් වේලාවට දුකසේ ජීවත්වන්නාවූ පොළුව සමානවූ නුවණැත්තේ සභාමඩ්‍යයේ හිඳ, ඉදින් කාරයණකුදුකියානම් ඔහුගේ ඒවචනය සභාවට නොනැගෙන්නේය. යමෙක් නුවණැතිවත් ඉසුරුමත් නොවේනම් ශ්‍රිකාන්තා ඔහු භජනය නොකරන්නිය, යමෙක් නුවණ නැතිවත් ඉසුරුමත්වීනම් ශ්‍රී ඔහු සෙවුනීය, එසේ හෙයින් ඉසුරුමත් තැනැත්තහු සම්මුඛයේ නුවණැත්තේ කඳෙපැණියෙක්මෙන් වැටහෙන්නේය. මේ කාරණයද දැක මම ප්‍රඥවන්ත තැනැත්තේ භිනය ඉසුරුමත් තැනැත්තේ වඹිනයයි කියමි”කිහ.

නැවත රජ්ජුරුවන් විසින් ‘කිමෙක්ද පුත මහෞෂධ පණ්ඩිතයෙනි, කී කල්හී පණ්ඩිතයන්වහන්සේ ‘සේනකයා කුමක් දනිද? මේලොව විදගන්නා යසස බලයි; පරලොව අපායදුක් නොබලයි, කියා ගාථාවකින් කාරණයක් දක්වනසේක්, “උදුරවූ නුවණැත්තේ අනුන්ගේ බිඳීම පිණිස වේවයි බොරුවක් නොකියන්නේයි, සඛවස රක්නාවූ හේතෙමේ මහපිරිස් මැද බොහෝදෙනා විසින් ‘කී නියා යහපතැ’යි පිදියයුතු වන්නේය. පරලෙව්හිදු සුභාෂිත කාරණයෙන් සුගතියටම යන්නේය. මේ කාරණයද දැක මම නුවණැත්තෝම උතුම නුවණ නැති ඉසුරුමත් තැනැත්තෝ උතුම් නොවෙති කියමි”යි වදාළසේක.

නැවත “කෙසේද”යි විචාළ රජ්ජුරුවන්ට සේනකයෝ ගාථාවකින් උත්තරයක් කියන්නෝ “මහරජ ඇසුව මැනව ඇතුන් අසුන් ගව මහිෂාදී වසතු හා මුතු මැණික් ආදිවූ රුවන්ද, මැණික්මය කුණ්ඩලාභරණ හා කණක කටක නූපුර යනාදි ආභරණයෝද ඉසුරු කුලයෙහි උපන්නාවූ දෙවහනන් හා සමාන වරඟනෝද අවශෙෂපරිවාර ජනයෝද යන සියල්ලම පොහොසත් තැනැත්තවුට උපභොග පරිභොග පිණිස වන්නාහ. නුවණ ඇතත් දුක්පත් තැනැත්තවුට එසේ වන්නාහු නොවෙති. මේ කාරණයෙනුත් සම්පත් ඇත්තෝ උතුම් වෙති කියමි”කිහ.

ඉක්බිත්තෙන් පණ්ඩිතයන්වහන්සේ වදරණසේක් ‘මේ නුවණ නැති සේනකයා කුමක් දනිද”යි එක් කාරණයක් ගෙණහැරදක් වන්නේ ගාථාවකින් “නොසලකා කරණලද මේලොවින් පරලොවින්

අනාථදයකවූ කටයුතුද ඇති අඥානවූ තෙපුල් ඇති මද නුවණැත්ත හුද දිරාගිය සැවයක් නිරපේක්ෂාකොට හැරපියා යන සපියෙකුමෙන් ශ්‍රී නොමෝ හරිණිය. තවද ඊටකාරණා කිමෙක්ද යතහොත් ප්‍රථම කල්පයෙහි අකුසල්නම් කළඔව සුදුඔව නොදන්නා මිනිසුන්ට ආයු බොහෝ සමයෙහි දඹදිව චේතියනම් රජකෙණෙක් ඇතිවූහ; උන් ගේ ශරීරයෙන් සඳුන් සුවඳ හමන්නේය, මුඛයෙන් මහනෙල්මල් සුවඳ හමන්නේය, ආකාශයෙහි පලඟ බැඳගෙණ ඉඳිනට සමර්ථවූ සෘඞ්ධි ඇත්තාහ; කාමාවචර දෙවියෝ සතර දෙනෙක් නිරන්තරයෙන් රැ දුවල් ආරක්ෂා ඇතිව රැකවල්ගෙණ සිටිනාහ, අනන්ත ඇතුන් අසුන් ආදිවූ සිවුරඟ සෙනඟින් යුක්තව දසදහසක් යොදුන් දඹදිව අගරජකරන්නාහ. එසේවූ ඒචේතිය රජුරුවන් කී බොරුවෙන් ශරීරයෙන් නික්මෙන චන්දනගන්ධයද මුඛයෙන් නික්මෙන උත්පල ගන්ධයද නැතිව දුගඳ හමන්නට වන, සතරදිග රැකවල්ගෙණ සිටිය දෙවියෝද ඔහු හැරපියා නැඟී ගියාහ; ආකාශයෙහි පලක් බැඳ සිටිනට සමර්ථ සෘඞ්ධිනැතිව බිමටම බට්ටුයේය; කීවාවූ මුසාවාදය කරණ කොටගෙණ ජීවමාන ශරීරයෙන්ම පොළව විවරව අවීචියෙන් ගිනි දැල් අවුත් රත්පලසක් බදුව වළඳිනාලද්දේ නරකයෙහි උපන; සතරදිග දෙවියන් රැකවල්ගත් එබදු ඔහුගේ සැපත පවා නුවණ නැතිව අපායට යනකල පිටිවහල්නොවී මුහුද එතරට මෙතර සේද ආකාශයට පොළවසේද නොලඟවිය, එසේ හෙයින් මේ කාරණයද දැක මම නුවණැත්තෝ උතුම නුවණ නැති තැනැත්තෝ උතුම් නොවෙති කියමි"වදාළසේක.

ඉක්බිත්තෙන් රජුරුවෝ "කිමෙක්ද සේනකයිනි" කී කල්හි "කිමෙක්ද දේවයන්වහන්ස මේ බාලදරුවෝ කුමක් දනිද්ද? තවත් මාකියන කාරණයක් ඇසුව මැනව"යි "පණ්ඩිතයන්වහන්සේ කරබාවම් හෙවත් කියනලද උත්තරයක් ඇත්නම් නැතිකෙරෙමි" සිතා ගාථාවකින් කාරණයක් දක්වන්නාහු, "දේවයන්වහන්ස නුවණින් තීරණයකටයුතුවූ කාරණයෙක්හි සැකඋපන්කල "සේනකාදී පණ්ඩිතවරුන් කැඳව"යි අපහැම කැඳවා යවූ ඔබවහන්සේගේ සැකය දුරලන මෙසේවූ ප්‍රඥාසම්පන්නවූ අපි පණ්ඩිතවරු පස්දෙනම දෙහොත් මුදුනෙහි බැඳගෙණ ඔබවහන්සේට සමනොවෙමුව, අපඔබවහන්සේ "දෙදෙව්ලොව දෙවියන් පිරිවරා ඔවුන්ගේ ආනුභාව මැඩපවත්නාවූ සක් දෙවිරජහුමෙන් කීර්තිහා තේජසින් පරිවාර සම්පත්තීන් මැඩගෙණ පවත්නාසේක; ඉදින් නුවණැත්තාහු උතුම් උවහොත් අප අනුශාසකව සිටි බැවින් ඔබවහන්සේ අපට යටත් උවමනාවේද, එසේද නොවනහෙයින් මේ කාරණය දැක මම නුවණැත්තෝ උතුම් නොවෙති, පරිවාර සම්පත්ඇති තැනැත්තෝ උතුමැයි කියමි"යිකීහ

සේනකයන් විසින් කියනලද දැන් මේවූ කාරණයම අසා රජුරුවෝ "සේනකයන් විසින් ගෙණහැරදක්වන ලද්දවූ මේ කාරණය

ඉතාම යහපත. මපුත්තනුවෝ මහෞෂධ පණ්ඩිතයෝ මේ සේනකයා ගේ වාදය බිඳ අනික් කාරණයක් ගෙණහැර දක්වන්නට පෝසත් හුඇහෝයි"යි සිතා "මේ කිමෙක්ද පණ්ඩිතයෙනි"කිහ. සේනකයා තමන් විසින් මේ කාරණය ගෙණහැර දැක්වූකල දැන් වනාහී මහ බෝසතාණන්වහන්සේ විනා අනික් ඒ වාදය බිඳින්ට සමර්ථ කෙනෙක් මුළු දඹදිව නැත්තේය; එසේහෙයින් බෝධිසත්වයන්වහන්සේ තමන්වහන්සේගේ විදුරක්හා සමාන අසාධාරණවූ ප්‍රඥානුභාවයෙන් ඒ සේනක පණ්ඩිතයන්ගේ වාදය බිඳිනාසේක් "දේවයන්වහන්ස මේ නුවණ නැති සේනකයා කුමක්දනිද? මේලොව විදහන්නා යසස් බලයි නුවණෙහි අරුම නොදන්නේය. නුවණෙහි අරුම ඇසුවමැනම දේවයන්වහන්සැ"යි කියා ගාථාවකින් කාරණාදක්වනසේක්, නුවණ ඇත්තන් විසින්ම පසිඳවියයුතුවූ එබදු කටයුත්තක් උපන් කල්හි නුවණනැති ඉසුරුමත් තැනැත්තේ නුවණ ඇත්තවූ ගැත්තකුමෙන් පවත්නේය, නුවණැත්තේ ප්‍රඥාවෙන් කටයුතුවූ සියුම්වූ යුක්ති ආදී යම් ගැටමුසු කාරණයක් සැකහැර කියාද එබඳු කාරණයෙහි නුවණ නැත්තේ අවලොකනයකොට ගතනොහී ඒක්ෂණයෙහි කණ ගෙරිවල් වන්නාසේ මුළාබවට පැමිණෙන්නේයි, මේ කාරණය දැක නුවණැත්තෝම උතුම සම්පත් ඇති නුවණ නැත්තෝ උතුම් නොවන්නේය"යි කිහ. මෙරගල් මුදුනෙහි සත්රුවන් ගෙණහැර වගුරුවන්නාක්හු මෙන්ද, ආකාශයෙහි පුන්සඳමඬල ඔසවා පානාක්හුමෙන්ද උත්තර ගෙණහැරදැක්වූසේක. මෙසේ මහබෝසතාණන්වහන්සේ විසින් නුවණෙහි අරුම වදාළකල්හි, ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ සේනක පණ්ඩිතයන්ට "කිමෙක්ද සේනකයිනි පෝසතුනම් උත්තරයක් කියව"යි කිහ.

සේනකයාත් කොටුවෙහි පටවා නිබ්බී කා නිමවා කොටුපත්ල අතඟපියා රැකෙන මාන සිතන එකක්හුමෙන් උගත් උගත් තරම නිමවාපියා මත්තෙහි වැටහෙන උත්තරයක් නැත්තේ, එසේහෙයින් කරබාගෙණ කොදුර කොදුරා සිතිවිල්ලේ හුන්නේය. ඉදින් ඒ සේනකයෝ අනික් උත්තරයක් ගෙණහැර කිවුනම් ගාථා දහයකින් මේ උම්මඟ්ගජාතකය නොනිමෙන්නේය, ඒ සේනකයන් කියහෙනඋත්තරයක් නැති කල්හි ගැඹුරු මහවතුරක් එකපැහැර න්මන්නාක්හු මෙන්ද ආකාශ ගඞ්ගාව පොළෝතලයට බහන්නක්හුමෙන්ද, මහ බෝසතාණන්වහන්සේමත්තේ ප්‍රඥාවණ්ණනාකරණසේක් ගාථාවකින් ඒකාන්තයෙන් බුදු පසේබුදු මහරහතුන්ආදීවූ නුවණැත්තවුන්විසින් නුවණ උතුමැයි පසස්නාලද, යම්හෙයකින් නුවණ නැති මිනිස්සු සම්පතෙහි ඇලුනාහුනම් එහෙයින් සම්පතෙහි ඇලුනු මිනිස්සු ශ්‍රීකාන්තාව උතුමැයි කියති, මෙලොව පරලොව දන්නා නුවණින් වැඩිසිටියන්ට මේ යසස්නම් ගැරවිල් කුණක් හා සමානය, ප්‍රඥාව අසදෘශවූ යථරූප ඇත්තීය, එසේ හෙයින් මහසාගරයට වෙරළ ඉක්මගන්

නොහෙන්නාසේ ශ්‍රීකාන්තාතොමෝ කිසිකලෙකත් ප්‍රඥාවන්තයා ඉක්මගත නොහෙන්නීය දේවයන්වහන්සැ”යි වදාළසේක.

ඒ අසා රජ්ජුරුවෝ මහබෝසතාණන්වහන්සේගේ ප්‍රශ්න විසඳීනයෙන් සතුටුව බුදුකෙණෙකුන් පරිද්දෙන් අපට විසඳා කිව, ඒ නොපගේ ප්‍රශ්නව්‍යාකරණයෙහි සතුටුවූ මම ගෙරි දහසක්ද, නැගෙනෙට උතුම් හස්ත්‍යාලඞ්කාරයෙන් සරහනලද්දාවූ සුශික්ෂිත හසති රාජයෙක්ද, ආජානිය අසුන් යොදනලද රථාලඞ්කාරයෙන් සරහන ලද රථ දහසක්ද, ධනධාන්‍යයෙන් සමෘඩවූ එකෙකී ගම්න් අවුරුදුදෙකට ලක්ෂයක් බැගින් අය නිමන ගම් සොළසක්ද යන මෙකී වස්තූන් නොපට දෙම්”කියා සියල්ල දෙවූහ.

සිරිමඳ ප්‍රශ්නය නිමි.

ජනනපථ ප්‍රශ්නය.

එනැන් පටන්කොට මහබෝසතාණන්වහන්සේගේ යසස කිරි මුහුදු රළ පරිද්දෙන් මහත්වූයේය. ඒ සියලුම සම්පත් බුනනියෝ උදුම්බරාදේවීම විචාරත්. බෝසතාණන්වහන්සේ සොළොස් හැවිරිදිවූකල “මාගේ මලනුවෝ වැඩිමාලුවගත්හ, උන්ගේ යසයත් මහත උන්ට සමාන කුලයකින් සරණපාවා දෙනබව සුදුසුය”යි සිතූහ. මෙසේ සිතා එපවත් රජ්ජුරුවන්ට දන්වූය; රජ්ජුරුවෝඅසා සොම්නස්ව “යහපත සොඳුර එපවත් උන්ටකියව”යි කීහ. දේවිත් මහබෝසතාණන්වහන්සේට එපවත්දන්වූය. එපවත් පණ්ඩිතයන්වහන්සේවිසින් ‘යහපතැ’යි ගිවිසිකල්හි “එසේවීනම් මලණඬ සුදුසු තැනකින් කුමාරිකාවක් ගෙණමෝදැ”යි කීහ. මහබෝසතාණන්වහන්සේ “ඉදින් මුන්වහන්සේ විසින් ගෙන්වා පාවාදෙනලද කුමාරිකාව කිසිසේත් මට අභිප්‍රායනොවන්නේය; එහෙයින් මමම පළමුකොට සුදුසුඑකක් පරීක්ෂාකෙරෙයි”මි සිතා “දේවීන්වහන්ස කිප දවසක් රජ්ජුරුවන් වහන්සේට මා අසවල් කාරියකට ගියයි නොකිවමැනව, එක් කුමාරිකාවක් පරීක්ෂාකොට මට අභිප්‍රාය එකක් ලදිම්නම්, නුඹවහන්සේට දන්වාලම්”යි කියා බිසවුන් විසින් “යහපත මලණඬ එලෙසක් කරව”යි කී කල්හි, මහබෝසතාණන්වහන්සේ බිසව් වැඳ තමන්වහන්සේගේ ගෙට ගොස්, හිත මිත්‍රයන්ට එපවත් කියා, එක්තරා වෙශයකින් සන්නාලි උපකරණගෙණ, උදකලාවම උතුරුවාසල් දෙරින් නික්ම උතුරු යවමැදුම්ගමට වැඩිසේක.

එසමයෙහි උතුරු යවමැදුම්ගම දුක්පත්වසිවි පුරානැන සිටුකුලයෙක්වූව, ඒ සිටුකුලයෙහි අමරාදේවීනම් එකම දුවනිකෙණෙක් බැලුවන්ට ප්‍රියකරුවූ රූඇත්තාහ; සියලු සත්‍රීලක්ෂණයෙන් සම්පන්නයහමහ පින් ඇත්තාහ. ඒ අමරාදේවි තුමූ එදවස්ම, හුළුකැන් පිසගෙණ “පියානන් සානා තැනට යෙමි” නික්ම මහබෝසතාණන්වහන්සේ වඩනාමගට පිළිපන්හ; මහබෝසතාණන්වහන්සේ ඉදිරියටඑන්නාවූ ඒකුමාරිකාව දැක සත්‍රීලක්ෂණයෙන් සමන්විත යන්‍රියෙක, ඉදින් සවා

මින් නැත්තීනම් මෝතොමෝ මට බිරින්දට සුදුසුය"යි සිතූසේක. ඒ අමරාදේවී මහබෝසතානන්වහන්සේ දැකලා "ඉදින් මෙබඳු පුරුෂයක්හුගේ නෙයි වුයෙම්නම්, කුටුම්බ යණ්ඩාපනය කරන්ට හෙවත් වසතු රැස්කරන්ට පිළිවනැ"යි සිතූය. ඉක්බිත්තෙන් මහබෝසතානන් වහන්සේ "මැගේ සැමියන් ඇති නැතිබව නොදනිම්, එපවත් හසතමුදාවෙන් විචාරම්, ඉදින් මෝ නුවණැත්තීනම්, හසතමුදාවෙන් විචාළා දැනගන්නිය"ස් සිතා, දුරම සිට ඇඟිලි හකුලුවා ඕට කළසේක. ඒ අමරාදේවිත් "මේ පුරුෂයා මාගෙන් සැමියන් ඇත්ත නැත්ත විචාරන්නේය"යි දැන අත්ල විදලූහ. මහබෝසතානන්ව හන්සේ සරණ නුහුනුබව දැන සමීපයට ගොස් "සොදුර තෙපි කිනම් මුදැ"යි විචාළසේක. සවාමිනි ගියදවස වේවයි දැන්වේවයි මතුදවස වේවයි* සමඤ්ඤා ලෝකයෙහි යම් නවේක් නැත්නම්, මම ඒ නම්මි" කීහ. "සොදුර ලොව උපන් සතුන්ගෙන් නොමියන කෙණෙකුන් නැතිහෙයින් 'අමරා' නාමයනැත්තේය; තෙපි එනම්මුදුයි විචාළසේක. 'එසේය සවාමිනි'යි කීහ. "සොදුර කවුරුන්ට කැඳ ගෙණය වදැ"යි විචාළසේක. "පුළු දේවතාවන්ටය"යි කීහ. 'නොපගේ පියානන්ට කැඳ ගෙණයවිදැ"යි විචාළේය. "සවාමිනි එසේය"යි කීහ. "නොපගේ පියානෝ කුමක් කෙරෙද්දැ"යි විචාළසේක. එකක් දෙකක් කෙරෙති, කීහ. "එකක් දෙකක් කිරීමනම් සී සැමය. සීසා දැයි සොදුර" වදාළසේක. 'සවාමිනි එසේය'යි කීහ. 'නොපගේ පියානෝ කොතනක සාද්දැ'යි විචාළසේක. "යම් තෙනකට එකවරක් ගිය කෙණෙක් නොඑද්ද, එතනය"යි කීහ. එකවිටක ගිය කෙණෙකුන්ගේ පසුව නොඑන තෙන සුසානය, සොදුර සෝනෙක් සමීපයෙහි සාද්දැ'යි විචාළසේක. 'එසේය සවාමිනි'කීහ. සොදුර අදම එව්දැ'යි විචාළසේක. "ඉදින් ආවහොත් නොඑම් නාවොත් එම්"කීහ. "සොදුර නොපගේ පියානෝ ගහකින් එතරකසානි; එයට කාරණා කිමෙක්දැයි යතහොත් ගහදිය ආවොත් නොඑන නිසාය, දිය නොආවොත් එනහෙයිනැ"යි වදාළසේක. එසේය සවාමිනි' කිව.

මෙසේ මෙපමණක් පෙරපසු කථාකොට අමරාදේවිතුමී "හුළු කැන් පුවමැනව සවාමිනි, පැවරුහ. බෝසතානන්වහන්සේ "ආදියෙන් කි පෙරැත්ත නොඉවසීම අවමඞ්ගල්‍යය"යි සිතා 'යහපතබොම්' වදාළසේක. අමරාදේවි කැඳ සැළිය ඉසින් බා තුබූහ. මහබෝසතානන්වහන්සේ "ඉදින් මණ්ඩය නොදෙව අනට පැන් නොදීම, කැඳ අනට දිනිනම්, මෙතනම හැරපියායෙමි"යි සිතූසේක. ඒ අමරාදේවී වනාහි මණ්ඩයෙන් පැන් ඇරගෙණ අවුත් අනට දීලා, සිස් මණ්ඩය අත නොතබා බිම තබාලා, සැළියේ කැඳ අලලා හුළුකැන් මණ්ඩය පුරාලූහ. වැලින් ඒ කැඳෙහි හුළු මදවූයේය. ඉක්බිති බෝසතානන්වහන්සේ "කිමෙක්ද සොදුර හුළුකැන් ඉතාම බොල්වනැ"යි වදාළසේක. පැන් නොලද්දේයයි සවාමීන්"කීහ. "නොපගේ කුඹුර පුදිනා අග දිය නොලදැයි සිතම්" වදාළසේක; අමරාදේවිත් 'එසේය සවාමිනි'

* අතීත, අනාගත, වර්‍තමාන.

කිහ. පියානන්ට හුළුකැන් තබා බෝසතානන්වහන්සේට හුළුකැන් පෙවූහ. උන්වහන්සේ හුළුකැන් අනුභවකොට අනකටසෝධා "යෝ දුර නොපගේ ගෙටයම්හ, අපට මගඋයව"යි වදාළසේක. අමරාදේවී 'යහපනැ'යි කියා තමන්ගේ ගෙට මග කියන්නාහු "මේ මග ඔස්සේ ගොස් ඇතුළුගමට වන්කල යම් තෙනක හස්සුනු තබා විකුණන සල්පිළද, ඉන් ඔබ්බට ගියකල කැඳතබාගෙණ විකුණන සල්පිළ, ඉන් ඔබ්බට ගියකල පිපි සිටිනා කොබලිල ගසෙක් ඇත්තේය. ඒ ගසමුලට ගියකල යම් අනකින් අනුභව කරද්ද ඒ අත මග යන්ට කියම්, යම් අනකින් නොකද්ද ඒ අත යන්ට නොකියම් හෙවත් දකුණන මග වැඩිය මැනව, ඒ මගය, හෙවත් යවමැදුම්ගම අපගේ දෙමව්පියන්ගේ ගෙට මගය, මා සහවා කී මග දැන වදාළමැනව" කිහ.

සත්‍රී ප්‍රශ්නය.

මෙසේ ඒ අමරාදේවී බොධිසත්වයන්වහන්සේට මග කියාලා පියානන්ට හුළුකැන් ඇරගෙණ නැගී ගියහ. මහබෝසතානන්වහන්සේත් අමරාදේවින් කී මගින් උන්ගේගෙට වැඩිසේක. ඉක්බිත්තෙන් අමරාදේවින්ගේ මැනියෝ පණ්ඩිතයන්වහන්සේදැක හිඳිනට අස්නක් දීලා පුතණ්ඩ බොනපරිද්දෙන් හුළුකැන් අතට වඩා ලම්දැ'යිකීහ. මැනියන්වහන්ස අපගේ නැගණියෝ අමරාදේවී කැඳිත්තක් පෙවූහයි වදාළසේක. අමරාදේවින්ගේ මැනියෝ "මාගේ දියනියන් නිසා ආ කෙණෙක්වනැ"යි සිතූහ. මහබෝසතානන්වහන්සේ උන් දුක්පත් නියාව දන්නාහු "මැනියන්වහන්ස මම සන්නාලියෙක්මි, ගෙත්තම් කටයුතුවූ කිසිවක් ඇද්දැයි විචාළහ. "පුතණ්ඩ විද්දයුතු කොට්ට මා වුලා ආදිය ඇත; ඒ විද්ද ගෙණදිලන්ට සුදුසු මිලියෙක් නැනැ"යි කිහ. මැනියන්වහන්ස මිලයෙන් කාරියෙක් නැත ගෙණෙව විදදිලම්" වදාළසේක. අමරාදේවින්ගේ මැනියෝ කඩරෙදි හැරගෙණ ගෙත්තම් කරණ පරිද්දෙන් දුන්හ. මහබෝසතානන්වහන්සේ ගම ඇත්තන් ගෙණ ගෙණා රෙදි හා උවමනා උවමනා දෙයද නිමවූ සේක්මය. පිණැත්තන් කරණ දෙය සිතූ ලෙසටම සමඹවන්නේය. ඉක්බිත්තෙන් බෝධිසත්වයන්වහන්සේ අමරාදේවින්ගේ මැනියන්ට 'මැනියෙනි විවියක්පාසා අඩගාපියව'යි වදාළසේක. අමරාදේවින්ගේ මැනියෝ ගම මූළුල්ලේම අඩගැහ මහබෝසතානන්වහන්සේ ගම ඇත්තන් ගෙණ ගෙණා කඩින් සන්නාලි මෙහෙවරකොට එක දවසින්ම මසු දහසක් ලත්සේක. අමරාදේවින්ගේ මැනියෝද බොධිසත්වයන්වහන්සේට දුවල් බත්පිස කවා පුතණ්ඩ රැට සාල් කෙතෙක් ගරම්දැයි"යි විචාළාහ. මැනියන්වහන්ස මේගෙයි යම්පමණෙක් කත් නම් එපමණම බත්පිසුව මැනව'යි වදාළසේක. අමරාදේවින්ගේ මැනි

යෝත් බොහෝවූ රසමසවුලෙන් යුක්තකොට බත්පිසූහ. අමරාදේවී ඉසින් දැරම්පියක් හා හිනින් * පලා හිනක් ඇරගෙණ වලින් අවුත් ඉදිරියේ දෙර දරම්පිය හෙළා පැලදෙරින් ගෙට වන්නුය. උන්ගේ පියානෝ වනාහි ඇඳිරිගැසී ගියකල ගෙට ආහ. බෝධිසත්වයන්ව හන්සේට අනෙකප්‍රකාර අනගි රසයෙන් යුක්තවූ ආහාර අනුභව කරවූහ. අමරාදේවී මවපිය දෙදෙන බත් කවා පසුව තුමූත් කා, මව්පිය දෙදෙනා පය සෝදවා තෙල්ගල්වා, මහබෝසතානන්වහන්සේ පයසෝදවා තෙල් ගැල්වූහ. පණ්ඩිතයන්වහන්සේ අමරාදේවීන් විමසනසේක් කිපදවසක්ම එහි විසූසේක.

ඉක්බිත්තෙන් එක් දවසක් උන් විමසනසේක් "සොඳුර අමරාදේවිනි සාල් මණාවක් පමණ ඇරගෙණ, ඉන් මට කැඳත් බතුත් අවුත් පිසව"යි වදාළසේක. අමරාදේවීත් "එක සාල් මණාවෙන් මෙතෙක්දෑ කෙසේ පිසම්දැයි" නොකියා 'යහපතැ'යි වදාළ බස ගිවිස ඒ සාල් මණාව පැස මුල් සාලින් බත්ද ක්‍රඩ සාලින් කැඳද සුන් සාලින් කැවුම්ද පිස ඊට සුදුසුවූ අවුළුත් පිහ, මහබෝසතානන්වහන්සේට අවුළු සහිත කැඳ දුන්හ. කැඳ කබලක් මුඛයට ගත් පමණකින්ම සියලු රසනහරවැල් පිණා සිටගත්තේය; පණ්ඩිතයන්වහන්සේ උන් විමසන පිණිස "සොඳුර තොප පිසමන්නොදන්නාකල කුමක්පිණිස මාගේ සාල් නසාපුදැ'යි කියා කෙළිහා සමග මුඛයට ගත් කැඳකබල කාරා දමාපිසේක. අමරාදේවීන් නොකිපිම කැඳ යහපත් නොවිනම් කැවුම් කැවමැනවයි සවාමිනි කියා අතට දුන්හ. කැවුම් මුඛයෙහිනිබු පමණකින්ම රසනහරවැල් පිණාගියේය. එසේම කාරා දැමූසේක. ඊටත් නොකිපිම් "එසේවිනම් බත් අනුභවකරව"යි කියා බත් අතනිබුහ; එයිත් ආලෝපයක් මුඛයෙහි තබන්නාම සියලුරසන හරවැල් පිණාහියේය. බොධිසත්වයන්වහන්සේ 'තොප පිසමන් නොදන්නාකල මාදුකසේ සොයාගත් දෙය කුමට නැසූදැ"යි කිපි කෙණෙකුන්මෙන් තුන්වගයම එක්කොට අඹරාපියා, අමරාදේවීන් ඉසපටන් ඇඟ මුළුල්ලෙහි ගල්වා දෙර අව්වෙහි සිටින්ට වදාළසේක. අමරාදේවීත් ඊට මදකුත් නොකිපි 'යහපත සවාමිනි' දෙර අව්වෙහි හුන්නාහ. මහබෝසතානන්වහන්සේ අමරාදේවීන් මන් නැතිබව දැන, සොඳුර මෙහි එව'යි වදාළසේක. ඔයිත් දෙවිටක් නොකැඳවනතුරු එකා බසින්ම සම්පයට අවුය. මහබෝසතානන්වහන්සේ නුවරින් එනසේක්ම මසුදහසක් හා එක් සීන් කඩක් බුලත්පසියෙහි ලා වැඩසේක. උන්වහන්සේ ඒ කඩ මැන්කොට අමරාදේවීන් අතනබා "සොඳුර නොපගේ යෙහෙළිනියන් සමග නොසින් නාපියා මේ කඩ ඇඳගෙණ එව'යි වදාළසේක. ඔයිත් වදාළලෙසම කළහ. පණ්ඩිතයන්වහන්සේ යන්නාලි කමින් උපයාගත් මසුරන්ද නුවරසිට ගෙණාමසුරන්ද යනමේ සියල්ල අමරාදේවීන්ගේ මවපිය දෙදෙනාට දීලා, දෙමහල්ලන්ට "නුඹවහන්සේ රක්‍ෂාවට නොසිතුව මැනව"යි අස්වසා

* එකුරුන්තෙන්

අමරාදේවීන් හැරගෙණ නුවරට ගොස්, තවත් විමසා පිණිස දෙර ටුපාලයාගේ ගෙයි ඉඳුවා, දෙරටුපාලයාගේ අඹුවට යවරූප කියාලා තමන්වහන්සේ ගෙට ගොස්, පිරිමින් දෙදෙනෙකු කැඳවා "අසවල් ගෙයි ගැණියෙකු රඳවා ආම්; මසු දහසක් ඇරගෙණ ගොස් ඈ විම සව"යි මසු දහස දී යැවූසේක. උයින් බොධිසත්වයන් වදුලි ලෙසම ගොස්, අමරාදේවීන්ට මසු දහස දික්කොට විචාළහ. අමරාදේවි "මේ මසු දහස මාගේ සමුණන්ගේ පයපිසුන් නොඅගනේය"යි කියා උන් කිබස් නොගිවිස්සාහ. ඒ පුරුෂයෝ ගොස් පණ්ඩිතයන්වහන්සේට දැන්වූහ. ඉක්බිත්තෙන් බොධිසත්වයන්වහන්සේ ඒපුරුෂයන් නැවත නැවත තුන්වරක් දක්වා යවා නොගිවිස්නා හෙයින් සතරවන වාර යෙහි "එසේවිනම් ඈ අත අල්වා ඇදගෙණ එව"යි වදුලසේක. ඒ පුරුෂයෝ ගොස් නොකැමති පරිද්දෙන් ඇදගෙණ ගියහ.

අමරාදේවි මහබෝසතානන්වහන්සේ සැපතෙහි සිටියහෙයින් හැඳිනගතනොහි මුන බලා සිනාසුනාහ, අඬාත්පිහ. පණ්ඩිතයන් වහන්සේ අමරාදේවි සිනාසුනු කාරණයත් නැඹු කාරණයත් විචාළ සේක. ඉක්බිති බොධිසත්වයන්වහන්සේට අමරාදේවි "සවාමිනි නුඹ වහන්සේගේ මුන බලා සිනාසෙන්නෙම්, ඔබවහන්සේගේ දිව්‍ය සැප තක් හා සමානවූ සැපත් බලා මේ සම්පත් නොකාරණයෙනුත් ලත් දෙයක් නොවෙයි, පූර්ජාතියෙහි පින්කම්කොට ලබනලද කුශල කර්මයාගේ විපාකය නොසිතියහැකි නියායයි සිතා සමාධින් සිනා සිනිම්; හඬන්නෙම් වනාහි, දැන් 'මබස් පත ලැබෙයි' කියා අනුන් විසින් රක්ෂිත ගෝපිතවසිටි යන්නේ කරා එළඹ, හෙවත් පරදාරකර්ම කොට මතු නරකයට යන්නාහයි සිතා ඔබවහන්සේ කෙරෙහි දයා වෙන් හැඬීම්"යි කිහ. බොධිසත්වයන්වහන්සේ උන්පරීක්ෂාකොටපිරි සිදු අදහස් ඇතිබව දැන "යව මුන් මෙසේ මා නොකිවිස්සෙනත් උන් ගෙණා තෙනම ලාපියව"යි කියා අමරාදේවීන් යවා, නැවත තමන් වහන්සේ සන්නාලි වෙස්ගෙණ එදා රෑ උන්දගේ ලහටගොස් සැනපී දෙවන දවස් උදැසනක්සේ රජගෙට ගොස් උදුම්බරාදේවීන්ට සුදුසු කුමාරිකාවක් ගෙණාබව වදුළසේක. බිසවුන් රජ්ජුරුවන්ට එපවත් කියා අමරාදේවීන් පාමුදු පාඩගන් පාසලඹ පාදඟුලා ශිරෝඵාලා කණ්ණාභරණ ග්‍රීවාලඞ්කාර කෙපෝට්ටු සිරිකත් ආදිවූ සියලු යන්ත්‍ර ආභරණයෙන් සරහා, මහත් හිදෙළුවෙක හිදුවාලා, ඉක්බිති රජ්ජුරුවන්ගේ විධානයෙන් ඒසා මහත් සත්යොදුන් මියුලු නුවර නොයෙක් පරිද්දෙන් සරහා රන්ධජ නගා, විසිතුරුකොට සරහා නිමවනලද උතුම්වූ මඞ්ගලරථයෙක්හි වඩා 'රථයෙහි දේවීන් උන්හොත් කැලිබවත් එලලිබවත් මිට්බවත් රෑ ඇතිබවත් නැතිබවත් නුවරවාසීන්ට නොපෙණෙන්නේවේද"යි සිතා, දේවීන්ගේ රූපවිලාසය නුවරවාසී සියල්ලන්ම සුවසේ දක්නා පරිද්දෙන් රථයෙහි සිටුවා, දේවතාවන් හා සමග වීථියෙහි නවාගත් තරුණ දිව්‍ය යන්ත්‍රයෙකු පරිද්දෙන්

මහපෙළහරින් මහබෝයතානන්ගේ ගෙට ගෙණවුත් සරණපාවාදි මගුල් කළහ. රජ්ජුරුවෝ බොධිසත්වයන්වහන්සේගේ සරණ මගුලෙහි එකි එකී වයතුවෙන් දහසක් ගණන් මිළි වටනා පඹුරු යවූහ. රජ්ජුරුවන් ආදිකොට වාසල් බලන්නවුන්ඇතුළුව නොපල්ලන් දක්වාත් මියුලුනුවර වාසීන්ගෙන් පඬුරෙක් නොගෙණෙන්ය එකද සත්වයෙක් නැත. අමරාදේවිද රජ්ජුරුවන් යැවූ පඬුරු සමයේ දෙකක් කොට බෙදා, එක් භාගයක් ගෙට ගෙණ අනික් භාගය නැවත රජ්ජුරුවන්ට යැවූදය. මෙම ක්‍රමයෙන් උදුම්බරාදේවී ඇතුළුවූ නුවරවාසින් විසින් එවනලද සියලු පඬුරු සරියේ දෙකක්කොට බෙදා භාගයක් ගෙණ නැවත භාගයක් උන් උන්ටයවා, ඒසා මියුලුනුවරවාසින් හැමදෙනම එක දවසින් එක ඇසිල්ලෙන්ම සිත්ගත්හ. එවක් පටන් තුන්ලොවට ඇසක් වැනි මාගේ බෝධිසත්වයන්වහන්සේ අමරාදේවීන් හා සමගිවාසයෙන් වාසයකරණාස්ක් රජ්ජුරුවන්ට අර්ථයෙන් හා ධම්මයෙන් අනුශාසනාකළසේක.

ඉක්බිති එක්දවසක් සේනකපණ්ඩිතයෝ පුක්කුසාදි අනිත්තුන් දෙනා තමන් සමීපයට ආවුන් බණවා "පින්වත්නි අපි ගොවියා පුතු මහෞෂධපණ්ඩිතයාට නොසැහෙම්හ; දැන්වනාහි ගොවියාපුතුවිසින් තමාට වඩා වියත් අඹුවක් ගෙණෙනලද; කිසිවක් කියා රජ්ජුරුවන් කෙරේ ඌ බිදුවාපුව මැනව"යි කිහ. ආචාරින්වහන්ස අපි කුමක් කරමෝද නුඹවහන්සේම ඊට සුදුසු කාරණාසිතුවමැනවයිකිහ. 'වන්නාට නෙපි නොසිතව උපායෙක් ඇත; මම රජ්ජුරුවන්ගේ චූඩාමණිකාය සොරාගෙණෙම්, පුක්කුසයෙනි නෙපි රන්මාලාව ගෙණෙව; කාවින්දයෙනි නෙපි රජ්ජුරුවන් පොරවනා පලස ගෙණෙව; දේවින්දයෙනි නෙපි රන් මිරිවැඩිසහල ගෙණෙව"යි කිහ. මෙසේ ඔහු සතර දෙනම වඩාවෙන් යටකීවසතුසතර රජගෙන් පිටත්කොටගත්හ. ඉක්බිත්තෙන් "බොහෝදෙනා නොදන්වා ගොදියාපුතු ගෙටයවමිහ"යි කියා සේනකයෝ පළමුකොටම තමන් ගත් මැණික මොර*කළයක ඛහාලා, කෙල්ලක අතතබා "මොරකළය අනික්කෙණෙකුන්ට ගණිත්තොත් නොදී, මහෞෂධපණ්ඩිතයන්ගේ ගෙයි ඉදින් ගණිත්නම් මිළ නොගෙණ කළයෙන්ම දිපියා එව"යි කියාලායවූහ. ඒ කෙලී පණ්ඩිතයන්වහන්සේගේ ගෙදරටගොස් 'මොර ගණුව'යි කියා දුරටත් නොගොස් ඊ දුවටෙන්නීය. අමරාදේවී දෙර සිටි තැනැත්තෝ ඒ කෙල්ලගේ ක්‍රියාව දැක "මෝ අනික් තැනකට නොගොස් මෙතනම දුවටෙන්නීය, එක් කාරණයක් උවමනාවැ"යි සිතා තමන් ගෙයි කෙල්ලන්ට ඉඩිකොට ඔබ්බට යවා තුමූම "අම්ම මෙසේ එව මොර ගණුම්හ"යි ඒ කෙල්ල බණවා ඇ තමන් සමීපයට ආකල්හි, තමන්ගේ කෙලලන් අඩහා ආදිම කියාලූ හෙයින් නොඇසූ සේ තමන් සමීපයට

* මෝරුකළය යනු පුරාණ පොතෙහි.

නොඑන්නා "යව අපගේ කෙල්ලන් මෙතනට බණවා ලව"යි ඇම යවා, කලියෙහි අතලා ඇතුලේහි තුබූ මැණික දැක ලඟට ආ කෙල් ලට "මැන්යෙනි තෙපි කවුරුන් සම්පයෙහි සිට අවුදු"යි විචාරා "සේනක පණ්ඩිතයන්වහන්සේගේ කෙල්ලකිමි" කී කල්හි ඉක්බිති ඇගේද මවගේද නම් විචාරා "එසේවීනම් මොරදෙව"යි කියා "අම්ම නුඹදු මොරගන්නාකල මට මිලයෙන් කාරියකිම්ද කලයෙන්ම ගත මැනව"යි කී කල්හි 'එසේවීනම් යව'යි කියා ඇ යවා "අසවල් මස අසවල් දවස සේනකාචාරීහු තුවූ තමන්ගේ අසවල් කෙල්ල දුව අස වල් තැනැත්තිය අත රජ්ජුරුවන්වහන්සේගේ චූඩා මාණික්‍යය පණ යම් පිණිස එවූහ"යි පතෙක ලියාගන්හ. පුක්කුස පණ්ඩිතයෝ රන් මාලාව සමන්මල් කරඬුවක ලාලා සේනක ආචාරීන් යවූ ලෙසම යැ වූහ. කාවින්ද පණ්ඩිතයෝ පලස පලා පැසෙක ලාලා යැවූහ. දේවි න්දපණ්ඩිතයෝ රන් මිරිවැඩිසහල පිදුරු කැරැල්ලක් * ඇතුළේලාලා යැවූහ. අමරාදේවී උන් හැමදෙනා යැවූ දෙය හැරගෙණ, පතෙක වක දවස හා ගියවුන්ගේ නම් ලියා මහබෝසතානන්වහන්සේට සව රූප කියාලා නබාලූහ. ඒ සේනකාදි සතරදෙනම වසතු සතර උපා යෙන් බෝසතානන්ගේ ගෙට යවා රජගෙට ගොස් "කිමෙක්ද දේව යන්වහන්ස ඔබවහන්සේගේ ආභරණවූ චූඩා මාණික්‍යය නොපළඳ නාසේක්ද"යි විචාළහ. "පළඳිමි ගෙණෙව"යි කීහ. මැණික භාණ්ඩාගාරයේ සොයා නුදුටුහ. සෙස්සත් එසේමය. පණ්ඩිතවරු "දේව වයන්වහන්ස නොපළඳනාසේක්ද"යි කී කල්හි 'පළඳිමි ගෙණෙව'යි කියා එයින් භාණ්ඩාගාරයෙහි නුදුටුවාහ.

ඉක්බිත්තෙන් සේනකාදි සතරදෙනම "දේවයන්වහන්ස ඔබ වහන්සේගේ ආභරණ මහෞෂධ පණ්ඩිතයන් ගෙහිය, තුමූ එකිවසතු පළඳින්නාහ, දේවයන්වහන්ස ගොවියාපිත් නුඹවහන්සේට සතුරු ය"යි රජ්ජුරුවන් කෙරේ බෝසතානන් බිඳවූහ. ඉක්බිත්තෙන් එප වන් බෝසතානන්වහන්සේට වැඩපසස්නා මිනිස්සු † ගොස් කීහ. පණ්ඩිතයන්වහන්සේත් "රජ්ජුරුවන් දැක ඒ සවරූප දනිමි" රාජ සේවයට වැඩසේක. රජ්ජුරුවෝත් සේනකාදි දුජ්ජනයන්ගේ බස්අසා මහබෝසතානන්වහන්සේට කිපි "නොදකිමි, නුඹ අවුත් කුමක්කෙ රේදු"යි තමන් දැක්ක නුදුන්හ. පණ්ඩිතයන්වහන්සේ රජ්ජුරුවන් කිපිබව දැන "පලායන්ට සුදුසු කලැ"යි අමරාදේවින්ට සලකුණු දී අප්‍රසිඩ වෙශයෙන් නුවරින් නික්ම, දකුණු යවමැදුම්ගමට ගොස් කුඹල් ගෙයක කුඹල්කම්කොට වසනසේක. නුවර මුළුල්ලෙහිත් "මහෞෂධපණ්ඩිතයෝ පලාගියාහ"යි ඒකකෝලාහලව ගියේය. සේ නකාදිසතරදෙනම පණ්ඩිතයන්වහන්සේ පලාගියබවදැන කණස්සළු

* යවකැරැල්ල- † අඹිවාරකයන්-

නොවන්නේය, කිමෙක්ද අපිත් පණ්ඩිතවරු නොවමෝද”යි ඔවුනොවුන් නොදන්නාම අමරාදේවීන්ට පත්යවූහ; අමරාදේවී සේනකාදී සතරදෙනම යැවූ පත් අතට ගෙණ “අසවල් වේලාවට එනේය”යි කියා යවා, වෙන වෙනම උන් තමතමන්ට අවධිකළ වේලාවට ආ කල්හි, අල්වාගෙණ නොසැලෙන අඳුමට බඳවා ඉසකේ කප්පවා පරණ නානා ගෙයක හෙළිවා බොහෝ දුකට පමුණුවා පැදුරුමාළු හා පැස්මාලුවල හොවා එසා බන්දවා රජ්ජුරුවන්ට කියා යවා, ඒ පණ්ඩිතවරුන් සතරදෙනා හා සමග වසතු සතරත් ගෙන්වාගෙණ ගොස් රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිට “දේවයන්වහන්ස මහෞෂධ පණ්ඩිතයෝ සොරනොවෙති, ඔබවහන්සේගේ භාණ්ඩාර සොරකම් කළෝ මේ සතරදෙනය, මුන් සතරදෙනාගෙන් සේනකයා මැණික් සොරාය පුක්කුසයා රන්මාලා ගත්සොරාය, කාවින්දයා පලස්සොරාය දේවින්දයා රන්මිරිවැඩි සොරාය, අසවල් මස අසවල් දවස අසවල් කෙල්ලගේ දුව අසවල් තැනැත්තිය අත, මොහු සතරදෙන මෙකී වසතු මට පණුවම් පිණිස එවූය, මේ මා ලියා තුබූ පත් පත් බලා වදුලමැනව, ඔබවහන්සේ සතු මෙකී වසතු පාවාගත මැනව දේව යන්වහන්සැ”යි රජ්ජුරුවන් වැඳ ගෙටගියාහ. රජ්ජුරුවෝ බෝසතානන් නැතීගිය බැවින් උන්වහන්සේකෙරේ සැකයෙන්ද අනික් මන්ත්‍රීකෙණෙකුන් නැති බැවින්ද සේනකාදී පණ්ඩිතවරුන් සතරදෙනාට කිසිවක් නොකියා “නාපියා නොපගේ ගෙදරවලට යව’යි කිහ.

ඛජ්ජාපණ ප්‍රශ්නය.

ඉක්බිති රජ්ජුරුවන් දළුපුඩු සේසත අධිගෘහීත දේවතා දූ මහ බෝසතානන්ගේ කුරවික නාදයක් හා සමානවූ කටහඬ විහිදුවා වදාරන්නාවූ මිහිරි ධම්මදේශනාවෙහි ශබ්ද නොඅසන්නී “කිමෙක් නේහොය”යි පරීක්ෂාකොට ඒ කාරණය දැන “පණ්ඩිතයන් ගෙන්වන උපායක් කෙරෙම්” මධ්‍යම රාත්‍රියෙහි දළුපුඩු සිදුරෙහි සිට අඩි ශරීරයක් දක්වා දේවතා ප්‍රශ්නයෙහි.—

“හත්ථි හත්ථේහි පාදෙහි මුඛඤ පරිසුම්භති,
සචෙ රාජ පියෝ හොති කං තෙන මභිපස්සසි”

යනාදී ගාථා සතරකින් දක්වනලද ප්‍රශ්න සතරක් රජ්ජුරුවන් ගෙන් විචාළහ. රජ්ජුරුවෝ එහි අර්ථනොදැන සේනකාදී පණ්ඩිතවරුන් විචාරම්’ එක්දවසකට අවසර ඉල්වාගෙණ දෙවන දවස් ‘පණ්ඩිතවරු සතරදෙන එවත්ව’යි කියා යවා, පණ්ඩිතවරුන් විසින් “අපි මුඩු හිස් ඇරගෙණ වීථියට බස්නට වළඳ ඇතැම්හ”යි කී කල්හි පයි සතරක් විද්දවා යවා ‘නෙල ඉස ලාගෙණ එන්නේය’යි කියා යවූහ. ඒඉස්පයි ඇතිවූයේ එනැන් පටන්කොටල, පණ්ඩිතවරු ඉස්පයිඉසලා

අවුත් රජ්ජුරුවන් වැඳ පණවනලද අසුන් මත්තෙහි හුන්හ. ඉක්බිති රජ්ජුරුවෝ "සේනකයිනි ඊයේ රෑ මධ්‍යම රාත්‍රි වේලෙහි දළුපුඩු සේ සත වසන දෙව් දූ මා පැණයක් විවාළිය. මම එහි අර්ථ නොදන්නෙම්, පණ්ඩිතවරුන් විචාරම්, ඒ පැණය මට කියව"යි කියා 'හන්ති හන්ථේහි පාදෙහි' යනාදී පළමුවන ගාථාව කීහ. සේනකයා ගාථාව අසා "කිං හන්ති කං හන්ති"යි කියා කටවඅා දෙයක් දෙඩා කිසිවක් දැනගත නුහුණුවහ සෙස්සෝත් කිසිවක් කියාගතනොහි කරබා ගත්හ.

රජ්ජුරුවෝ දෙමිනස්ව, දෙවනදවස් රෑ දේවතා දූ විසින් "පැණ සතරෙහි අර්ථ දුටුදූ"යි විචාරණ ලද්දාහු "මා විසින් පණ්ඩිතවරුන් සතරදෙනාවිචාරණලද, උයිත් එහිඅර්ථ නොදත්හ"යි කීහ. දේවතාදූ "මූ හැමදෙනම කුමක් දනිද්ද? මහෞෂධ පණ්ඩිතයන් විනා අනික් මේ පැණය කියන්ට සමර්ථකෙණෙක් නැත, ඉදින් මහෞෂධ පණ්ඩිතයන් ගෙන්වා මේ පැණය උන්ලවා නොකියවුනම් මේ දිලියෙන යකුලෙන් තොපගේ හිස සත්පළුවක්කොට බිඳපියම්"යි රජ්ජුරුවන් භයගන්වා, "රජ්ජුරුවෙනි ගින්නෙන් ප්‍රයෝජනයක් ඇති කල්හි කණාමැදිරියන් පිඹින්නටද කිරෙන් ප්‍රයෝජනයක් ඇති කල්හි අහ අල්වාගෙණ දෑනටද සුදුසු නොවන්නේය"යි කියා ඛෙජ්ජාපණ ප්‍රශ්නයෙහි මේ මතු කියන කාරණා කීහ. "ගිනිනැතිව ගිනිසොයා ඇවිදිනා පුරුෂයෙක් දිලියෙන්නාවූ කඳෝපැණියෙක් 'ගිනිපුපුරකැ යිසිතා ඒ කඳෝපැණියා මත්තෙහි ගොමවැරටි හා තණරොඩු පොඩි පොඩිකොට ලාලා 'කණමැදිරියා ගිනිපුපුරකැ'යි යන විපරීත සලකුණෙන් දෙදන බිමඇන ඇස් පිපිරයනතුරු පිඹත්, ගිනිදල්වාගත නොහේද, එපරිද්දෙන් නුවණ නැතිහෙයින් නිරිසනුන් හා සමානවූ නැනැත්තේ උපායක් නැතිහෙයින් තමහට අභිවෘඩියක් නොලබන්නේය. පස මිතුරන්ට නිග්‍රහකිරීමෙන්ද සඞ්ගයෝ නොයෙක් වැඩට පැමිණෙන්නාහ. සේනාවට නායක අමාත්‍යයන්ගේ ලැබීමෙන්ද වැඩපසස්නා මිත්‍රයන්ගේ උපදේශයෙන්ද රජ්ජුරුවෝත් රාජ්‍යයට පැමිණ වාසයකරන්නාහ. තොපසේ නුවණැති අමාත්‍යයන් පලවා පියා නොවසන්නාහ. ගිනිතබා කඳෝපැණියන් පිඹින්නාසේද, ලොටතන තබා අහ ගෙණ කිරිඳෙනාසේද, තරාදිය තබාලා අහින් කිරණසේද, මේ නියා ගැටමුසු පැණ මහෞෂධ පණ්ඩිතයන් නොවිචාරා සේනකාදි පණ්ඩිතවරුන් විචාරන්ට ඒ කොල්ලෝ කුමක් දනිද්ද? උන්ම කඳෝපැණියන් හා සමවූය. ඉදින් නොපගේ පණ රකිනා කැමැත්තෙහිනම් ගල් මුදුනෙක දිලියෙන මහගිනිකඳසේ නුවණින් දිලියෙන්නාවූ මහෞෂධපණ්ඩිතයන් ගෙන්වා විචාරා මට පැණ සතරෙහි අර්ථ කියාලව, එසේ නොකෙළෙහි නම් "නොපගේ ජීවිතය නැතැ"යි රජ්ජුරුවන් භයගන්වා සැඟවී * ගියාහ.

---

* අනනඛානවි-

භූරි ප්‍රශ්නය.

ඉක්බිති රජ්ජුරුවෝ මරණ බියෙන් තැතිගෙණ දෙවනදවස අමාත්‍යයන් සතරදෙනෙකු කැඳවාලා "දරුවෙනි තෙපි සතරදෙන රථ සතරක නැගී නුවර සතරවාසලින් නික්ම, යම් තෙනකදී මපුතනුවන් මහෞෂධ පණ්ඩිතයන් දුටුනම් එතනදීම උන්ට සත්කාරකොට වහාකැඳවාගෙණ එව"යි කියා යවූහ. උන් සතරදෙන අතුරෙන් දකුණු වාසලින් නික්මුණු අමාත්‍යයා දකුණු යවමැදුම්ගම මහබෝ සතානන්වීහන්සේ මැටි ඇරගෙණ කුඹල් ආචාරින්ට සක වටා මැටි වැකුණු ඇඟින්ම පිදුරු බිස්සෙක හිඳ මිටි මිටි කොටගෙණ යවසාලේ බත් අනුභවකරන්නවුන් දුටුයේය. කුමක් පිණිස එබඳු දුකෙක්ගෙණ කුඹල් කම්මාන්තය කළසේක්ද"යි යනහොත්? මහෞෂධ පණ්ඩිතයෝ මහානුභාවඇත්තෝය, නිසැකයෙන් රාජ්‍යයගන්නාහ"යි සැකයක් රජ්ජුරුවෝ කලෝනම් "කුඹල් කම්මාන්තකොට ජීවත්වනු අසාසැක නොවන්නාහ"යි සිතා, මේ කාරණය පිණිස මෙබඳු දුකෙක් ගත්සේක. මහබෝසතාන්වහන්සේ රජ්ජුරුවන්ගේ අමාත්‍යයා දැක, තමන්වහන්සේ කැඳවා ආ බැව් දැන "මාගේ සම්පත පෙරපරිදෙදන්ම වන්නේය, අමරාදේවීන්විසින් ඉදිකරණලද අනගි රසඇති රසමසවුලෙන් යුක්තවූ බත්ම අනුභවකෙරෙමි" සිතා, අතින් ගත් බත්පිඬ හෙළා නැගීසිට අතකට සෝධාපියා සිටිසේක. ඒ ඇසිල්ලෙහිම අමාත්‍යයා ලහට ගියේය. ඒ වැලින් සේනක පණ්ඩිතයන් ලබ්ධි එකෙක, එහෙයින් මහබෝසතාන්වහන්සේට පණ්ඩිතයෙනි ඉසුරුමත් නැනැත්තේ උතුමැයි සම්බසක් ආචාරි කිවුනම්, ඒ සේනක ආචාරි කී බස සැබව; නොපගේ යසස පිරිහුනුකල්හි එබඳු නුවණ නොපට පිටිවහල්වන්ට නොපොහොසත්විය; දැන් මැටි වැකුනු ඇඟින් පිදුරුබිස්සෙක හිඳ මෙබඳු බතක් අනුභවකරව; ඉදින් නොපගේ වාදය සැබෑවීනම් යැසින් පිරිහුනු නොපට නොපගේ නොපිරිහුනු වීයෂ්ත් සිංහනි ශකතියත් පිටිවහල් උවමනාවේද"යි කීහ.

ඉක්බිනි මහතානන්වහන්සේ "නුවණ නැත්තව මම මාගේ නුවණ බලයෙන් නැවත ඒ මාගේ පිරිහුනු සම්පත මුහුකරවන්නෙම් මේ සැඟවෙනු මනා කාලයයි මේ පිළියමට මනා කාලයයි කල්නොකල් දැන, රජ්ජුරුවන් කිපුනුකල සැඟවීඇවිද සතුටුකල්හි එලිබැස, පෙර පරිද්දෙන් විදි සම්පතෙහි පිහිටවන පිණිස කුඹල් කම්මාන්තකොට මෙබඳු රසනැති යවසාලේ බත් අනුභවකරන්නෙම් විරියකරණයට කල් දැන, මාගේ නුවණින් පුරාතන සම්පතෙහි පිහිටා සැටයොදුන් රත්ගල්තලා මුදුනෙහි චිත්‍රමණයකරණ සිංහරාජයක්හුමෙන් අසම්භීතව හැසිරෙන්නෙම් දකුව"යි වදාළසේක; නැවත අමාත්‍යයා "රජ්ජුරුවන්ගේ සේසත වසන දෙව්දූ රජ්ජුරුවන් පැණ සතරක් විචාළිය;

රජ්ජුරුවෝ සේනකාදි පණ්ඩිතවරුන් සතරදෙනා විචාළහ, එක්කෙණෙකුත් ඒ පැණය කියාගත නුහුනුවහ; එසේ හෙයින් රජ්ජුරුවෝ නොප සම්පයට එවූහ"යි කීහ. එයේකල නුවණෙහි බල දුටුයෙහි වෙද? එසේවිට ඉසුරු සැපත් පිටිවහල් නොවන්නේ"යි මහතා නන්වහන්සේ නුවණෙහි ආනුභාව වර්ණනාකළසේක. අමාත්‍යයා "පණ්ඩිතයන් දුටුතැනදී නහවාපියා හන්දවාලා ගෙණ එව"යි කියා රජ්ජුරුවන් කී විසින් දුන් පිළිසඟළත් මසුරන් දහසත් මහබෝසතා නන්වහන්සේ අත නිබ්බයේය; කුඹලානොත් "මා මෙහෙ ගත්තේ මහෞෂධ පණ්ඩිතයන් අණ්නැ"යි සිතා බාගියහ. පණ්ඩිතයන්වහන්සේ "නොබව ආචාරිනි නොපි මට බොහෝ උපකාරිව සිටියහුය"යි අස්වසා, කුඹලාන්ට මසුදහසදි මැටි වැකුනු ඇඟින් රථයෙහි නිද, සිතුසේ වනයෙහි ඇවිද වසන තෙනට ගමන්ගත් හස්තිරාජයෙකු පරිද්දෙන්, නුවරට වැඩිසේක. ඇමතියා රජ්ජුරුවන්ට බෝසතා වහන්සේ වැඩි නියාව කීය. "පුත, පණ්ඩිතයෝ නොප විසින් කොයිදි දක්නාලදහුදැ"යි කී කල්හි, දේවයන්වහන්ස දකුණු යවමැදුම් ගම කුඹල්කම්කොට ජීවත්වෙති; ඔබවහන්සේ කැන්දූ එවූහයි අසමින් නොනාම මැටි වැකුනු ඇඟින් අවුය"යි දැන්විය. රජ්ජුරුවෝ "ඉදින් මට පසමිතුරුවිනම් සම්පතෙහි පිහිටා සේනාව ඇතිකොට ගෙණ ඇවිදිනි. මූ මට සතුරු නොවෙති" සිතා "මපුතනුවන් තමන්ගේ ගොස් ඉස්සෝධා නහා සර්‍වාලඞ්කාරයෙන් සැරහී මා දුන් පෙළහරින් දකින්ට එන්ට කියව"යි කීහ. එබස් අසා පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවන් කීලෙයම සැරහී සිවිරහ සෙනග පිරිවරා, විජයොත් මහපායෙන් සුදම් දෙවිසභාවට වඩනා දෙවිරජනන් පරිද්දෙන් අවුත්, රජ්ජුරුවන් විසින් 'එන්නේය'යි කීකල්හි රජගෙට වැද රජ්ජුරුවන්වැඳ එකත්පස්ව සිටිසේක. රජ්ජුරුවෝ බොධිසත්වයන් වහන්සේ හා සමග සුවදුක් දෙඩා පණ්ඩිතයන්වහන්සේ විමසන්නාහු "සමහර කෙණෙක් ඉසුරු සම්පතෙහි පිහිටා සිට මෙතෙක් සැපත් අපට ඇතැයි සම්පත් නසා පණිවා ආදී පව්නොකරන්නාහ. සමහර කෙණෙක් තමන්ට සැපත් දුන් උන්ට වැරැද්දෙයයි අනුන් බණන පිණිස පව් නොකරන්නාහ; සමහර කෙණෙක් කිසිවක් කරන්ට නොපොහොසත් හෙයින් පව් නොකරන්නාහ; සමහර කෙණෙක් නුවණ නැතිව අමන්ත්‍රීහෙයින් පව් නොකරන්නාහ; තෙපි බොහෝවූ අචින්තනයෙහි දක්ෂව සිතුවහොත් දසදහසක් යොදුන් දඹදිව රජ්ජුරුවන් මරා රාජ්‍යය ගන්නට පොහොසත්ව කුමක්නිසා මට නොවරැද්දූද? මරාපියා රාජ්‍යය නොගතුදැ"යි කීහ.

එබස් අසා මහබෝසතානන්වහන්සේ නුවණැත්තෝ තමන්ට සුව පිණිස පව්කම් නොහැසිරෙන්නාහ; යසසින්, පිරිහි කායික චෛතසිකදුකින් පෙළෙනලදුවත් එක්කෙණෙකුන් කෙරෙහි සෙනෙදසයෙන්

වේවයි, උරණින් වේවයි පැවත එන සුචරිත ධම්මය නොහරණහයි වදාළසේක; නැවතත් රජ්ජුරුවෝ බොධිසත්වයන් විමසන පිණිස රාජමායමක් කියන්නෝ මොළොක්වූ හෝ දරුණුවූ හෝ යම්කිසි කාරණයකින් සතුතෙමේ බැගෑවට පැමිණ තමා සම්පත පිහිටා, පසුව ආචාර ධම්මයෙහි හැසිරෙන්නේය"යි කීහ. ඉක්බිති බෝධිසත්වයන්වහන්සේ එසේ කී රජ්ජුරුවන්ට ගසක් උපමාකොට දක්වන සේක් "යම් ගසක් මුල සෙවන සැතපී යමෙක් හුන්නේවිනම් වේවයි වැද හොත්තේ හෝ සිටියේ හෝ විනම්, ඒ සැතපුනු ගස අත්තක් වේවයි සත්පුරුෂ තැනැත්තේ නොබිඳිනේය; ඉදින් බින්දේවීනම් පවිටු මිත්‍රද්‍රෝහිය"යි වදාරා "දේවයන්වහන්ස සැතපුනු රුක කොල අත්තක් පමණ කඩාපි මාත්‍රාවකින් මිත්‍රද්‍රෝහිවනකල, මපියානන්. වහන්සේටද බොහෝ සැපත් දී මාන් මේසා ඉසුරු පම්පතෙහි පිහිටුවාරහිමින් සිටි ඔබවහන්සේ කෙරේ වරදනා මම කෙසේනම් මිත්‍රද්‍රෝහි නොවෙමිද"යි සියලු සැටියේම තමන්වහන්සේ මිත්‍රද්‍රෝහි නොවනබව වදාරා රජ්ජුරුවන්ගේ සිත් ඝසරට යෝජනාකරණසේක් "යම් පුරුෂයක්හු සම්පයෙන් යමෙක්තෙමේ සුවල්පවූ කාරණයකුදු විචාරා දන්නේද; යම් නුවණැති කෙණෙක් තුමූ යමක්හට සිත උපන් සැකයෙක් දුරුකෙරෙද්ද; ඌ තුමූ සැකවිචාරාගත් තැනැත්ත වුට පිහිටව සිටීමෙන් පිළිසරණ වන්නාහ, සැක දුරුකිරීමෙන් ආචාර්‍ය්‍ය තනතුරෙහි සිට නුවණැත්තවුන් හා සත්පුරුෂ තැනැත්තේ විශ්වාසය නොහරණේය"යි වදාරා, දැන් රජ්ජුරුවන්ට අවවාදකරණ සේක්, "රජ්ජුරුවන්වහන්ස, පස්කම්සුව අනුභවකරණ ගෘහස්ථතෙමේ කුසීතවිනම් යහපත් නොවන්නේය; තමා විඳිනා ඒ පස්කම් සැප තරකොට නොහෙන්නේය; කායාදි සන්හිදිමක් නැති මහණද ඒ මහණ ධම්මය පුරාගත නොහෙන්නේය; එසේ හෙයින් යහපත් නොවෙයි. නොවිමසා සඞ්ග්‍රහ නිග්‍රහ කරන්නාවූ රජද යහපත් නොවෙයි; යම් නුවණැත්තෙක් තෙමේ කෝපවීනම් අමායෙහි වස බිහුවක් හුනුවා සේ ඔහුගේ සන්තානයෙහි පිහිටි සියලු ගුණම නස්නා හෙයින් එයින් උතුම් නොවන්නේය. දේවයන්වහන්ස රජතෙමේ පරීක්ෂාකාරිව රාජ්‍යය කරන්නේය; අපරීක්ෂිතව රාජ්‍යය නොකරන්නේය; පරීක්ෂිතව දශරාජධම්මයෙන් රාජ්‍යය කරන්නාවූ රජ්ජුරුවෝ යසස් පරවාර ගුණකීර්තිද ඒකාන්තයෙන් වඩන්නාහු"යි වදාළසේක.

මෙසේ වදාළකල්හි රජ්ජුරුවෝ මහබෝසතානන්වහන්සේ නාග නලද දළුපුඩු සේසත් ඇති රජඅස්නෙහි වඩා හිඳුවා, තුමූ මිටි අස්නෙහි හිඳ "පණ්ඩිතයෙනි සේසතෙහි වසන දෙවිදූ, මා පැණසතරක් විචාළිය; මම ඒ පැණ දැනගත නුහුනුයෙමි; මේ සේනකාදි පණ්ඩිත වරුන් සතරදෙනාට කීතැන උන්වත් නොවැටහිනා; පුන ඒ පැණ මට කියව"යි ආරාධනාකළසේක.

එදවස් මහබෝසතාණන්වහන්සේ සැට යොදුන් රත්ගල් මුදු නෙහි සිංහනාදකරණ අඟින කේසරසිංහයෙකුසේ "දේවයිනි සේස තෙහි වසන දේවතාවාවේවයි, චාතුම්මහාරාජිකාදිවූ සදිව්‍යලෝක යෙහි දේවතාවෝ වෙත්වයි සොළොස් බඹලොලෙහි බඹහු වෙත්වයි, යම් කිසි කෙණෙකුන් විසින් විචාරණලද්දාවූ පැණ තියුණු මුවහත් ඇති කඩුවකින් ඇඹුල මල් මිටියක් කපා වගුරුවන බල ඇති පිරිමි යක්හුමෙන්, මාගේ නිම්මලවූ නුවණ නැමති කඩුවෙන් පිරිසිදකියම් කියව දේවයිනි දෙව් දූ විචාළ පැණය"යි සඵාඥ ප්‍රවාරණයක් පරිද් දෙන් වදාළසේක. එදවස් මහබෝසතානෝ සවිනේ නොදත්තෝ නාම් කෙසේද? මතු ලොවුතුරා බුදුව සියලු සතුන් සිත සැක දුරු කොට ධර්ම සිංහනාද කිරීමට මේම දෘෂ්ටාන්ත නොවේද? වැලිකෙළි යෙහිදී එතෙක් පැණ විසඳූ ඒ මහනානන්වහන්සේට දැන් එක දේව තාවකු විචාළි පැණයක් විසඳීමනම් කවර අරුමයක්ද? ඉක්බිති රජ්ජුරුවෝ දේවතාදුව විචාළලෙසම කියන්නාහු.

මාතෘ ප්‍රශ්නය.

"හත්ථි හත්ථේහි පාදෙහි මුඛඤ පරිසුම්භති,
සබ්බෙ රාජ පියෝ හොති කන්තෙන මහිපස්සසි"

යනාදින් දක්වනලද පළමුපැණය කිහ.

(අනින් පයින්අණිති මුහුනටද අණිති, මහරජ (එසේ කල) ඉදින් ප්‍රියවේනම්, එයින් කවරෙකු දක්නෙහිද?)

මහබෝසතාණන්වහන්සේට ගාථාව අසමින්ම ආකාශයේ නගාලූ පුන්සඳ මඩලක්මෙන් අතීය අවබෝධවිය. ඉක්බිති බෝධිසත්වයන් වහන්සේ "අසව දේවයිනි" වදාරා යම් වේලෙක්හි මැනියන්ගේ ඇක යෙහි හොත්තාවූ ලදරුකුමාරයා කිරි බී ඔඩ පුරාගෙණ සතුටුව මැනි යන් හා සමග කෙළනේ, තමාගේ ලහෝපළුපන්සේ මොළකැවි අතින් මැනියන් මරන්නේද, ඉසකේ ඇද කඩන්නේද, මිටින් මැනි යන් මූන අන්නේද; එවේලෙහි වතුළ සඳරැසින් ඔදවැඩි කිරිමුහුදක් සේ සෙනහයෙන් ඔදවැඩියාවූ සිත් ඇති මැනියෝ පුතනුවන්ට "සෙ රගේ පුත මා කුමට මරන්නේද"යි යනාදි සෙනහවශයෙන් කියා සෙනහ දරාගන්ට අසමර්ථව දරුවන් සිපගෙණ ලෙහි හොවා ගණිති; මෙසේ ඔර හිද තමන් මරා කෙළනා වේලෙහි මැනියන්ට දරුවෝ ආදි ඇති ප්‍රේමයට වඩාලාම ප්‍රියවන්නාහ; පියානන්ටත් එසේම ප්‍රිය වෙති. මෙසේ නහෝ මධ්‍යයෙහි සූර්‍යම්ණ්ඩලය ඔසවා පාන්නාක්හු මෙන් ප්‍රශ්නය පහලකොට වදාළසේක. ඒ ප්‍රශ්න විසර්ජනය අසා දේවතා දූ දළිපුඩුසේසත් විවරයෙන් මැත්ව අඩි ශරීරයක් දක්වා "ප්‍රශ්නය වදාළ නියාව ඉතා යහපතැ"යි මිහිරි කටහඬින් ශබ්ද පවත්වා සත්රුවන් කරඬුවක දිවමල් දිවසුවදින් පුරා, මහබෝසතා නන්වහන්සේට පූජාකොට සැඟවී ගියාය.

බාල පරාය ප්‍රශ්නය.

රජ්ජුරුවෝද මහබෝසතාණන්වහන්සේට ගඳින් මලින් පූජා කොට දෙවන පැණයට ආරාධනාකොට "කියව දේවයේනි" වදාළ කල්හි—

"අකෙකාසති යථාකාමං ආගමෙච න ඉච්ඡති
සවෙ රාජ පියෝ හොති කං තෙන මභිපස්සසි."

යන ගාථාවෙන් දෙවන පැණය කීහ.

(මුඛ නොසැහෙනතෙක් ආක්‍රෝශ බෙණෙයි හෙවත් යදි; ඉන් කිසිවකගේත් ඒම නොකැමැතිය. මහරජ (එසේකල) ඉදින් ප්‍රියවේ නම්, එයින් කවරෙකු දක්නෙහිද?

ඉක්බිති රජ්ජුරුවන්ට බෝසතාණන්වහන්සේ "රජ්ජුරුවනි කකුල්දඬ ගොසින් කිදේ කට ලන්ට සමර්ථ සත්ඇවිරිදි පුතනුවන් විසින් "ඉදින් මට මේ මේ කැවුම් දුන්නේවිනම් යෙමි" කියන්නා "එසේද පුතණඬ"යි උන් කැමති කැවුම් ඉදිකොට දුන්කල්හි ඒ කැවුම් කෑලා "තොපි සිහිල් සෙවනේ හිඳුව, මම නොපට පිටතඇවිද මෙහෙවර කෙරෙමිද"යි කියා හස්තවිකාර මුඛවිකාරාදි නොයෙක් උසුළු පැපෑ, කී මෙහෙවර නොගොසින් සිටිනා පුතනුවන්ට, මැනියෝ කිපී මරන්ට දණ්ඩක් හැරගෙණ "මා සන්තක දෙය කාලා කුඹුරේ කුරුල්ලන් පමණ පලවාපියන්ට නොයෙයිද"යි භයගැන්වූකල වේගයෙන් දිවගත් පුතනුවන් ලුහුබැඳ අල්වාගන්ට අසමර්ථව සෝනට යේවයි බිල්ලට යේවයි සොරු නා කඩකඩකොට කපාපියත්ව'යි යනාදින් කියා කැමති පරිද්දෙන් කටහෙලන පමණක් හැවිලි අවන්නි යමක් මුඛයෙන් පෙණේනම් ඉන් සිහිත්නකුත් දරුවන්ට වන්නා නොකැමැත්තිය. ඒ කුමාරයා දවස මුළුල්ලෙහි කොල්ලන් හා එක්ව කෙළිපියා සවස ගෙට වදනට නොපොහොසත්වූයේ නැයන්ගේ ගෙටයන්නේය මැනියෝද 'දරුවෝ දැන් එත්දෙහෝ'යි පෙරමග බල බලා ඉඳ සවස්වනතුරු නොඑන්නා දැක "මා උරණ හෙයින් ගෙට එන්ට භය ඇතිව නොඑති" සිත ශෝකයෙන් පුරාගෙණ කඳුලුපිරුණු මුහුනින් යුක්තව නැයන්ගේ ගෙවල්හි බලන්නී පුතනුවන් දැක වඩාගෙණ සිපසනහාපියා දැනින් කරමකොට අල්වාගෙණ "පුත මා කිබසුත් සිතතබද්ද"යි ආදි ඇති ප්‍රේමයටත් වඩාලා ප්‍රේම උපදවන්නිය. මෙසේ දේවයිනි දරුවෝ මැනියන්ට කිසිකලෙ කත්වඩාලාම ප්‍රියවන්නාහ"යි වදාරා දෙවන පැණය විසඳ වදාළ සේක. දේවතා දූ පෙර පරිද්දෙන්ම සාධුකාර දී පූජාකළාය.

අඹු සැමි ප්‍රශ්නය.

රජ්ජුරුවෝද පූජාකොට තුන්වන පැණයට ආරාධනාකොට 'කියව දේවයිනි' වදාළ කල්හි;—

"අබහකඤ්ච අභූතෙන අලිකෙන මඝිසාරයෙ
සවෙ රාජ පියො හොති කතෙතන මඝිපසසසි.

යන ගාථාවෙන් තුන්වන පැණය කීහ.

(අභූතයෙන් බොරුබෙණෙයිද බොරුවෙන් චොදනා කෙරෙයිද, මහරජ (එසේකල) ඉඳින් ප්‍රියවෙනම්, එයින් කවරෙකු දක්නෙහිද?)

ඉක්බිති මහබෝසතාණන්වහන්සේ "දේවයිනි යම් වේලක අඹු සැමි දෙමහල්ලෝ රහසිගතව ලෝකඝාදරතියෙන් කෙළනාහු ඔවුනොවුන්ම 'නොප මාකෙරෙහි මදකුත් ප්‍රේමයක් නැත නොපගේ සිත බැහැරය'යි මෙසේ ඔවුන්ගොවුන්ට නැත්තක් කියද්ද බොරුවෙන් චෝදනා කෙරෙද්ද; එවේලෙහි ඔහු දෙමහල්ලෝ ඔවුනොවුන්ට අධිකව ප්‍රියවන්නාහ"යි තුන්වන පැණය වදාළසේක. දේවතා දූ පෙර සේම පූජාකළාය.

———ooo———

ශ්‍රමණ බ්‍රාහමණ ප්‍රශ්නය.

රජ්ජුරුවෝද පූජාකොට අනික් පැණයට ආරාධනාකොට 'කියව දේවයිනි' වදාළ කල්හි;—

"හරං අන්නාඤව පානඤව වත්‍ථු සෙනාසනානිච
අඤඤවත්‍ථු හරාසනන්නා,
තෙ වෙ රාජ පියා හොන්ති කං තෙන මඝි පසසසි".

යන ගාථාවෙන් සතරවෙනි පැණය කීහ.

(ආහාරපාන වස්ත්‍ර සෙනසුන් හැරගණිම්න් ඒකාන්තයෙන් හැරගණිති.මහරජ ඔව්හු ඉඳින් ප්‍රියවෙත්නම්,එයින් කවරෙකු දක්නෙහිද?)

ඉක්බිත්තෙන් රජ්ජුරුවන්ට"දේවයිනි මේ පැණයතෙම ධර්මිෂ්ඨවූ ශ්‍රමණ බ්‍රාහමණයන් සඳහාය; ඔවුන් තමන්ගේ ගෙදොර සිහා සිටිකල්හි තමන් විසින් පිළිගන්වනලද ආහාරාදිය පිළිගෙණ යන්නාද, ගොස් වළඳන්නාද දැක, අප සිහන්නාහ අප සන්තකවූ ආහාරාදිය ගෙණයන්නාහ; ගොස් අනුභවකරන්නාහයි ඒ ශ්‍රමණ බ්‍රාහමණයන් විෂයෙහි වඩාලාම ප්‍රේම ඇතිවන්නාහ; මෙසේ ශ්‍රමණ බ්‍රාහමණාදීන්, සැදැහැති උපාසක කුලය, තමන් විසින් දෙනලද්දවූ සතරපසය දැක්කදී අනුභවකරණ කල්හී, අධිකයක්ම ප්‍රියකරන්නාහ"යි සතරවන පැණය වදාළකල්හි දේවතාදූ පෙර පරිද්දෙන්ම පූජාකොට සාධුකාරදී

සත්රුවන් පිරූ රුවන් කරඬුවක් "ගණුව පණ්ඩිතයෙනි"යි කියා මහබෝසතාණන්වහන්සේගේ ශ්‍රීපාදමූලයෙහි පූජාකළාය. රජ්ජුරුවෝද පැහැද සෙනෙවිරත් තනතුරු දුන්හ. එතැන් පටන්කොට මහබෝසතාණන්වහන්සේගේ යසස මහත්වූයේය.

———ooo———

පඤ්ච පණ්ඩිත ප්‍රශ්නය.

නැවත ඒ සේනකාදී සතරදෙන "ගොවියාපුතු වඩාලා මහත් යසසට පැමිණියේය. කුමක් කරමෝද"යි මන්ත්‍රණයකළහ. ඉක්බිත්තෙන් සේනක පණ්ඩිතයෝ අනික් තුන්දෙනාට කියන්නාහු "ඌ මහතට පැමිණියෙන් කාරියකිම්ද? රජ්ජුරුවන් කෙරෙහි බිඳුවාපියන්ට මා විසින් උපායක් දන්නාලදු"යි කීහ. "කුමන උපායෙක්ද ආචාරිනි" කී කල්හි "ගොවියාපුතු සම්පයට ගොස් 'රහස්නම් දෙයකාට කිවහොත් යහපත්ද'යි විචාරම්හ. ඒ තෙමේ මහාමන්ත්‍රිහෙයින් 'කිසිවක්හට කියනොහැක්කැ'යි ඉදින් කියේවිනම්, ඉක්බිති 'ගොවියාපුතු දේවයන්වහන්ස ඔබවහන්සේට වරදනට සිටිය'යි බිඳුවාපියම්හ"යි කියා ඔහුසතරදෙනා සිංහරාජයෙකු සම්පයට යන්නාවූ ජරපත් ශෘගාලයන්සතරදෙනෙකු පරිද්දෙන් පණ්ඩිතයන්වහන්සේගේ ගෙට ගොස් සුවදුක් දැඩා 'පණ්ඩිතයෙනි පැණයක් විචාරම්හ'යි කියා බෝධිසත්වයන්වහන්සේ 'විචාරව'යි කී කල්හි සේනකයෝ පණ්ඩිතයෙනි පුරුෂයා විසින් ආදිකොට කුමක්හි පිහිටියයුතුද'යි විචාළහ. සබවසෙහි පිහිටිය යුතුයයි වදාළසේක. 'සබවත පිහිටියවුන් විසින් කුමක් කටයුතුද'යි විචාළහ. 'වසතු සෙවිය යුතුය'යි වදාළසේක. 'වසතු උපයාගෙණ කුමක්කටයුතුද'යි පිළිවිස්සාහ. මන්ත්‍රණය උගතයුතුයයි වදාළසේක. 'පසු කුමක් කටයුතුද'යි පිළිවිස්සාහ. 'තමා සිතරහස් කටයුතු අනුන්ට නොකිය යුතුය'යි වදාළසේක.

ඔහු සතරදෙන 'යහපත පණ්ඩිතයෙනි' සතුටු සිත් ඇතිව ගොවියාපුතු පිටුදකුම්හ'යි රජ්ජුරුවන් සමීපයට ගොස්, දේවයන්වහන්ස ගොවියාපුත් ඔබවහන්සේට වරදනට සිටියේය'යි කීහ. රජ්ජුරුවෝ "මම තොපගේ බස් නොඅදහම්, ඌ තුමූ මට නොවරදති නොගිවිස්සාහ. "දේවයන්වහන්ස අප කී බස් නොඅදහනසේක් විනම් උන් ඔබවහන්සේම දක්නට ආකල 'පණ්ඩිතයෙනි තමා සිත උපන් රහස් කටයුත්ත කාට කියයුතුද'යි විචාළමැනව. ඉදින් ඔබවහන්සේට සතුරු නොවෙත්නම් 'අසවළුන්ට කියයුතුය'යි කියති; ඉදින් ද්‍රොහි වෙත්නම් 'කිසිවක්හට නොකියයුතුය, මනදෙළ පිරුණුකල කියයුතුය'යි කියති. එවිට අපි අදහාගෙණ සැක හළමැනවයි කීහ. රජ්ජුරුවෝත් 'යහපතැ'යි උන් කිවා ගිවිස එක් දවසක් පණ්ඩිතවරුන් පස්දෙනා එක්ව අවුත් දැකලා උන් කල්හි රහස් කිය යුත්තන්

විමාරන්නාහු "පණ්ඩිතවරුන් පස්දෙනාත් එක්වූහ. ප්‍රශ්නයෙක් මට වැටහෙයි, ප්‍රශ්නය හැමදෙනම අසව; නින්දාකටයුතු හෝ ප්‍රශංසාකටයුතු හෝ රහසක් කවරක්හට කියන්නේද, රහස් කිවමනා කාටදැ"යි විචාළහ. මෙසේ කිකල්හි සේනකයෝ "රජ්ජුරුවනුත් අප හා එක්කොට ගනුම්හ"යි සිතා "පොළවට ඉසුරුවූ රජ්ජුරුවන් වහන්ස ඔබවහන්සේ අපට රක්ෂාස්ථානව සිටිසේක, අපගේ සියලු කාරිය භාරය උසුලා සිටිසේක; එසේ හෙයින් නුඹවහන්සේම ආදි කොට වදාළමැනව, ඔබවහන්සේගේ අදහස පරීක්ෂාකොට හෙවත් වදාළාක් අසා පණ්ඩිතවරු පස්දෙනාත් කියන්නාහ"යි කිහ. ඒ අසා රජ්ජුරුවෝ තමන් කෙලෙස් වසඟ හෙයින් "යම් ස්ත්‍රියක්නොමෝ ආචාරසීලයෙන් යුක්තද පුරුෂයන් කරා නොඑළඹෙන්නිද හෙවත් පතිව්‍රතාධර්මය රක්ෂාකරන්නිද පුරුෂයාගේ අදහස්දැන පවතීද්‍රියද මන වඩන්නිද එසේවූ තමාගේ අඹුවට නින්දාවටයුතුහෝ ප්‍රශංසාකට යුතු හෝ රහස් කියන්නේය"යි කිහ.

ඉක්බිති සේනකයෝත් "අපකෙරේ රජ්ජුරුවෝ ඇතුළත්වනලද හ"යි සතුටුව තමන්කළ කටයුත්ත ප්‍රකාශකරන්නාහු "යමෙක් තෙමේ දුකට පැමිණි ආතුරයාහට සරණව පිටිවහල්වේද එසේවූ දුකෙහි නොහරණ තමා යහලුවාහට රහස් කියයුතුය"කිහ. ඉක්බිති රජ්ජුරුවෝ "පුක්කුසයෙනි නොපට කෙසේ වැටහේද? රහස් කියයුතු කාටදැ"යි විචාළහ. පුක්කුසයෝ "දේවයන්වහන්ස යමෙක්තෙම තමාට වැඩිමහළුද නොහොත් මැදිබව සිටියේද නොහොත් කිස්දෙවුන්ද, ඉදින් එක කුසෙහි හොත් නැනැත්තේ ආචාරසීලයෙන් යුක්තවීනම් තමාටපැමිණි සුවදුක් දෙකෙහි කනස්සල්ල පසුබැස නොසිටිනම් එසේවූ තමාගේ හිතකාමිවූ මළුවේවයි බැයාවේවයි සහෝදරයාට රහස් කියයුතුය"යි කිහ. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ කාවින්දයන් විචාළහ. කාවින්දයෝද "දේවයන්වහන්ස යම් පුත්‍රයෙක් තෙමේ පියානන්ට වහලෙක්සේ මෙහෙවර කොටගෙණ වංශයත් රක්ෂාකෙරේද. (අතිජාත අනුජාත අවජාත පුත්‍රයෝ තුන්දෙනනම් කවුරුදැයි යතහොත්;-පියාගන්ට වඩා සැපත් රැස්කොටගෙණ ඵානාන්තරයට පැමිණෙන්නේ අතිජාතනම්වෙයි. පියාසතක වසතුව නසා ධූනීව වසන්නේ අවජානනම් වෙයි. පියා සන්තක සම්පත් ස්ථිර කොටගෙණ වංශයත් රක්ෂාකරන්නේ අනුජානනම් වෙයි) එසේවූ අනුජාත පුත්‍රද අලාමකවූ නුවණැත්තේද, එවෙනි නමාපුතුට රහස් කියයුතුයයි කිහ. ඉක්බිති රජ්ජුරුවෝ දේවින්දයා විචාළහ. දේවින්දයෝද 'දෙපා ඇත්තවුන්ට අධිපතිවූ රජ්ජුරුවෙනි, යම්මැනිකෙණෙක් තුමූ ප්‍රේමයෙන් යුක්තවූ සිතින් තමන් පුනනුවන්ට සියලු පෝෂ්‍ය කෙරෙද්ද? එසේ හිතකාමිවූ මැනියන්ට රහස් කියයුතුය"යි කිහ. සේනකාදි පණ්ඩිතවරුන් සතරදෙනා විචාරා රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයන් විචාළහ. ඉක්බිති පණ්ඩිතයන්වහන්සේ "රජ්ජුරුවෙනි

රහස් දෙයනම් නිඳුකටයුතුවත් කිම, ප්‍රශංසාකටයුතුවත්කිම, සැඟ වීමම උත්තමය; රහස්ප්‍රකාශකිරීම නුවණැත්තන් විසින් ප්‍රශස්තනොවන්නේය. තමා සිතූ දෙය මුදුන් නොපැමිණියේවීනම් නුවණැති සාර පුරුෂතෙම ඒතාක්කල්ම කිසිකෙණෙකුන්ට ප්‍රකාශ නොකරන්නේය, ඒසිතූ කටයුත්ත මුදුන් පැමිණියේවීනම් එවිට සභාමධ්‍යයෙහි කිසි සැකයක් නැතිව ප්‍රකාශකරන්නේය”යි වදාළසේක. පණ්ඩිතයන්වහන්සේ විසින් මෙසේ වදාළ කල්හි රජ්ජුරුවෝ නොසතුටුවූහ.

ඉක්බිත්තෙන් සේනකයෝ රජ්ජුරුවන්මුණ බැලූහ. රජ්ජුරුවෝත් සේනකයන් මුණ බැලූහ. බෝසතාණන්වහන්සේ උන් දෙන්නාගේ ක්‍රියාවදැක “මුන් සතරදෙන දුෂ්කියා පළමුව රජ්ජුරුවන්කෙරේ මාබිඳුවාපි වන්හ; පරිඤ්ඤාකරණපඤ්හ ප්‍රශ්නය විචාරණලද්දේවනැ”යි සිතූසේක. රජ්ජුරුවන්හා පණ්ඩිතයන් කථාකෙරෙමින් සිටියදීමහිරු අස්තයට ගියේය, රාජභවනයෙහිත් ඒඒ ස්ථානයෙහි වට විලක්කුවල පාහුන් නගනලද්දේය. පණ්ඩිතයන්වහන්සේ ‘රජ්ජුරුවන්ගේ කටයුතුනම් බැරිය, කුමක්වනබවත් නොදැනෙයි, වහා මෙතනින් නැඟී යනබව සුදුසුය”යි හුනස්නෙන් නැඟී රජ්ජුරුවන් වැඳ රාජභවනයෙන් නික්මෙනසේක්;–“මුන්සතරදෙනාගෙන් එක්කෙණෙක් ‘යහලුවහට රහස් කිම යහපත’; එක්කෙණෙක් ‘මල්බෑයන්ට රහස් කිම යුතුය’ එක්කෙණෙක් පුතනුවන්ට රහස් කිම යුතුය; එක්කෙණෙක් මැනියන්ට රහස් කිකල යහපතැ’යි කිහ. මුන්විසින් තමතමන්කළ දෙයක්වත් දුටු දෙයක්වත් කියනලද්දැයි සිතමි; වන්නාටය අදම ඒතත්‍වයත් දනිමි” සනිටුහන්කරමින්, ඔහු සතරදෙනද මෙතෙක් දවස් රජගෙන් නික්ම මාලිගා දොරකඩ එක් හඹු * හොරුවක්මත්තේ හිඳ කළමනාකටයුතු දැන තමතමන්ගේ ගෙවලටයන්නාහ. එසේහෙයින් මුන්ගේ රහස් හඹුහොරුව යට වැදහොත්තොත් දතහැක්කැ”යි සිතා ඒ හඹුහොරුව තමන්වහන්සේගේ මිනිසුන් ලවා උසුලුවා උඩනංවා යටසැතපෙනදැ අතුරුවා හොරුව යටවැද තමන්වහන්සේගේ පුරුෂයන්ට “නෙපි මුවාවසිට පණ්ඩිතවරුන් සතරදෙනා කථාකොට නැඟීඕයකල්හි අවුත් මාහැරගෙණයව”යි සම්මතකළසේක; ඔවුහුත් ‘යහපතැ’යි මුවාවගත්හ. සේනකයෝද “දේවයන්වහන්ස අපකිවක් නුඹවහන්සේ නොදහන සේක්වේද, දැන් අප කිවා ශ්‍රිබුද්ධියට නැඟේද”යි කීහ. රජ්ජුරුවෝ භෙදකාරීන්ගේ බස්ගෙණ පරීක්ෂානොකොට හයින් ත්‍රාසව “දැන් කුමක් කරමෝද සේනකයිනි” විවාළහ “දේවයන්වහන්ස කල්නොයවාම කිසිකෙණෙකුත් නොදන්නාලෙස නොවියාපුතු මරවාපිම යහපතැ”යි කීහ. “සේනකයිනි තොප විනා මට අනිකෙක්නැත තෙපිමනොපගේ මිත්‍රයන් හැරගෙණ වාසල්කඩ ඇලිසිට ගොවියාපුතු උදෘසන රාජසේවයට එමින් වාසල් ඇතුළුවූ විටම කඩුවෙන් ඉස කපාපියව”යි තමන්ගේ මගුල්කඩුව සේනකයන්අතට දුන්හ. ඔහුසතරදෙනාත් යහපත දේවයන්වහන්ස හය නූනමැනව

* බත–

අපි ගොවියාපුතු මරම්හ”යි කියා රජගෙන් නික්ම “අප විසින් පසම්තුරාගේ පිටු දක්නාලදු”යි කියා හඹු හොරුව මත්තේ හුන්නාහ

ඉක්බිති සේනකයෝ “කොල ගොවියාපුතු ගසන්නේ කවරෙත් දූ”යි කිහ. අනික් තුන්දෙන “ආචාරින් වහන්ස නුඹවහන්සේම ගැසුව මැනව”යි ඔහුටම භාරකළහ. නැවත සේනකයෝ ඉන් අනික් තුන්දෙනාට “තෙපි රහස් අසවළුන්ට කියයුතුයයි කිවුය. කිමෙක්ද තෙපි කළු දෙයෙක්ද නොහොත් දුටු දෙයෙක්ද ඇසූදෙයෙක්ද”යි විචාළහ. “ආචාරින්වහන්ස ඒ පසුකළමැනව, නුඹදැ ‘රහස් යාලුවාට කියයුතුය’යි යමක්වදළිසේක්විනම් ඒ නුඹවහන්සේ කළිදෙයෙක්ද නොහොත් දුටු දෙයෙක්ද ඇසූ දෙයෙක්ද”යි විචාළහ. සේනකයෝ “නොපට ප්‍රයෝජන කිම්ද”යි කිහ. “කිව මැනව ආචාරින්වහන්ස”යි කිහ. “මේ රහස් කටයුත්ත රජුරුවන් දනහොත් මාගේ දිවිනැත”යි කිහ. “නොබව මැනව ආචාරින්වහන්ස මෙතන නුඹවහන්සේගේ රහස් ප්‍රකාශකරණ කෙණෙක් නැත. සැක නොකොට කිවමැනව”යි කිහ. සේනක පණ්ඩිතයෝ හඹු හොරුවට නියපිටින් ගසා ‘මේ හොරුව යට ගොවියාපුතු ඇද්දේහෝ”යි කිහ. “ආචාරින්වහන්ස ගොවියාපුත් නමාගේ ඓශ්වර්‍යයෙන් මත්ව සුවවිදිනේ මෙබඳු අපවිත්‍ර නැනකට කුමට වදිද? නොවදිය. නුඹවහන්සේ කිවමැනවැ”යි කිහ. සේනකයෝ තමන්ගේ රහස් කටයුත්ත ප්‍රකාශකරන්නාහු “මේ තුවර අසවල් වෙශ්‍යාදුව හඳුනවිද”යි කිහ, “එසේය හඳුනම්හයි ආචාරිනි” කිවිය. “දැන් ඒ වෙශ්‍යාදූ පෙණේද”යි කිහ. “නොපෙණෙයි ආචාරිනි” කිහ. “එසේවීනම් එම්බා මම මගුල් සල්ලියනේදි ඈ හා සමග පුරුෂකෘත්‍යකොට හෙවත් සැනපී ඇගේ පලඳනා ලොහයෙන් ඈ මරාපියා ඇගේ හන් පොදියක් කොට බැඳගෙණ අපගේ ගෙයි අසවල් මාලේ අසවල් ගබඩාවේ බූවඅං කොක්කේ * එල්වාලිම් තව දක්වා ඉන් කිසිවක් අලෙවිකළේ නැත පරණව ගන්නාතුරු බලාහිඳිම් මෙබඳු රාජාපරාධ කටයුත්ත මාගේයාලුවෙකුට කිම්, ඌකිසි කෙණෙකුට නොකිවිරිය. මේ කාරණයෙන් ‘යාළුවාට රහස් කිය යුතුය’යි කියෙමුය”යි කිහ. පණ්ඩියන්වහන්සේ සේනකයන්ගේ රහස අසා සිත තබා ගත්හ. පුක්කුසයෝද තමන්ගේ රහස ප්‍රකාශකරන්නාහු “එම්බා මාගේ කලවයේ අසාධ්‍ය කිලාස කුෂ්ඨයක් ඇත්තේය. මාගේ මලනුවෝ උදයනක්සේම කිසිකෙණෙක් නොදන්වාම ඒ කිලාසය කසට පැනින් සොධාපියා බේත් ගල්වා මත්තෙහි මොලොක් කොට කඩරෙදි වසා බදනාහ. රජුරුවෝ මා කෙරෙහි මොලොක් සිතින් මෙසේ එව පුක්කුසයෙනි කැඳවාලා බොහෝසේම මාගේ කලවයෙහි ඉස තබාගෙණ සැනපෙන්නාහ. ඉදින් නොකටයුතු දත්තුනම් මා මරාපියන්නාහ; ඒ රහස් මාගේ මලනුවන් විනා අනික් දන්නා කෙනෙක් නැත; ඒ කාරණය හෙතුකොටගෙණ ‘රහස්නම් මල්බැයන්ට කියයුතුය’යි මා විසින් කියේය”යි කිහ.

---

* බිත්ති කොක්කේ.

කාවින්දයෝද තමන්ගේ රහස් ප්‍රකාශකරන්නාහු "එම්බා මා වරද, අව පසලොස්වක් දවස් නරදේවනම් යක්ෂයෙක් මා ඇඟට නැගෙන් නේය, ඒ යක්ෂයා නැගි කල්හි මම වියරුහුනු බල්ලෙකු පරිද්දෙන් හඬම්; මම ඒ යක්ෂවිකාරය මට ඇති නියාව මාගේ පුතනුවන්ට කිමි, උෆ මා ඇඟට යක්ෂයා ආවිෂ්ටවූබව දැන ඇතුළඟෙයි මා හුවැටී බැම් මෙන් බැඳ හොවාලා දෙර පියාගෙණ ගෙන් පිටත්ව මා හඬන බල්ල හඬ කිසිකෙණෙකුත් නොඅසනු පිණිස දෙරලඟ රහමඩුලු බන්ද අරගල කරන්නාහ. මේ කාරණය හේතුකොටගෙණ 'රහස් පුතනුවන්ට කියයුතුය'යි මා කියේය"යි කීහ. ඉක්බිති තුන්දෙනම දේවින්ද පණ්ඩිතයන්විසිවාළුහ. උයිත්තමන්ගේරහස් ප්‍රකාශකරන්නාහු"එම්බා ශක්‍රදේවේන්ද්‍රයන් විසින් කුසරජ්ජුරුවන්ට දුන්නාවූ ශ්‍රීසම්පත් එල වන්නාවූ මාණික්‍යරත්නය රාජපරම්පරාවෙන් පැවත අවුත් රජ්ජුරු වන් සන්තකව භාණ්ඩාගාරයේ තුබ්බවා මැණික් මටකම් කරන්නාවූ මාවිසින් සොරාපැහැරගෙණ මාගේ මැනියන්ට දෙනලද,කිසිකෙණෙකුත් නොදන්වා රජගෙට යන වෙලෙහි ඒ මැණික මට දෙන්නාහ, මම ඒ මැණිකින් ශොභාව මුණට පතුරුවාගෙණ රජගෙට යෙමි. රජ්ජුරුවෝ නොප හැමදෙනා හා කථානොකොට පළමුකොට මාහා සුවදුක් දෙඩන්නාහ. දවසක් පාසා අටකහවණුවක් හෝ දෙතිස් කහ වණුවක් හෝ සූසැට කහවණුවක් හෝ මසුරන් වියදම් දෙන්නාහ; ඉදින් ඒ මිණිරුවන සොරාගත්බව රජ්ජුරුවෝ දත්තුනම් මාගේ දිවි නැත, මේ කාරණය හේතුකොටගෙණ 'රහස්නම් මැනියන්ට කියයුතුය'යි මාවිසින් කියනලද්දේය"යි කීහ.බෝසතානන්වහන්සේ මේ හැමදෙනාගේම රහස්කටයුත්ත ප්‍රත්‍යක්ෂකොට සිත තබාගත් සේක. ඔහු වනාහි තමන්ගේ ලය පලා බඩවැල් පිටත්කරවන්නාවුන් මෙන් රහස් ඔවුනොවුන්ට කියා හැමදෙනම 'පමානොවව දැදැසනම එව ගොවියාපුතු මරම්හ'යි කියා හුන්නැනින් නැගිසිට තමන්ගේ ගෙවලට ගියාහ.

ඒ සේනකාදී පණ්ඩිතවරු ගියකල බෝධිසත්වයන්වහන්සේගේ පුරුෂයෝ අවුත් ඔරුව ඔසවා මහබෝසතානන් ගෙණ ගියහ. උන්ව හන්සේ ඉක්ඛෝධා නහා ගඳ විලවුන් ගෙණ සැරහි දිව්‍ය භෝජනයක් හා සමානවූ රසඉසවුලින් යුක්ත ආහාරය අනුභවකොට "අද මාගේ බ්‍රහ්මණියෝ උදුම්බරාදේවී රජගෙන් මට සඬරූප කියා අස්නක් එවති" දැන, "රජගෙන් ආ කෙනෙකුත් වහා ඇතුළට ඇරගෙණ මට පැල"යි කියා ඇදහිලි පුරුෂයෙකු වාසල සිටවූසේක. මෙසේ විධානකොට විවිත්‍රාස්තරණයෙන් විභූෂිතවූ සයන මස්තකයෙහි බ්‍රහ්ම කුමාර විලා සයෙන් සැතපුනුසේක රජ්ජුරුවෝද ඒක්ෂණයෙහි ශ්‍රීයහනෙහි සැතපු නාවූපණ්ඩිතයන්වහන්සේගේගුණසිහිකොට"මහෞෂධපණ්ඩිතයෝ

සත්ඇවිරිදිකල් පටන් මට සේවයකරන්නාහු, කිසි අවැඩක් නොකළහ, දේවතාදූ විචාළ පැණයෙහි පණ්ඩිතයානෝ නැතහොත්මාගේ ජීවිතය නැත්තේය. වෛරී පසම්තුරන්ගේ බස්ගෙණ "අසමානවූ නුවණැති මහෞෂධපණ්ඩිතයන් මරව'යි කියා මගුල්කඩුව දුන්නාවූ මා විසින් කෙළේ අයුකතිය, සෙට පටන්කොට එවැනි පණ්ඩිතරත්නයක් දක්නට නොලැබේ"යි ලය පැළියන පරිද්දෙන් ශෝක ඉපදූහ ශරීරයෙන් ඩා බිඳගත්තෝය. ශොකඃයන් මඩනාලද්දහු, චිත්තාඃඛවාදයක් නොලද්දහ. උදුම්බරාදේවි රජ්ජුරුවන් හා සමග එක්ව යහනෙහි ඉඳ' රජ්ජුරුවන් චිත්තාඃඛවාදයක් නොලැබ සැනපෙන්නාදක 'කිමෙක්ද්‍යෙහෝ මාගෙන් කිසි වරදෙක් ඇද්ද්‍යෙහෝ නොහොත් අනික් කිසි කාරණයෙක් රජ්ජුරුවන් සිතට උපන්ද්‍යෙහෝ"යි විචාරන්නාහු "රජ්ජුරුවෙනි තෙපි ඉතාම දෙම්නස්වූව, නොපතේසිතට නොහැනිලෙස මා කළු වරදක් නැත්තේය, අනික් කවුරුන්කළු වරදෙක් සිතට ගෙණද්‍යෙහෝ නොහොත් කවුරුන්ගේ විෂයෙහි නොපට ශෝකයක් ඇතිවිද ඒ මට කියව"යි කිහ. ඉක්බිති රජ්ජුරුවෝ "සොඳුර සේනකාදි පණ්ඩිතවරුඃතරදෙන "මහෞෂධපණ්ඩිතයෝ නොප මරාපියා රාජ්‍යය ගන්ට සිතති" මටකිහ. මා විසින් නඃඛය පරීක්ෂානොකොට "එසේවීනම් ඌ මරාපිය"වයි මඟුල්කඩුව අනට දිලා පණ්ඩිතයන් මරන්නට විධානකරණලද. ඒ කාරණය සලකන්නාවූ මම "මහෞෂධ පණ්ඩිතයන් මරණට පෙරතුකොට මට මරණවීනම් යහපතැ"යි උන්ගේ වාක් විෂයානි ක්‍රාන්ත ගුණ නුවණ සලකන්නෙමි "එවැනි පණ්ඩිතරත්නයක් සෙට පටන් නොදකිමි" සිත උපන් බොහෝ ශොකයෙන් දෙම්නසිමි" කිහ. එබස් අසා උදුම්බරා දේවීන්ට බොධිසත්වයන්වහන්සේ විෂයෙහි පඊතයකින් මඩනාලද පරිද්දකින් ශොක උපන්නේය.

ඉක්බිති "උපායකින් රජ්ජුරුවන්අස්වයමි' සලකා, රජ්ජුරුවන් නිදන්ටවත් කල්හි මාගේ මිලනුවන්ට සරූප කියා පත් යවමි"සිතා රජ්ජුරුවන්වහන්ස, ගොවියාපුතු මේසා මහත් ඓශ්වර්‍යයක පිහිටුවා තෙපිමවද ඇතිකළය, ඉතාප කෙරෙන්ම සෙනෙවිරත් ධුරයට පැමිණ, නොපටම දැන් වරදනට සිපියෝය; එම්බා පසම්තුරෝනම් කුඩානොවෙති, මැරිය යුත්තෝමය, නොපි නොසිනව"යි රජ්ජුරුවන් බිසව වචාවෙන් අස්වැසූහ. රජ්ජුරුවෝ බිසවුන් කී බසින් තුනිකරණලද ශෝක ඇතිව නිදන්ට වන්හ. බිසවි රජ්ජුරුවන් නිදන නියාව දැන, නැගිසිට ශ්‍රියහන් ගබඩාවට වැද, පතක් හා පන් බිදක්ගෙණ "මහෞෂධපණ්ඩිතයෙනි සේනකාදී පණ්ඩිතවරු සතර දෙන රජ්ජුරුවන්ට දූෂා කියා නොප බිඳුවාපිහ. රජ්ජුරුවෝ කිපී සෙට උදෑසනම තොප රජගෙට එන් වේලෙහි වාසලදී මරණ පරිද්දෙන් විධානකොට තමන්ගේ කඩුව සේනකයාට දුන්හ. සෙට රජගෙට නොඑව, ඉදින් එවිනම් නුවර මුළුල්ල අත්පත්කොටගෙණ

යුඩයක් වී නමුත් කරණ පරිද්ඳෙන් බලඇනිව එව"යි පත ලියා අකු
එවා අග්ගලාවක් පළා ඇතුළේ ලා නොපෙණෙනලෙස හුයකින් අග්
ගලාව වෙළා සුවඳ කවා සැළියක ලා තමන්ට වැඩපසස්නා කම්මිත්
තකට ගෙණ ගොස් මාගේ මලනුවන්ට දිලව'යි කියා දුන්හ. කම්මිත්
තින් බිසව කී ලෙසට කළිය. රැකවල් ඇතිතැන කෙසේ ගියාද'යි
නොසිනියයුතුය. රජපුරුවන් විසින් බිසවුන්ට පළමුකොටම 'කැමති
වේලක අමුත්තක් නොපගේ මලනුවන්ට යැවිව රැකවල් නැතැ'යි
වරදෙනලද. එසේහෙයින් කිසිකෙණෙකුත් නොවැළකුහ බෝධිස
ත්වයන්වහන්සේ බිසවුන් යැවූ පඬුරු සඬ්ඛ්‍යාත අග්ගලාව අතටගෙණ
'මා මේ පඬුරු ගත් නියාව බිසවුන්ට කියාලව'යි කියා කම්මිත්ත යැව්
සේක. ඔයිත් රජගෙට අවුත් යැවූ දෙය පණ්ඩිතයන්වහන්සේට දුන්
නියාව බිසවුන්ට කිව; එවිට බිසව් ගොස් රජපුරුවන් සමග සැතපු
නාහ.

බෝසතාණන්වහන්සේද අග්ගලාව බිඳ අතුලෙහි තුබූ පත කිය
වා එපවත් තත්වූ පරිද්දෙන් දැන ත්‍රුවර කළමනා කටයුතු මුළුල්ල
විචාරා, යහනෙහි සැතපුනුසේක. සේනකාදි සතරදෙන රාත්‍රිභාගය
වශියක්මෙන් දික්කොට සිතන්නාහු 'කවරවිටක පහන්වේදැහෝයි
වර්තකරණලද නිදි ඇතිව උදැසනක්සේම කඩුගත් අත්ඇතිව වා
සල ඇලි රැකසිට, පණ්ඩිතයන්වහන්සේ නොදැක දෙම්නස්ව බෝධි
සත්වයන්වහන්සේගේ මුළුලොව පතළ මෛත්‍රී නැමැති චණ්ඩවාත
යෙන් උදුරාදැමන ලද්දාවූ වෘක්ෂ සතරක්මෙන් රජපුරුවන් සමීපයට
ගොස්'කිමෙක්ද පණ්ඩිතවරුණි නොප විසින් ගොවියාපුතු මරණලද
දැ'යි කී කල්හි 'දේවයන්වහන්ස නුඹවහන්සේගේ ගොවියාපුතු නුදු
වුමු'යයි කිහ. මහබෝසතාණන්වහන්සේද හිරු නැගෙමින් සිටියදිම
සත්යොදුන් මියුළුනුවර මුළුල්ලම තමන්වහන්සේ වසහකොට, ඒ ඒ
ස්ථානයෙහි රැකවල් තරකොට ලවා, බොහෝදෙනා විසින් පිරිවරණ
ලදුව, සර්වාලඞ්කාරයෙන් සරහනලද උතුම් රථයානාවකට නැඟී,
මහත්වූහස්ත්‍යශ්වාදි පරිවාරයෙන්හා අනුපමවූ ශ්‍රීසෞභාග්‍යයෙන්උප
ලක්ෂිතව, රජගෙයි වාසල කරා වැඩිසේක. රජපුරුවෝ සිවිමැදුරු
කවිළුව හැරපියා බෝධිසත්වයන්වහන්සේ එන්නා බලාසිටියහ. ඉක්
බිති මහබෝසතාණන්වහන්සේ රථයෙන් බැසපියා එතනදීම රජපුරු
වන් වැඳිසේක. රජපුරුවෝ 'ඉදින් පණ්ඩිතයෝ මට පසමිතුරුවෙත්
නම් මා නොවඳනාහ'යි සිතූහ, මෙසේ සිතා ඉක්බිති 'මපුතනු එන්
නේය'යි වහා කැඳවා යවා රාජාසනයෙහි හුන්හ. මහබෝසතාණන්
වහන්සේද ගොස් එකත්පස්ව හුන්හ. සේනකාදි පණ්ඩිතවරු සතර
දෙනත් එතනම උන්හ.

ඉක්බිති රජපුරුවෝ බෝධිසත්වයන්වහන්සේට කිසිවක්ම නො
ද්න්නාකෙණෙකුන්මෙන් "පුත මහෞෂධ පණ්ඩිතයෙනි මා මෙසේ

කුමට හළුවාද? ඊයේ පෙර සන්ධ්‍යායෙහි ගියෙහිය, දැන් හිරු නැඟී මෙතෙක් වේලෙන් අවුත් මා දුටුව, කුමක් අසා තොපගේ සිතට කුම න සැකයෙක්වීද ? කවුරු තොපට 'රජ්ජුරුවන් දැක්මට නොළුව'යි කුමනබසක් කිවිදැයි යඩරූප අසන්නා කැමැත්තම්හ; එබැවින් තොප පමාවූ කාරණය කියව"යි විචාළහ. ඉක්බිති මහබෝසතාණන්වහන්සේ රජ්ජුරුවන්ට "දේවයන්වහන්ස ඔබවහන්සේ විසින් මට සතුරුවූ සේනකාදී සතරදෙනා බස් ගෙණ මා මරන්ට නියෝගකරණලද්දේ වේද, එසේහෙයින් නොඇයෙමි" රජ්ජුරුවන්ට චෝදනාකරණසේක් "ජනප්‍රධානවූ දේවයන්වහන්ස, ඔබවහන්සේ විසින් 'ප්‍රඥාසම්පන්නා මහෞෂධ පණ්ඩිතයෝ මැරිය යුත්තෝය'යි වෛරවූ සේනකාදින්ගේ බස්ගෙණ මා අපරීක්ෂිතව මරන්ට නියෝගකරණලදහ. යම්හෙයකින් ඊයේ මධ්‍යමරාත්‍රිවේලෙහි බිසවුන්වහන්සේට රහසිගතව කියනලදද; එබදුවූ නුඹවහන්සේගේ රහස්කටයුත්ත ප්‍රකාශකළුවිට මාවිසින් අස නලදැ"යි වදාළසේක. රජ්ජුරුවෝ ඒ අසාලාම 'මා විසින් කියනලද රහස එවිට තමා මලුට කියායවනලදැ'යි කිපී බිසවුන් මූණ බැලූහ.

රජ්ජුරුවන් බිසවුන්ට කිපිනියාව දැන, මහබෝසතාණන්වහන්සේ "දේවයන්වහන්ස බිසවුන්වහන්සේට කුමකට කිපෙනසේක්ද? මම අතීතානාගත වර්‍තමාන සඞ්ඛ්‍යාත කාලත්‍රය එතීනිවූ සියල්ලම දනිමි; දේවයන්වහන්සේගේ රහස් වනාහී මට දේවීන් විසින් කියන ලද්දේ වේවා; ආචාරී සේනකයන්ගේ හා පුක්කුසාදින්ගේ රහස් මට කා විසින් කියනලදද? මම උන්ගේ රහසුත් දනිම්මය'යි කියා සේන කයන්ගේ රහස් පළමුකොට වදාරණසේක් "දේවයෙනි, සේනකයා මේම නුවර අසවල් වෙශ්‍යාදුව මගුල්සල්ලයනේදී මරාපියා, ඇපලන් ආභරණ ඇගේම කඩේ පොදියක්කොට බැඳගෙණ අවුත් තමාගේ ගෙයි අසවල් තෙන තුබ්බේය; ඉක්බිති තමා කළ ලාමක පාපකර්මය තමාගේ එක් යහලුවෙකුට රහසිගතව කියා ඒ රහස්ද මා විසින් අසන ලද, මම දේවයන්වහන්සේට සතුරුනොවෙමි සේනකයා සතුරාය ඉදින් ඔබවහන්සේට පසම්තුරෙකුගෙන් කාර්‍යයෙක් ඇත්නම් සේ නකයා ඇල්ලුව මැනවැ"යි වදාළසේක. රජ්ජුරුවෝ සේනකයන් මූණබලා 'සැබෑද සේනකයිනි' විචාරා 'සැබව දේවයන්වහන්සැ'යි කී කල්හි ඔහු කර පය මස්වා සිරගෙයි ලන්ට විධාන කළහ.

පණ්ඩිතයන්වහන්සේද පුක්කුසයන්ගේ රහස් වදාරණසේක් "දේ වයන්වහන්ස මේ පුක්කුසයානම් රජදරුවන්කරා නොළුබිය යුතුවූ අසාධ්‍ය කුෂ්ඨරෝගයක් කලවයෙහි ඇති එකෙක; ඒ කුෂ්ඨරෝගය අතලන්ටත් පිළිකුල්වන්නේය, නුඹවහන්සේ 'පුක්කුසයාගේ කලිව මොළොකැ'යි බොහෝසේ උගේ කලවයෙහි ඉස තබාගෙණ සැත පෙනසේක් ඒ මේ වනයෙහි බැඳි කඩරෙද්දෙහි මොළුකය දේවයන් වහන්සැ"යි කියා "එසේ තමාගේ රහස මලුට කීයේය; ඒ රහස

කියනකල මා විසින් අසනලද්දේය"යි වදාළසේක. රජ්ජුරුවෝ පුක්කුසයන් මුණබලා 'සැබෑද පුක්කුසය'යි විචාරා 'එසේය දේවයන් වහන්ස'යි කී කල්හි උනුත් දහගෙයි ලැවූහ. පණ්ඩිතයන්වහන්සේ කාවින්දයාගේ රහස් වදාරණසේක් "දේවයන්වහන්ස යම් යකෘවිකාරයෙක් ඇතිවූකල්හි සත්තෙමේ වියරුහුනු බල්ලෙකුසේ හඬා ඇවිදිද, එසේවූ රජගෙවත් නොවැද්ද යුතුවූ නපුරු සවභා ඇති නරදේවනම් යකෘයෙක් අවපසලොස්වක්හි මොහුඅැහට නැගෙයි; ඒ යකෘයා ඇහට ආවිඤවූකල්හි උන්මත්ත සුනඛයෙක් මෙන් සතර පය බිම ඔබා ගෙණ මුළුල්ලෙහි අඬා ඇවිදිද, ඒ යකෘවිකාරය තමාට ඇති නියාව තමාගේ පුතුට රහස කියේය. ඔහු පුතුට ප්‍රකාශකළ නියාව මා විසින් අසන ලදැ"යි වදාළසේක. රජ්ජුරුවෝ 'සැබෑද කාවින්දය'යි විචාරා 'සැබෑය'යි කී කල්හි උනුත් දහගෙයි ලැවූහ. පණ්ඩිතයන්වහන්සේ දේවින්දයාගේ රහස් ප්‍රකාශකරණසේක් "දේවයන්වහන්ස ප්‍රභාවතී බිසවුන් නිසා, ඒසා යුඛයක් සජ්ජිතකොට ආ රජ්ජුරුවන් සත්දෙනෙකු 'මම සිංහසවර කුසරජය' යන වචන මාත්‍රයකින් පරාජයකොට ශත්‍රු සේනාවෙහි කිසිකෙණෙකුත් ඇටලේමැස්සෙකු බොන පමනත් ලේ පතක් නොසල්වා; ව්‍යඹ පවනකින් එකපැහැර වගුල තල්වනයක් පරිද්දෙන් විසංඥකොට හෙළා,යුඛයේ ජයලත්නුඹවහන්සේගේ මිමුත්තනුවන් කුසරජ්ජුරුවන්වහන්සේට සත්තුඤව, ශක්‍රදේවේන්ද්‍රයන් විසින් දෙනලද්දාවූ මහත්වූ මඩගල්‍යසම්මත අඤවඞ්ක මාණික්‍ය රත්නය ඔබවහන්සේගේ හා ඞ්ඩාරයෙහි තුබුවා දැන් දේවින්දයා අතට ගියේය. තමා මැණික සොරාගත් නියාව රහස්කොට මවට කීයේය; ඌ මවට කී රහසත් මා විසින් අසන්ලද; දේවයන්වහන්ස මම ඔබවහන්සේට පසම්තුරු නොවෙමි, මෙකී පණ්ඩිතවරු සතරදෙන ඔබවහන්සේට පසම්තුරෝය, පසම්තුරන්ගෙන් ඔබවහන්සේට කාරියෙක් ඇත්නම් මෙකී පණ්ඩිතවරුන් සතරදෙනා අල්වාගෙණ කැමැත්තක් කළමැනව"යි වදාළසේක. රජ්ජුරුවෝ 'සැබෑද දේවින්දය'යි අසා 'සැබව'යි කී කල්හි උනුත් දහගෙයි ලවාපිහ.

මෙසේ සේනකාදී පණ්ඩිතවරු "බෝධිසත්වයන්වහන්සේ මරම්හ"යි හැමදෙනම සිරගෙට වන්නාහ. බෝධිසත්වයන්වහන්සේද "දේවයන්වහන්ස තමන්සිත උපන් කටයුත්ත රහස මුදුන්පැමිණියොත් මුත් අනුන්ට නොකිය යුතුය කියේ මේ නිසාය"යි කීසේක. "අසවලුන් අසවලුන්ට රහස් කීම යහපතැ"යි කිවාහු මහත් විනාසයට පැමිණියෝයයි වදාරා මත්තෙහි ධම්මදේශනාකරණසේක් "මහරජ රහස් නම් දෙය සැඟවීම යහපත, නුවණැත්තෝ 'රහස් ප්‍රකාශකිරීම උතුමැ'යි නොකියන්නාහ; යම්නාක් තමාසිතූ දෙය මුදුන් නොපැමිණියේවීනම්, ඒනාක්ම නිධානයක්මෙන් නුවණැත්තේ ඉවසන්නේය; නිෂ්පන්නවූ අර්ථඇත්තේ කැමතිපරිද්දෙන් ප්‍රකාශකරන්නේය. තවද

දේවයන්වහන්ස විශෙෂයෙන්ම රහස් නොකියයුත්ත අසා වදාළ මැනව. මේ ලෝකයෙහි යම්තාක්මෝ හදවතක්සේ වෙසේ නුමුත් නුවණැත්තේ ගැණිටත් රහස් නොකියන්නේය. යමෙක් ආමිෂයෙන් සිත් ගතයුතුනම් එසේවූ තැනැත්තවුටද, යමෙක් සතුරුව මිතුරෙකු සේ මුඛයෙන් එකක් බැණ සිනින් එකක් සිතා නම් එසේවූ කුට සිත් ඇත්තාහටද, රහස් නොකියන්නේය. යම් අඥානයෙක් කිසිවක්හට ප්‍රකාශ නොකටයුතු රහස යමක්හට කීයේවීනම්, ඔහු මරතොත් ආක්‍රොශ පරිභව බණතොත් දුසයෙකු පරිද්දෙන් 'තමා කී රහස් ප්‍රකාශකළේවිනම් නුපුරැ'යි යන සිතින් සියලුනින්දම ඉවසන්නේය. තමා සිත උපන් රහස යම්තාක් දෙන දනිත්නම් ඒමනත්‍රණයකළාවූ එතෙක්දෙනා කෙරෙහිම 'මුන් විසින් ප්‍රකාශවේත්‍රෙහෝ'යි එතෙක්ම භය ඔහට උපදනේය. එසේහෙයින් රහස් කිසිවක්හට නොකියන්නේය. ඉදින් දහවල් රහස්මනත්‍රණයක් කරණු කැමතහොත් අවකාශයක් කරවාගෙණ හෙළි තැනකදී මනත්‍රණය කරන්නේය. ඉදින් රැමනත්‍රණයක් කරණු කැමතහොත් කන් සිමා නොයික්මවා උන්ගේ කණින් බැහැරට නෙප්ල නොවනලෙස සෙමෙන් ප්‍රකාශකරන්නේය. කුමක්හෙයින්ද්‍යයි යතහොත්, භිත්තිප්‍රාකාරාදි ප්‍රවිඡන්න ස්ථාන යෙහි සිටිකෙණෙක් ඇත්නම් මනත්‍රණය අසන්නාහ. එසේහෙයින් දේවයන්වහන්ස ඒ මනත්‍රණය භෙදවන්නේයයි වදාළසේක.

රජ්ජුරුවෝ මහබෝසතානන්වහන්සේගේ ධම්මකථාව අසා 'මෙවිහු තුමූම රාජද්‍රොහිව නිරපරාධවූ පණ්ඩිතයන් මට ද්‍රොහිකරන්නාහ'යි කිපී 'යව කොල මේ කොල්ලන් මරමරා නුවරින් පිටත්කොට වාසල්දොර සමීපයෙහි අගල ඔස්සේ ගෙණ ගොස් හුල හෝ හිඳුවා ඉස කපාපියා අගලට හෝ දමාපියව'යි නියමකළහ. උන් පිටතළහයා බැඳ සන්ධිසන්ධියෙහි සිටුවා කටු සැම්වියෙන් සියගණන් පහර ගසගසා මරන්ට ගෙණයන වේලෙහි පණ්ඩිතයන්වහන්සේ 'දේවයිනි මොහු තුමූ ඔබවහන්සේගේ පුරාතන අමාත්‍යයෝය, උන්ගේ වරද ක්‍ෂමා කළමැනව'යි රජ්ජුරුවන්ට වදාළසේක. 'යහපතැයි ගෙන්වා බෝධිසත්වයන්වහන්සේටම දස්කොට පාවාදුන්හ. උන්වහන්සේ වනාහි පණ්ඩිතවරුන් එතනදීම නිදහස්කළසේක. 'එසේවීනම් මාගේවිජිතයෙහි සිටිය නොහැක්කේය'යි රටින් නෙරණට නියෝගකළසේක. පණ්ඩිතයන්වහන්සේ 'නුවණැත්තන්ගේ වරද ක්‍ෂමාකළමැනව'යි දිව්‍යෞෂධයකින් අසාධ්‍යව්‍යාධියක් සංහිඳුවන්නාක්මෙන් තමන්වහන්සේගේ වචනෞෂධයෙන් රජ්ජුරුවන්ගේ කෝපව්‍යාධිය සංහිඳුවා ක්‍ෂමාකරවා උන්ගේ තනතුරු පෙර පරිද්දෙන් දෙවාවදාළසේක. රජ්ජුරුවෝ 'පසම්තුරන් කෙරෙහිදු මුන්ගේ මෛත්‍රිය මෙබඳුය, සෙස්සවුන්කෙරේ මෛත්‍රී කෙබඳු වන්නීද'යි පණ්ඩිතයන්වහන්සේට වැඩියක්ම යතුටුවූහ. එතැන් පටන්කොට සේනකාදී පණ්ඩිතවරු සතර

දෙන දලි උදුරාපු සර්පයන්මෙන් වැඩියක් ප්‍රභූශක්තියක් නැතිව බෝධිසත්වයන්වහන්සේට කිසිවක් කියන්ට අසමර්ථවූහ.

පරිබ්‍රාජක කථා නිමි.

එතැන් පටන්කොට පණ්ඩිතයන්වහන්සේම රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනාකරණසේක. උන්වහන්සේ "රජ්ජුරුවන්ට ධවලච්ඡත්‍රයමය; රාජ්‍යය විචාරන්නේනම් මම මය. එසේ හෙයින් මා විසින් නොපමාවියයුතුය"යි සිතා, සත්වයොදුන් මියුදුනුවර වටා, ක්ෂීරසාගරයෙන් නැගි තරඟගමාලාවක්සේ, ධවලවූ අට ලොස් රියන් පමණ උස මහා සීමාපවිරක් ලැවූසේක. ඒ පවිර ගාවා ඇතුළතින් තරය පිණිස මහාපදනමක්ද වටකොට සියගණන් සාරි ගෙවල්හා වටබඳ වෙව්වමිද ලවා, වාසලක් පාසා පිටත පුලිමුඛමිද ඒ ඒ ස්ථානයෙහි බලකොටුද කරවූසේක. සීමාපවිර වටා පිටතින් සුංසුමාර මකරාදී චණ්ඩමත්ස්‍යයන් විසින් ගහණවූ පළවිධ පද්මයෙන් සැදුණහා දියපිරුණු අගලක්ද, ඒ වටා කලල් අගලක්ද ඒ වටා පොලෝ අගලක්දැයි තුන්අගලක් බිඳවූ සේක. ඇතුළගෙවල මුළුල්ල කටුකෝල් ඇරවූසේක ඒ ඒ ස්ථානයෙහි මහපොකුණු බිඳවා එහි දිය පිරවූසේක. නුවර සියලු ගෙවල් වී පිරවූසේක. හිමාලවන ප්‍රදේශයෙන් කුලුපග තාපසවරුන් ලවා අරුණුවන් මඩහා ඇඹුල බිජුවට ගෙන්වා නැබ්බවූසේක. බොහෝකලක් රොන්බොර ගසා වැලිබේරා අශුඩ ඇල හෝ අදිය සකස්කරවා වාරිමාර්ගවල් සුණුමැටි කවා පිටිනුවරද සුන්බුන්තැන් පිරියම්කරවූසේක. මේ හැම කුමක්නිසාද යත හොත් මත්තෙහි සතුරන් විසින් වන බය වලකන පිණිසය. ඒ ඒ නුවරවලින් ආ වෙළඳුන් අතින් 'කොයිසිට අවුදැ'යි විචාරා 'අසවල් රටසිට ආමිහ'යි කීකල 'නොපගේ රජ්ජුරුවන්ට කුමක් ප්‍රියද'යි විචාරා 'අසවල් දෙය ප්‍රියය' යනු අසා ඒ වෙළඳුන්ට කළමනා සත්කාර කොට යවා තමන්වහන්සේ හා එකද උපන් යෝධයන් දහස බණවා "සබඳිනි මා දුන් පඬුරු ගෙණ දඹදිව එක්සියයක් රාජධානි යටගොස් මේපඬුරු නොපකෙරෙහි සෙනෙහස තබන පිණිස ඒඒ රජදරුවන්ට දීලා, ඒ ඒ රජදරුවන්ටම සේවාකම්කොට උන්ගේ කරණ ක්‍රියාවක්වත් බණන මන්ත්‍රණයක්වත් කියා එව එවා එහිම වසව; මම නොපගේ අඹුදරුවන් රක්ෂාකෙරෙමි, කියා සමහර රජදරු කෙණෙකුන්ට මැණික්මය කුණ්ඩලාභරණද, සමහර රජදරු කෙණෙකුන්ට රන් මිරිවැඩිද, සමහර රජදරු කෙණෙකුන්ට විසිතුරු මගුල් කඩුද, සමහර රජදරු කෙණෙකුන්ට රන් මාලාද, තමන්වහන්සේ තම අසුරුකොටා "යම් දවසක් මාගෙ කායෂ්යෙහි නිශ්ශාවෙක් වේද, එදවස් මේ අසුරු බැලුවන්ට පෙනේව'යි අධිෂ්ඨානකොට එක්සියයක් යෝධයන් අත යැවූසේක.

ඒ යෝධයෝ ඒ ඒ නුවරට ගොස් ඒ ඒ රජදරුවන්ට තම තමන් ගෙණගිය පඬුරුදී 'ඔබවහන්සේට සේවාකම් කරන්ට ආමිහ'යි කියා රජදරුවන් විසින් 'කොයිසිට අවිදැ'යි විචාරණලද්දාහු තමන් ආ නුවරතබා, අනික් නුවරක්ම කිවුය. ඒ රජදරුවන් විසින් 'යහපතැ'යි රඳවනලදුව සේවාකම් කරන්නාහු ඒ ඒ රජදරුවන්ම. ආත්ම සමාන වූහ. එසමයෙහි ඒකබලරට ශඛපාල රජදරුකෙණෙක් ආයුධසන්නාහ සැපයීම කරන්නාහ. සේනා රැස්කරන්නාහ. ඒ රජදරුවන් සමීපයෙහි සිටි යෝධයානෝ පණ්ඩිතයන්වහන්සේට "මේ රට රජදරුවෝ මෙසේවූ ප්‍රයෝගයක් කෙරෙති; කුමක්බවත් නොදනිම් සුදුසු කෙණෙකුන් එවා තබිය දනමැනව"යි එවූහ. ඉක්බිති මහබෝසතාන්වහන්සේ ගිරාපෝතකයන් බණවා "සබඳ ගොස් ඒකබලරට ශඛපාල රජදරුවෝ මෙනම් ප්‍රයෝගයක් කෙරෙති; දැනගෙණ දඹදිව මුළුල්ලෙහි ඇවිද ඒ ඒ රට පවත් දැනගණ එව"යි කියා විලඳ කවා මිපැණිපොවා, ශතපාක සහස්සපාක තෙලයෙන් දෙපියාගස්ස මැඩ, නැගෙණගිරි සිවිමැදුරු කවිළුව සමීපයෙහි සිට ගිරාපණ්ඩිතයන් හළිසේක. ගිරාපෝතකයෝද ඒකබලරට ගොස් ශඛපාල රජදරුවන්ගේ සමීපයෙහි සිටි යෝධයන් අතින් රජදරුවන්ගේ පවත් තන්වූපරිද්දෙන් දැනා, දඹදිව මුළුල්ල පරිඝාකරන්නාහු කම්පිල්ල රට උත්තර පඤ්චාල නුවරට පැමිණියහ.

චූලනී කේවට්ට කුමන්ත්‍රණය.

එ සමයෙහි උත්තරපඤාල නුවර චූලනිබ්‍රහ්මදත්තනම් රජදරුකෙණෙක් රාජ්‍යය කෙරේති, ඒ රජදරුවන්ට කේවට්ටනම් බමුණුකෙණෙක් ඇසීයෙන් ධර්මයෙන් අනුශාසනාකරන්නාහ. ඌතුමූ නුවණැත්තාහ, වියත්නාහ, ඒ කේවට්ටාචාරි එක්දවසක් තුමූ අළුයම්වේලෙහි පිබිද සුවද නෙලෙහි නහනලද පහන් ආලෝකයෙන් ගඬදුම් පුෂ්ප දුමාවලම්බිත නානාවණ්ණ විචිත්‍ර විතානොපලක්ෂිත අලඞ්කෘත ශ්‍රියහන්ගහීය බලන්නාහු, මහත්වූ සම්පත් දැක, "මේ මාගේ යසස කවුරුන් සන්තකදෝ?"යි සිතන්නාහු 'අනික් කෙණෙකුන් සන්තක නොවෙයි, චූලනිබ්‍රහ්මදත්ත නම් රජදරුවන් සන්තකය; මෙබඳු සම්පතක් දුන් රජදරුවන් සියලු දඹදිවට අගරජකළොත් යහපත; එසේ උවහොත් මමත් අග්‍ර පුරෝහිත වෙමි" සිතා උදෑසනක්සේම රජදරුවන් සමීපයට ගොස් රැදවස සුවයෙන් නිදිලත් පරිදි විචාරා "දෙවයන්වහන්ස කොටපියයුතු කථාවෙක් ඇතැ"යි කීහ. රජදරුවෝ 'කියව ආචාරීනි' කීහ. "දේවයන්වහන්ස ඇතුළුනුවරදී රහස් කියන්ට නොපිළිවන; මගුල්උයනට යමිහ"යි කීහ, රජදරුවෝ 'යහපත ආචාරීනි' කියා බමුණන් හා සමග උයනට ගොස් සේනාව පිටත සිටුවා,

වටකොට රැකවල් ලවා, බමුණන් හා සමග ඇතුළු උයනට වැද, මගුල්සල්වට හුන්හ. ගිරාපණ්ඩිතයෝ මේ ක්‍රියාව දැක "මේ එක් කාරණයෙක් උවමැනව, අද පණ්ඩිතයන්වහන්සේට කියයුතු කිසිවක් අසමි" උයනට වැද මගුල්සල්ගස කොල අතුර සැඟවී උන්හ. රජ්ජුරුවෝ බමුණන්ට 'කියයුතු රහස් කිව ආචාරීනි' කීහ. "දේවයන් වහන්ස ඔබවහන්සේගේ කණ මැතට නමාලුව මැනව, මේ මන්ත්‍රණය සතරකන් මන්ත්‍රණය වන්නේය. එසේහෙයින් ඔබවහන්සේගේ දෙකණ හා මාගේ දෙකණ හා මුත් අනික් කණකට නොයායුතු වන්නේය. ඉදින් දේවයන්වහන්ස මා කිවා කරණසේක්නම් සියලු දඹදිවට ඔබවහන්සේ අගරජකොටලම්" කීහ. චූලනිබ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද මහත්වූ රාජ්‍යලෝභයෙන් යුක්ත බැවින් බමුණන්ගේ බස් අසා "කියව ආචාරීනි නොපකිවාක් කරම්" කීහ. "දේවයන්වහන්ස අපි සේනාව රැස්කොට ගෙණ පළමුකොට කුඩා නුවරක් වටකොට ගණුම්හ; මම කුරුබිලියෙන් ඇතුළු නුවරට වැද ඒ නුවර රජ්ජුරුවන්ට 'දේවයිනි නොප හා අප හා සටන්කොට කායෂ්ක් නැත හුදක් අප නතුවව, නොපගේ රාජ්‍යය නොපට වන්නේය; සටන්කළෝනම් අපගේ සේනා වාහන මහත් සෙයින් ඒකාන්තයෙන්ම පරදුව'යි කියම්. ඉදින් මා කිලෙස නොකොළෝනම් සටන්කොට අල්වාගෙණ මරාපියා, උන්ගේ සේනාවත් හැරගෙණ අනික් නුවරකට යම්හ; ඒ නුවරත් එසේම සටන්කොට ගෙණ, ඉන් අනික් නුවරකැයි මෙම සැටියේම සියලු දඹදිව රාජ්‍යය ගෙණ 'ජයපානය අනුභවකරම්හ'යි කියා එක්සියයක් රජදරුවන් අපගේ නුවරට ගෙණවුත් උයනදී රාම ඛඩ්ලයක් සාදා උන් හැමදෙනා 'රාඛොන්නටය'යි රා මැඩිල්ලේ හිඳුවාලා, විෂ යොදා කරණලද්දාවූ රා අනුභවකරවා උන්හැම්දෙනාම ජීවිත විනාශයට පමුණුවා, ගඟදියට දමා, එක්සියයක් රාජධානි යෙහි රාජ්‍යය අත්පත්කොට ගණුම්හ; එසේකල්හි නුඹවහන්සේ සියලු දඹදිවට අගරජවනසේ කැ"යි කීහ.

රජ්ජුරුවෝ 'යහපනායි'ආචාරීනි නොප කිලෙසම කෙරෙමි'කීහ. "දේවයන් වහන්ස මේ මන්ත්‍රණය සතරකන් මන්ත්‍රණයනම් වෙයි; අනික් කෙණෙකුන් දනනොහැක්කේය. එසේහෙයින් කල් නොයවා යහපත් නැකතකින් වහා නික්මුණමැනවැ"යි කීහ. රජ්ජුරුවෝ යහපනැ'යි හිවිස්සාහ. ගිරාපෝතකයෝ ඒ මන්ත්‍රණය අසා නිමවා උන් දෙදෙනා මන්ත්‍රණයකොට අන්තයෙහි සාල්ලෙකලාලා පාතට බාන කෙණෙකුන්මෙන්, කේවට්ට බමුණා හිස වර්වස් පිඩක් හෙලා 'කිමෙක්ද'යි කට දල්වාගෙණ උඩ බැලූ නැනැත්තවුන්ගේ මුඛයේ නැවත වර්වස් පිඩක් හෙළා, 'ත්‍රින්' යන අනුකරණයෙන් හඬමින් කොලපා තෙන් උඩ නැඟී "කේවට්ටය තෝ තමාගේ මන්ත්‍රණය සතරකන් මන්ත්‍රණයයි සිතයිද? දැන්ම සකණකට ගියේය, නැවත අටකණකට

ගොස් පසුව සියදහසකට යන්නේය"යි කිහ. 'ගිරවා කොල ගනුව'යි කියදීම පවනට බදුවූ වේගයෙන් පියාසරකොටගෙණ මියුලුනුවරට ගොස්, මහෞෂධ පණ්ඩිතයන්වහන්සේගේ ප්‍රාසාදයට වන්හ.

———ooo———

ශුක පෝතක කථාව.

ඒ ගිරාපණ්ඩිතයන්ගේ මෙබඳු වතෙක් ඇත්තේය; ඉදින් කිසි නෙනකින් ගෙණා අස්නක් පණ්ඩිතයන්වහන්සේට පමණක් කියයුතු වීනම්, උන්වහන්සේගේ දසරුවට බස්නාහ. ඉදින් අමරාදේවිනුත් ඇසුව මනාවීනම් ඇකයෙහි ගොස් ඉඳිනාහ. ඉදින් බොහෝදනා ඇසුවමනාවීනම් බිමට බස්නාහ. එදවස් ගිරාපණ්ඩිතයෝ පණ්ඩිතයන්වහන්සේගේ දසරුවෙහි බැස උන්හ. ඒ සලකුණෙන් 'රහස බිණියයුතුය'යි බොහෝදෙන ඉවත්ව ගියහ. පණ්ඩිතයන්වහන්සේ සුවපෝතකයන් හැරගෙණ මතු මාළුනලයට නැඟී 'සබඳ නොපවිසින් කුමක් දක්නාලදද? කුමක් අසනලදද්ද'යි විචාළසේක. ඉක්බිති ගිරාපණ්ඩිතයෝ බෝධිසත්වයන්වහන්සේට "මම දේවයිනි සියලු දඹදිව අනික් රජදරුකෙණෙකුන් සම්පයෙන් කිසි භයක් නුදුටිමි, උත්තර පඤ්චාල නුවර චූලනිබ්‍රහ්මදත්ත රජදරුවන්ගේ කේවට්ට නම් පුරෝහිතයානෝ රජදරුවන් උයනට ගෙණගොස් සතරකන් මනත්‍රණයක් කළහ, මම මගුල්සල්ගස සල් අත්තක් ඇතුළේ සැඟවී ඉඳ මනත්‍රණය අසා නිමවාගෙණ කේවට්ට බමුණා කට වචිස් පඩක් එලාපියා ආම්" කියා සියලු තමන් දුටු දෙයත් ඇසූ දෙයත් පණ්ඩිතයන්ට දැන්වූහ. උන්වහන්සේ විසින් 'රජදරුවෝ ගිවිස්සෝද"යි විචාළකල්හි 'ගිවිස්නාලදය දේවයිනි' කීහ. පණ්ඩිතයන්වහන්සේ ගිරාපෝතකයන්ට කළමනා සත්කාරකොට හෙවත් මියෙන් ඇනූ විලද කවා මිපැන් පොවා බෙත් තෙලින් පියාසහල මැඩ මොලොක් ඇනි රිලි අතුරණලද රන් මැදිරියෙහි සතප්පා "කේවට්ටයා මා මහෞෂධ පණ්ඩිතබව නොදනී සිතම්; දැන් ඔහු කළ මනත්‍රණය මුදුන්පැමිණිය නොදෙමි"සිතා ඇතුළුනුවර හුන් දිළිඳුන් පිටත්කරවා පිටිනුවර ලැවූසේක. පිට රටින් දනවවලින් සතරවාසල නියම්ගම් සතරින් වයඹා භරණ ධන ධාන්‍යාදින් සමෘඩවූ ඉසුරුමතුන් ගෙන්වා ඇතුළුනුවර වැස්සූසේක. බොහෝ ධන ධාන්‍ය රැස්කරවූ සේක.

චූලනිබ්‍රහ්මදත්ත රජදරුවෝද කේවට්ටයින්ගේ බස් ගෙණ හස්ත්‍යශ්වාදී සෙනග පිරිවරා ගොස් එක් කුඩා නුවරක් වටලාගත්හ. කේවට්ට බමුණු තමා යටකී සැටියේම කුරුබිලියෙන් ඇතුළු නුවරට වැද කාරණා කාරණා ඒ රජදරුවන්ට කියා තමන් වසඟකොටගෙණ දෙසේනාව එක්කොටගෙණ අනික් නුවරක රජදරුවනැයි, මෙසේ චූලනි බ්‍රහ්මදත්ත රජදරුවෝ කේවට්ටාචාරීන්ගේ අවවාදයෙහි සිට

ඒ වේදේහ රජ්ජුරුවන් තබා සෙසු සියලු දඹදිව රජදරුවන් තමන් නාතුකළහ. බෝධිසත්ත්වයන්වහන්සේ විසින් ඒ ඒ රජ්ජුරුවන් සමීප යෙහි සිටුවනලද පුරුෂයෝද බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් විසින් 'අදවකට මෙතෙක් නුවර ගන්නාලදැයි පණ්ඩිතයන්වහන්සේ නොපමාවන සේක්ව'යි කියා නිරන්තරයෙන් හසුන් එවන්නාහ. උන්වහන්සේද ඒ යෝධයන්ට "මම මෙහි පමාවක් නැත්තෙමි නෙපි උකටලී නොව නොපමාව වසව'යි කියා යවනසේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ සත්හවුරුදු සත්මස් සත්දවසකින් වේදේහරජ්ජුරුවන්ගේ රාජ්‍යය තබා, සෙසු දඹදිව රාජ්‍යයන් ගෙණ කේවට්ට බමුණන්ට 'ආචාරීන් මියුලු නුවර වේදේහ රජ්ජුරුවන්ගේ රාජ්‍යය ගණුම්හ'යි කීහ. "දේවයන් වහන්ස මහෞෂධපණ්ඩිතයන් වසන නුවර රාජ්‍යයගන්ට නොපොහොසතුම්හ ඒ පණ්ඩිතයෝ වනාහි මෙබඳු නුවනැත්තාහ, ඉතාම උපායවන්තයහ"යි මෙසේ ඒ කේවට්ට බමුණු ආචාරි විහිතරකොට සාදම්බලෙහි අදනා කෙණෙකුන්මෙන් මහබෝසතාණන්වහන්සේගේ ගුණ රජ්ජුරුවන්ට කීහ. ඒ ආචාරි වනාහි තුමූත් උපායවත්හුමය. එසේහෙයින් "මියුලුනුවර රාජ්‍යයනම් ඉතා සුළුපය, සියලු දඹදිව රාජ්‍යය අපට සෑහෙයි, එක් රාජ්‍යයකින් අපිට කාරිය කිම්ද"යි උපායෙන් රජ්ජුරුවන් ගිවිසූහ. සෙසු රජදරුවෝ 'අපි මියුලුපුර රාජ්‍යය ගෙණම ජයපානය බොම්හ'යි කියන්නා කේවට්ට ආචාරි උනුත් කාරණා කියා වලකා "වෙදේහ රාජ්‍යය ගෙණ කුමක්කරමෝද? ඒ රජ්ජුරුවෝත් අප නතුවෝමය නවතුව'යි එක්සියයක් රජදරුවන් උපායෙන් ගිවිස්සූහ.

ඒ රජ්ජුරුවෝ කේවට්ටනම් බමුණානන්ගේ බස් අසා මියුලුනුවරට යන ගමන් නැවැත්තාහ. බෝසතාණන්වහන්සේට ඔබවහන්සේගේ චරපුරුෂයෝ "බ්‍රහ්මදත්තරජ්ජුරුවෝ එක්සියයක්රජදරුවන්පිරිවරා මියුලුනුවරට නික්මුණාහු නැවත තමන්ගේ නුවරටම නැඟී ගියහ'යි හසුන් එවූහ. බෝධිසත්ත්වයන්වහන්සේද ඒ පුරුෂයන්ට 'මෙතැන් පටන්කොට රජ්ජුරුවන් කරණ ක්‍රියාවන් දැන එවන්නේය'යි කියා නැවත අසුන් යැවූසේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද කේවට්ටයන් හා සමග "විෂමිශ්‍ර සුරාපානය අනුභවකරවා රජදරුවන් මැරීම් සඞ්ඛ්‍යාත ඒ කටයුත්ත දැන් කරම්හ"යි මන්ත්‍රණයකොට 'අපි ජයපානය බොම්හ'යි කියා මඟුල්උයන නදුන්උයනක්සේ සරහා, දහස්ගණන් කුඩම් ඵල රාපුරා තබ්බවා අනේකප්‍රකාර මසවුළු ඒඒ සථානයෙහි වලන්පුරා රැස්කොට තබව'යි අමාත්‍යයන්ට විධානකළහ. එපවත් පණ්ඩිතයන් වහන්සේට අන්තඃසර පුරුෂයෝ ක්‍රියා යවූහ. ඔහු වනාහි විෂ යොදා රජ්ජුරුවන් මරණ්හැමනි නියාව නොදනිති මහබෝසතාණන්වහන්සේ වනාහි ගිරාපෝතකයන් අත්න් ඇසුබැවින් දන්නාසේක. එසේහෙයින් උන්වහන්සේගේ අන්තඃසරයන්ට 'ජයපානය බොන දවස් නියමකොට කියා එව'යි නැවත අසුන් යවූසේක. ඒ යෝධයෝ වැළි

ලෙසම දවස් නියම් කොට යවූහ. ඒ අසා පණ්ඩිතයන්වහන්සේ "මා බදු පණ්ඩිතයෙණෙකුන් ජීවත්ව ගින්දැමි මෙනෙක් රජදරුවන් මිය යාම් යුක්ත නොවන්නේය; උන්ට මා පිටිවහල්වුව් මැනව" යි සිතා තමන්වහන්සේ හා එකදවස උපන් යෝධයන් දහස බණවා "සබ්බදිසි චූලනිබ්‍රහ්මදත්ත රජ්ජරුවෝ උයන සරහවා, එක්සියයක් රජදරුවන් පිරිවරා සුරාපානය අනුභවකරණ්ණ කැමැත්තෝල; තෙපි ඔබ ගොස් රජ්ජරුවන්ට අසුන් පණවාලූකල කිසිකෙණෙකුන් නොගිදිනාතුරුම් චූලනිබ්‍රහ්මදත්ත රජ්ජරුවන් හිඳිනට පැණවූ හස්නට ඉක්බිති පැණවූ මාහැනි අස්නක් අපගේ රජ්ජරුවන්ටය" යි ගෙණ ඒ රජදරුවන්ගේ සේනාව විසින් 'නෙපි කවුරුන්ගේ සේනාද' යි කීකල වේදේහරජ්ජරුවන්ගේ සේනාවමිහ' යි කියව. 'කුමක්ද අපි සත්අවුරුදු සත්මස් සත් දවසක්මුළුල්ලෙහි දඹදිව රාජ්‍යයගන්නමෝ' එක දවසකුත් වේදේහ රජ්ජරු කෙණෙකුන් නුදුටුම්හ; වේදේහරජ්ජරුවෝනම් කවුරුද? යව උන්ට උවමනාවිනම් කෙළවර අස්නක් ගණුව' යි නොපහා සමග කලහ කරන්නාහ. නෙපි බ්‍රහ්මදත්ත රජ්ජරුවන් විනා අපගේ රජ්ජරුවන්ට වැඩිතරම් කෙණෙක් නැතැයි කලහ වඩාගෙණ 'අපගේ රජ්ජරුවන්ට අස්න පමණකුත් නොලබන්නෝ දැන් නොප රාත් පිය නොදෙම්හ' යි මස්අවුළු ආදියත් කැනොදෙම්හ' යි වාසිබෙණම්න් සිංහනාදඇසූ මුවපොල්ලන්පරිද්දෙන්, නොපගේ අහිත ශබ්දයෙන්ම උන් භයගන්වා, යමුහුරු බාලා සියළු රා මස් පිරූ සැලවල් බිඳ නූ නූ කොටපියා වහා රාමස් අවුළු විසුරුවා, නොකැහැකි පරිද්දෙන් කොට, දිවීමෙන් ගොස් සේනාමධ්‍යයට වැද, ශක්‍රපුරයට වන් අසුරභටයන් පරිද්දෙන් මහත් අරාගලකොට 'අපි මියුලූනුවර මහෞෂධ පණ්ඩිතයන්ගේ යෝධයම්හ. පිළිවන්වීනම් අප අල්වාගණුව' යි නොප ගියබව අහවා එවයි කියා යෝධයන් දහස යවූසේක. ඒ යෝධයෝත් බෝධිසත්වයන්වහන්සේත් වදාළබස මුදුණෙන්පිළිගෙණ වැඳ සමුගෙණ දුනු මුගුරු අඩයට පත් කොහොල් පාරාවලලූයයියන පඤ්චායුධසන්නාඩවි උතුරු පසල්දනව්ව නුවරට ගොස් නදුන්ඵයන්මෙන් සරහණලද උයනට වැද, නගනලද දළුපුඩුසේසත් ඇති එක්සියයක් රාජාසන ආදිවූ පිළියෙලකොට නබනලද ශ්‍රීවිභූතීන් දැක, මහබෝසතාණන්වහන්සේ විසින් වදාරණලද නුවණෙන්ම සියල්ලකොට සේනාව මධ්‍යයට වැද බොහෝදෙනා සෙබාහකොට තමන්ගේ මියුලූනුවර වන්හ.

———ooo———

යු ධා ර මහ.

චූලනීරජද 'එක්සියයක් රජදරුවන් මරණ පිණිස, ශානිලා ඉදිකරණලද මෙබඳු සුරාපානය මහෞෂධ පණ්ඩිතයන් විසින් බාධාකළේය' යි කිපියේය. එක්සියයක් රජදරුවෝද 'අපට ජයපානය බිනහා නුදුන්හ' යි කිපියෝය. සේනාවද 'අපි නොමිළයේ බොන සුරාපාණය

නොලද්දම්හ'යි කිපියහ: බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද, එක්සියයක් රජදරුවන් බනවා "එව පින්වත්නි මියුලූනුවර ගොස් වේදේහරජ්ජුරුවන්ගේ ඉස තල්පැන්පකක් මඩනාසේ කඩුවෙන් කපාපියා දෙපයින් මැඩහෙණ හිඳ ජයපානය බොම්හ; සේනාව ගම්නට සැරසීහෙණ එනපරිද්දෙන් විධානකරව"යි කියා නැවතරහසිගතව කෝවිටයන් ටද එපවත් කියා "අපගේ මෙබඳු මන්ත්‍රණයකට බාධාකළාවූ පසම්තුරා ගණුම්හ; එක්සියයක් රජදරුවන් හා අටලොස් අක්ෂෞහිණියක් පමණ සේනාව පිරිවරා ඒ මියුලූනුවරට යම්හ; අප හා කැවිව එව ආචාරිනි"කීහ. බමුණානෝ තමන් නුවණැතිහෙයින් "මහෞෂධ පණ්ඩිතයන්දැ ගන්ටනොපිළිවන, ගියොත් අපට මහාලජ්ජාවන්නිය; කාරණාකියා රජ්ජුරුවන් නවතම්"සිතා රජ්ජුරුවන්ට "දේවයිනි මේ වේදේහරජහුගේ බලයෙක් නොවෙයි, මහෞෂධපණ්ඩිතයන්ගේ විධානය, ඌතුමු මහානුභාව ඇත්තාහ; ඒ මහෞෂධ පණ්ඩිතයන් විසින් රක්නාලද මිථිලානම් රාජධානිය සිංහයෙකු විසින් රක්නාලද රත්ගල්ගුහාවක් * පරිද්දෙන් වෙන කිසිකෙණෙකුන් විසින් ගන්නට නොහැක්කේය; ගියොත් හුදක් අපටම ලජ්ජාවන්නිය; ඔබ ගමන නොකමැත්තෙමය"යි මෙසේ කිහ. රජ්ජුරුවෝ වනාහි රාජමානයෙන්ද ඉසුරුමදයෙන්ද මත්ව දණ්ඩකින් පහරණලද සජ්ජරාජයකු සේ'කෝපයෙන් දිලිහි'ඒමහෞෂධයා කුමක්කෙරේද'යි කියා එසේම අභිමාන පුරස්සරවූ එක්සියයක් රජදරුවන් පිරිවරා, වේරම්බ වාතයෙන් හැළලිගිය මහාසාගරයසේ කෝපනැමති වාතයෙන් ඇලලිගිය අටලොස් අක්ෂෞහිණියක් සේනාවෙන් යුක්තව නික්මුනාහ. කේවට්ටයෝද තමන්ගේ බස් රජ්ජුරුවන් සිතට නංවාගතනොහි, රජ්ජුරුවන්ට පටහැනිවිම්නම් යුක්තනොවෙ'යි සිතා, රජ්ජුරුවන් හා සමග නික්මුනාහ.

බෝධිසත්වයන්වහන්සේ විසින් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ ජයපානය විධ්වංසනයකරන්ට එවනලද්දාවූ දහසක් යෝධයෝ තමන් ආකටයුතු සම්පාදනයකොට, එකදවසින්ම රාත්‍රිය මුළුල්ලෙහි ගොස් මියුලූනුවරට පැමිණ තමන්කළ කටයුතු පණ්ඩිතයන්වහන්සේට දන්වූහ. පළමු ඒ ඒ රජ්ජුරුවන් සමීපයට යවනලද්දාවූ චරපුරුෂයෝද පණ්ඩිතයන්වහන්සේට "චූලනිබ්‍රහ්මදත්තරජ්ජුරුවෝ 'වේදේහ රජ්ජුරුවන් ගණුම්හ'යි එක්සියයක් රජුන් පිරිවරා එන්නාහ. පණ්ඩිතයන් වහන්ස පමානොවනසේක්ව'යි හසුන් එවූහ. අද අසවල්තෙන ලැගුම් ගන්නාහ. අද එනාහි නුවරට එන්නාහ"යි පණ්ඩිතයන්වහන්සේට නිරන්තරයෙන් හසුන් එවන්නාහ. ඒ අසා මහබෝසතානන්වහන්සේ වඩාලාම කළමනා විධානයෙහි නොපමාවූසේක. වේදේහරජ්ජුරුවෝ වනාහි මේ නුවර ගන්ට එන්ලෂි පරම්පරා ශබ්දයෙන් ඇසූහ.

* මිණිලෙනක්.

ඉක්බිති බ්‍රහ්මදත්තරජ්ජුරුවෝ පෙර සඤ්ඤායෙහිම ගන්නලද්දාවූ ලක්ඛණයෙන් දඹුවැට පහන් ආලෝකයෙන් ගොස්, සියලු සත්‌යොදුන් මියුලුනුවර පිරිවරාගත්හ. කෙසේ වටකළෝදයත්? පළමුකොට පාපොළොන් අගල වහා, රන් සන්නාහ ලනලද්දාවූ රන් සැත් රන් පොරොදු ආදී හස්ත්‍යාලඞ්කාරයෙන් සරහනලද්දාවූ, සොඬින් ගන්නාමුග්ග රූඇනි ලෝහ ප්‍රාකාරවිනමුත් පිටින් ඇණ සුණුවිසුණුකරන්ට සමර්ථ ශක්තිඇති, දෙකපෝලය හා කෝෂය යන තුන්තැනින් වැහෙන්නාවූ එක් මදයකින්ද, යථොක්ත ස්ථාන තුණ හා දෙකන් සිදුරුහා දෙඇස් සිදුරුයස් යන සපත ස්ථානයෙන් වැහෙන්නාවූ එක් මදයකින්ද එම සපත ස්ථානය හා දෙනාසාපුටය ගුදමාර්ගීය යන දශ ස්ථානයෙන් වැහෙන්නාවූ එක් මදයකින්දැයි මෙසේ තුන්මදයහින් ගිලිහෙන්නාවූ සර්වාභරණයෙන් විභූෂිත ජයඅකුසුහා තොමරාදී ආයුධගත්අත් ඇතිව, පිටගිදිනා ඇතුරුවන්විසින් ගැවසීගත් ඒරජ්ජුරුවන්ගේ කෝපනැමති ගින්නෙන් නැගි දුම්කඳසේ, උස්වූ කන්තලින් කන්තල ගසාසිටුවනලද්දාවූ ඇත්වලල්ලකින්ද, යුඩයට ලනලද්දාවූ සන්නාහ ඇතිඅශ්වාලඞ්කාරයෙන් සරහනලද, සිඹු කාමේබාජ යෝනකාදි උත්තම දේශයෙහි උපන්නාවූ, නානා හරණ ප්‍රතිමණ්ඩිතාව සන්නාහ සන්නද්ධව පිටගිදිනා අසරුවන් විසින් ගැවසීගත් 'සතුරා හසුකොටගණිම්' ඔදවැඩියාවූ රජ්ජුරුවන්ගේ සිත් නැමැති ආකාශ ගහාවෙහි බිඳිබිඳි දිවන්නාවූ රළිපතරසේ, යුඩයට පිඹිනාලද කාහල ශබ්දයෙන් සතුටුව පැණ පැණ සිටිනාවූ ග්‍රීවයෙන් ග්‍රීවය ගසා සිටුවන ලද්දාවූ අස් වලල්ලකින්ද, සිංහ ව්‍යාඝ්‍ර ආදී සම් අතුරණලද්දාවූ රථාලඞ්කාරයෙන් සරහණලද නගණලද නානාවණී ධජපතති ඇති, සෛන්‍යව අශ්වයන් යොදනලද, සච්චාලඞ්කාරයෙන් සැරහී පිට බඳනාලද ගියවුරුඇනි නැගෙණලද ධනුර්ධරයන් විසින් උපලක්ෂිතවූ, සේනා නැමැති සමුදුයෙන් නැංගාවූ මහ තල්මස් කැලසේ, රියසකින් රියසක ගසා සිටුවනලද්දා රථවලල්ලකින්ද; "සිඛාණ්ඩිකුමාරයන් සමනිස් පෙරුම්පුරා මුළුකොටගෙණ, බෝධිදැමයක් පිරිවහල් ලදින් සත්තිස් බෝධිපාක්ෂික ධර්ම්ම සඞ්ඛ්‍යාත යෝධයන් බලකොටගෙණ, විදුරසුන් අරා, බුදුවන්ට උන්වෙලෙහි ජයගැන්ම පිළිවන් හෝ වේවයි නොපිළිවන් හෝ වේවයි දුරතඞ්ම අන්‍යතර ජාතියක අන්‍යතර යුඩයක් කොට බැලුව මැනවැ"යි සිතා, චූලනීරාජ ව්‍යාජයෙන් ආ වසවර්ත්තී මාරයාගේ සිංහමුඛ හස්තීමුඛ අශ්වමුඛ ව්‍යාඝ්‍රමුඛාදිවූ නොයෙක් භයඞ්කරවූ මුඛ මවා, අසි ශක්ති තෝමර හෙණ්ඩිවාල කරවාලාදීවූ දීප්තිමත් නානාවිධ අවි ගන්මින් අනේක ප්‍රකාර වේශයෙන් ආ දසබිම්බරක් මාරසේනාවයේ, භයඞ්කරවූ සේනායෙහි බාහුවෙන් බාහුව ගසා සිටුවනලද්දාවූ යෝධවලල්ලකින් දැයි මෙසේ සතර වලල්ලකින් ඒ සත්‌යොදුන් මියුලුනුවර වටලවා, ඒ ඒ ස්ථානයෙහි බලඇණි සිටුවූහ.

මනුෂ්‍යයෝ ඔල්වරහඬදෙන්නාහු අත්පොළුයන් දෙන්නාහු පණන් නාහු 'වටලාගනුම්හ' යන ගමාඩියෙන් නටමින් ගජිනාකරමින් සිටි ගත. අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාවෙහි නගණලද මිණි දඬුවැටෙහි ලක්ෂගණන් පහන් ආලෝකයෙන්ද එක්සියයක් රජදරුවන් හා හස්ත්‍යශ්වාදී සේනාව පලන් ආභරණයෙහි ආලෝකයෙන්ද සියලු සත්ත්වයොදුන් මියුලුනුවර, ඒ මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රඥා නැමති සූර්‍යයා පහළුව සත්වයන්ගේ සිත මෝහාන්ධකාර විගමනයෙන් හෙළිවූ කලක් පරිද්දෙන් ආලෝකවිය. ඇතුන්ගේ කුඤ්චනාදයෙන්ද අසුන්ගේ හේසාරවයෙන්ද රථයෙහි චක්‍ර * නාදයෙන්ද පාබලසේනායෙහි ගජිනාවෙන්ද, සක් සින්නම් හර තන්තිරිපට ගැට පහටු මහබෙර පනාබෙර රන්සක් රිදිසක් ආදිවූ පඤ්චාංගික තූර්‍යනාදයෙන්ද, පොළොව පැළියන පරිද්දෙන් වූසේය. සේනාකාදිවූ පණ්ඩිතවරු සතරදෙන මහත්වූ කෝලාහල සබ්දය අසා, කුමන අරගලක් බවත් නොදන්නාහු, වෙද්හරජ්ජුරුවන් සමීපයට ගොස් "දේවයිනි මහත්වූ කෝලාහල ශබ්දයක, අපි කුමක් බවත් නොදනුම්හ 'කුමන අරගලයෙක්ද'යි විමසුවහොත් යහපතැ"යි කීහ. එබස් අසා රජ්ජුරුවෝ 'යලි බ්‍රහ්මදත්තන රජ්ජුරුවෝ ආවනැ'යි සිවිමැදුරුකවි එව හරවා පිටත බලන්නාහු උන් ආ බැව් දැන භයින් ත්‍රස්තව "ඉතිකින් අපගේ දිවි නැත බ්‍රහ්මදත්තයා නෙමේ දැන් දැන් අප හැම මරන්නේය"යි සේනාකාදින් හා සමග කථාකරමින් හුනුහ.

මහබෝසතාණන්වහන්සේ වනාහි චූලනී රජ්ජුරුවන් ආබව දැන, සිංහයකුමෙන් කිසිභයක් නැතිව, නුවර මුළුල්ලෙහි රැකවල් සකස් කොට ලවා "රාජාදිහු භයින් දිලිඟිලා හිඳිති, මා උන් අස්වසාලුව මැනව"යි රජගෙයි මතුමාලට නැඟී රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිටි සේක. රජ්ජුරුවෝ මහබෝසතාණන්වහන්සේ දැක, ලබනලද අස්වස්ඇතිව 'මපුත්තනුවන් මහෞෂධ පණ්ඩිතයන් විනා අනික් මා මේ දුකින් මුදන්ට සමර්ථකෙණෙක් නැතැ'යි සිතා, පණ්ඩිතයන්වහන්සේ හාසමග කථාකරන්නාහු; -"මහෞෂධපණ්ඩිතයෙනිපඤ්චාලදේශවාසිවූ බ්‍රහ්මදත්තරජතෙම එක්සියයක් රාජධානියෙහි සියලු අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාව හා සමග ආයේය. පඤ්චාල රාජධානි සන්තකවූ මේ සේනාතොමෝ 'මෙතෙකැ'යි පමණ නැත්තීය. ඉතා මහත් වාරවිථාලසාලාදිවූ නොයෙක් කම්මාන්තයට පිටින් ගෙණෙන්නාවූ දුව පත්‍ර සහාලියම් වෙවිටම් ලැලි ආදිවූ දරුසම්භාරයන් ගෙණ ඇවිදිනාවඩු සෙනඟින් යුක්තව, සියලු සඞ්ග්‍රාමයෙහි දක්ෂවූ ඇතුන් අසුන් ආදිවූ බලසෙනඟ ඇත්තීය. ගහණ බැවින් තමා අතුරට වන් නවුන් නොපෙණෙන පරිද්දෙන් පය බිම ගැවියනොදී උරපිටින් ගෙණයන්නිය. හස්තිශබ්දය අශ්වශබ්දය රථශබ්දය වීණාශබ්දය මෘදඞ්ග

* ඛුම්ණයෙන්ද.

ශබ්දය ගීතශබ්දය තාලශබ්දය ,විදුව ගණුව අණුව'යි මෙසේ දශවිධ ශබ්දයෙන් යුක්තවූය, ඇතුන් ආදිවූ සිවුරඟ සෙනඟෙහි පවත්නා නාදය මුදුපරගාණසේ පවත්නාහෙයින් 'මුඹ එව ඔබ යව යුඩකරව පමා නොවව යනාදිවූ ඒ ඒ කටයුත්තෙහි නියෝග වචන වාග්භෙදයෙන් දන්වන්ට නොපිළිවන්හෙයින් මෘදඞ්ග මද්දලාදිවූ නානාප්‍රකාරභෙරි ශබ්දයෙන් හා ශඞ්ඛ කාහල ශබ්දයෙන් හඟවන්නාවූ ඒ ඒ කටයුතු ඇත්තිය. සත්රුවනින් විසිතුරුවූ සන්නාහයෙන් හා සුවණ්ණජාල හත්ථිකුම්භ විශෙෂයෙන්ද රාජ රාජ මහාමාත්‍යාදීන් පළඳනාලද්දාවූ කනක කටක රසනා නූපුර තාඩඞ්ක වලය තිසරපට අවුල්හර උදර බන්ධන ගැටනිමුල්හර පස්රෑ පස්වලලු පේරැස් එක්වැටි පාමුදු පාඩඟන් පාසළඹ පාදජාලා පාදත්‍ර පාදාභරණාදිවූ ශරීරාභරණයෙන් හොබනිය. කනක රජතාදින් විචිත්‍රවූ රක්ත නීලාදිවූ නානාවර්ණයෙන් සමූජ්‍රලිත රථාදියෙහි නගනලද නානාප්‍රකාර ධවලවර්ණ්‍ර පතාකයෙන් ගැවසිගත්තිය. ඇත්වාහණ අස්වාහණ රථවාහණයෙන් යුක්තය. හත්ථිශිල්පය අශ්වශිල්පය රථශිල්පය ධනුශ්ශිල්පය ආදිවූ අටලොස් මහා ශිල්පයෙහි කෙළ පැමිණියන් විසින් විශෙෂයෙන් සමාඩය. මේ සේනාතොමෝ සිංහසමාන වික්‍රම ඇත්තිය. සූර යෝධයන් විසින් සුප්‍රතිෂ්ඨිතය. මේ සේනාවෙහි පොළව හා සමාන නුවණ ඇති රහස් මන්ත්‍රණකරණ සුලුවූ, හෙවත් දෙදවසක් නතිවහිද සිතුවහොත් මහ පොළව පෙරලන්නටද අහස හා පොළව ගැටලන්ටද පොහොසත්වූ පණ්ඩිතවරු දසදෙනෙක් ඇත්නාහ. ඒ පණ්ඩිතවරුන්ට වඩා අධිකවූ ප්‍රඥාඇති රජ්ජුරුවන්ගේ මැනියෝ තලතාදේවි පණ්ඩිතවරුන් දසදෙනාට එකොලොස්වැනිව හිඳ, චූලනිරජ්ජුරුවන්ගේ සේනාවට අනුශාසනාකරන්නාහුය." "වැලිදු 'ඒ තලතාදේවින්ගේ ප්‍රඥාව කෙසේදයනහොත්; —

———ooo———

මාෂක විනිශ්චය.

එක් දවසක් මිනිසෙක් සාල්නැළියක්ද පලාඛත්මුලක්ද මසුරන් දහසක්ද හැරගෙණ 'ගහෙන් එතරයෙමි' ගහමැදට ගොස්, දිය සැඩ හෙයින් එතරවගතනොහි එතර සිටි මිනිසුන්ට 'පින්වත්නි මා අත සාල්නැළියක් හා බත් මුලක්ද මසුදහසෙක්ද ඇත, මෙකී තුණින් මට යමක් රුවිවිනම් ඒ දෙමි, නොප ඇමදෙනා කෙරෙන් යම් කෙණෙක් මා එතරකළහෙයිනම් ඌ මා එතරකෙරේව'යි මෙසේ කීය. ඉක්බිති සකතිසම්පන්න පුරුෂයෙක් * කඩිය තරකොට හැඳගෙණ ගහට බැස ඒ පුරුෂයා අල්වාගෙණ එතරකොට 'මට දියයුතු දෙය දෙව'යි කීය. ඒ තෙමේ සාල්නැළිය හෝ බත්මුල හෝ ගණිව'යි

* පටුවතක්.

කියේය. ඒ අසා දියෙන් එතරකළ පුරුෂයා "මම මාගේ ජීවිතය නොසලකා නොප එතරකලෙමි මට සාල්නැළිය හා බත්මුලින් ප්‍රයෝජනනැත, මසුදහස දෙව"යි කිය. ඒ අයමින් 'යමක් මට රුචිවිනම් ඒ දෙන්නෙමි, කියෙමි, දැන් මට යමක් රුචිවිනම් ඒ දෙමි කැමති හොත් ගණ්හව'යි කිය. එතෙමේ සමීපයෙහි සිටි එකෙකුට එපවත්කිය. එයින්, යමක් තමන්ට රුචිවී නම් ඒ නොපට දෙමි කියාවේද උන් කියේ; උන් දෙනුකැමති දෙයක් හැරගණ්හව'යි කියේය. ඒ පුරුෂයා උන්කී බසත් නොසිට 'එසේ මා ගන්නේ නැතැ'යි ඔහු ඇරගෙණ අධිකරණ නායකයන්ට සරුප කිය. අධිකරණයේ ඇත්තෝද දෙන්නාගේ බස් අසා 'උභ දැන් දෙයක් ගණ්හව'යි එලෙසම කිවුය. ඒ පුරුෂයා අධිකරණ නායකයන්ගේ යුක්තියෙහි නොසිට රජ්ජුරුවන්ට දැන්වීය; රජ්ජුරුවෝ අධිකරණ නායකයන් ගෙට ගෙන්වාගෙණ උන් මෑදයේ දෙන්නාගේ බස් අසා එම ලෙසම කියා යුක්තිය පසිඳිනාසේ නොදන්නාහු නමාගේ ජීවිතයෙහි ආසාවක් නැතිව ගහට බට තැනැත්තවුම පැරදවූහ. එවේලෙහි රජ්ජුරුවන්ගේ මෑනියෝ නලනාදේවී තුමූ එතනට නුදුරුනැනක හුන්නාහු රජ්ජුරුවන් යුක්තියනපුරුකොට පසුන්බව දැන 'පුත මේ යුක්තිය සලකාසියා කියව'යි කිහ. මෑනියන් වහන්ස මා දන්නේ මෙපමණෙක්මය; ඉදින් තුඹවහන්සේ අමූවා තක් දන්නාසේක්වීනම් පසිඳුව මැනව'යි කිහ. නලනාදේවී 'යහපත යුක්තිය පසිඳිම්' කියා ඒ දියෙන් යන්ට සිටි පුරුෂයා බණ්වා 'මේසේ එව දරුව නොප අන තුබ්බ සාල්නැළියත් බත්මුලත් මසුදහසත් තුණ පිළිවෙළින් බිම තබාලව'යි කියා පිළිවෙළින්ම තබවා 'නෝ දිඝයන් යන්නෙහි මුව කුමක් කීදැ'යි විචාරා 'මෙලෙස කිම්' කි කල්හි එසේ වීනම් තට රුචියක් හැරගෙණ යව'යි කිහ. එතෙමේ මසුදහස අතට ගත; ඉක්බිති උභ මදනැනක් ගියකල බිසව් උභ ගෙන්වා 'දරුව මසුදහස නොපට අභිප්‍රායදැ'යි විචාරා 'එසේය කැමැත්තෙම්' කිකල "දරුව නොප විසින් මින් මට යමක් රුචිවීනම් ඒ දෙමි මෝහට කිය නලදද නොකියනලදදැ"යි කියා 'කියනලදුයි දේවීන්වහන්ස කිකල 'එසේවීනම් මේ මසුදහස මෝහට දෙව'යි කිහ. ඒතෙමේ හඩමින් වල පමින් මසුදහස ඕහට දුන්නේය. එවේලෙහි රජ්ජුරුවෝද අමාත්‍යයෝද සතුටුව සාධුකාරදුන්හ. එනැන්පටන් නලනාදේවීන්ගේ නුවණ දඹදිව මුළුල්ලෙහි පහළවිය. මේ නියාව චූලනී රජ්ජුරුවන්ගේ මෑනියෝ නලනාදේවී එකොළොස්වනුව සේනාවට අනුශාසනා කෙරෙති කීයේ,

නැවත ඒ සේනාවෙහි පඤ්චාල රාජ්‍යයෙහි අනූනවූ ප්‍රධාන සම්පත් ඇති බ්‍රහ්මදත්තයා විසින් හැරගත් රට අයිති, මරණභයින් තැති ගත් එක්සියයක් රජදරුවෝ මේ චූලනීරාජ්‍යයා සමඟ යෙති, අටළොස් අක්ෂෞහිණියක් සේනාවෙන් මේ මිථිලානම් රාජධානිය වටලා, පළමුව ඇත්පවුරෙක, දෙවැනිව අස් පවුරෙක, තුන්වැනිව රථ පවුරෙකා

සතරවැනිව යෝධ පවුරෙකැයි මෙසේ සතර වලල්ලක් හා, අස් වලල්ලට අතුරෙහි එක් වීථියෙක, අස් වලල්ලට හා රථ වලල්ලට අතුරෙහි එක් වීථියෙක, රථ වලල්ලට හා බලි වලල්ලට අතුරෙහි එක් වීථියෙක, මෙසේ තුන්සඬියකින් වටකරණලද වේදේහරට වාසින්ගේ මිථිලානම් රාජධානිය හාත්පසින් කැණඋඩ නගණකලක් පරිද්දෙන් පවිරු පදනම් බිද දුන් දුන් සුණු විසුණු කරණුලැබෙයි; මහෞෂධ පණ්ඩිතයෙනි, හාත්පසින් යම්බඳු සේනාවක් පිරිවරණ ලදද ඒ සේනාවට මත්තෙහි පෙණෙන නොයෙක් සියදහස්ගණන් මිණිදඹුවැට පහන් කරණකොටගෙණ තරුවැලයෙන් ගහණවූ අව කාශය වැන්න පණ්ඩිතයෙනි නුවණනම් මෙසේවූ තැනටවේද: තොප හා සම නුවණැති කෙණෙකුත් නැත මෙසේ මහසේනාවෙන් අප ගැලවීමෙක් කෙසේවේද"යි කිහ.

මෙසේ රජ්ජුරුවන් මරණභයින් යුක්තව කියන්නාවූ බස් අසා මහ බෝසතානන්වහන්සේ"මේ රජ්ජුරුවෝ ඉතා මරණභයින් භයපත්ව ඝියාහ. රෝගයෙන් පෙළෙන එකක්හට අවසථා පිළියමක් දන්නා වෙදෙකු පිළිසරණ වන්නාසේද, සාදුකින් පෙළෙන එකෙකුට හොජ නයමුත් අනිකක් පිළිසරණ නොවන්නාසේද, පිපාසා ඇති එකෙකුට පැන්පොවාමුත් ඒ පිපාසය නොසන්හිඳෙන්නාසේද,මේ රජ්ජුරු වන්ට මා මුත් අනික් පිළිසරණක්නැතැ"යි සිතා, ඉක්බිති රජ්ජුරු වන්ට මහබෝසතානන්වහන්සේ සැටයොදුන් රන්ගල්තලා මස්තක යෙහි නාදකරණ සිංහරාජයෙකුමෙන් "නොබව මැනව දේවයන් වහන්ස රාජ්‍යසුව අනුභවකළමැනව, මම කැටක් ගෙණ කපුටු රැසක් පලවන එකක්හු මෙන්ද, දුන්නක් අල්වාගෙණ වඳුරු මුළුක් පලවන එකක් පරිද්දෙන්ද, මේ අටලොස් අක්ෂෝහිණියක් පමණ සේනාව බැඳබන් කඩ * පමනකටවත් අසාමික කරවා නිගණඨ සේනාවක් පරිද්දෙන් ඉස් ලූ ලූ අත ලුහුබඳවාපියම් එය මට භාරය; 'සටනෙකැ'යි සිතක් නොතබා භය නොගෙණ සුවසේ රාජ්‍යශ්‍රී අනු භවකළ මැනව"යි කීසේක.

මෙසේ කියා රජ්ජුරුවන් අස්වසාලා මාලිගාවෙන් බැස නුවර බෙර ලවා හැමදෙනාට වඳුරණසේක් "පින්වත්නි තෙපි හැම 'සතුරෝ වටලාගත්තෝවේද'යි නොසිතා මල් ගඳ විලවුන් හා අටලොස් වගී යේ කැවුම් හා රා මස් ආදි නොයෙක් අන්නපාන සපයා වස්ත්‍රාභරණ යෙන්සැරහී උත්සවයට පටන්ගණුව,සමහරකෙනෙක් නොප නොපට සුදුසු පරිද්දෙන් බොවනම් මහා පානයත් බොව, බෙරගසව, ගීකියව, එළසන් ඔල්වර සන් අසුරු සෑ දෙව, සියල්ලක් නැති කෙණෙකුන්ට මාගෙන් දෙම්,මහෞෂධපණ්ඩිතයෝනම් මමය.කිසිභයක් නොකරව,

* හන්කඩවත්.

මාගේ ආනුභාව බලව"යි කියා අස්වසා වදාළසේක, ඒ බසින් නුවර වාසිහු සත්අවුරුද්දේපටන් ඔබගේ බල තමන් ඇම ඉදුරා දන්නාහෙයින් කිසි භයක් නැතිව ශඞ්කා රහිතව නැටුම් ආදී සියල්ලෙන්ම මහා නානන් වදාළපරිද්දෙන් උත්සවයට පටන්ගත්හ. නුවර ඇතුලේනි ශිකියන වයන අරගල පිටත සිටි සතුරෝ අසන්නාහ. සතුරන්ගෙන් බොහෝදෙන කුරුබිලියෙන් ඇතුළු නුවරට වදනාහ. සතුරුව ආ විටෙක මුත්, දුටුදුටුවන් නොඅල්වන්නාහ. එසේහෙයින් සතුරන්ගේ සඤ්චාරය නොසිදෙන්නේය. නුවරට වන් වින් මනුෂ්‍යයෝ උත්සව කෙළනාත් ජයපානයබොන්නාත් ජනකෝලාහලත් දක්නාහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ අතුළුනුවර කෝලාහල අසා, සමීපයෙහි සිටියවුන්ට කියන්නාහු "පින්වත්නි අටලොස් අක්ෂෝහිණියක් පමණ මේ සේනාව ගෙණවුත් තමන්ගේ නුවර වටලාගත් නියාවට කිසි භයක්වත් නැතිගැන්මක්වත් නැත්තේය; සතෙන්ෂයෙන් යුක්තව පස්වණක් ප්‍රීතීන් පිණාඟියවුන් සේ අත්පොළසන් දෙන්නාහ, අඩගසන්නාහ, එළ සන්දෙන්නාහ, ගී කියන්නාහ, බෙරගසන්නාහ, කොල කුමන ආශ්චර්යඥයෙක්ද"යි කිහ. එසේ කී රජහට චරපුරුෂයෙක් බොරුවක් ගොනාගෙණ කියන්නේ 'දේවයන්වහන්ස මම කිසි කටයුත්තක් නිසා කුරුබිලියෙන් ඇතුළුනුවරට වන්නෙමි සැණකෙළි කෙළනා ජනයන් දැක විචාරන්නෙමි 'පින්වත්නි සියළු දඹදිව රජදරුවන් සේනාසහිතව අවුත් තොපගේ නුවර වටලාගෙණ සිටියදී, තොප හැම මෙසේ ප්‍රමාදව වසන්නට කාරණාකිම්ද'යි විචාළෙමි; ඔහු මට කියන්නාහු අපගේ රජ්ජුරුවන් කුමාරකල මෙසේවූ දෙලෙක් විය; කෙසේදයත්? දසදහසක් යොදුන් දඹදිව රජුන් මුළුල්ල සේනාව පිරිවරා අවුත් මා උන් නුවර පිරිවරා සිටිකල සැණකෙළි කෙළිම් දෙලෙක් උපන; එබැවින් ඒ දෙළ දැන් මූදුන් පැමිණියේය: එබැවින් 'සත් දවසක් සැණකෙළි කෙළුව'යි නුවර බෙරලවා තමන්වහන්සේ මාලිගාවේ මතුමහලේ අමාත්‍යම ඉඬුලයා පිරිවරාගිඳ මහ සතෙන්ෂයෙන් මත්ව ජයපනය බොනසේක් මේ රජ්ජුරුවන් හා සේනාව ආ නියාව ඔබ තමා දන්නාසේක්ද'යි කීහ. මම එබස් අසා 'රජෙකු බොලඳ නියාය'යි නින්දාකළෙමි"කීහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එබස් අසා දණ්ඩන් ගසනලද ආශීවිෂයක්හුමෙන් ක්‍රෝධයෙන් දිලිහි කිපුනාහු "කොල වහා මේ නුවරට ඒ ඒ දිගින් අගල මැඩහැස්වා පවුරු දෙරටු අටලු වාසල් බලකොටු ආදි බිඳ සුණුවිසුණු කෙරෙමින්, වහා නුවරට වැද ගැල්පුරා ගෙණවුත් කොමඩු බානසේ මහජනයන් ඉස් කපාගෙණ, වේදේහරජහු ඉසත් වහා ගෙණෙව"යි කීහ.

එබස්අසා බලසම්පන්න යෝධයෝ නොයෙක් ආයුධයන් අන්ඇතිව 'නුවර ගණුම්හ'යි පවුරු වාසල් සමීපයට ගියාහු, බෝධිසත්වයන් වහන්සේගේ යෝධයන් විසින් දමනලද කලල් වැලි ආදියෙන් මහා

විනාශයට පැමිණ නුවර බිඳිනා තබා පවුර සමීපයටත් යා නොහී නැවත යන්නාහ. ඉන් සමහරකෙණෙක් නොනැවත 'පවුර බිඳුම්හ'යි වාසිකියා සාහසිකව ගොස්, අගලබටවූනම් අන්තරවීථිවලවල සිටියෝ ඊදඹුමුණ කොහොල් තෝමර හෙණ්ඩිවාළාදින් දමා මහාවිනාශයට පමුණුවන්නාහ. බෝධිසත්වයන්වහන්සේගේ යෝධයෝ බ්‍රහ්මදත්ත යන්ගේ යෝධයන්ට අතින් මුහුන්න් උසුළුවිසුළු පෑ නොයෙක් ප්‍රකාර යෙන් ආක්‍රෝශ පරිභව බෙණෙමින් ගහට කරන්නාහ. * මචඡ මාංස හා කනබොනදෑ හා රාවිත් ඔඩම් † ආදී පුරාගෙණ පිටත සිටියවුන්ට දික්කොට පුළුගන්වා නැවත තුමූම කන්නාහ බොන්නාහ; මෙසේ සතුරන් කිපෙන සුලුවූ නොයෙක් විකාර පවුරෙන් ඇතුළේ පදනම් උන්ට පෙණෙන නියායෙන් සක්මන් කරන්නාහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ යෝධයෝ උන්ට කිසිවකුත් කොටගතනොහී ගෙඩි බැට කා අත පය හිස නලළු ලේ පිස පිස පසු බල බලා දිවන්නාවූ රජ්ජුරුවන් සමීපයට ගොස් 'දේවයන්වහන්ස සෘඞ්මත් කෙණෙකුන් ආකාශයෙන් ගොසින් වදුත් මුන්, මිනිසුන් විසින් මේ නුවර වදනා තබා සිතන්ටත් බැරිය'යි කීහ. එබස් අසා රජ්ජුරුවෝ නොසතුටුව කිප දවසක් රදා නුවරගන්නා උපායෙක් නොදන්නාහු කේවට්ටයා විචාළහ. "ආචාරිනි නුවරගන්නා තබා පවුර ලඟට යන්ටත් සමර්ථ එකද සත්වයෙක් නැත කුමක් කරමෝදැ"යි කීහ. එබස් අසා බමුණු කියන්නේ "වන්නාටය මහරජ නුවරටපැන්නම් පිටතින්ම වන්නේය, කිප දවසක් පැන් නවතාලන්නා පැන් නොලදින් කලානතාවූවාහු දෙර හැර පියන්නාහ; එවිට අපි සිත්වූ පරිද්දෙන් සතුරන්ට කටයුතු කියම්හයි කීහ. 'කොල එසිත් උපායෙකැ'යි එතැන්පටන් පැන් වැද්ද නොදෙන්නාහ. එපවත් බෝධිසත්වයන්වහන්සේගෙන් රජහු සමීපයෙහි සිටි චර පුරුෂයෙක් පතක ලියා ඊදණ්ඩක බැඳ ඇතුළු නුවරට විදපිය.

බෝධිසත්වයන්වහන්සේද සතුරන්ආ දවස් විධානයක් කරණසේක් "යමෙක් ඊදණ්ඩක ලියා විදපි පතක් දුටුයේවිනම් වහා ගෙණවුත් මට දෙව'යි වදාළසේක. එබැවින් එක් පුරුෂයෙක් ඒ පත ගෙණවුත් දින. ස්වාමිදරුවානෝ ඒබව දැන 'මේ කේවට්ට මහල්ලා ඇතුළුවූ අඥාන ජඩයෝ මා තවම මහෞෂධපණ්ඩිතබව නොදන්නා වන්හ'යි සිතා සැටරියන් උණදණ්ඩක් ගෙන්වා සරියේ දෙකක්කොට පලා ඇතුළුපිට ගැටහරවා ශුඛකොට එක්කොට තබා සම්න්වසා බඳවා පිට මැටි ගාවා, තපස්වින් ලවා හිමාලයෙන් ගෙන්වූ මැටි හා ඇඹුල අල ගෙන්වා, පොකුණු අස දියෙහි මැටි තබා මැටි පිට උණදණ්ඩ සිටුවා ඇතුළේ පැන් පුරවාලූසේක. එක රැයින්ම පැලය නැගී උණදණ්ඩ මුදුණෙන් රියනක් පමණ වඩා මලෙක් පිපී සිටියේය. ඒ අභිමතාර්ථ සාධකවූ චින්තාමාණික්‍යයක් බඳුවූ මාගේ ස්වාමිදරුවූ බෝධිසත්වයන්

* සැහෙන්නාහා † මණ්ඩා.

වහන්සේ ඒ මල්දඬු මුලින් උදුරුවා 'මේ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ට දෙව'යි තමන්වහන්සේගේ පුරුෂයන්ට දුන්හ. ඔහු ඇඹුලුදණ්ඩවලල්ලේලා 'කොල බ්‍රහ්මදත්තයන්ගේ පුරුෂයෙනි, සයින් නොමිය නෙලෙමල කඩා ගිස පැළඳගෙණ ඇඹුල දඬු හුයාගෙණ බඩපුරා සාපියව'යි පවුරෙන් පිටත දමාලූහ; එයින් බෝධිසත්වයන්වහන්සේගෙන්ම සිටි චරපුරුෂයෙක් හැරගෙණ රජ්ජුරුවන් සමීපයටගොස් "බැලුවමැනව දේවයන්වහන්ස මෙබඳු ඇඹුලමලක් හා මේ දිග ඇඹුල දණ්ඩක් දුටුවිරුදැ නැතැ"යි කීහ. රජහු මැනබලවයි කී හෙයින් චරපුරුෂයා මනන්නේ සැටරියන් දඩ අසුරියන්කොට මැනපිහ. රජහු "මේ කෙසේවූ තැනක ඇතිවිද"යි කීහෙයින් ඉන්ම එනෙක් රජහු කට්ටින් බස උදුරාගත්තා සේ බොරුවක් ගොනාගෙණ කියන්නේ 'මම එක් දවසක් රටිකක් බිපියනු කැමතිව කුරුබිලියෙන් ඇතුලු නුවරට වන්නෙම්, නුවරවාසීන් දියකෙළිනා මහපොකුණක් දිවිම්. බොහෝ මනුෂ්‍යයෝ ඔරු අතුළු ආදියෙහි ඉඳගෙණ මල්කඩා දියකෙළි ඇවිදිනාහ. මේ වූකලි ඒ පොකුණේ නොඩ අස පිපි මලෙක් සැටිය. ඉදින් ගැඹුරු තැනෙක පිපි මලෙක් වීනම්, සියක් රියනටත් වඩා ඇත්තේ වේදැයි කිය. ඒ අසා "ආචාරිනි 'පැන්නවතා මේ නුවර ගණුම්හ'යි නොසිතව ඒ නොපගේ උපායෙක් නොවේ"යි කිහ. "එසේකල දේවයන්වහන්ස මෙවිට මා සිතුදෙය ඉතාම ඝනපත නුවරට වී සාල් නම් පිටනින්ම වන්නේය, ඒ වී සාල් වැද්ද නොදෙමිහ, ඛතින් පීඩිතවූ මනුෂ්‍යයෝ දෙර ඇර පියන්නාහ; එවිට අල්වාගෙණ කෑමැත්තක් කරම්හ"යි කිය.

ඒ මනතුණයත් පළමු පරිද්දෙන් පනකින් දැන "මේ නිවටවූ කේවට්ටයා මා නුවණැති නියාව නොදන්නාවැනැ"යි කියා 'අනුපාකාරය'යි කියනලද පදනම් මුදුනේ කලල් අතුරුවා ඊට විඉස්වාලිසේක බෝධිසත්වයන්ගේ අභිප්‍රායනම් සිඹවන්නේය. එබැවින් එකරැයින් පැලනැගී සත්යොදුන් මියුලු නුවර වට පවුර මුදුනෙන් ඉතා නිල්වලා සමූහයක් සේ අතීනීලව පෙණෙන්ට වන, ඒ දුටු රජ්ජුරුවෝ 'පවුර මුදුනේ ඉතා නිල්ව අර මේ පෙණෙන්නේ කිම්ද'යි සිටියවුන් විවාළහ චරපුරුෂයෙක් කියන්නේ "දේවයන්වහන්ස ගොවියාපුත් මහෞෂධ පණ්ඩිතයා තමා ප්‍රඥාබලයෙන් මතුවන්නාවූභය දැන, තමාගේ විධාන වැටෙන්නාවූ මේ ජනපදයෙහි වී ටිකක් ඇයි තිබිද, එකහෙලා ගෙන්වාගෙණ මේසාමහත් නුවර හැමදෙනාගේ කොටු ගෙවල් පුරවා, ඉනිරි වී පවුර පිට හා වීපියේ ඒ ඒ ස්ථානයෙහි ලවාපිය, ඒ වීනාක් මුළුල්ල අව්වේ වියලී වැස්සේ තෙම් පැලනැගී ගොයම්ව ගියේය; මම එක් දවසක් කටයුත්තක් පිණිස කුරුබිලියෙන් ඇතුළු නුවරට වන්නෙම්, ඇස්වූ වියෙන් වී ටිකක් ඇරගෙණ 'කොල ඉතා යහපත් වියෙක, ඉස්නෙම් කියා වීපියට දමාපිම්; ඒ දැක එතනා සිටි ජනයෝ

මා වෙහෙසන්නාහු 'ඉතාම බඩසාය සැටියක, කැමැත්තෙහිවීනම, නිලින් පොදියක්කොට බැඳගෙණ ගොස් පැහැරපියා පිසගෙණ බඩ පුරා කා නොමිය'යි කීහ. ඒ වී මා ඇල්ලුසේයි 'ඉතා නපුරු'යි මම ලජ්ජාවට පැමිණිමයමි"කීහ. ඒ අසා රජ කේවට්ටයාට කියන්නේ 'වී නාවතාලන් මේ නුවර ගතනොහැක්ක, තාගේ එයින් උපායෙක් නොවෙයි හැරපියව'යි කීහ. "දේවයන්වහන්ස නොසිතා වදුල මැනව, අනිත් බලවත් මාගේ උපායෙක් ඇත, නුවර ඇතුළේ වලක් නැතිහෙයින් දරනම් පිටතින් මුත් හෙණ නොහැක්කේය; දර නව තාලා නුවර ඇරගණුම්හ"යි කීයේය. ඒ මනත්‍රණයන් පෙර පරිද්දෙන්ම දැන වදුරා පුවරුපිටින් වී හා ගොයම් හරවා පිටතට පෙණෙන්නියායෙන් දර රැස්කරවාපියේක. පවුරේ උන් මනුෂ්‍යයෝ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ යෝධයන්ට සිනාසිසී වෙහෙසන්නාහු 'කොල දර නැතිව පිස කෑනොහී සයින් පිඩිතව නොහිද, නැතිකෙණෙක් උළුකැන් බත් ආදිය පිස කව බොව'යි කියමින් 'තෙල ඇරගන්ව'යි මහත් මහත් දරකඳන් ඇහට දමාලන්නාහ; සමහරු ඒ වැදගෙණ නැළි තැළි මහත් දුකට පැමිණෙන්නාහ; රජ්ජුරුවෝ දර රාශිය පෙණෙන්නා දුක 'තෙල කිමෙක්ද'යි විචාළහ; එනන සිටි වරපුරුෂයන්ගෙන් එකෙක් "ඇයි මහරජ නොදන්නාසේක්ද? ගොවියාපුත් මහෞෂධයා මතු වන්නාවූ භය දැන වල දරක් තිබිද, එකහෙලා අද් දැගෙණවුත් නුවර ගෙයක් පණහා පැලදෙරවල පුරා ඉතිරිවෙන දර පව්රපිට රැස්කරවාපිය"යි කීය. ඒ අසා කේවට්ටයාට 'මේ නුවර දර නවතාලා ඇරගන්ට නොපිළිවන; තාගේ එයින් උපායෙක් නොවෙයි ඇරපියව'යි කීහ. ඉතා ඇවිලි අවන්නාවූ නිවටවූ කේවට්ටයා කියන්නේ "මහරජ නොසිතා වදුලමැනව; මාගේ බලවත් අනික් උපායෙක් ඇතැ"යි කීය. ඒ අසා "ආචාරීනි උපායනම් තමා කිමිද? මම මේසා මහත්වූ නොපගේ උපායකින් වැඩකුත් නිමාවකුත් දුටුවදෑ නැත; මේ නුවර වේදේහ රජු අල්වාගන්ට නොපිළිවන එබැවින් අපගේ නුවරට යමිහ"යි කීහ.

ධම්ම යුද්ධය.

නැවත අඤ්ඤවූ මහළු බමුණු කියන්නේ "දේවයන්වහන්ය 'බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එක්සියයක් රජදරුවන්හා ඒසා මහත් චතුරඞ්ගිණී සේනාවක් ගෙණ වේදේහරජු අල්වාගතනොහී පැරද පලාගියහ'යි අපට මහත් ලජ්ජා වන්නේයි; එබැවින් නුවනැත්තෝනම් මහෞෂධ පණ්ඩිතයෝ මතුනොවෙති; මමත් මහානුවණැත්තෙමි; එක්ලෙස කින් ඔහු පරදවාපියමිහ"යි කීය. 'ආචාරීනි ලෙසනම් තමා කිමිද'යි කීහ. ධම්මයුද්ධනම් දෙයක් කෙරෙමි' කීය. ධම්මයුද්ධනම් කිමිද'යි කීහ.

'මහරජ දෙසේනාව සටන්නොකොට මැනව; රජදරුවන් දෙදෙනාගේ පණ්ඩිත දෙදෙන එකතැනකට එද්දැ; ඉන් එක්කෙණෙක් වැන් දුවුනම් වැඳි පක්ෂයේ රජහට පරාජය වන්නේය; වැදුම්ලත් පක්ෂයේ රජහට ජයවන්නේය; එබැවින් ඒ මන්ත්‍රණය මහෞෂධ පණ්ඩිතයෝ නොදන්නාහ. මම ඉතා වැඩිමහල්ලෙමි, මහෞෂධ පණ්ඩිතයෝ බාලයෝය ආචාරදන්නා නුවණැති පණ්ඩිතයන් හෙයින් ඔහු මා දුටු කල සැක නැතිව වදනාහ; එවේලෙහි වේදේහරජ සැබවින් පැරැද්දුනම් වන්නේය; එසේකොටත් වේදේහරජු පරදවාපියා නැතියම්හ එසේකල අපට ලජ්ජා නොවන්නේය; ධම්මයුධනම් මෙය"යි කීහ. එසේ රහස් කථාවත් පෙර පරිද්දෙන්ම දැන වදුරා "කේවට්ටයාට මිනුත් මම පැරැද්දෙමිනම් මාගේ කුමන පණ්ඩිතකමෙක්ද"යි සිතූ සේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් ආචාරීනි ඒ උපාය ඉතා යහපත, සෙට උදෑසන ධම්මයුධ වන්නේය; ඉදින් ධම්මයුධයට නොඇවිනම් එයින් පැරැද්දුනම් වන්නේය"යි පනලියා කුරුබිලියෙන් වේදේහරජහට යවූහ.

ඒ අසා වෙදේහරජ්ජුරුවෝ බෝධිසත්වයන්දැ කැඳවා එපවත් කීය. ඒ අසමින් සකලජනානන්දකරවූ තිලෝගුරු බෝධිසත්වයන්වහන්සේ 'යහපත දේවයන්වහන්සැ'යි කියා ඔස්නාගිර වාසලින් පිටත ධම්මයුධ මණ්ඩලය සැරහුසේක. එතකුදුටත් ඒඒ රජුන්කෙරෙහි සිටි වර පුරුෂයෝ එක්සියයක් දෙන "කවුරු දනිද්ද කිමිදැ'යි බෝධිසත්වයන්වහන්සේට ආරක්ෂාපිණිස කේවට්ටයා පිරිවරා සිටගත්හ. බ්‍රහ්මදත්තයන්හා එක්සියයක් රජදරුවෝ ධම්මයුධ මඩලයට ගියහු, පුරදියවක යහපත් දවස් සඳ බලනට එක්සිත්ව එකදසාව බලන්නවුන් පරිද්දෙන් පැදුම්දිග බලා සිටියහ. එසේම නිවටවූ කේවට්ටයාන් නැගෙණහිරි දිසාව බලබලා 'කල්යේනුයි කල්යේනුයි' කියකියාසිටිය නමන් පාපියුම් ලෝ මුදුන්කළ තිලෝගුරු බෝධිසත්වයන්වහන්සේ එදවස් උදෑසන සොළොස්කළයක් සුවඳ පැනින් ඉස් සෝධා නහා ලක්ෂයක් වටනා කසී සලුවක් හැඳ,සර්වාභරණයෙන් විභූෂිතව හොයෙක් රසයෙන්අග්‍රවූ අමරාදේවීන් පිසනලද භෝජනය අනුභවකොට මහත් පෙළහරින් වාසල් දොරකඩට ගොස් ආ නියාව කියායවා 'මපුතනුවෝ වහා එන්ව'යි රජ්ජුරුවන් විසින් කීකල්හි රජගෙටවැද රජ්ජුරුවන්වැඳ,එකත්පස්වසිට'කිමෙක්ද පුත මහෞෂධපණ්ඩිතයෙනි, රජ්ජුරුවන් කී කල්හි 'ධම්මයුධයට යෙමි' වදාළසේක. පුත මා විසින් කුමක් කළ මනාදැයි කීහ. දේවයන් වහන්ස කේවට්ටයා මැණිකකින් වඤ්චාකරණුකැමැත්තෙමි; එබැවින් අෂ්ටවඞ්ක මාණික්‍යරත්නය ලදමැනව'යි වදාළසේක. පුත එයින් මට කියාද ගන්නේ ඇරගන්වයි කීකල්හි ශක්‍රයන් පළමුත් තමන්වහන්සේටම දුන් මාණික්‍යරත්නය ශ්‍රීහස්තයෙන් ගෙණ රජහු වැඳ මාලිගාවෙන් බටසේක.

තමන්වහන්සේ හා එකදවස උපන් යෝධයන් දහස හා සිව්රහ සෙනග පිරිවරා අනුදහසක් රන් වටනා හැලි අසුන් යොදනලද සමී ලඬකාරයෙන් සැරහූ රථයකට පැනනැඟී දුවල් මේ නිමවන වේලා වට වාසල සමීපයට පැමිණිසේක. කේවට්ටයෝද 'මහෞෂධපණ්ඩිත යෝ දැන් එති, දැන්එති, මහබෝසතාණන්වහන්සේ වඩනා පෙරමග කර ඔසව ඔසවා බලාගෙණ සිටීමෙන් කොක්කරක්සේ දික්වූ කරඇති වූහ. මහාබෝධිසත්වයන්ගේ දිගනතරයෙහි පතලාවූ තේජස් පරිද් දෙන් පහරන්නාවූ හිරුරැසින් ඩා වැහෙන්නාවූ ශරීර ඇතිවූහ. මහ බෝසතාණන්වහන්සේද ඔදවැඩියාවූ සාගරය පරිද්දෙන් පොළොව මැඩපියන්නාසේ, වීථිය පුරාගෙණ යන්නාවූ ඇත් අස් ආදිවූ පරිවාර යෙන් යුකතව, අසම්භීතව වාසල්දොර හරවා නුවරින් නික්ම රථ යෙන් බැස, කෙසුරු සලා විදහා කිලිපොලන්නාවූ සිංහරාජයෙකුසේ විජෘම්භනය කෙරෙමින් ධර්මයුද්ධ මඩලයටම වැඩිසේක. එක්සියයක් රජදරුවෝ ඒ මහතාණන්වහන්සේගේ රූපෙශ්වයශ්‍රිය දැක "නුව ණින් සියලු දඹදිව තමන්ට දෙවනු කෙණෙකුන් නැති සිරිවඩන සිටානන් පුනනුවෝ මහෞෂධපණ්ඩිතයෝනම් මොහුය"යි සමාධින් ඔල්වරහඬ සියගණන් පැවැත්තුහ. පණ්ඩිතයන්වහන්සේද, දෙදෙව් ලොව දෙවියන් පිරිවරා අසුරයුද්ධයට නික්මුණු සක්දෙවරජහු පරිද් දෙන් උපමාවිෂයානික්‍රාන්තවූ ශ්‍රීසෞභාග්‍යයෙන්යුක්තව,ඒ අඟවඩක මාණික්‍යරත්නයඅතින්ගෙණ කේවට්ටයන්ඉදිරියෙහිලංව වැඩිසේක.

කේවට්ටබමුණා මහබෝසතාණන්වහන්සේ දැක ඔබගේ තේජසින් සිටිපළ සිටින්ට නොපෝසත්ව පෙරගමන්කොට 'මහෞෂධපණ්ඩිත යෙනි අපි දෙන්නමෝම පණ්ඩිතවරුම්හ තොප නිසා අවුත් මෙතෙක් කල් මෙතන වසන අපට නෙපි අමුතු පඹුරක් නොළුවුවිරුව, කුමක් නිසාද මෙසේම සාදරයක් නොකෙලේය'යි කීය. එසේ කී කේවට්ට යන්ට බෝසතාණන්වහන්සේ 'පණ්ඩිතයෙනි තොපට සුදුසු පඹුරක් සොයන්නෙමි අද මේ මිණිරුවන ලදිමි, හැරගණුව මෙබඳු මිණිරු වණෙක් මේ මුත් නැතැ'යි වදාළසේක. කේවට්ටයෝ පණ්ඩිතයන් වහන්සේ අත දිලියෙන මිණිරුවන දැක 'මේ පණ්ඩිතයෝ මට මිණි රුවනක්ගෙණ වන්නාහ'යි සිතා 'එසේවිනම් දෙව'යි අත දික්කළහ. බෝසතාණන්වහන්සේද 'හෙද ගණුව'යි කියා අත දික්කොට අත ඇතිලි අග මැණික එළාවූසේක. බමුණාතෝ බරවූ මිණිරුවන ඇතිලි අගින් රඳවාගත නුහුඹුවන; මැණික පෙරළිගණ ගොස් බෝසතා නාණ්වහන්සේගේ පාමුල වැටිගියේය. බමුණාතෝත් ලෝභයෙන් 'මැණික ගණිමි' බෝධිසත්වයන්වහන්සේගේ ශ්‍රීපාදමූලයට නැබුරු වූය. ඒ දැක බෝසතාණන්වහන්සේ බමුණා නැබුරුවූ තැනැත්තවුන් කර ඔසවාගත නොදීම, එක් අතකින් පිටිකර හා එක් අතකින් පිට මුල තරසේ අල්වාගෙණ 'නැඟිසිටුව ආචාරිනි' මම බාලයෙමි,

නොපගේ මුනුබුරු තරමට ඇත්තෙමි, මා නොවදුව මා නොවදුව; යි කිය කියා බමුණා හා සමග නලලු පෙරලි පෙරලා කොරසැඩි බීම. උලා රත් වදමලක්සේ ලේ හා පස් වකා 'නුවණැත්තව තෝ මා අතින් වැදුම්ගන්ට සිතයිද?'යි බොටුව අල්වාගෙණ දමාලූසේක. මේ තෙමේ ඉස්ඔක් පමණ තැනා වැටීගොස් නැගිසිට වැලි පිස පිස පලා ගියේය. මැණික වනාහි මහබෝසතානන්ගේ මිනිස්සුම ඇරගත්හ. 'නැගිසිටුව ආචාරීනි මා නොවදුව'යි කියා මහබෝසතානන්වහන්සේ බැණ නැගී හඬ සියලු චතුරඞ්ගිණී සේනාවෙහි අරාගල මැඩගෙණ සිටියේය. කේවට්ට බමුණා විසින් මහෞෂධ පණ්ඩිතයන්වහන්සේගේ පා වදනාලදු"යි සියලු පෂිත් කොක්සන්දි පිළි ඉස සිසාරා අත් පොළියන්දී කෝලාහල කළහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා එක්සිය යක් රජදරුවන් ඇතුළුවූ හැමදෙනම කේවට්ටයා මහෞෂධ පණ්ඩිත යන් පාපිට නැමුනා දුටුවහ. නැවත කියන්නාහු 'අපගේ කේවට්ට ආචාරීන් විසින් මහෞෂධ පණ්ඩිතයෝ වදනාලද, එබැවින් අපි පැරැද්දමිහ; අපගේ ජීවිතය මෙවිට නොදෙන්නාහ'යි භයින් තැති ගෙණ, තමතමන්ගේ අසුන්පිට නැගී උත්තර පඤ්චාල නුවරට මුනලා නමා ගත්හ.

ඒ යන්නවුන් දැක බෝධිසත්වයන්වහන්සේගේ පිරිස එකපැහැර කියන්නාහු 'කොල බ්‍රහ්මදත්ත රජ එක්සියයක් රජුන් හා සේනාව ඇරගෙණ බිඳී පලා යන්නාහ'යි මහත්කොට හඬගසා කෝලාහල කළහ. ඒ අසා රජදරුවෝ තාක්මුළුල්ල වඩ වඩා භයපත්ව පලායන් නාහුමය ඔවුනොවුන් නොබලා මහා සේනාවත් බිඳිගියහ. බෝධිසත්ව යන්ගේ පිරිස ඒ දැකත් වඩ වඩා කෝලාහල පැවැත්වූහ. කරුණා නිධානවූ මාගේස්වාමිදරුවානෝ 'බිඳියන්නවුන් ලුහුබඳව'යි යනබස කුත් නොකියා තමන්වහන්සේගේ සේනාව පිරිවරා නුවරට වන්සේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා ඒසා මහත් සේනාව දෙලොස්ගව වක්තැන් බිඳී පලාගියහ. ඉතා අලජ්ජිවූ දුෂ්ටවූ කේවට්ටයා අසුනැගී කටින් ලේදම දමා නළල ලේ පිසපිස දිවන්නේ සේනාවට ආසන්නව අසුපිටම හිඳ 'පින්වත්නි නොයව නොයව, මම ගොවියාපුතු නොවැන් දෙමි, සිටුව සිටුව'යි කීය. එසේ කීවත් සේනාව නොරඳම දිවන්නාහු මෙසේ කියන්නාහ. "කොල පවිටු දුෂ්ට අධර්මිෂ්ඨවූ නිකාෂ්ඨ අනාර්‍යස්වරූපඇති අවලක්ෂණවූ අඥාන බමුණු මහල්ල, තෝ ධර්මයුද්ධ කෙරෙමි' කියා ගොසින් තට මුනුබුරුනරමටත් නැති ඉතා බාල තැනැත්තන් වැදපිය. මේ මනුෂ්‍යලෝකයෙහි උපන් සත්වයන්ගෙන් ජඩවූ යම් එකක්හු කළමනා යම් නොකටයුත්තෙක් ඇත්නම්, ඒ සියල්ලෙන් තා විසිනුත් නොකළමනා දෙයෙක් ඇද්ද? ජඩය මැනැ නොදැඩා, තොයිත් තාගේ පණ නොනසා යන අතෙක නැගිය'යි යනාදින් කිය කියා ඔහුගේ බස් තමන් කණෙක නොහෙලා ඔහට ආක්‍රෝශ පරිභව බෙණෙමින් නොරඳම දිවන්නාහ.

ඒ බමුණා වහා වහාම දිවගෙණ ගොස් සේනාව මැදට පැණ මෙසේ කීයාලිය; "ඇයි කුමක් කියවද? මම ගොවියාපුතු නොවැන්දෙම්, කොල වදිනා කෙණෙක් නම්ල දන වැලමීට ලේ ලාගෙණත් වදිද්ද? මේ වැදිමිමාන තොප අතින් අද ඇසීමි; ඒ ගොවියාපිත් මාණික්‍ය රත්නයකින් මා වඤ්චාකොට පිය"යි නොයෙක් කාරණා කියා හිවිස්වා තමා වසඟකොට, එසේ බිඳි තුන්යොදුනක් පලාගිය ඒසා මහත් සේනාව රඳවා නැවත ගෙණවුත් පළමුපරිද්දෙන්ම වටලාගත.

බෝධිසත්වයන්වහන්සේගේ ආනුභාවයෙන් නොසිතුහෙයින් මුත්, ඒ සේනාව එකි එකී පස්මිටවත් දැමුවේවිනම් අගල තුන පුරාගෙණ අටලොස්රියන් පවුරපිට නැවත එපමණ ගොඩකරන්ටත් වඩා ඇති වන්නේය. ඒ එසේමැයි නිලෝගුරු බුදුරජානන්වහන්සේ ශ්‍රී මුඛයෙන් "බෝධිසත්තානං අධිප්පායානාම ඉජ්ඣන්ති" (බෝසතුන්ගේ අදහස්නම් සිදුවෙනිසි) වදාළබැවින් අභිමතාර්ථසාධකවූ චින්තාමාණික්‍යයක් බදුවූ මාගේ බෝධිසත්වයන්වහන්සේගේ තේජසින්ම පස් මිටක්වත් කැටක්වත් නුවර දිසාවට දමන්නා තබා සිතුනුත් සිතූ එකද සත්වයෙක් නැත්තේය. සියල්ලෝම අවුත් තමන් පළමු උන් නාවූ සථානයෙහිම හිඳගත්හ.

බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ'ආචාරිනි මෙවිට කුමක්කරමෝද'යි කේවට්ටයා විචාළහ. ඒ දුෂ්ටයා කියන්නේ දේවයන්වහන්ස කිසිකෙණෙකුත් මහවාසලින් තබා කුරුබිලියෙනුත් පිටත්විය නොදෙමිහ. එසේ කල මනුෂ්‍යයෝ උකටලිව තුමූම දෙර හැරපියන්නාහ. එවිට අපි අනායාසයෙන් සතුරන්අල්වාගෙණ කැමැත්තක්කරමිහ'යි කියූ නියාවත් බෝධිසත්වයන්වහන්සේගේ වරපුරුෂයෙක් පියඳූ පනකින්ම දැන වදාරා "මේ සතුරන් බොහෝදවසක් මෙතන විසීමෙන් අප හැමදෙනාගේම සිනට සැපයෙක් නැත්තේය; උපායකින් මුන් පලවා පියමි' සිතා, මන්ත්‍රණයෙහිදක්ෂවූ උපායවත් පුරුෂයක්හු පරික්ෂාකරණසේක්. 'අනුකේවට්ටයාය'යි යන එකෙකු දැක ඔහට වදාරණසේක් 'අපගේ කටයුත්තෙක් ඇත නොප විසින් සමෘඩකොට දුන යහපතැ'යි වදාළ සේක. සවිමිනි කුමක්කෙරෙම්ද වදාළ මැනවැ'යි කීය. "නොපි මහපවරෙහි පදනම සිට අපගේ මිනිසුන්ගේ ප්‍රමාදයක් බලාලා, අතර තුරේ බ්‍රහ්මදත්තයන්ගේ පිරිස සිටියවුන්ට 'පින්වන්නි උකටලිනොව නිපදවසක් රඳන්ට උත්සාහකරව, නුවරවාසි සියල්ලෝ මැදිරියෙහි අසුවූ කුකුළන් පරිද්දෙන් ඉනා උකටලිව ගියහ. කිපදවසකින් තුමූම දෙරහරින්නාහ; එවිට තොපි වේදේහයාත් දුෂ්ටවූ ගොවියාපුතුත් අල්වාගණුව'යිකියා මච්ඡමාංස කනබොනදැදීමෙන් ඔවුන්සිත්ගෙණ කියා ඇවිදුව; ඒ තොපගේ කථාව අපගේ මනුෂ්‍යයෝ අසා නොපට ආක්‍රෝශ පරිභව බැණ තොප අල්වාගෙණ බ්‍රහ්මදත්තයන්ගේ මිනිසුන් බලබලා සිටියදීම දැන දෙපය තරව අල්වා උණපත්තෙන්

මරන්නාසේ පැලා, ඉන් බාහෙණ ඉස පස්කොන්ඩයක් බඳවා ඇත උළුසුඹු ගල්වා රත්මල් කණේරුමල් වඩම් කරලා කිපපාරක් ගසා පිට ගඹුනංවා පිටිතොල හයා බැඳ පවුරපිට නගා සාල්ලෙක හිඳුවා යොතකින් පිටත බාවා බ්‍රහ්මදත්ත රජුගේ මිනිසුන් බල බලා සිටියදී 'මන්ත්‍රඥෙදක සොරුය'යි කියා පිටත ලූකල තොප ගෙණගොස් රජ හට පානාහ, රජ්ජුරුවෝ 'තොපට මෙවැන්නක් කරන්ට තොපගේ අපරාධය කවරේදූ'යි විචාළෝනම් තොප කියනකල 'මහරජ මාගේ සම්පත් බොහෝය, ඉගාවියාපුත් මහෞෂධයා 'මන්ත්‍රඥෙදක සොරුය'යි මට කිපී රජහට කියා මාගේ සම්පත් උදුරාගත. 'ඒ නිසා දැන් මම මාගේ සම්පත් නැසුවාවූ සොරවූ ගොවියාපුතුගේ ඉස දෙවාපියන්ට සිහන්නෙම්, නුඹවහන්සේගේ සේනාව මේ නුවර සාධාගතඥෝති උකටලිවන ගෙයින් එහි ඉතා කණස්සළුව ඔවුන්ට අතරතුරේ කන බොන දැන් දෙම්, ඇතුළුනුවර අඩුවැඩියත් කියම්, ඒ දැන මාගේ පුරණ වෛරයත් සිත තබාගෙණ මට මේසා මහත් ව්‍යසනයක් කරවිය. මේ සියල්ලම නුඹවහන්සේගේ මනුෂ්‍යයෝ දන්නාහ'යි කියා රජහු නොයෙක් පරිද්දෙන් ගිවිස්වා තොපකෙරේ තරව ඇදගිලිව ගත්කල නැවත තෙපි මෙසේ කියව—'මහරජ මෙවිට මා ලත් පසු නොසිතා වදාළමැනව, වේදේහයාත් ගොවියාපින්මහෞෂධයාත් දිවිනැත්තේය. මම මේ නුවර පවුර තර තැනුත් නොතරතැනුත් අගල මුවරුන් හා කිඹුලුන් ඇති තැනුත් නැතිතැනුත් ඉදුරා දනිමි; නොබෝ දවස කින් නුවර ගෙණ දීලම්' කියව; ඉක්බිතිව රජ්ජුරුවෝ 'සැබවැ'යි ගිවිස තොපට බොහෝ සත්කාරකොට තමන්ගේ සේනාව තොපට පාවාදෙති, තෙපි ඒ සේනාව හා සවනට ගොස් චණ්ඩවූ කිඹුලුන් හා මුවරුන් ඇති තෙනට බාලව; කිඹුලුන් හා මුවරුන්ගෙන් භයපත්වූ වාහ සවන් තබා අගල සම්පයටත් ලංනොවන්නාහ. එවිට තෙපි අවුත් 'දේවයන්වහන්ස නුඹවහන්සේගේ මේ සේනාව ගොවියාපුතු විසින් භින්නව ගියාහ; කේවට්ටයා ඇතුළුවූ සියලු රජදරුවෝම ඔහු අතින් අත්ලස් නොගත් එකද කෙණෙක් නැත්තාහ, නුඹවහන්සේට හිතයෝනම් මම්මය; හුදක් නුඹවහන්සේ පිරිවරා ඇවිදිනාබව මුත් මේ සියල්ලෝම ගොවියාපුතු සන්තකයහ; මෙතෙක්දෙනා නුඹවහන්සේට වෙනස් කල මම තනිව කුමක් කොටලියහෙම්ද? ඉදින් මා නොඅදහනසේක් වීනම් සියලු රජදරුවෝ සව්ාභරණයෙන් සැරහී අවුත් මා දකිත්මයි නියෝගකළ මැනවැයි කියව. එබසින් හැමදෙනම සැදී පැහැදී ආකල්හි ගොවියාපින් තමාගේ නම අකුරු ලියාදෙනලද වඤ්ඣාභරණ කඩු ආදිය අකුරු බලා තෙල අදහාගත මැනවැ'යි කියව ඔහු තොප කී පරිද්දෙන් 'රජදරුවන් එන්ට කියව'යි නියෝගකොට ඔවුන් සැරහී ආ කල්හි, තොප කී පරිද්දෙන් අකුරු දැක තමයින් තැති ගෙණ බිය ගත්තාහු රජදරුවන්ට සමුදී යවා 'මෙවිට කුමක් කරමෝද ආචාර්‍යි' විචාරති; ඒ විචාළ රජහට තෙපි මෙසේ කියව—'මහරජ

ගොවියාපින් බොහෝ මායම් දන්නේය. ඉදින් කිපදවසක් මෙතන රැඳුනුසේක්නම්, නුඹවහන්සේගේ සියලු සෙනඟ තමා වසඟකොට ගෙණ නුඹවහන්සේ ජීවිතක්ෂයට පමුණුවයි; ප්‍රපඤ්ච නොකොට අද මධ්‍යම රාත්‍රියේහි අසුපිට හිඳගෙණ පලායම්හ'යි කියව; සතුරන් අත මියන මරෙක් අපට නොවේවයි කී කල්හි, රජ්ජුරුවෝ හිමිස නොප කී ලෙසම කරන්නාහ; ඉතපි උන් නික්මෙන වේලා දැන, නැවත අපගේ ඔනුම්‍යන්ත්‍රණාදී බව අඟවාලව''සි වදාළසේක.

ඒ අසා අනුකේවට්ටි බ්‍රාහ්මණයා 'පණ්ඩිතයන්වහන්ස මා නිසා වැඩෙක්වේනම් නුඹවහන්සේ වදාළලෙසම කෙරෙමි' කිහ. 'එසේවිනම් උන්ට පෙණෙන පරිද්දෙන් පහර කිපයක් ඉවසාපුව යහපතැ'යි වදාළසේක. 'පණ්ඩිතයන්වහන්ස මාගේ ප්‍රාණයත් දැන් දෙපයත් නොනසා, සම්‍යක්සම්බුදු මුඳුන්ල නුඹවහන්සේ කැමැත්තක් කරවුව මැනවැ'යි කීහ. එදෝලෙහි අනුකේවට්ටියාගේ අඹුදරුවන් පවන් උන් සත්තක කිසිකෙණෙකුනුත් නොවරදවා සඛ්‍යාකොට, අනුකේවට්ටියන් හිස පස්කොණඩයක් බැඳ පෙණෙනලෙස පහර කිපයක් ගසා ගඩු නගා සම්‍යක්සම්බුදු උළුසුඹු ගල්වා කණේරුමල් වඩම් කරලා මහා විප්‍රකාරයට පමුණුවා, සාල්ලෙක හිඳුවා ලනුවෙක බැඳ පිටතට බාවා බ්‍රහ්මදත්තයන්ගේ මනුෂ්‍යයන්ට දැක්වූවාහ. රජ්ජුරුවෝ අනුකේවට්ට යන් නොයෙක් පරිද්දෙන් විමසා අදහාගෙණ ඕනම ප්‍රසාද දී සේනාව පාවා දුන්හ. ඒතෙම සේනාව ගෙණ 'නුවර ගන්මි' කොස් 'මෙතනින් බටකල නිරුපද්‍රවය, මෙතන පවුරත් දුර්ලභය, එතන රුකවලුත් නැතැ'සි ගෙණගොස් පොවාලූ ඇඟිල්ල කඩා කනතරම් චණ්ඩවූ කිඹුලුන් හා මුවරුන් ඇති තොටවලටම බාලයි, බටුබටුවන් ගසාකන්නා; අව්වාලවල සිවියාහු හිමුණ කෝල් ගෙණඩිවාල තෝමරාදියෙන් දමාඇන මහාවිනාශයට පමුණුවන්නාහ; සේනාව මහා ව්‍යසනයට පැමිණ නැවත ඒ දෘෂ්ටව යන්නා තබා බලන්නත් අසමර්ථවූහ; අනුකේවට්ටියා රජහු සමීපයට ගොස් ''මහරජ නුඹවහන්සේ නිසා සටන් කරණ කෙණෙක් නැත්තාහ; හැම ගොවියාපුතුගෙන් අත්ලස් ගත්තාහ. මා බස් නොඅදහසසේක් වීනම්, රජදරුවන් සැරහි එන්ට කියා ගෙන්වා, ගන් පළන් වස්ත්‍රාභරණාදිය අකුරු බලා, සැක හළමැනවැ''සි කීහ.

රජ්ජුරුවෝ ඔහු කී පරිද්දෙන් හැම ගෙන්වා, නොයෙක් ආභරණාදියෙහි ලියා තිබුවා දැක 'ඒකාන්තයෙන් හැමදෙනම අත්ලස් ගත්තේසැබෑය'සි අදහාගෙණ උන් හැම යවා 'ආචාරිනි මෙච්ච කුමක් කරමෝදැ'සි විචාරා ''දේවයන්වහන්ස මෙච්ච අනික් කටහැකි දෙයක් නැත; ඉදින් ප්‍රපඤ්චකොට කල් යවූසේක් වීනම්, ගොවියාපින් නුඹවහන්සේ අල්වාගන්නේය, මැලිත් කේවට්ටියාත් නලළ වණයක් කොට ගෙණ ඇවිදිනාබවමුත් ඔහු විසිනුත් අත්ලස් ගත්තේමය, ධම්ම

යුවයෙකිදී අතෙකිවූ මාණික්‍යාරත්නයක් කාටත් නොදන්නා පරිද්දෙන් ඇරගෙණ, නුඹවහන්සේ තුන්යොදුනක් පලාකියවුන් නැවත ගිහිස්වා ගෙණවුත් මේ මරළගුලේ ලාපියා එයින් නුඹවහන්සේට ඒකාන්ත යෙන්ම අහිතයෑ, එබැවින් එක රැයකුත් මෙතන රඳන්නා කැමති නැත අද මධ්‍යම රාත්‍රියෙහි නැගියන්නා කැමැත්තෙමි, මා විසා නුඹවහන්සේට මනා සිත්කෙණෙක් මේ සේනාවෙහි එකෙකුත් නැතැ'යි කිය. ඒ අසා රජ්ජුරුවෝ වඩ වඩා භයින් තැතිගෙණ "එසේවීනම් ආචාරිනි නොප විනා මට හිතකෙණෙක් නැත, තෙපිම අසෙකු සඳ, ගමන නිල කරව"යි කිහ. අනුකේවට්ටයාත් රජහු ඒකාන්තයෙන්ම යනබව දැන "මහරජ නොබා වදාළමැනවැ'යි අස්වසාලා, ඒක්ෂණයෙහි අවුත් චර පුරුෂයන්ට කියන්නේ "අද රජ්ජුරුවෝ පලායෙති 'කොල නිදුපියම හ'යි නොසිතව"යි කියාලා, රජහට අසු සඳන්නේ, යම්සේ රඳන්ට කඩියාලම භයාලූකල නොරඳුම ඉදිරියට දිවේද, එපරිද්දෙන් අව කල්පන සැදීමෙන් අසු සඳලා, මධ්‍යම රාත්‍රියෙහි අවුත් අසු සදලා ගෙණිමි වේලා දතමැනව වහා නික්මුණ මැනවැයි කිය. රජ්ජුරුවෝ අසු නැගි පලාගියහ. අනුකේවට්ටයාත් අසෙකු නැගි රජු හා එක්ව යන්නාසේ මදක් තැන් ගොස් රඳුනියේය. අවකල්පන සැදීමෙන් සැදූ අස් රඳවන්ට භයාලූයේය, නොරඳුම ඉදිරියට දිවන්නේ බ්‍රහ්මදත්තරජු හැරගෙණ පලාගියේය.

අනුකේවට්ටයා සේනාව මැදට වැදලා 'චූලනිබ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ පැලහ'යි මහත්කොට හඬහසාලීය. චරපුරුෂයෝ තමතමන්ගේ අතවැසි පුරුෂයන්හා සමඟ මහත්කොට හඬහසා ශබ්ද පැවැත්වූහ. එක්සියයක් රජදරුවෝ සිතන්නාහු මහෞෂධ පණ්ඩිතයෝ වාසල් හරවා පිටත්වූවන්හ, මෙවිට අප හැමගේ ජීවිතය නැත්තේය'යි භයින් තැතිගෙණ උපභෝග පරිභෝග වස්තුවෙන් කිසිවක් නොගෙණ මගුල්කඩු හා උතුරුසළු ආදිවූ වස්ත්‍රාභරණාදියත් ආලයනොකොට නිහඬඑඑසේනාවක් සේ ඉස් ලූ ලූ අත උතුන් නොබලාම දිවගත්හ. චරපුරුෂයෝ එවිටත් 'එක්සියයක් රජදරුවෝ පැලහ'යි වඩ වඩා කෝලාහල පැවැත්වූහ. ඒ අසා නුවර වාසල් අට්ටාල පවුරු පදනම් ආදිය සිටියාහු මහත්කොට කෝලාහල කළහ. එවේලෙහි පිටත සිටි චරපුරුෂයෝ ඇතුළතුවර මනුෂ්‍යයන් හා එකපැහැර ශබ්ද පවත්වා කෝලාහල කළාහ. ඒ හැසු සියලු හඬ පොළව පැළියන්නාසේ, වාත වේගයෙන් මහාසමුද්‍රය ඇලලීගියාසේ සෙනඟ ගොස් පිටිනුවරත් ඇතුළතුවරත් කෝලාහලයෙන් එකහින් නාදවිය. අටමසාස් අක්ෂෝහිණියක් පමණ මනුෂ්‍යයෝ සිතන්නාහු 'මහෞෂධ පණ්ඩිතයන් විසින් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා එක්සියයක් රජදරුවෝ ඒකාන්ත යෙන්ම අල්වාගන්නාලදහ"යි මරණභයින් තැතිගත්තාහු කිසි සරණ යක්වත් පිවිමහලක්වත් හැලවෙන්ට කිසි උපායක්වත් නොදන්නාහු, සෙසු දෑ තබා හන්සඬවත් අසවාම්කව සියල්ල උන් උන් තැනම ඇර

පියා පළමු පැලැවුන්සේ ඉස් ලූ ලූ අත දිවඟන්ඟ. ඒසා මඟන් රාජසේ නාවක් කඳයුරු බැඳ ඟුන් තැන එකද මනුෂ්‍යයෙක් නැතිව සිස්වූ යේය. චූලනීරජ්ජුරුවෝ එක්සියයක් රජදරුවන් හා සමඟ බිඳී තමන්ගේ නුවරටම ගියඟ.

රෑ පැවති කෝලාහලයෙන් ඇත් අස් ආදිඟු කඹ දම් ආදින් කඩා බිඳගෙණගොස් වල් නැංඟාඟ. දෙවන දවස් උදෑසන නුවර වාසල් හැර බලඇණි නුවරින් පිටත්ව, ඒ මහාවිප්‍රකාර දුක අභිමතාර්ථ සාධක චිත්තාමාණික්‍යයක් බදුවූ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ සමීපයට ගොස් මේ සම්පතට කුමක් කරමෝදැ'යි විචාළඟ. ඔබ වදාරණසේක් 'උත් ඇමදෙනා නොකැමතිකරවා උදුරාඟත් දෙයක් නොවන පසු උන් තමන්ම ආලය නැතිව දමාපියා නිරාලයව ගිය වසතුකෙසින් සියල්ලම අප සන්තකවන්නේය; ඉනුත් රජදරුවන් සන්තක වසතු අපගේ රජ්ජුරුවන්ට දෙව, සිටුවරුන් හා කෝට්ටිවයා සන්තක වසතුතාක් මුළුල්ල අපට ගෙණෙව, සෙසු අවලොස් අණෝ ඟිණියක් පමණ මහාසේනාව සන්තක වසතු මුළුල්ල නුවරවාසිඟු ගණිත්ව'යි වදාළසේක. ඉන් මාහැඟි රන්රුවන් ආදි වසතුව අදන වුන්ට දෙපෝයක්ම ඉක්ම ගියේය. වී සාල් ආයුධ ආදිවූ අවශෙෂ වසතු අදනවුන්ට සාරමසෙක් ඉක්ම ගියේය. බෝධිසත්වයන්වහන්සේ අනු කෝට්ටිවයන්ට බොහෝ සත්කාර කළඟ. වල ගිය ඇත් ආදින් බඳවා ගෙන්වාගත්තාඟ. එවක්පටන් මියුලු නුවර වාසිඟුද දශවිධ රත්නයෙන් සමෘධවූඟ. බ්‍රහ්මදත්තරජ්ජුරුවන් එක්සියයක් රජුන් හා එක්ව බිඳී ගොස් උත්තර පඤ්චාල නුවර වසන්නවුන්ට අවුරුද්දක් ඉකුත්ව ගියේය.

විවාහ ගිවිසීම.

එක් දවසක් කෝට්ටිව මහළු බමුණු කැඩපතකින් තමා මුහුන බැලූයේ, තලල කබරව කුගියාසේ වණ කැලළි දැක "මේ අනිකෙක් නොවෙයි ගොවියාපිත් මනෞෂධයා අත කර්මාන්තය, ඔහු විසින් එක් සියයක් රජුන් හා මේ සේනාව මධ්‍යයෙහි මා ලජ්ජාවට පමුණුවන ලදැ"යි දැණෙන් හසනලද ආශීවිෂයෙකු පරිද්දෙන් වඩනලද ක්‍රෝධ ඇත්තේ කවර දමයෙක ඔහු පිවිසුකපියම්හෝ'යි සිතන්නේ 'ඒ වන්නා බලවත් උපායෙක් ඇත, අපගේ රජ්ජුරුවන්වහන්සේගේ පඤ්චාලචණ්ඩි කුමාරිකාවෝ දිව්‍යාප්සරාවකසේ උතුම් රූ ඇත්තාඟ, සිව්සැටක් පමණ ස්ත්‍රීලක්ෂණයෙන් යුක්තයඟ, ඒ කුමාරිකාවන් වේදේහ රජුනට දෙමින'යි කියා රජු කාමයෙන් පොළඹා බිලියක් ගිලූ මසෙකු කොඩගන්නාසේ මහෞෂධ පණ්ඩිතයා හා සමඟ මේ නුවරට ගෙණ වූන් දෙන්නාම මුරාජ්‍යපානය බොම්හයි සතිවූනන්කොට සිතා නිමවා

රජතු සමීපයට ගොස් දේවයන්වහන්ස එක් රහස් කථාමන්ත්‍රණයෙක් ඇතැ'යි කිහ. 'පළමු තාගේ මන්ත්‍රණ නිසා අපගේ උතුරුසළුවටත් අස්වාමිකව දමාපියා ආමිහ. මේ මන්ත්‍රණයෙන් කුමක් කෙරෙයිද? මුවෙන් කොබැණැ'යි කිවුය. 'මහරජ මේ උපාය හා සමාන උපායෙක් නැතැ'යි කිය. ඒසේවීනම් කියයි කිහ. 'මහරජ අපි දෙන්නා මතු තනිවියයුතුය'යි කියා ඔහු ඇරගෙණ මාලිගාවේ මතුමාලට නැගි 'මහරජ වේදේහරජු කාමයෙන් පොලඹා ගොවියාපුතු සමඟ මේ නුවරට ගෙණවුන් ජීවිතක්ෂයට පමුණුවාපියම්හ'යි කිය. ඒ වන්නා තොපකිවා කවර උපායකින් පොළඹා මේ නුවරට ගෙණෙමෝදැ'යි කිහ. මහරජ නුඹවහන්සේගේ දියනියෝ පඤ්චාලචණ්ඩි කුමාරිකාවෝ උතුම් රූ ඇත්තාහ, ඒලක්ෂණ සම්පන්නවූ කුමාරිකාවගේ රූපවිලාසය කවින් ලවා ගී බඳවා කාව්‍යකරවා ඒ කාව්‍ය මියුලුතුවර ගායනාකරවා 'මෙබඳු ස්ත්‍රීරත්නයක් නොලබන්නාවූ වේදේහරජතට රාජ්‍යයෙන් ප්‍රයෝජන කිම්දැ'යි රූපශ්‍රී ඇසූ පමණකින්ම ඔහු ශ්‍රවණ සංසර්ගයෙහි බැඳුනු කල මමම ඔබ ගොස් දවස් තියම දුන නැකැත්ලා එම්, ඒ රජ දවස් නියමකොට මා ආ කල්හි බිලියක් ගිලූ මසෙකුසේ ගොවියාපුතු හා සමඟ මේ නුවරට එන්නේය, එවිට උන්දෙන්නා අල්වාගෙණ මරා ජීවිතක්ෂයට පමුණුවා පියම්හ''යි කිය. රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා ගිවිස ඉතා සතුටුව 'ආචාරිනි ඒ උපාය ඉතා යහපතැ'යි කියා තොපකි ලෙසම කෙරෙමි' ගිවිස්සාහ.

මේ දෙදෙනාගේ රහස්කථාව චූලනිරජ්ජුරුවන්ගේ යානබලත එක් සැලලිහිණියක් සහස්කොට අසා සිත තබාගත. ඉක්බිතිව රජ්ජුරුවෝ යහපත්කොට අදැල කාව්‍යකාරයන් ගෙන්වා ඒවුනියාව කියා බොහෝ සත්කාර ඔවුන්ට දියනියන් පෙන්වා 'කුඩාවරිනි මේ කුමාරිකාවගේ රූපශ්‍රී වර්ණනාකෙරෙමින් මුන් නිසා කාව්‍ය කරව'යි කිහ. ඒ කාව්‍යකාරයෝ කර්ණීරසායනකොට අතිමනෝහරකොට ගී බැඳ රජතු ඇස්වූහ. එදවස් රජ්ජුරුවෝ බොහෝ ප්‍රසාද දුන්හ. කවින් අතින් විද්දත් නායකයෝ ඉගෙණ බොහෝදෙනා මධ්‍යයෙහි ගායනා කළහ. ඒ ගීතිකාවන් ඇසූ ඇසූවන්ට කර්ණීරසායනමය. මෙසේ කාව්‍ය ගීතිකා බොහෝදෙනා අතරේ ප්‍රසිද්ධවූ කල්හි රජ්ජුරුවෝ ගී කියන්නවුන් කැඳවා කියන්නාහු "දරුවෙනි තෙපි කොස් ලිහිණියන් අල්වාගෙණ රූ හඬවූඩ ඉඳ ගීතිකාවන් කියා අලුයම්වේලෙහි උන් කර කසිතාලම් බැඳ උන් ආකාශයට හැරපියා කාත් නොදන්වා බැස පියව"යි කිහ. ඒ කුමක් පිණිසදයත්? බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ දුවණියන්ගේ රූපවිලාසය දේවතාවෝ පවා කියන්නාහ'යි දඹදිව ප්‍රසිද්ධවන පිණිස කරවූහයි දතයුතු.

නැවත රජ්ජුරුවෝ කවින් කැඳවා, කුඩාවරිනි දැන් තෙපි කියන කල මෙවැනි රූ ඇති කුමාරිකාවක් දඹදිව අනික් රජක්කව තරම්

නොවෙයි, මියුලුතුවර වේදේහ රජගට තරමැයි වේදේහ රජ්ජුරුවන්ගේ රාජ්‍යශ්‍රී හා කුමාරිකාවන්ගේ රූපවණ්ණනාව හා එක්කොට යි බැඳ කාව්‍යකරව''යි කියා. ඔහු එතැන් පටන් වන් වන් තැන ගායනා කෙරෙමින් සාරසියයක් ගව් ගෙවා මියුලුතුවරට පැමිණ බොහෝදෙනා රැස්වූ සභායෙහි ගායනාකළහ. ඒ අසා බොහෝ ජනයෝ ඔල්වර හඬ දහස්ගණන් පවත්වා මහාසන්තෝෂයෙන් වසනු දුන්හ. ඒ ගායකයෝ රැ ගස්වල හිඳ ගායනාකොට, අලුයම්වේලෙහි කොස්ලිහිණියන් කර කංසුතාලම් බැඳ ආකාශයට හැර බස්නාහ. ආකාශයෙහි ඒ කංසුතාලම් හඬ අසා චූලනීරජ්ජුරුවන් දුවනියන්ගේ රූපවණ්ණනාව දෙවතාවෝ පවා කියන්නාහ'යි තුවර මහත්වූ කෝලාහලවිය. වේදේහරජ්ජුරුවෝ ඒ අසා,කාව්‍යකාරයන් කැඳවා තමන්ගේ රජගෙයිදී බොහෝදෙනා මිඛ්‍යයෙහි කියවා'බ්‍රහ්මදත්තාරජ්ජුරුවෝ තමන්ගේ මෙබඳු රූපශ්‍රීන් විරාජමානවූ දුවනියන් මට සරණ දෙත්ල'යි මහත්වූ සොම්නසට පැමිණ නාවකයන්ට බොහෝ ප්‍රසාද දී මහත්වූ සත්කාරකළහ. ඔහු නැවත අවුත් ඒ බව චූලනීරජ්ජුරුවන්ට කීහ. ඊට අනතුරුව කේවට්ටනම් බමුණු කියන්නේ'මහරජ දැන් මම ගොස් නැකැත් ලාලා දවස් නියමකොට එමි' කිය. 'යහපත ආචාර්‍යනි කුමක් ලදමනාදැ'යි කීහ. යම්තම් පඬුරක් ලදමැනවැ'යි කිය. 'යහපත ගන්ව'යි කියා මාහැණි පඬුරු දෙවූහ. ඒ බමුණු මහපෙළහරින් ගොස් වේදේහරටට පැමිණියේය. ඔහු එන ගමන අසා ''බ්‍රහ්මදත්තරජ්ජුරුවෝ තමන්ගේ දුවනියන් අපගේ රජ්ජුරුවන්ට සරණදෙන්ල; රජදරුවන් දෙදෙනාගේ බන්ධුත්වයත් මිත්‍රකමත් යහපත් වන්නේය; කේවට්ටබ්‍රාහ්මණයා නැකැත්ලන්ට එමින් සිටියේල''යි තුවර එකකෝලාහල විය. වේදේහ රජ්ජුරුවෝත් ඇසූහ.

පරසිත් දන්නා බෝධිසත්වයන්වහන්සේ එපවත් අසා සිතනසේක් ''මේ විවාහය කියා කේවට්ටයා එන ගමන මට රුස්නේ නොවෙයි, ඒ තත්ත්වය දැනපිම්නම් යහපතැ''යි සිතා, චූලනීරජ්ජුරුවන් කෙරෙහි සිටිය චරපුරුෂයන්ට 'මේ සරණය තත්වූ පරිදෙන් කියා එව'යි කියා යවූසේක. නැවත උහු කියා එවන්නාහු ''අපි තත්ත්වය නොදනුම්හ; කේවට්ටයෝ රජ්ජුරුවන් හා මාලිකාවේ මතුමාලේ ශ්‍රීයහන් හබඩා වේ හිඳ මන්ත්‍රණය කළහ; රජ්ජුරුවන්ගේ යාන බලන සැලලිහිණියක් ඇත; ඔතොවෝ එහි තත්ත්වය ඉදුරා දන්නීය''යි නැවත කියා යවූහ. ඒ අසා බෝධිසත්වයන්වහන්සේ සිතනසේක් 'යම්සේ සතුරන්ට අවකාශයෙක් නොපෙණේද එබැවින් මා විසින් සුරක්ෂිතකොට රක්නාලද මේ තුවර මේ දුෂ්ටවූ කේවට්ටයාට නොපාමි' සිතා තුවර මහවාසල පටන් රජගෙයි දොරකඩ දක්වාද එතැන් පටන් තමන් වහන්සේ දොරකඩ දක්වාද ඇතුළු විටි මාළිග දෙපාශ්වයෙහි බටපැලලි හදවා මුදුනෙහිත් පැදුරු බඳවා ඔත්තම්කරවා බිම සුදු

වැල්ල ලවා පස්වණක් මල් ඉස්වා දෙපාදිවයෙහි පුන් කලස් හා මා රුක්මල් තබා කෙහෙල්ගස් බදවා සරහාලූසේක. කේවට්ටයාත් නුව රට වන්නේ නුවර හෙවල් ආදිවූ දෙය ඉදුරා නොදැක 'රජතු විසින් මා එන්නාවූ මගුල් පිණිස සරහණලද්දේවනැ'යි සිතිය. ඒ බමුණු තමා ට නුවර නොපානා පිණිස කළතියාව නොදන්නේය. කේවට්ටයොත් සරහනලද විථියෙන් හොස් රජ්ජුරුවන් දැක, හෙණ පඬුරු පාවාදී මියුරු කථාකොට එකත්පස්ව හිඳ රජතු විසින් කරණලද සත්කාර සම්මාන විඳ තමා ආ කාරණය කියන්නේ * "මහරජ අපගේ රජ්ජුරු වන්වහන්සේ නුඹවහන්සේ හා ඥාතිසම්බන්ධයෙන් අතිශයින් හිත මිත්‍රව හිඳිනා කැමතිසේක, අනඹිවූ රුවන් ආදිවූ පාක්කුඩම් එවූසේක. මිහිර්වූ ප්‍රියතෙපුල් දන්නා දූතයෝ එරටින් මෙහි එත්වා, යම් බසක් ප්‍රියමනාපනම් එසේවූ මෘදු තෙපුල් කියත්වා, පඤ්චාලයෝද විදේහ යෝද යන දෙපක්ෂය එක්වෙත්වා" මෙසේ කියා නැවත කියන්නේ "යම් යම් බසෙක් සන්තෝෂයට කාරණවිනම් ඔවුනොවුන්ට එසේවූ ප්‍රියතෙපුල් කියත්වා, කුමක් නිසාදයත්? පඤ්චාලදේශයෙහි රජ්ජුරු වන් හා වේදේහරජ්ජුරුවන් හා දෙදෙන ආවාහ විවාහයෙන් ඒකාත් මිකව ඔවුනොවුන් කෙරෙහි සතුටුව වසන්නාහ, එබැවින් අවමඩ්ඩ්‍ය වචනයෙක් නොකියා මඩ්ඩ්‍ය සන්නිශ්‍රිතවූ බසක්ම කියත්ව"යි කියා නැවත කියන්නේ "තවත් ඒ මතු නොවෙයි; තමන්ගේ දුරුවන හා උතුම් උතුම් මාහැඟි රුවන් එවනසේක; මෙවක්පටන් දෙරටින් ඔවු නොවුන්ට පාක්කුඩම් හෙණ මිහිර්වූ ප්‍රිය තෙපුල් දන්නා දූතයෝ මොබින් ඔබ යෙත්වා, ඔබින් මොබ එත්වා, මේ දෙරට සම්බන්ධවූ නියාව කුමක් වැනිදයත්, කඩ්ඩානම් ගඟ දිය හා යමුනානම් ගඟ දිය එක්වූ කලක් පරිද්දෙන් ඔවුනොවුන් එක්සිත්ව සමගිව සන්තෝෂව වෙසෙන්ව"යි කිහ. මෙසේද කියා නැවත කියන්නේ "අපගේ රජ්ජුරු වන්වහන්සේ අතික් මහාමාත්‍යයෙකු එවනු කැමතිවත් අතික් කෙ ණෙක් මේ මඩ්ඩ්‍ය වචනය සිත්හෙණ ඉදුරා කියාලන්ට අසමර්ථයයි සිතා මට කියනසේක් 'ආචාරිනි තෙපිම හොස් මේ මගුල් කියා රජ්ජු රුවන් යහපත්කොට සතුටුකරවා කැඳවාහෙණ එව'යි කීසේක. එබැ විත් රාජෝත්තමයානන්වහන්ස වහා වැඩියමැනව. ඔබ ගියාවූ නුඹ වහන්සේව වැඩ දෙකෙක් වන්නේය. හේ කවරේදයත්? අසමාන රූ ඇති කුමාරිකාවනුත් ලබනසේක; රජ්ජුරුවන් හා සමග මෛත්‍රී සිතත් අධිකවන්නේය"යි කිය.

---

* රාජා සකථව කාමෝ තෙ රතනානි පවෙච්ඡති
ආගච්ඡතු තණ්හා දූතා මධුපුඤ්ඤා පිය භාණිනෝ
භාසතු මුදුකා වාචා යා වාචා පඨිනන්දිතා
පඤ්චාලාව විදෙහාව උභෝ එකා භවන්තුතෙ.

රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා සතුටුව 'උතුම්වූ රූ ඇති කුමාරිකාව ලැබේල'යි ඇසූ බස් පමණකින්ම බැඳී ගොස් නැවත කියන්නාහු "ආචාරිනී තොප හා මනෞෂධ පණ්ඩිතයන් හා දෙන්නා ධර්ම යුධයෙහි පළමු වාදයෙක් වූයේවේද, යම මපුතනුවන් දකුව, තොප දෙදෙනාම පණ්ඩිතවරුන් බැවින් ඔවුනොවුන් ක්ෂමාකරවා ප්‍රියකථා කොට එව'යි කිහ. ඒ අසා ක්ෂේවට්ටනී බමුණිතෙම 'යහපතැ' යන්ට නමාගත. බෝධිසත්වයන්වහන්සේද එදවස් උදෑසන 'ඒ පවිටා මා හා එක්ව කථාවෙක් නොවේව'යි සිතා උදෑසනම තමන්ගේ බසට කැප පිණිස එලඟිතෙල් සුඟක් අනුභවකොට ගෙයි ගොම පිරිබඳ ගාවන්නේක් දූහුල් බොල ඇතිකොට ගාවා මිදුනු තෙල් කප්වල ගාවා බෝධිසත්වයන්වහන්සේ වැදගෝනා එක් පටුහැඳක් පමණ තබා, සෙසු ඇඳපුටු ආදිය ගෙන් පිටත්කරවූසේක; නැවත සිටියවුන්ට විධානකරණසේක් "බමුණිනි මා හා කථාවට ආරම්භකළ කල 'බමුණ පරිඩිතයන්වහන්සේ හා නොදෙඩ, අද බෙහෙත් තෙලක් අනුභවකළසේකැ'යි ඔහු නවතා මාත් දෙඩන්ට වන් කල්හි 'ස්වාමිනි බෙහෙත් තෙලක් වැලඳූසේක්වේද නොදෙඩා වදාළ මැනවැ'යි කියවයි විධාන කොට රතක් පෙරවාගෙණ සත්වන දොරටුවේ යටිමාලේ පටුහැඳ වැදගොත්සේක.

ක්ෂේවට්ටියාත් සත්වන දොරටුවෙන් පළමුවන දොරකඩට අවුත් රැකවලුන්ට පණ්ඩිතයෝ කොසිදැයි කිය. සිටියෝ කියන්නෝ "බමුණ මහන්කොට නොදෙඩා අරගල නොකොට බැණනොඇගි ගොළු වෙකුසේ කරබාගෙණ නැගිවර, අද අපගේ ස්වාමි බෙහෙත් තෙලක් වැලඳූසේක; එබැවින් මහන්කොට දෙඩීම් හා අරගල කිරීම් නොකැමැත්තේය"යි කිහ. සෙසු දොරටුවල සිටියාහුත් එපරිද්දෙන් කිහ. බමුණිනි මුවෙන් නොබැණ කරබාගෙණ සවන දොරටුව ගෙවා බෝධිසත්වයන්වහන්සේ සමීපයට ගියේය.

බෝධිසත්වයන්වහන්සේ ඒ ගිය බමුණා හා කථාවට ආරම්භ දුක් වූසේක. ලඟ සිටියාහු "ස්වාමිනි ඉතා සුඟමවූ තෙලක් වලඳනලද්දේවේද, එබැවින් මේ දුශ්ටවූ බ්‍රාහ්මණයා හා කථාවෙන් ප්‍රයෝජන කිම් ද"යි කියා නැවතූහ. ක්ෂේවට්ටියා බෝධිසත්වයන්වහන්සේ සමීපයෙහි හිඳිනා ආසනයක්වත් වැතිරගෙණ සිටිනා ආධාරයක්වත් බෝධිසත්වයන්වහන්සේගෙන් මිසිරි කථාමාත්‍රයක්වත් නොලදින් වැසි සමයෙහි ගවරපිරි ගොවුදකට වන් ගොන්මාල්ලෙකු සේ; බොල් ගොම ඇඟිලි අසුවලින් පලව පලවා, මිරිමිරියේ ඒ පයින් ඒ පය ලා මිරිකමින් සිටියේය, ඒ සිටියාවූ බමුණා මූන බලා එකෙක් තමාගේ නුවන කසා ලීය. එකෙක් තමාගේ බැම උඩනගාලීය. එකෙක් තමාගේ වැලමිට කසාලීය. බමුණු ඔවුන්ගේ මේ ක්‍රියාව දැක ඉඟිකරුව ඇත් මැත් බලන්නේ 'පණ්ඩිතයෙනි අපි යම්හ'යි කියා අසිකෙකු විසින් "කොල

අරිවු බමුණ 'නොදෙඩ'සි කියදිත් දෙඩ දෙඩා සිටිනෙසිද? දැන් තොපගේ ඇටබැට තළාපියම්හ''සි කී කල්හි ඔසින් තුසතව නැවත පිටිපස්ස බැලිය, ඉක්බිති එසේ බැලූ බමුණාට එකෙක් තුණපත් තෙන් පිටට පහරක් කැසිය. 'එකෙක් යෙසිද නොයෙසිදැ'සි කියා කර අල්වාගෙණ දැමිය, එකෙක් දිවමින් ගොස් පිටිදැමැද අතුල් පහරක් කැසිය. ඒ තෙමේ දිවියෙකු කවිත් ගැලවුනු මුවමාල්ලෙකුමෙන් ඔසින් තැතිගෙණ වෙව්ල වෙව්ලා දිවන්නේ දුකසේ ගොස් රජගෙට පැමිණියේය.

රජ්ජුරුවෝ සිතන්නාහු ''මපුතනුවෝ අද මාගේ විවාමගුල් අසා අතිශයින් සතුටුවන්නාහ, තවද පණ්ඩිතවරුන් දෙදෙනාගේ ධර්ම ශ්‍රවයෙන් ශ්‍රුතාවූ කථාවකුත් වන්නේය, අද දෙදෙනා ඔවුනොවුන් ක්ෂමාකරවාගන්නාහ, එබැවින් මට වූයේ මහත් ලාභයකැ''සි සිත සිතා උන්නාහ, එවේලෙහි ආනඅනා අවුත් එතනට වන් කේවට්ටයා දුක, දෙදෙනා ඔවුනොවුන් දුක කථාකළ සංසඳනය විචාරන්නාහු මේ ගාථාවෙන් කිහ.

කථන්නු කෙවට්ට මකොත්ථඩෙන, සමාගමෝ ආසි තදිඩ්ඝ බ්‍රූහි,
කච්චි තෙ පටිනිජ්ඣත්තෝතා, කච්චි තුට්ඨා මකොසඩො.

මේ ගාථාවෙන් රජ්ජුරුවෝ කියන්නාහු ''කිමෙක්ද කේවට්ට පණ්ඩිතයෙනි මහෞෂධ පණ්ඩිතයන් හා තොප හා එදවස් ධර්මයුධ යෙහිදී වූ කණ්ඨස්ල්ල කැර ක්ෂමාකරවා ගතුද? නැවත තොප දෙදෙනාගේ මිහිරි කථා කෙසේවිද? නොපගේ රජ්ජුරුවන් කියා එවූ මගුල් විවාහය අසා මපුතනුවෝ සතුටුවූවද? ඒ මට නොවලහා තන්වූ පරිද්දෙන් කියව''සි කිහ. ඒ අසා කේවට්ටයා කියන්නේ මේ ගාථාවෙන් කියය.

අනරිය රූපො පුරිසො ජනින්ද, අසමේමාදකො ඵඩො අසඛ්භිරූපො,
සථා මූගොව බධිරො, න කිඤ්චත්ථං අභාසථ.

''ජනප්‍රධානවූ රජ්ජුරුවන්වහන්ස, ඒ මහෞෂධ පණ්ඩිතයානම් අනාර්‍යාචාරයට ඇති සාධුගුණයක් නැති ඉතා තද එකෙක, සවභාවයෙන්ම ඉතා තද එකෙක, අසත්පුරුෂයෙක, කොළුවෙකුසේ බසකුත් නොකියේය, බිරෙකුමෙන් බසකුත් නොඇසූයේය, ඒ පණ්ඩිතයා නුඹළුහන්සේටම තරම, ඔහු තරම් දුප්පතයෙක් මනුෂ්‍යයන් කෙරෙහි එකද කෙණෙකුත් නැතැ''සි ඉතා දෙඩමලුවූ බමුණුමාථ තමා කරට ආවාක්ම කියේය. තමා කැ කෙඩිබැටයෙහි නමකුත් නොකියේය. 'හන්දුරුවා කැ බැටනම් තමා මේය'සි සිතමි. එකෙහින් තමා ලත් අවමානයේ නමකුත් නොකියා මහතාණන්ගේ තුගුණම කීය. රජ්ජුරුවෝ තුවුද නොවී විරුඛයකුදු නොකියා කේවට්ටයා හා

කැටිව ආවුන්ට බත්විසදම් දී නවාතැන් ලවා 'යව ආචාරිනි සැතපී හිඳිනුව'සි කිහ. ඔහු යවා ඉක්බිති රජ්ජුරුවෝ සිතන්නාහු ''මපුතනුවෝ ඉතා නුවණැත්තාහ, ප්‍රියතෙපුල් ඇත්තාවූ කෙණෙක, මේ බමුණි හා කථාවකුත් කොකළාහ. දැක සතුටු පමණකුත් නොවූහ; කිමෙක්ද? මොහු අ ගමනේ මතු වන්නාවූ භයක් මපුතනුවන් දුටු හෝසි සිතමි; එබැවින් මේ කේවට්ටයා අ ගමන අපට වැඩක් හා අභිවෘඩියක් නියා නොවෙසි, සරණ දෙම්හසි කාමයෙන් පොළඹා, ඔබ නෙන්වාගෙණ මරණ පිණිස මා කැඳවා ආහසි සිතමි, ඒ බව දැනලාවත, මපුතනුවන් ඔබට කිසිවකුත් නොකියේය''සි සිතා, භය ගෙණ හුන් කල්හි සේනකාදී ප්‍රඥාසමුද්‍රයෝ සතරදෙන ආහ.

ඔවුන්ට රජ්ජුරුවෝ කියන්නාහු ''කිමෙක්ද සේනකය උත්තරපඤ්චාලයට ගොස්, චූලනී රජ්ජුරුවන්ගේ දුවනියන් ගෙණෙව්ද, ඒ ගමන තොපි ඇම කැමැත්තෝදැ''සි විචාළහ. ඉක්බිති සේනකයා කියන්නේ ''මහරජ කුමක් කියනසේක්ද? තමා කරා එන ශ්‍රීකාන්තාව හසා දුරු කරණ කෙණෙක් ඇද්ද? ඉදින් ඔබවහන්සේ ඔබ ගියහොත් ඒ කුමාරිකාව ගෙණෙසේක්වීනම් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හැර සියලු දඹදිව නුඹවහන්සේ හා සමාන රජෙක් නැත්තේය. ඒ කුමක් පිණිසද යත්? නායක රජ්ජුරුවන්ගේ දියනියන් රක්ෂාකරණ හෙයිනි. තවද ඒ රජ්ජුරුවෝ සිතනකල සෙසු රජදරුවෝනම් මාගේ සේවකයෝය. මා හා සමානයෝනම් එකම වේදේහරජ්ජුරුවෝයසි සිතා, දඹදිව සියලු සත්‍රීන්ට වඩනා රූ ඇති දුවනියන් නුඹවහන්සේට දෙන්නාහ, නුඹවහන්සේට වන්නේ මහත් අභිවෘඩියක, යම්කිසි කෙණෙක් නුවණ මඳව ඊට බාධාකෙරෙන්නම් ඊට කිසි සැකයක් නොකොට වැඩියමැනව; අපිත් නුඹවහන්සේ හා කියකල වසන්නාකරණ අන්නපානාදියෙන් සඞ්ග්‍රහ ලබම්හ''සි කේවට්ටයාට නොඇඩුවූ ගුණඇති ඉතා දැඩමලුවූ ගුණමකුවූ සභාවයෙන් ඉතා ලෝභිවූ සේනකනම් බමුණුතෙම රජහු අතිශයින් පොළඹා ගිවිස්නා පරිද්දෙන් සිතට නගා කිය. ඔවුන් හා සමඟ කථාකෙරෙමින් උන් තැනට කේවට්ටයා තමා හුන් තැනින් අවුත් 'මහරජ අප රදන්ට නොපිළිවන යම්කසි කිය. රජ්ජුරුවෝ ඕහට සත්කාරකොට යැවූහ.

බෝධිසත්වයන්වහන්සේ ඔහු ගියබව දැන නහා සැරසි රාජසේවයට අවුත් රජ්ජුරුවන් වැඳ එකත්පස්ව උන්සේක. රජ්ජුරුවෝ සිතන්නාහු ''මපුතනුවෝ මහාමන්ත්‍රිය, සියලු මන්ත්‍රණයෙහි පාරප්‍රාප්තයා අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න යන තුන්කල්හි වන්නාවූ අර්ථයන් පරෝපදේශ රහිතව සභාවමහු ඥානයෙන් මනාකොට දක්නාහ; එබැවින් අප ඔබගන ගමනේ යහපත නපුර මේ පණ්ඩිතයෝ දනිති' සිතා, තමන් පළමු සිතුලෙස නොරඳා රාගයෙන් රත්ව මෝහයෙන් මූළුව විචාරන්නාහු මේ ගාථාවෙන් කියත්:—

ජනසඞ්ගහං ඒකාව මති සමෙති, යෙ පණ්ඩිතා උත්තම භූරිපඤ්ඤා
යාසං අයාසං අථවාපි ධාසං, මඤ්ඤොසඩ්ඩා තම්පි මති කරොති.

"පුත මහෞෂධ පණ්ඩිතයෙනි, සේනකය පුක්කුසය කාමින්දය දේවින්දය කේවට්ටය වේදේහය යන අප සදෙනාගේ අදහස් 'උත්තර පඤ්චාලදේශයට බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ දුවනියන් ගෙණෙන්ට යාම යහපතැ'යි එක්වූ නියාව ඔඩ්ඩාදකය හා යමුනෝදකය හා වෙනසක් නැතිවූවා මෙන්ය. මහෞෂධ පණ්ඩිතයෙනි තෙපිත් කියව ඔබ යාමවත් නොගොස් රැඳීමවත් යහපත නපුර යන මේ දෙකින් එකක් නොපගේ සූක්ෂ්මවූ ප්‍රඥාවෙන් මඤාකොට සිතාලා කියව, ඔබ යමෝද නොයමෝදැ"යි කිහ. ඒ අසා මඤාණෝ සිතනසේක් "මේ රජ තමා නුවණ මදගෙයින් මුත් සතරදෙනාගේ බස් ගිවිස නුවණින් අඬිව කාමයෙහි ගිජුව. ඒකාන්තයෙන්ම යන්නේය, ගොස් මහාවිනාශයට පැමිණෙන්නේය, ඉමසෙහි දොෂ කියා නවතින්නම් නවතාලමි" සිතා "මහරජ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් පඤ්චප්‍රකාර බල යෙන් යුක්ත නියාව නොදනිද්ද? පළමුත් තමන් මේ නුවරට අවුත් පැරද පලානියකෙසින් ලජ්ජාව පසිදහන්නා පිණිස 'දුව සරණදෙමි' ඔබ නෙන්වා දැල මුවෙකු අසුවූකල වැද්දෙකුසේ තමන් කැමැත්තක් කෙරෙති සිතමි; තවද ඇම කෙරේ ගිජුවූ මත්ස්‍යයා යට තිබූ බිලිය නොදැක ඇලපියා නස්නා පරිද්දෙන් කාමයෙහි ගිජුව ඉදින් පඤ්චාල දේශයට ගියසේක්වි නම් ඒ බිලිය ගිලූ මත්ස්‍යයා පරිද්දෙන් වහා නස්නා සේක. තවද පණ හසුවූ මුවෙකු පරිද්දෙන් මහත්වූ විනාශයට පැමිණෙනසේක, එබැවින් ඇත යන ගමන මම නොකැමැත්තෙමි"යි නාථා සතරකින් වදාරණසේක:—

ජානාසි බො රාජ මහානුභාවො, මහබ්බලො චූලනි බ්‍රහ්මදත්තො
රාජාව තං ඉච්ඡති කාරණත්ථං, මිනං යථා ඔකචරෙන ලුද්දො.

යථාපි මච්ඡා බලිසං, වඩිසං මංසෙන ඡාදිතං
කාමගිද්ධො න ජානාති, මච්ඡාව මරණ මත්තනො.

එවමෙව නුවං රාජ, චූලනෙය්‍යස්ස ධීතරං
කාමගිද්ධො න ජානාසි, මච්ඡාව මරණ මත්තනො.

සචෙ ගච්ඡසි පඤ්චාලං, ඛිප්පමත්තං ජහිස්සසි
ඉමං පඨොනුපන්නංව, මඤ්ඤං සය මෙසසි.

වදාළ කල්හි—නුවණ නැති රජ එබස් අසා නුවණින් සලකාගත නොහි 'තමන්ට හෙලා දෙඩූ'යි සිතා "මේ තමාගේ දැසයෙකුන් කොට නොසිතා 'රජ්ජුරුවෝය'යි මදකුත් නොතකා දඹදිවට අග්‍රවූ රජ්ජුරුවන් "තමන්ගේ ලෙහි දූ දුවනියන් සරණදෙමි"යි කියා තමන්ගේ දූතයන් එවූ නියාව දැන දැනම, මඟුලට නිසි එක බසකුත්

නොකියා, මා කෙළතොලුවෙකුසේද, බිලියක් ගිලූ මසෙකුසේද, පණ හසුවූ මුවෙකුසේද, මහත්වූ භයට හා මරණට පැමිණෙයි කියයි කිපී "මතුලට නිසි කථා දන්නෝනම් සේනකාදී පණ්ඩිතවරු සතරදෙනා කා කේවට්ට පණ්ඩිතයෝය; තා නිමුන්මිට එලිගෙණ සීහා කන ගොවියාපුතු අතින් මෙහා උතුම් මඬහල්‍ය වචන වචාලාවූ අපිම නුවණ නැති කෙළතොල්ලම්හ"යි බෝධිසත්වයන්වහන්සේට නොයෙක් පරිද්දෙන් නින්දා පරිභව බැණපියා 'මේ ගොවියාපුතු මෙතනින් පිටත ලව'යි නියෝගකරන්නාහු "මාගේ මේ නියා සත්‍රුරතන ලාභයගේ අනන්තරායට සුදුසු ඉස් කිවාවූ මොහුගේ කර අල්වාගෙණ මාගේ විජිත යෙන් පිටත ලව"යි කිහ.

බෝධිසත්වයන්වහන්සේ රජහු කිපිබව දැන සිතනසේක් "ඉදින් මෙහි යමෙක් නුවණ නැති රජහුගේ ඉස්ගෙණ මා අතවත් කරවත් අල්වුයේවිනම් මා දිවිහිමියෙන් ලජ්ජාවට එම සැගෙන්නේය, එබැවින් මම්ම යෙමි" සිතා උනස්නෙන් නැගි රජහු වැඳ තමන්වහන්සේගේ ගෙට ගියසේක. රජ්ජුරුවෝත් කිපිබස් කිබවමුත්, බෝධිසත්වයන් කෙරෙහි ගෞරවයෙන් එකක්හට 'තුලු ගහව මරව පිටතලව'යි නොකිහ. එසේහෙයින් තමතමන් මූන බලා එකෙක්හට නොකිහෙයින් බෝධිසත්වයන් ලහට ගිය එකද කෙණෙක් නැත්තාහ. ඒ එසේමැයි රජගෙයි වසන්නවුන් විසින් රජහු යමෙක්හට කිපී 'තුලු ගහව මරව පිටත ලව'යි සාමාන්‍යයෙන් කී කල්හි සිටියවුන් විසින් එබස් අසා සිටියෙන් නොයිගිලී රජහු මුහුන යමසින් බලබලා සිටියවුන් අතක් නොසෙල්විය යුතුය. එකෙකු මුහුන බලා කිනල ඒ නියෝග ලද්දාහු මුත් අසිකක්හු කිසිවකුත් නොකටයුතුය. ඒ නියෝග ලද්දාහු තබා අනික් කෙණෙක් නොමේවරෙයි මේවර කෙළේ නම් අරුට කළමනා නිග්‍රහ වරදවා කළ තැනැත්තේ විදහන්නේය; එබැවින් රජහු එකෙක්හට තෝරා නොකිහෙයින් බෝධිසත්වයන් ලහට ගොස් සෙසු නිග්‍රහ තබා 'පිටත ගිය මැනවැ'යි යන බසක් පමණකුත් කී එකද සත්වයෙකුත් නැත්තාහ.

ඉක්බිති බෝධිසත්වයන්වහන්සේ සිතනසේක් "රජ්ජුරුවෝ නුවණ නැතිව කිතයන් අකිතයන් නොදැන කාමයෙහි ගිජුව 'බ්‍රහ්මදත්තයන් හේ දුව ලබමි' සිතා මතු වන භය නොදැන ගොස් මහාවිනාශයට පැමිණෙන්නාහ; එබැවින් මට බොහෝ යසඳායකවූ උපකාරව සිටි රජ්ජුරුවන්ගේ බස් සිත තිබීම මට තරම් නොවෙයි, මා විසින් මෝහට පිරිවහල් විය යුතුය"යි සිතා 'පළමුකොට ගිරවාහන් යවා තත්ත්වය දැන පසුව මම යෙමි' සිතා ඒ නුවරට ගිරහන් යැවූසේක. පණ්ඩිත යන්වහන්සේ ගිරහන් යවා තත්වූපරිදි දන් නියාව බුදුව වැඩසිඳ වදාරණ මාගේ සහාම්දරුවූ තිලෝගුරු බුදුරජාණන්වහන්සේ මේ ගාථා වෙන් වදාළසේක.

තතො ච සො අපක්කමම, වෙදෙහස්ස උපනිසිකා
අථ ආමන්තයි දූතං, මාඤ්ඣරං සුව පණ්ඩිතං.
එහි සම්ම හරිපක්ඛ, වෙයාවච්චං කරොහි මෙ
අජ්ජ පඤ්චාල රාජස්ස, සාලිකා සාධු පාලිකා.
තං පඨමරෙන පුච්ඡස්සු, සාති සබ්බස්ස කොවිදා
සාධු සබ්බං පජානාති, රඤ්ඤෝ ච කොසියස්සච.
ආමෝති සො පටිස්සුත්වා, මාඤ්ඣරා සුව පණ්ඩිතා
ආගමාසි හරිපක්ඛා, සාලිකාය උපනිසිකං.
තතො ච සො ඛො ගන්ත්වාන, මාඤ්ඣරා සුව පණ්ඩිතා
අථ ආමන්තයි දූතා, සාලිකං මිගජාණිකං.
කච්චි භරෙ ඛමනීයං, කච්චි වස්සෙ අනාමයං
කච්චි තෙ මධුතා ලාජා, ලබ්භතෙ සුභරෙ තව.
කුසලඤ්ච මෙ සම්ම, අනාමය මථො මම
අථො මෙ මධුතා ලාජා, ලබ්භතෙ සුවපණ්ඩිත.
කුතොනු සම්ම ආගම්ම, කස්ස වා පහිතො තුවං
නවමෙසි ඉතො පුබ්බ, දිට්ඨා වා යදි වා සුතා.

"එම්බා මහණෙනි, ඒ මහෞෂධ පණ්ඩිතයෝ වේදේහ රජ්ජෙහි උදකස්ස අසා තමාගේ කෙට කියාහු තමන් වැඩූ මාඩ්‍රශෝත්‍රයෙහි උපන් හිරා පැටවා නත් කැඳවා ඕහට දූතමෙහෙවර කියා යවන්නාහු "රන්වන්වූ පඤ්චවයක් ඇති සබඳ හිරාපණ්ඩිතයෙනි යෙහේ එව, තොපව්සින් මට කළමනා මෙහෙවරෙක් ඇතැ"යි කිහ. එබස් අසා මින් තමන් හුන් රන්මැදිරියෙන් පිටත්ව මහා සන්තෝෂයට පැමිණ තමන් දෙපියා මුදුනේ තබා වැඳ එකත්පස්ව සිට 'කී යම් මෙහෙ වරක්කොට දිලම්, සැකනොකොට වදාළමැනවැ"යි කිහ. ඒ අසා පණ්ඩිතයන්වහන්සේ වදාරණසේක් මාඩ්‍රශෝත්‍රයෙහි උපන් හිරා පැටවානෙනි, කේවට්ට බ්‍රාහ්මණයා හා බ්‍රහ්මදත්තරජතු දෙදෙනා 'සරණදෙම්හ'යි කළ කථාව රහසකෙසින් 'සැබෑද බොරුද'යි රජතුගේ යාන බලය සැලලිහිණිය අතින් තත්වූ පරිද්දෙන් විවාරා දැනගෙණ වහා අවුත් මට කියව"යි කියාලා මී හා මිලදී කවා මීපැන් පොවා ශත පාක සහස්‍රපාක තෙලින් දෙපියා අතුර මැඹි කල්හි ඉතා සියුම්වූ තුවණැති හිරාහු අසාගත් මෙහෙවර ඉදුරා සිත තබාගෙණ මහතාගෙන් තුන්විටක් පැදකුණුකොට වැඳලා මාලිකාවේ මතුමාලේ කරණලද සිව්මැදුරු සවුළුවෙන් නික්මුණාහු වාතවේගයෙන් සිව්රට දිවාවට මූණලා නික්ම එහි යන් සිත තබාගෙණ සැලලිහිණිය සමීපයට ගියාහ. හේ මෙකෙසේදැයි?

———o———

ගිරා සැළලිහිනි පුවත.

ගිරාතෝ ගොසින් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ මාලිගාවේ රන්කොත් කැරැල්ල මුදුනේ හුන්නාහු මධුර සවරයෙන් රාත්‍රිභාගය ඔබක් ඇඹුහ, ඒ කුමක් පිණිසද යත්? සැළලිහිණිය කවර මාලෙක කවර ගබඩා වෙක බවත් නොදන්න "මේ මාගේ ශබ්දය අසා මට ප්‍රතිවචනදී තොමෝත් හඬයි, ඒ සලකුණෙන් ඇය සමීපයට යෙමි" සිතා ඇඹුහ, ඔවුන් ඒ ශබ්දය අසා ඒ රජතුමාගේ ශ්‍රීයනන් ගබඩා සමීපයට ගොස් රන් මැදිරියේ උන් තැනැත්තී රාත්‍රියෙන් රත්වූ සිත් ඇත්තී පිට පිට හුන් අඹත් ඇඹුහ. ගිරාහු මදක් නොසිත්, නැවත නැවත ශබ්දය අසා, ඒ අනුසාරයෙන් ක්‍රමයෙන් ගොස් සිව්වැදුරු කව්ළුවේ එලිපත පිට හිඳ, ගෙයි මිනිසුන් ඇත්ත නැත්ත පරීක්ෂාකොට නැතිසේ දැක ඇය සමීපයට ගියාහ.

මෙසේ කෙළේ කුමක් පිණිසදයත්? "මේ සත්ත්වලෝකයෙහි සත්ත්වයන් නිසා ගොස් ඇණ තොල්මුව් බිඳවාගෙණ මහාපීඩාවට පැමිණෙන්නාහු ඇත; ඉදින් මේ ගෙයි යමෙක් මා දුටුවත්වීනම් මටත් අවවාදයක් කළෝනම් නපුරු"සි සිතාහෝ එසේ පරීක්ෂාකළහ. නැවත සැළලිහිණිය 'සබඳ මේ අවුත් රන්මැදිරියේ හිඳිනැ'සි කිව. ගිරාතෝ මැදිරියට දැද 'නැළලිහිණිය'සි තැණුවහ. 'කිමෙක්ද සඛිනී' කිව. 'කිමෙක්ද තොපගේ රන්මැදිරියේ වැඩහිඳුවුන්ට දොම්නසෙක් නැද්ද? මි නා ළඟළඳ සුවසේ ලැබේදැ'සි විවාළහ තොමෝත් කියන්නී 'මා මෙහි වසන්නියට ඉතා හැපය, දොම්නසෙකුත් නැත, ළඟළඳ හා මි සුවසේ ලැබෙසි පණ්ඩිතයෙනි' කිව. ගිරාහෝ ඇ කී බස් අසා 'ඉදින් මෙ මිත්‍රලුතුවර සිට අම් කිමිනම් තමා පණිවේ නමුත් සමාගමක් නොවන්නේය'සි සිව්දෙශයෙහි අරිට්ඨපුරය සඳහන්කොට ඔබසිට ආම් කියා සිව්රජ්ජුරුවන් එව්වාකොට බොරුගොතාගෙණ කියන්නාහු මේ ගාථාවෙන් කියත්:—

අතොසිං සිව්රාජස්ස, පාසාදෙ සයන පාලකො
තතො සො ධම්මිකො රාජා, බබ්බෙ මොචෙසි බන්ධනා.

'සොදුර මම වැලිත් එසේමෙසේ කෙණෙක් නොවෙමි; සිබිරජ්ජුරුවන්ගේ යාන බලන්නාවූ ගිරවෙකිමි; අපගේ රජ්ජුරුවෝ ඉතා බහුමිහිර කෙණෙක, එසේහෙයින් දහගෙයි හිඳින මනුෂ්‍යයන්ද මැදිරිවල හිඳිනා පක්ෂීන්ද හරවණසේක්, මාත් රන්මැදිරියෙන් හැරියේකැ; මම මෑ කැමති තෙන ඇවිද ගොදුරු කා අවුත් දවස්පතා මාගේ රන් මැදිරියේ වෙසෙමි, තොපසේම මැදිරියෙන් පිටත්නොවී ඇතුළු මැදිරියේ හිඳිනෙම් නොවෙමි' කිහ. එසේ කී ගිරානන්ට සැළලිහිණි තමාට රන්මැදිරියෙහි ලා තුබූ ළඟළඳ කථා මිපැන් පොවා අනන්තයෙහි කියන්නී 'සබඳ තෝ ඉතා දුර සිට ආයෙහිය, කුමක් පිණිස අව්දැ'සි

කිය. ගිරාතෝ ඇගේ ඉස් අසා සිතන්නාහු 'මේ ලොව බොරුවක් නොකියා බොරු සතාවක් මතාකොට සිත්ගත නොහැක්ක, එබැවින් බොරුවක් කියා ඇ නම්මාගෙණ රහස් විචාරාගණිම්' සිතා කියන්නාහු මේ ගාථාවෙන් කිහ.

තස්ස මෙකා දුතියාසි, සාළිකා මඤ්ඤුභාණිකා,
තං තත්ථ අවධි සෙනො, පෙක්ඛතො සුසරෙ මමං.

"එම්බා සොඳුර, තොපගේ කුලෙහිවූ මාගේ පළමු ඇඹෙනි කෙණෙක්වූවා, උසින් එසේවෙසේ තෙණෙක් නොවන්නාහ, පුරුෂයන් සිත්ගන්නා තරම් ලදබොලඳ මිහිරි ප්‍රියතෙපුල් දන්නාහ, මාගේ ඇසට රසඤ්ඤතයක් හා සමානවූ ඒ මාගේ භායිව්ව මා බලබලා සිටියදී මා ඇස්හමුවේ උකුස්සෙක් අල්වාගෙණ මරාපියා ඇරගෙණ පලාගියේය" යි කියේය. එසේ කී කල්හි සැලලිහිණි විචාරන්නී 'තොපගේ අඹුවන් උකුස්සා කෙසේ මරාපියා ඇරගෙණ ගියේද' යි කිව. ඒ තෙමේ ඇ සිතට නැගෙණ පරිද්දෙන් බොරු ගොතා කියන්නේ "එක් දවසක් අපගේ රජ්ජුරුවෝ දියකෙළියට යන්නාහු මාත් කැඳවූ හේතු, මම මාගේ අඹුවන් කැඳවාගෙණ ගොසින් දියකෙළිපියා සවස රජ්ජුරුවන් හා සමග අවුත් මාලිගාවට නැඟී ඇඟ දිය විදලාගන්නා පිණිස මාගේ බිරින්ද කැඳවාගෙණ සිව්මැදුරු කවුළුවෙන් නික්මලා පිවත කුවාගාර කුසියෙහි නොබෝගෙහි වළල්ලෙහි උන්නෙම් ඒ ඇසිල්ලෙහි උකුස්සෙක් කුළුනෙය ආසින් යන්නේ මා අල්වාගන්ට දිවීය, මම මරණ භයින් තැතිගෙණ වහා දිවිපිමි, උන් දුරි ඇති තෙසින් බඩබරව වහා යා නුහුනුවාහ, එවිට මා බලබලා සිටියදීම අල්වාගෙණ මරාපියා ඇරගෙණ ගියේය, උන්ට භෝකයෙන් හඬන්නාවූ මා දැක, අපගේ රජ්ජුරුවන්වහන්සේ සබඳ කුමට හඬාදැ'යි විචාරා ඒ බව අසා 'සබඳ නොහඬව අනික් බිරින්දක් ගොයායව'යි කිහ.

"එබසට මම කියන්නෙම් 'ස්ත්‍රීහු නම් බොහෝසේ අනාචාරසිලිහුය, එසේතෙසින් එසේ අනාචාර දන්නා දුශ්ශිල එකකු නෙණ ඊමට වඩා උදකලාම විසිම යහපතැ'යි කිමි. එබසට කියනසේක් 'තොපගේ ඇඹෙනියන්ට ශතසහස්‍ර ගුණයෙන් වඩනා සිලාචාර සම්පන්න සැලලිහිණියක් චූලනීරජ්ජුරුවන්ගේ යාන බලා ඉඳුනිය, ඕ ඉතා යහපත් එකක, තෙපි වහා ඔබගොස් ඇගේ අදහස් පරීක්ෂාකොට පියා 'යහපත ඉදිම්' ගිම්හසි නම් ඇතෙන් අවකාශයක් ලද්දාහ නම් තෙපින් කැමැත්තා නම් වහා අවුත් කියව, මමවත් බිසවත් ගොසින් මහපෙළහරින් නෙණවුන් පාවාදෙම්හ'යි කියා තොප සමීපයට එවූසේක. මම තොප සරණ බඹවා ආමි' කිහ. ඉක්බිති කියන්නාහු "ඉදින් තෙපි මා කැමැත්තානම් වහා කියව, මා රදන්ට නොපිළිවන, මා කෙරේ රැකෙන්නා කැමැත්තානම් අපි දෙන්නමෝ සමග මාසයෙන් එක් සිත්ව සුවසේ වසම්හ'යි සිත ඇත්ත නොමලහා කියව" යි කිහ.

උන්ගේ ඔස් අසා සැලලිහිණි ඉතා මිහන් සොම්නසට පැමිණ තමා සතුටුවම නොහසවා නොකැමැත්තියකමෙන් හඟවන්නී මේ ගාථාවෙන් කියා:—

සුවොච සුවිං කාමෙය්‍ය, සාලිකො පන සාලිකං,
සුවස්‍ස සාලිකායාච, සංවාසො හොති කිදිසො.

මේ ගාථාවෙහි අභිප්‍රායනම්:-"ගිරාපණ්ඩිතයෙනි කුමක් කියව්ද? ගිරවෙක් රක්ෂාකෙරේනම් ගිරාඩෙහුවෙක, සැලලිහිණියෙක් රක්ෂා කෙරේනම් සැලලිහිණියක; ගිරවෙකු විසින් සැලලිහිණියක රක්ෂා කිරීමනම් කවර කලෙක වූවිරූ දෙයක්ද? එසේ දෙයක් මා ඇසූදැ විරුත් නැහැ"යි කිව. ඒ අසා ගිරාහෝ සිතන්නාහු "දැරිය බැහැවුම් කියනබව මුත් මා නොකැමැති සැටිය නොවෙයි,සිතින් ඉතා කැමැත්තිය. නොයෙක් පරිද්දෙන් කාරණා කියා ගිවිස්වාගත මැනව්"යි සිතා කියන්නාහු මේ ගාථාවෙන් කිහ.

යං යං නාරී කාමයති, අපි චණ්ඩාලකාමපි,
සබ්බත්ථ සදිසො හොති, නරෝ කාමෙ අසාදිසො.

"එබඳු යම් ස්ත්‍රියක් යම් පුරුෂයෙක් කැමැත්තේවිනම් චණ්ඩාල උවත් උත්තම උවත් ඇමදෙනම පඤ්චකාමයෙන් සමයහ; ඒ විෂයෙහි අඩුවැඩියක් නැත; මනුෂ්‍යයන් විෂයෙහි පවා නොයෙක් ජාති වෙන වෙන ඇතත් ප්‍රමාණනම් කාමචෙතනාවමය"යි අඟවන්නාහු මේ ගාථාවෙන් කිහ.

අත්ථි ජම්බාවතී නාම, මාතා සිබ්බිඝ රාජිනො,
සා භර්යා වාසුදෙවස්‍ස, කණ්හස්‍ස මහෙසී පියා.

"ශෝභනීය දවස චාරවතී නුවර රජකළ සෘෂණ යන ගෝත්‍රයෙහි උපන් දසබැ රජ්ජුරුවන්ට වැඩිමාලු වාසුදෙව රජ්ජුරුවෝ නුවරින් නික්ම උයන්කෙළියට යන්නාහු, චණ්ඩාලග්‍රාමයෙන් තමාගේ යම් කටයුත්තක් නිසා නුවරට එමින් සිට මඟින් ඉවත්ව සිටී අනඟී රූ ඇති එක් කුමාරිකාවක දැක පිළිබඳවූ අදහස් ඇති රජ්ජුරුවෝ ඇගේ ජාති විචාරා 'චණ්ඩාකුලයෙහිය'යි කියවත් බලවත් ප්‍රේම ඇති බැවින් අසාම්කබව අසා උයනට නොගොසින් ඇ රැගෙණ නැවත මාලිගාවට කොසින් සොළොස් දහසක් බිසෝවරුන්ට නායකකොට ඔවුහු පළදවා අඟමෙනෙසුන් කළාහ. ඒ බිසව් රජහට හිවිනම් පුතෙකු වැදූහ. ඒ කුමර පියරජහු ඇවැමෙන් චාරවතිනුවර රජකෙළේය"යි උදානරණකොට "එබඳු ක්ෂත්‍රිය කුලෙහි උපන් රජ්ජුරුවෝ පවා චණ්ඩාල ස්ත්‍රියක් රක්ෂාකළහ, නොපත් අපත් තිරිසනුන් කෙසින් කවර වෙනසක්ද? අපට ප්‍රමාදනම් ඔවුනොවුන් කැමති පමණක් මය"යි කිහ.

නැවත අනික් කාරණයක් දක්වන්නාහු මේ ගාථාවෙන් කිහ.

රථාවති කිමපුරිසි, සාපිවච්ඡං අකාමසි,
මනුස්සා මියියා සබ්බං, නත්ථි කාමෙ අසාදිසා.

මේ ගාථායෙහි අභිප්‍රායනම්:—

සටගිර දවස එක් බමුණෙක් පඤ්චකාමයෙහි ආදීනව දැක තමාගේ බොහෝ සැපත් හැර හිමාලවනයට වැද තවුස් පැවිද්දෙන් මහණව පන්සලක් කොට වසන්නේය. එතනට නුදුරු තැනෙක්හි එක් ගල් ගුහායෙක බොහෝ කිඳුරෝ වසන්නාහ. එතනට නුදුරු තැනක මහ මකුළුවෙකුත් වසන්නේය. ඒ මකුළුවා කිඳුරුලෙන ලොර දැලක් බැඳ උදැසන එකෙකු බැගින් කිඳුරන් ඉස්කඩා ලේ බොන්නේය. කිඳුරෝ ඉතා දුර්ල සත්වයෙක්ම බාහුල්ලක, මකුළුවානම් රථසකක් පමණ ඇති මහාවිසාලඋදරයක. කිඳුරෝ ඕහට කිසිවකුත් කොටගතනොහි තාපසයන් සම්පයට ගොස් මිහිරි කථා කොට ආ කටයුතු විචාළකල්හි "ස්වාමීනි එක් මකුළුවෙක් අපගේ ජීවිත හරණයකෙරෙයි; නුඹවහන්සේ හැර අනික් පිටිවහලෙක් නැත, ඌ මරා අප ඇම දිවිරැකදී අප•සුවපත් කළමැනවැ"යි කිහ. ඒ අසා තපස්වී "අප වැන්නෝත් ප්‍රාණවධ කෙරෙද්ද? මෙතැනින් පහව යා"යි අසුරගසා නෙරපිය. එවිට කිඳුරෝ සිතන්නාහු 'අපගේ රථවතිනම් කිනසරාඛ්‍යනාව අස්වාමිකය ඇ සරභාලා ගෙණවුත් යාචිඤ්ඤකරම්හ'යි තපස්වී ලඟට ගෙණවුත් 'මැ නුඹවහන්සේට පාදපරිචාරිකාවෙයි අපගේ සතුරා මරාවදාළ මැනවැ'යි කිහ. තාපසයා ඇ කෙරේ පිළිබඳසිත් ඇතිව ඇ සමඟව අළුයම් වේලෙහි කිඳුරන්ගේ ලෙන දෙර සැඟවී සිට, ගොදුරට ආ මකුළුවා මුගුරකින් ගසා ජීවිතක්ෂයට පමුණුවා, ඇ හා සමඟ වසන තපස්වියා, එහිම දූ දරුවන්ලදින් බොහෝ දවස් වැස කාලක්‍රියාකෙළේය. ගිරානෝ මේ උදාහරණය ගෙණහැරදක්වා "ඒම්බල තාපසයෝ මනුෂ්‍යව සිට තිරිසන් කිනසරාඛ්‍යනාව සමඟ විසූහ. අපි දෙපක්ෂයම පක්ෂීහ, එබැවින් තොප හා අප හා සරණමගුලට ප්‍රමාදනම් ඔවුනොවුන් කැමතිවීමය"යි කිහ.

එවිට සැළලිහිණි ගිරානන්ගේ බස් අසා "ස්වාමීනි හැම දවස්ම සිතනම් එකලෙස තිබෙන්නේ නොවෙයි; ප්‍රිය විප්‍රයෝග ඉතා නොකැමැත්තෙමි, හෙවත් නුඹවහන්සේගෙන් මතු වියෝගවීමෙක් ඇත දැන්ම නැවැත්ත මැනව, පසුව වියෙවින් ඉතා නොකැමැත්තෙමි" කිව. ගිරානෝ තමන් ඉතා නුවණැති කෙයින් හා ස්ත්‍රීමායමෙහි දක්ෂ කෙයින් තවත් විමසන පිණිස මේ ගාථාවෙන් කිහ.

කදාඛෝ 'හං ගමිස්සාමි, සාළිකෙ මඤ්ඤුභාණිනෙ,
පච්චක්ඛානුපදං හෙතං, අත්තමඤ්ඤසි නූන මං.

මේ ගාථාව කියා "තොප මෙසේ මා නොකැමැතිවම කියන හෙයින් අපි යම්හෑ, තොපගේ මෙතනට මා තනිව අවුත් යාච්ඤා කරණහෙයින් තෙපි මා නිකම් එකෙකැයි සිතුදැ? මම ඉතා රාජ පූජ්‍යයෙමි, මට අඹුවෝත් අරුමදැ? අනිකක් හොයාගණිමි, එබැවින් දැන්ම යෙමි" කිහ. සැලලිහිණි "දැන්ම යෙමි" කී බස අසමින්ම ලැය පැළියනතරම් සෝකයෙන් පීඩිතවන්නී, ඔහු දුටුවිටම උපන් සෙනහයෙන් හා කාමච්ඡන්දයෙන් සච්චාඛ්‍යයෙහි දැඩ වැදගන්නාසේවියෝ ගින්නෙන් පැලහෙන්නී, තවත් තමාගේ සැබෑ මායමෙන් නොකැමැත්තියක මෙන් හඬවා නොයාදී රඳවන්ට උපමා ඉශ්‍රකොට කියන්නී, මේ ගාථාවෙන් කියා:—

න සිරී තරමානඤ්ඤ, මාඵර සුවපණ්ඩිත
ඉඩෙව තාව අච්ඡසසු, යාව රාජාන දක්ඛසි
සොඤ්ඤ සද්දං මුතිඞ්ගනං, ආනුභාවඤ්ච රාජිනො.

මේ ගාථාවෙහි අර්ථනම්:-ගිරාපණ්ඩිතයෙනි යම්සේ සිතඇත්තක් සාදුගන්නා එකක්ඛු ඉක්මන් නොවියයුතුය. ඉක්මන් තැනැත්තවුට ශ්‍රීකාන්තා තොමෝම දුරුවන්නිය, එබැවින් අද මෙහිම රඳව, ගෘහ වාසය නමුත් බිරින්දැක් රක්ෂාකිරීම නමුත් ඉතා ඉක්මන්ව බැරිය, ඉක්මන්ව කළදෙය ඔබින්නේ නොවෙයි, එබැවින් අද රෑ මෙහි රඳව, ඉඳින් රැඳුනානම්, අපගේ රජ්ජුරුවන්ගේ මහත්වූ රාජෛශ්වර්‍ය්‍ය දැක උතුම්වූ රූ ඇති සච්චාඛරණයෙන් සැදුනු නාටිකාඛ්‍යනාවන් ලියකිදුරන් සඬර හා සමානව කියන්නාවූ ගීතිකා ඇසුවමැනවෑ, ඔවුන් විසින් වයනලද මාදඛ්‍යනාදයත් අසව; ඉක්මන්නොවී සැබවින් අද රැඳුනානම් වැඩක්මුත් අවැඩක් නැත්තේය; තොපගේ ගම බිරින්දත් නැත, ඇති බිරින්ද 'උකුස්සා ගෙණියි'සි කිව. තොප ඉක්මන් වන්නේ ඇයිදැ? රැඳුනානම් තොපගේ අභිමතාර්ථය සිඛවන්නේය'සි බැහැවුන් වසයෙන් රඳන්නා කැමතිවම කිව.

ගිරානෝ, 'තොප මෙසේ කියනපසු රඳෑයෙමි' කියා රැඳුනාහු නොයෙක් අල්ලාප සල්ලාපයෙන් ඇ සත්ගෙණ එදවස් සවස්වේලේ ලෝකාසඩාදුරතියෙහි යෙදී සන්තුෂ්ටව ඔවුනොවුන්ට ප්‍රාණය සමාන වූහ. ඉක්බිති ගිරාපණ්ඩිතයෝ "මෙවිට මෝ තමා සිතඇති යම්ම රහසක් මට හොවලහා කියයි, ප්‍රපඤ්ච නොකොට විචාරාගෙණ මෙතනින් වහා නැගියෙමි" සිතා 'සැලලිහිණිය'සි කිය. 'කිමෙක්ද සඛා මිනි' කිව. 'යම්ක් විචාරන්නා කැමැත්තෙම් කියව්දැ'සි කිහ. 'යහපත කිවමැනව, අද අපගේ මගුල්දිනය, පසු දවසේ කිවමැනව, ඉදින් මගුලට නිසි දෙයක්වී නම් අද කිවමැනව, අවමඞ්ගල්‍යයෙක්වී නම් නොකිවමැනවැ'සි කිහ. 'තෝ කුමක් කියසිද? මියේ මී වන්කලාහේ මගුල්පිට මගුලෙක මා කියන්නේය'සි කිහ. කිමෙක්ද බ්‍රහ්මදත්තා

රජ්ජුරුවෝ ඉතා රූපශ්‍රීත් බබලන්නාවූ තමන්ගේ දුවකියන් තමන් වසඟව හිඳිනා එක්සියයක් රජදරුවන්ට නොදී සතුරුවූ වේදේහ රජ්ජුරුවන්ට කුමක් පිණිස දෙද්දැ'සි කිහ.

සැළලිහිණි ශිරානන්ගේ බස් අසා ඉතා නොසතුටුව කියන්නී 'ස්වාමීනි අපගේ ඊනියා මගුල්දවසේ මෙවැනි අවමඬලාපයක් කුමක්නිසා කියේදැ'සි කිව. ශිරානෝ කියන්නාහු "මම 'මගුලැ'සි කියමි; තෙපි අවමගුලැ'සි කියව; අප දෙන්නාගේ බස් විපරිතවන්නේ කුමක්ද"සි කිහ. "ස්වාමිනි මෙසේවූ මඬලාපදිනයෙහි කිවමනා දෙයෙක් නොවෙයි; නොකියමි' කිව. සොඳුර අවශ්‍යයෙන් මට කිවමැනවැ'සි කිහ, 'ස්වාමිනි එසේවූ නොඇසිය යුත්තෙක් සමස්ත ලොකයෙහි නැත, එබැවින් කියන්ට නොපිළිවන නොකියමැ'සි කිව. 'එසේද තොප සිත ඇති රහස් මට නොකියනකල තොපගේ හා මාගේ හා සමඟ වාසයෙන් ප්‍රයෝජන කිම්ද'සි කිහ. සැළලිහිණි එබසට සෝකයෙන් පිරුණු ලැය ඇත්ති 'එසේ නොකියෙම්නම් මා ඇරපියා පලාගියෝ නම් නපුරැ'සි සිතා 'එසේවිනම් කියමි ඇසුව මැනවැ'සි කියන්නී 'බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා වේදේහරජ්ජුරුවන් හා දෙන්නාගේ විවාහ මඬලාපයසේවූ මගුලෙක් තොපගේ සතුරන්ටත් නොවේව'සි කිව.

එදිසො තෙ අමිත්තානං, විවාහො කොතු මාඪර,
යථා පඤ්චාල රාජස්ස, වෙදෙහෙන භවිස්සති.

ශිරානන් 'ඊට කාරණ කිම්දැ'සි කී කල්හි 'එහි තත්වය කියමි ඇසුව මැනවැ'සි කියන්නී "බ්‍රහ්මදත්තරජ්ජුරුවෝ 'දුවනියන් සරණදෙම් හ'සි කියා වේදේහරජ්ජුරුවන් හා මහෞෂධ පණ්ඩිතයන් හා දෙන්නා මායෙන් මේ නුවරට ගෙන්වාගෙණ මරන්නාහ; ඉදින් අවුතම් උන්ට මරබාධා නැත, මිත්‍රකමට කරණ දෙයක් නොවෙයි, ඒ මගුල නිසා වන්නාවූ අභිවෘධියෙක් නැතැ"සි කිව. නැවත කියන්නී "සරණදෙන්නා නබා දුව ඇසටත් නොපානාහ. 'දෙන්නාම මරා ජයපානය බොමිහ'සි කෝච්චියා හා රජ්ජුරුවන් හා දෙන්නා මා උන් ශ්‍රියහන් ඔබඩාවේ හිඳ රහස් මන්ත්‍රණයකොට දැන් කෝච්චියා රජු යවිස්වා ගෙණෙන්ට යියේය"සි දෙන්නාගේ රහස්කථාවෙන් මද කුත් නොවරදව ශිරාපණ්ඩිතයන්ට කිව.

ඒ අසා 'කෝච්චියාගේ නුවණ ඉතා යහපත් නියාය, මේ උපායෙන් රජහු මේ නුවරට ගෙන්වා මරන්ට බැරිනොවෙයි; සිතූ නියාම ඉතා යහපතැ'සි කෝච්චියාට කයිවාරුකොට 'අපගේ මේ නියා මගුලේ අවමගුලක් කිමෙන් ප්‍රයෝජන කිම්ද? ඒ නොකිය'සි කියා නවතා, තමන් ආ කම් සැපයුතුබව දැන, ඒ රාත්‍රියෙහි ඇ සමඟ දවස් යවා පාන්වූකල්හි "සොඳුර මම සිඹිරට කොසින් 'මා සිත්වන් බිරින්දක් ලදිමි' මාගේ රජ්ජුරුවන්ට කියන්ට යෙමි, මට සද්දවසකට

සමුදෙව, අටවැනි දවස මහපෙළහරින් එමි, මා එනතෙක් තෙපි මා කෙරේ සෝකයෙන් නොකා නොබී වැහැර නොගොස් උසාවලි නොව සුවසේ ඉඳුව''යි කිහ. සැළලිහිණි ගිරාසන්ගේ වියෝදුක් ඉවසියනොහි සමණන්ට උත්තර කිමෙහි අසමර්ථවයහපත සද්දවස කට අවකාශ දෙමි, අටවෙනිදා ආයේනම් ඒකාන්තයෙන් මා මල තෙසට නුඹ එන්නේය, සැබවින් මා කැමතහොත් සද්දවස ඇතුළත අවමැනවැ'යි කිව. 'ගොඳුර කුමක් කියව්ද? ඉදින් අටවෙනිදා තොප නුදුරුම්නම් මාගේ ජීවිතය තමා ඇද්ද?දැරිඇති අඹුව නොකලේ මිය යාමක් හා අලුත් අඹුවන් රකුසාකළ සද්දවසකින් මළකල මාගේ ලැය ගලෙක්ද? තෙපි මා එන ගමන සැකනොකරව'යි කියා සිතින් සිතන් සාහු 'තෝ මියේවා රැකේවා තිගෙන් මට ප්‍රයොජන කිම්ද'යි මැදිරියෙන් නික්ම සිවිරට දිසාවට මුහුනලා මදක් තැන් කොසින් නැවත මියුලුනුවරට ගොස් බෝධිසත්වයන්වහන්සේගේ උරයට බටහ. මහ කානෝ මතුමහල්තලයට වඩාගෙණ විචාළකල්හි සැළලිහිණිය කී කළදෑ මුළුල්ල ආද්‍යන්ත නොවිරදවාම කිහ. බෝධිසත්වයන්වහන්සේ මී හා පිලඳ කවා මීපැන් පොවා ශතපාක සහස්‍රපාක තෙලින් දෙපියා අතුර කකුල් සනි මිරිකා ඉතා සැපවූ රන් මැදිරියේ සැතැප්වූසේක. ඒ බව ප්‍රකාශකොට වදාරණ බුදුරජාණන්වහන්සේ මේ ගාථාවෙන් වදාරණසේකි.

තතො ච ඛො සො ගන්ත්වාන, මාඩරො සුවපණ්ඩිතො,
මහොසධස්ස අක්ඛාසි, සාලියා වචනං ඉදං.

'එබබා මහණෙනි, ඒ ගිරාතෙමේ සැළලිහිණියගෙන් රහස් කථා ගෙණවුත් මහෞෂධ පණ්ඩිතයන්ට කියේවේදැ'යි වදාළසේක.

ගිරාසන්ගෙන් බස් ඇසූ අනතුරු බෝධිසත්වයන්වහන්සේ සිතන සේක් ''මේ රජ්ජුරුවෝ මා නොකැමැතිකරවා ගොස් මහාවිනාශයට පැමිණෙන්නාහ; 'මෙවෙනි යසඳුයසකවූ රජ්ජුරුවන්ගේ බස් සිත තබා ඒබව දැන පිවිසිහල්නුවූහ'යි දත් කෙණෙක් නිදැකෙරෙති. මා වැනි පණ්ඩිතයෙකු ජීවත්ව ඉන්දදී මේ රජ කුමක් පිණිස නස්නේද? රජහට පළමුව ගොස් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් දැක වේදේහරජ්ජුරුවන්ට යහපත් නුවරක් කරවාලා ඔව්වක් පමණ සුළු උමඟක් හා දෙඔව්වක් පමණ මහඋමඟක් කරවාලා, චූලනීරජ්ජුරුවන්ගේ දියනියන් අපගේ රජ්ජුරුවන්ට අභිෂෙකකරවාදී, එක්සියයක් රජදරුවන් හා අටලොස් අක්ෂෝභිණියක් පමණ මහාසේනාව අප උන් නුවර වටලාගෙණ සිටියදී අපගේ රජ්ජුරුවන් රාහු මුඛයට වන් සඳමඬලක් පරිද්දෙන් ගලවාගෙණ එන ගමන මට භාරවන්නේය''යි සිතන සවාමි දරුවානන් ශරීරයෙහි පස්වණක් ප්‍රීති උපන්නේය. ප්‍රීති වේගයෙන් උදන් අනනශේක් ''යම් පුරුෂයෙක් යම් රජ්ඤගෙන් සියලු සම්පත් ලදින් කිසිවෙකිනුත් අන්‍යනව මහා ආඩ්‍යව වෙසේනම්, එසේවූ

ප්‍රඥාසම්පන්න පුරුෂයා විසින් කාය වාක් මනඃ යන චාරිත්‍රයෙන්ම ඒ රජහට වැඩෙහි කැසිරියයුතුය; ඔවුන්ගේ ආපදාවක් දුටුකල්හි ඉන් මුදාලන්ට ශක්‍ති ඇතිවත් ඊට පිටුවහල්නොවිනම්, මිත්‍රද්‍රෝහියායෑ එබැවින් රජහු නුවණ නැතිව නොදැන කියාපු යම්තම් බස් පමණක් සිත තබාගැන්ම මට තරම් නොවේ'යි සිතා, සොළොස් කලයක් සුවඳ පැනින් ඉස් සෝධා නහා සම්‍යාරණයෙන් සැරසී මහපෙළහරින් රජ ගෙට ගොස්, රජහු වැඳ එකත්පස්ව සිට වදාරණසේක් "කිමෙක්ද මහරජ උත්තරපඤ්චාල දෙශයට යනසේක්ද"යි වදාළසේක.

"එසේය පුත යෙමි, **පඤ්චාලචණ්ඩි කුමාරිකාව** නොලබන්නාවූ මට රාජ්‍යයෙන් ප්‍රයොජන කිම්ද? නොපිත් මා අත්නොහැර කැවිව එව; ඔබ යාමෙන් වැඩ දෙකක් වන්නේය, ස්ත්‍රිරත්නයත් ලබමි, රජ්ජුරුවන් හා සැවිමෙන් ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රී සිතත් පිහිටන්නේය"යි කීහ. ඉක්බිති රජ්ජුරුවන්වහන්සේට පණ්ඩිතයෝ කියන්නාහු "මහරජ එසේවිනම් මම පළමුකොට ගොස් නුඹවහන්සේ ඉඳිනා මැලිහා ආදී කෙවල් නංවාලා, යම් දවසෙක කියා එවිම්නම් එදා වැඩිය මැනවැ"යි වදාළසේක. ඒ අසා රජ්ජුරුවෝ 'ඒකාන්තයෙන් දරුවන් මා අත්නොහරණ සැටිය'යි ඉතා සතුටුවූ සිත් ඇතිව 'පුත තොප පළමු යන්නවුන්ට කුමක් ලදමනාදැ'යි කිය. 'බල වාහන ලදමැනවැ'යි කීහ. යම් පමණක් කැමැත්තානම් එපමණක් ගෙණ යවයි කීහ. ඒ මහතාණන්වහන්සේ "සිරගෙවල් රැකවල සිටිනා බලසම්පන්න යෝධයන් මා හා කැවිව එව්ව මැනවැ"යි වදාළසේක. රජ්ජුරුවෝ කියන්නාහු 'මට කියන්නේ කිම්ද? තොප කැමැත්තක් කරව'යි කීහ. ඒ මහතාණෝ සිරගෙවල දෙර හරවා ගිය ගිය තෙන සිතූ සිතූ අසීයක් සාදුදෙන්ට බලඇති සූරවීර යෝධයන් දම්බිඳුවා පිටත් කරවාගෙණ 'මට සේවයකරව'යි ප්‍රසාදදෙවා වඩු කඹුරු සොම්මර චිත්‍රකාරාදීවූ නොයෙක් කම්මාන්තයෙහි දක්ෂවූවන්ගෙන් අටලොස් කුලයක් හා වැ පොරෝ උදළු යහුල්ආදිවූ උවමනා බොහෝ උපකරණ හාණ්ඩ ගෙන්වාගෙණ මහසේනාව පිරිවරා නික්මුණුසේක. බෝධිසත්වයන්වහන්සේ නික්මුණු නියාව ප්‍රකාශකොට වදාරණ බුදුරජාණන්වහන්සේ මේ ගාථාවෙන් වදාරණසේක.

තතෝ ච පායාසි පුරෙ මහොසධො, පඤ්චාලරාජස්ස පුරං සුරම්මං
නිවෙසනානි මාපෙතුං, වෙදෙහස්ස යසස්සිනො.

"එම්බා මහණෙනි, ඒ මහෞෂධ පණ්ඩිතයෝ වේදේහරජහට පළමු ගොස් නුවර හා ගෙවල් කරණ පිණිස බලවාහන ගෙණ නික්මුණෝවේද"යි වදාළසේක. බෝධිසත්වයන්වහන්සේ වඩනාසේක් සතරගව්වෙන් සතරගව්වට එකි එකි ගමක් බැගින් ගම්කරවා ගම කට ඇමැත්තෙකු බැගින් සිටුවා මෙසේ විධාන කරණසේක් "තොපි

අපගේ රජ්ජුරුවන් පඤ්චාලචණ්ඩ කුමාරිකාවන් ඇරගෙණ එනකල, ඇත් අස් රථ ආදිවූ වාහන සරහා කැටිව ආ දුම්ල වාහන රඳවා ගෙණ තොපගේ වාහනවලට නංවා සතුරන්ට අසුවියනොදී වහා මියුලුතුවරට යමාලව''සි වදාළසේක.

මෙසේ මායිහ සංවිධානයෙන් හොස් ගංතෙරට පැමිණ ආනන්ද කුමාරයයි යන එකක්හු කැඳවා ''තෙපි තුන්සියයක් පමණ නැව්වඩුවන් ඇරගෙණ හොස් හරඇති දඹු කප්පවා තුන්සියයක් නැව් කරවා මාලිකා වාසල් දෙරටු අට්ටාල ගෙවල් ආදිය කරවාගන්නාලෙස දරු සම්භාර ඔබදීම ලැසුකොට සන්වා නැඟී තුන්සියය පුරාගෙණ එව''සි විධානකොට යවා තමන්වහන්සේ හඬින් එතරව බැස පියවර සතින් ගණනසේක් ''මේ දෙගව්වක් පමණ තෙන මහ උමඟ වන්නේය. ඒ ඉක්බිති මෙතැන්හි අපගේ රජ්ජුරුවන් හිඳිනා තුවර වන්නේය, නැවත මෙතැන්පටන් රජඟය දක්වා මේ ගව්වක් පමණ තැන සුළු උමඟ වන්නේය''සි සවකිය ප්‍රඥාවෙන්ම නියම දැන මහපෙළහරින් නුවරට වන්සේක.

බෝධිසත්වයන්වහන්සේ එන නියාව චූලනීබ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ අසා ''මහෞෂධ පණ්ඩිතයා ආ කල වේදේහයා නොබෝකලකින් එන්නේය; ඒකාන්තයෙන් මාගේ සතුරන් පිටිදකිමි, මෙවිට මාගේ මනතෙළ පිරෙන්නේය, මෙවිට දෙන්නාම මරා ජයපානය බී, සියලු දඹදිව එක්සත්කොට රජකෙරෙමි''සි ඔදවැඩී සතුටුව ගියහ.

ජීවකෙත්‍ර රසාඤ්ජනවූ සවාමිදරුවානන් නුවරට වදුන්ම අයම්විත රින් අටසාළිස් හව්වක් පමණඇති ඒසා මහත් නුවර වාසී මනුෂ්‍යයෝ එකතෙලා ''මහෞෂධ පණ්ඩිතයෝනම් මූල, එක්සියයක් රජුන් හා අටලොස් අමාත්‍යාභිණ්ඩියක් සේනාව, කැටක්දමා කපුටුරැසක් නෙරණ්සේ, ඉස් ලූ ලූ අත ලුහුබදවාපුවෝ නම් මේ මහතානෝදැ''සි බලා ඇස් ඇදහතනොහී මහාආශ්චර්‍යයට පැමිණියහ. සියලු නුවර එදවස් සඳරැස්වන් කිරිමුහුදක්සේ කෝලාහල කියේය.

මෙසේ ඒ නුවරවාසීන් තමන්වහන්සේගේ රූපදර්ශනයෙන් සන්තෝෂව බල බලා සිටියදී රජගෙදොරට හොස් ආ නියාව කියා යවා 'එන්ට කියව'සි කියල්සි රජගෙට වැද රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිටිසේක. එවිට රජ්ජුරුවෝ මියුරු කථාකොට 'පුත රජ්ජුරුවෝ කවරතු එද්දැ'සි කියහ. 'මා කියා යැවූකලස'සි වදාළසේක. 'තෙපි පළමු කුමක් පිණිස අව්දැ''සි කියහ. 'දේවයන්වහන්ස අපගේ රජ්ජුරුවන්ට මඟුලට මාලිකා නංවන්ට ආමි' වදාළසේක. 'යහපතැයි කියා බෝධිසත්වයන්වහන්සේ හා කැටිව ආ ඉස්නාවට බන්ධියදම් දෙවා මහතා නන්ට මහත් සත්කාරකොට ඉඳිනට යහපත් මාලිකාවක් දී 'පුත

රජ්ජුරුවන් එනතෙක් උකටලිනොව අපටත් කළමනා දෙය කරවාලා සුවසේ ඉඳුව'යි කීහ. ඔබත් රජගෙට නැගෙණසේක් මතුමාලට නැගෙණ හිණි පාමුලසිට'මෙතැන්හි සුළු උමඟ දෙරකඩය'යි සිතුසේක. නැවත ඔබට මෙසේවූ අදහසකුත් වූයේය. "මේ රජ්ජුරුවෝ 'අපටත් කළමනාදෙය කරවාලව'යි තුමූම කීහෑ එබැවින් උමඟ කණන කල මේ හිණ නොවැටෙන ලෙසක් කෙරෙමි" සිතා නැවත රජ්ජුරුවන්ට වදුරණසේක් "මහරජ මාලිඟාවට නැගෙන්නෙම් හිණිපාමුල සිට මාලිඟාවේ නවකම්මාන්ත බැලීම්, තෙසු මා දුටු නපුරෙක්නම් නැත, නැගෙණහිණ යම්තම් වරදෙක් ඇත, කැමතිසේක්නම් ඊට තරම් දඩුපත් ලදිම්නම් නිකම් වඩුවෙකුතබා විශ්වකර්මයාත්'නපුරු'යි නොකියනලෙස කරවාලමි" වදාළසේක. 'යහපත තොප කැමති ලෙස කරවාලව'යි දාරුසම්භාර දෙවූහ. ඒ මහතානෝ 'උමඟදෙර මෙතන වියයුතුය'යි සිතා ඉදුරු සලකාගෙණ පරණ හිණ හරවා, යම් තෙනක උමඟ දෙරවේද, එතන පස් නොවැගිරෙණ පරිද්දෙන් පෝරු අතුරුවා නොගෙන පරිද්දෙන් නිශ්චලකොට හිණ සිවුවාලූ සේක. රජ්ජුරුවෝ මේ අනතුරය නොදන්නාහු තමා කෙරේ ඉත සිතින්ම කෙරෙති සිතූහ. ඒ පරණ හිණ ඔබ දුටු වරදනම්, යවින් උමඟ බිඳිනකල හිණ ඉණිනම් නපුරු'යි යන මෙපමණෙක්මය.

මෙසේ එදවස් නවකම්මාන්තයෙන් දවස් යවා දෙවන දවස් රජ්ජුරුවන්ට කියනසේක් "දෙවයන්වහන්ස ඉදින් එක් තිලයක් ලදුමෝනම් අපගේ රජ්ජුරුවන්ට හිඳිනා පරිද්දෙන් යහපත්කොට මාලිඟා ආදිවූ ගෙවල් නංවාලන්නමෝවේද"යි වදාළසේක. "යහපත පුත මාගේ මාලිඟාව හැර මේ තුවරින් යම් ගෙයක් කැමැත්තානම් ඒ ගත්ව"යි කීහ. "මහරජ අපි ආගන්තුකයම්හ, ඔබවහන්සේගේ බොහෝ වල්ලභයෝය, ඔහු තමතමන්ගේ ගෙවල් ගන්නාකල අප හා කලහ කරන්නාහ, උන්ට අපි කුමක් කරමුද්ද"යි වදාළසේක. පණ්ඩිතයෙනි තොපි උන්ගේ බස් නොගිවිස තොප කැමති ගෙයක්ම ගන්ව"යි කීහ. "දෙවයන්වහන්ස අප ගෙය නිලකොට ගන්නාතෙක්ම අපගෙන් දෙරකඩ රැකවල් විනම් කියන්ට ආවුත් වැද්දකොදෙන්නා පලායන්නාහ, එසේකල අපටත් නුඹවහන්සේගේ සිතටත් දෙම්නසක් නැත්තේය"යි වදාළසේක. රජ්ජුරුවෝත් "ඉතා යහපත, තොපගෙන්ම රැකවල් ලවාගන්ව"යි කීහ. බෝධිසත්වයන්වහන්සේද හිණිඉසය රජගෙයි දෙරකඩය යන මේ කැමතැන්හිම තමන්වහන්සේගෙන් රැකවල් ලැබූසේක. 'රජගෙට කාත් වැද්ද නොදෙව, පළමුකොට ගොස් රජ්ජුරුවන්ගේ මැනියන් තලතාදෙව්න්ගේ ගෙය බිඳුව"යි නියෝගකළ සේක. ගියාවූ පුරුෂයෝ දෙරටුයෙහි පටන් හිත්ති පදනම් ඇතුළුව උළුසුඹු මැටි ආදිවූ දෙය බිඳ හරණම පටන්ගත්හ.

රාජමාතාවෝ එපවත් අසා මහවහා ගෙන් අවුත් "කොල අපගේ

ගෙය බිඳුනෝ කවුරුදැ'යි කිහ. මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ මේ ගෙය බිඳුවා තමන්වහන්සේගේ රජ්ජුරුවන්ට මාලිගා නංවනසේකැ'යි කිහ. 'ඇයි දරුවෙනි මේ ගෙයි ඛුන්කල කිම්දැ'යි කිහ. 'අපගේ රජ්ජුරුවන්ගේ බොහෝ සේනාව හෙයින් මේ ගෙය ඉතා කුඩාය, මහත් කොට මාලිගා කරවන්වය'යි කිහ. එබසට බිසව් කිපී "කොල තොපි මා රජ්ජුරුවන්ගේ මැනියන්බව නොදනුද? දැන් මපුතනුවන්ට කියා තොපව කියවි දන්නෙම්වේදැ"යි කිහ. "නුඹවහන්සේ කුමක් පෙඩනසේක්ද? අපි අපගේ පණ්ඩිත සැමීන්ගේ බසින් බිඳුම්හ. ශක්ති ඇතිදැ විනම් නවතාගන්නැ"යි කිහ. තොපව කියවි කියම්' කිපී රජගෙට කියන්ට ගියහ. දෙරකඩ සිටි රැකවල්ලු 'නොවදුව'යි කියා නැවතුහ. "කුමක් කියව්ද? මම රජ්ජුරුවන්ගේ මැනියෙමි, මට පෙර රැකවලෙක් නැත, මා යා දෙව"යි කිහ. "කාත් වැඳ්ද නොදෙව'යි තොපගේ රජ්ජුරුවන් විසින්ම කියනලද, තෝ මෙතන නොසිට පලායා"යි කිහ. බිසව් කිසිවක් කියන්ට නොපොහොසත්ව තමන්ගේ ගේ බිඳුනා බලබලා සිටියහ. එසේ සිටියවුන් එකෙක් නැගිසිට 'මෙතනින් යෙයිද නොයෙයිදැ'යි බොටුව අල්වාගෙණ තරවා දමාලීය. ඒ මැහැලිවහන්සේ මුහුනින් හි පියා දුකසේ නැගිසිට සිතන්දැ "ඒකාන්ත යෙන් රජ්ජුරුවන් කියේ සැබෑසැවිය, ඉන් මිසක් මට මෙසේ කරන්ට සමර්ථ එකෙක් ඇද්ද? පණ්ඩිතයන් සම්පයට යෙමි" සිතා හොස් "පුත මහෞෂධ පණ්ඩිතයෙනි මාගේ ගෙය කුමක් නිසා බිඳුවාදැ"යි කිහ. ඔබ උන් හා කැවිව එකබසකුත් නොකියා නොඇසූ කන්ව ඒ දසාව නොබලාපියා සිටිසේක. ලඟ සිටි පුරුෂයෝ 'දේවීන්දැ කියන්නේ කිම්දැ"යි කිහ. 'දරුවෙනි පණ්ඩිතයෝ මාගේ ගෙය කුමට බිඳුවද්දැ'යි කිහ. "වේදේහරජ්ජුරුවන්ට මාලිගා කරවන්වය'යි කිහ. "ඇයි දරුවෙනි මේසා නුවර අතික් ගෙයක් නොලැබෙයි සිතව්ද? මාගේ මේ මසු ලක්ෂය ගෙණ අතික් තැනකින් ගෙයක් ගෙණ මාලිගා කරව"යි කිහ. ඒ වන්නා නුඹගේ මේ ලක්ෂය ඇරගෙණ ගෙය අරවා පියම්හ, මේ නුවර අපොහොසත් කෙණෙකුත් මදවුව, එසේහෙයින් අතික් ගෙයක් අල්වාගන්කල උසින් අන්ලස් දෙන්නවමසිතති,එසේ කල ගත් ගත් ගෙවල් අන්ලසටම අරණකල අප ගෙවල් ලබන්නේත් මාලිගා නඟන්නේත් කෙසේද? වන්නාටය නුඹවහන්සේ මෙසේම අඩා දෙඩා සාවිඤ්ඤකරත් අන්ලස් දී ගෙය අරවාගත් නියාව ඔබ්බට නොකියනොත් හැරපියම්හ"යි කිහ. "දරුවෙනි කුමක් කියව්ද? රජ්ජුරුවන් මැනියෝ පවා අන්ලස් දී ගෙය හරවාගත්හ'යි කී කල මටත් ලජ්ජාවන්නේය; එබැවින් මා පණ තබා කාටත් නොකියම්" කිහ. ඔහු 'යහපතැ'යි බිසවුන් දුන් මසු ලක්ෂය ඇරගෙණ ගෙය බිසවුන්ටම අළඟ, මැලින් මසුරන් ලක්ෂය නම් දුන් මේ සමයෙහිදු තඹ ආදී පස් ලොසින් හැසූ රනෙක් නොවන්නේය. ඒ රනට 'නීලකඤ්ඨපණ'යයි කියති. ඉන් සතර අකෙක් මාඇරත්රන්ය, සතර අකෙක් පස්ලෝය,

එබැවින් ඒ බිසවුන් දුන් මසුරන් ලක්ෂයෙන් පණස්දහසෙක් 'මාඵරත් රනැ'යි දතයුතු.

ඒ ගෙය හැර එතනින් ගොස් කේවට්ටයාගේ ගෙයි බාගෙණ පළමු පරිද්දෙන් ඇරවුයෙහි පටන් බිඳිනට වන්හ. ඒ බමුණු පැණහැගි "ගොවියාපුත් තමාගේ නුවරදී එක්සියයක් රජදරුවන් හා සේනාව බලබලා සිටියදී තමාට සතුරුව ගිය මෙතෙක් දෙනාගෙන් මාගේම බොටුව අල්ලාගෙණ බිම උලා නලල මූන ආදිවූ තැන් ලේකැන් ලේ මඩුලු කොටපියා දුන් කබරව දැගියාසේ ලජ්ජාවට පමුණුවාපිය, නැවත විවාමගුල කියා ගියාවූ මා තමාගේ ගෙයිදී තනිකොටගෙණ තමාගේ බලසම්පන්න පුරුෂයන් ලවා උණපත්තෙන් මරවා පිටිකර හස්වා එසේත් මා නොමී නියාවත් කොටපිය. ඒ මදින්ඒදු දුන් මිට අවුත් මේසා නුවරින් මාගේ ගෙය බිඳුවා මා උන්තෙනින් නෙරණ මානකෙරෙයි, වන්නාවය ඌගේ රජු නාවත් දෙන්නාටම කළමනා දෙය මූට කරවමි" තරව කිපි රජහට කියන්නට රජගෙයි දොරට ගියේය; රැකවල සිටියවුන් විසින් බමුණු මාල්ලා මැන නේයි' කියව කියවා තමා වලලහකමට දොරකඩට ගියේය. රැකවල්හු 'කොල නිකෘෂ්ට ගුණ ඇති දුෂ්ටවූ බමුණ මැන නේයි කියවකියවා එයිදැ'යි එකෙක් නැගිසිට හසන්නේ තමා පසඟිල්ල බමුණා පිටිකර පෙණෙන පරිද්දෙන් හසා හඬු නහාපිය; ඒ පාර ලදින් තුෂ්ණීම්භූතව ඉඟිකරුව කකිය කකියා, අනික් උත්තරයක් කියන්නට අසමර්ථව හතයුත්තාක් නොදන්නේ මසු ලක්ෂයක් දී ගෙය අරවාහන. මේ උපායෙන් එදවස් සවස්වන දැතුරේ සියලු නුවර ගෙවල් බිඳුවා නැවත හරණට හස් අත් ලස් රන් එක්කොට නවකෝටියෙක් වන්නේය. ඒ නවකෝටියෙන් සතරකෝටි පණස්ලක්ෂයක් මාඵරනැයි දතයුතු.

නැවත බෝධිසත්ත්වයන්වහන්සේ නුවර මූළුල්ලෙහි ඇවිද රජගෙව වැඩිසේක. රජ්ජුරුවෝ 'පණ්ඩිතයෙනි වසතතෙනක් ලදුදැ'යි විචාළහ. "මහරජ නොදෙස කෙණෙක්නම් නැත, එසේවුවත් බොහෝ දවසක් වැදහුන් ගෙවල් හන්නාකල මහත් දොම්නසින් කම්පිතවන් නාහ, උන් උන්ට ප්‍රිය විප්‍රයෝග කිරීම මට තරම් නොවෙයි, මේ නුවරින් පිටත හව්වක් පමණ මේනම් තෙන බිම අවකාශයෙක් ඇත, එතන අපගේ රජ්ජුරුවන්ට ගෙවල් මාලිගා නගමහ'යි වදාළසේක. ඒ අසා රජ්ජුරුවෝ ඕතන්නාහු "ඇතුළු නුවරදී සටන්කරණකල සතුරන් දතනොහැක්කා; පිටතදී චීනම් වටලාගෙණ සුවසේ සතුරන් මරා ජයහතහැක්කැ"යි සිතා සොම්නස්ව 'යහපත පුත තොප සැලකූ තෙනම නිලකරව"යි කීහ. මහරජ අපිවන්නා ඒ සියල්ල කරම්හ, නුඹවහන්සේගේ ඕනිසුන් ඒ දහවට දර පලාදී යම්කිසිවක් පිණිස අපගේ නවකර්මාන්තානුමයව නොයායුතුය, ගිය කෙණෙක් යම්සේ කලහයක් කෙරෙන්මුය, එවේලෙහි නුඹවහන්සේගේ සිතට සැපයෙක්

නැත්තේය'යි විදැළඹේක. 'යහපත පුත මැතින් ඒ දසාවට යන මිනිසුන්ගේ ගමන් නවතාලමි' කිහ. දේවයන්වහන්ස අපගේ ඇත්තු දියකෙළියට රැස්වන්නාහ, එක්වන් දියෙහිම කෙළනාහ. 'මහෞෂධ පණ්ඩිතයන් ආවක් පවන් පහන් පැනක් බීපියන්වත් නොලබමිහ'යි නුවරවාසි කිපෙත්නම් එයිත් ඉවසුව මැනවැ"යි විදැළඹේක. 'පුත තොපගේ ඇත්තු සුවසේ ගිම් නිවා දියකෙළිත්ව"යි කිහ. නැවත රජ්ජුරුවෝ "මහෞෂධයන්ගේ නවකම්මානන්ත භූමියට මේ නුවරින් යම් කෙණෙක් ගියාහුනම් දහසක් දඩය"යි නුවර බෙරලැවූහ.

උමඟ කම්මානන්තය.

බෝධිසත්වයන්වහන්සේ රජහු වැද තමන්වහන්සේගේ පිරිවර හා සමඟ නුවරින් නික්ම තමන් විසින් නියමකරගත් තැන නුවර කරවන පිණිස කොසින් ගඟින් එතර 'ගඟුල් ගමුවක්'යි ගමක් කරවා ඇත් අස් රථ ආදිවූ වාහනද කෙරි සරක්ද එහි රඳවා නුවර කම්මානන්තයට විධානකරණසේක්:—'මෙතෙක් දෙන මේ මේ කරව, මෙතෙක් දෙන මේ මේ කරව'යි කම්මානන්ත බෙදා උමඟ කම්මානන්තයට පවත්වත්සේක, මහඋමඟ දෙරකඩ ගඩොයෙහි අස විය, බලසම්පන්න සඳහසක් යෝධයෝ මහඋමඟ කණන්නාහ, මහත්වූ සම්පයිවලින් පස් පුරාගෙණ ගඟ දියෙහි ලන්නාහ, ලූ ලූ පස් මුළුල්ල ඇත්තු මඩ නාහ, එබැවින් ගඟ පැන් කැළඹී මඩවන්නේය. නුවරවාසිහු 'මීට කාරණ කිම්දැ'යි කියන්නාහ. මහතානන්ගේ චරයෝ "මහෞෂධ පණ්ඩිතයන්ගේ ඇත්තු දියකෙළනාහ, ඉන් ගඟ පැන් මඩවන්නේය, මැඩමැඩ මඩ මතුකරන්නාහ'යි කියති. එබැවින් සැක නොකරන්නාහ.

බෝධිසත්වයන්ගේ අභිප්‍රාය නම් සිඳවන්නේය. එසේකෙසින් ඒ උමඟ ඔලෙක්වත් මුලෙක්වත් නැතිව බිම ගිලී අන්තර්ධානවිය. සුළු උමඟ දෙරකඩ උපකාරිනුවර වූයේය. සත්සියයක් පමණ යෝධයෝ ඒ උමඟ කණන්නාහ. සම්පයිවලින් පස් කෙණවුත් නුවර ලන්නාහ. ලූ ලූ පස් පැනින් මිරිකා අනා පවුරු බඳනාහ. කෙවල්මැවි ආදී කම්මානන්ත කරන්නාහ. මහඋමඟට වදනා දෙරකඩ එම නුවර වූයේය. අවලොස්රියන් උස ඇති යන්ත්‍රයෙන් යුක්තා දෙරවලින් ගැවසීගත් තේය, ඒ දෙරවල් මුළුල්ල එක ඇණක් මිරිකාලන්නා සියලු දෙරවල් පිහියන්නේය; අනික් ඇණක් මිරිකාලන්නා ඇරියන්නේය ඒ උමඟ දෙපාශ්වයෙහි උලින් බඳවා සුණුකම්මානන්ත කරවූසේක, ඔදුනේ වියන්පෝරු අතුරුවා සඟ ලා ගාවා මකුලෙන් අතිබවල කරවූසේක. ඒ මහඋමඟ අසූ මහදෙරක් හා සූසැවක් සුළුදෙර වූයේය. ඒ මුළුල්ල යන්ත්‍රයෙන් යුක්තාවූයේය. ඒ උමඟ දෙපාශ්වයෙහි

නොයෙක් සියදහස් ගණන් පහන්ගබඩාත් වූයේය. එහිත් යන්ත්‍රයෙන් යුක්ත අගුළුම වූයේය. තවද ඒ උමඟ දෙපාර්ශ්වයෙහි එක්සිය යක් රජදරුවන්ට ක්‍රියහන්ගබඩාත් වූයේය. එහිත් යන්ත්‍රයෙන් යුක්ත අගුළුම වූයේය. එකි එකි ගබඩායෙක්හි නොයෙක් පැයෙන් යුක්තවූ කොදුපලස් ආදියෙන් අතුව සරඹ තබනලද සැතපෙන මඤ්චකයුත් ඇත්තේය. නඟණලද බවලඡත්‍ර ඇති එසේම සරඹනලද එකි එකි සිංහාසනයකුත් ඇත්තේය, ක්‍රියහන්ගබඩාවල මඤ්චකයන් ලඟ උතුම්වූ රූ ඇති දිව්‍යාප්සරාවන් බඳු සර්වාභරණයෙන් සරඹ සිටුවන ලද පෙතලි රූත් වන්නේය. නොදන්නවුන් අතින් පිරිමැදුමුත් 'අජීවය'හි නොදත හැක්කේය. තවද ඒ උමඟ දෙපාර්ශ්වයෙහි දෑසවූ චිත්‍රාකාරයන් ලවා ඇති මනොහරවූ සිත්තම් කරවනලද්දේය, ඒ සිත් තම් කවරේදයත්? ශක්‍රවිලාසය, සතරමහලිපය, මහාමේරුපර්වතය, සතරමහාසමුද්‍රය, හිමාලයපර්වතය, අනවතප්තවිලය, සිරියෙල්අතලය, චන්ද්‍රබිම්බය, සූර්‍යබිම්බය, චාතුම්මහාරාජිකාදි කාමාවචර දිව්‍යලෝකය, මොඩිඝ බ්‍රහ්මලොකය, යනාදී ලොව විද්‍යමාන ආශ්චර්‍යමත් දෙයත් උමඟ සිත්තම් කරමාලුසේක. රිදී පටක් හා සමානවූ සුදු වැලි තන මාලුසේක. ඒ උඩුම්යන තවු උඩ බලා කෙම් බිම බලා එල්වනලද සුපුෂ්පිතවූ පද්ම වනයක් පරිද්දෙන් අඳවාලුසේක. උමඟ දෙපාර්ශ්ව යෙහි නොයෙක් බඩු පුරා තිබෙන සල්පිළින් සැදවූසේක. ඒ උමඟ ඒ ඒ ස්ථානයෙහි ගන්ධදාම පුෂ්පදාමයන් එල්වූසේක. ඒ උමඟ සුධර්මා නම් දිව්‍යශාලාවසේ අලඞ්කාරවිය.

පළමු යැවූ ආනන්දනම් අමාත්‍යයා තුන්සියයක් වඩුවන්ලවා සැස නිමවනලද දරුසම්භාර නැව් තුන්සියක් පුරා ගෙන් ගෙණවුත් බෝධි සත්වයන්වහන්සේව කියා, බෝධිසත්වයන්වහන්සේ දඹුපත් තුවරට බාහෙණ 'තෙල නැව් සඟවා තබා මා කී යම් දවසක ගෙණෙව'හි නික්මෙන තොට උඩුගඟින් තුදුරු තැනෙක්හි සඟවා තැබ්බවූසේක. නැවත ඒ තුවර 'පැන්අඟලය කලල්අඟලය වියලි අඟලය'යි අඟල තුණකුත් කැණවූසේක. තවද ඒ තුවර අටලොස්රියන් උස පවුරද පවුරට තරම් පදනමද වාසල් අටවාල බලකොටු කුරුබිලි ආදියද රජගෙය ආදිවූ නොයෙක් ගෙවල් සමූහද ඇත්තල් අස්තල් පැන් පොකුණු ආදියද යන මේ සියල්ල නිමාවට පැමිණේය. සුළු උමඟය මහ උමඟය ඒසා මහත් බිම පිස කරවූ තුවරය යන මේ සියල්ල සාර මසකින් නිමවා ඉක්බිති බෝධිසත්වයන්වහන්සේ රජ්ජුරුවන් කැඳවා දූතයන් යැවූසේක. ඒබව ප්‍රකාශකොට වදාරණ ඛුද්දකනිකායන්වහන්සේ මේ ගාථාවෙන් වදාරණසේකි:—

නිවෙසනානි මාපෙත්වා, වෙදෙහස්ස යසස්සිනො,
අථස්ස පහිණී දූතං, එහි දානී මහාරාජ මාපිතංතෙ නිවෙසනං.

"එම්බා මහණෙනි, මහෞෂධ පණ්ඩිතයෝ වේදේහරජහට පළමුව ගොස් නුවර උමං රජගෙවල් ආදිය කරවා සාරමසකින් නිශ්චාකොට වේදේහරජු කැඳවා දූතයන් පැවූහයි වදාළසේක.

පෙරමග බලබලා උන්නාසේ රජ්ජුරුවෝ දූතයාගේ ඔස් අසම්ම්ම සේනාව පිරිවරා නික්මුණහ; ඒ බව ප්‍රකාශකොට වදාරණ බුදුරජාණන්වහන්සේ මේ ගාථාවෙන් වදාරණසේක:—

තතො ච රාජා පායාසි, සෙනාය චතුරඞ්ගිය,
අනන්තවාහනං දට්ඨුං, ජිතං කම්පිල්ලියං පුරං.

"එම්බා මහණෙනි, අවලොස් අනෙකාකිණි සඞ්ඛ්‍යාත ඒසා මහත් සතුරු සේනාවක් හා එක්සියයක් රජුන් හුන්නාවූ උත්තරපඤ්චාල දේශයෙහි කම්පිල්ල නුවරට, කාමයෙහි ගිජුවූ නුවණින් අඩුවූ ඒ වේදේහරජ මෝහමයන් මූඪවූයේ අවීචිනරකී දෙක ඉදුරා සලකාගත නොහි, චතුරඞ්ගිණී සේනාව පිරිවරා නික්මුනෝවේදැ"හි වදාළ සේක; ඉක්බිති රජ්ජුරුවෝ සාරසියක් ගව් ගෙවා ගොස් ගංතෙරට පැමිණියහ. බෝධිසත්වයන්වහන්සේ රජ්ජුරුවන්ට පෙරගමන්කොට කැඳවා අවුත් තමන්වහන්සේ කරවූ නුවරට ගෙණගියසේක. රජ්ජුරුවෝ මාලිකාවට නැඟී අග්‍රවූ භෝජනය අනුභවකොට මදක් සැතපී පස්වරුවේලේ තමන් ආ නියාව චූලනීරජ්ජුරුවන්ට කියා දූතයන් යවූහ. ඒබව වදාරණ බුදුරජාණන්වහන්සේ මේ ගාථාදෙකින් වදාරණසේක:—

තතො ච ඛො සො ඤත්වාන, බ්‍රහ්මදත්තස්ස පාහිණී,
ආගතොස්මි මහාරාජ, තව පාදානි වන්දිතුං.

දදාහි දානි මෙ භරියං, නාරිං සබ්බඞ්ගසොභිනිං,
සුවණ්ණන්න පරිච්ඡන්නං, දාසිගණ පුරක්ඛතං.

"එම්බා මහණෙනි වේදේහරජ බ්‍රහ්මදත්තාරජහට කියා යවන්නේ 'මහරජ නුඹවහන්සේගේ ශ්‍රීපාදය වඳනා පිණිස ආමි, සච්චාකරණයෙන් සරණලද ශරීරශොභා ඇති දැසි දස් සමූහයා විසින් පිරිවරණලද නුඹවහන්සේගේ දියණියන් මට බිරින්දකොට එහා එව්ව මැනවැ"සි කියා යැවිය"සි වදාළසේක; අඹුවන් කෙරේ ලෝභයෙන් 'වඳිමි' කිබව මුත් වේදේහරජ්ජුරුවෝ ඉතා වැඩිමහල්ලහ, චූලනී රජ්ජුරුවෝ චූකලි මුනුඹුරුතරමටත් ඇත්තාහ, දූන් රහසාකරණ කල කෙසේ මහලු උවත් කෙසේ පොහොසත් උවත් වැන්ද මනාකෙසින් එසේ තමාත් සිත්හෙණ කුමාරිකාව ලැබතිම්නම් යහපතැයි සිතා වැඳ යවූහයි දතයුතු.

වේදේහ රජ්ජුරුවන්හෙන් යිය දූතයන්ගේ ඔස් අසා චූලනීරජ්ජුරුවෝ මහසොම්නසට පැමිණ මෙවිට මාගේ සතුරු කොයිහේදැ?

සෙට දෙන්නාගේ ඉස් කපාපියා පසින් මැඩගෙණ ඔද ජයපානය බොමි, සිහින් ක්‍රොධ උපදවා බසින් දූතයන්ට හඬවා උන්ට ප්‍රසාද දී නැවත කියා යවන්නාහු මේ ගාථාවෙන් කීහ:—

සඛාගතං තව වෙදෙහ, අථොඅත අදුරාගතං;
නක්ඛත්තමෙතං පවිචාරයස්සු, අහං කඤ්ඤං දදාමි තෙ,
සුවණ්ණඤ්ච පටිච්ඡන්නං, දාසීගණ පුරක්ඛතං.

මේ ගාථායෙහි අභිප්‍රාය නම්:—"වේදේහ රජ්ජුරුවෙනි, තමන් මිට ආ ගමන නපුරු ගමනෙක් කොවෙයි, ඉතා යහපත් ගමනෙක, තොප විසින් විචාළමනා මඟුලට යොග්‍ය නක්ෂත්‍රයක්මය, සුවර්ණාලඞ්කාර යෙන් සරහා නිමවනලද කොබනා අවයව ඇති මාගේ දුවනියන් දැසිදස් සමූහයා විසින් පිරිවරණලදුව තොපට පාවාදෙමි" කියා යවූහ. ඒ දූතයෝ කොස් වේදේහරජ්ජුරුවන්ට "දේවයන්වහන්ස ඔබින් බාධා නැත, මඟුලට හඳුළ නැකත් වහා විචාළමැනව, රජ්ජුරුවෝ දුවනියන් පාවාදෙන්නාහ"යි කීහ; ඉක්බිති රජ 'අදම නකත් යහපත, 'යි දූතයා අත කියා යැවිය"යි වදාරණ ඛුදුරජාණන්වහන්සේ මේ ගාථාවෙන් වදාරණසේක:—

තතො ච රාජා වෙදෙහො, නක්ඛත්තං පරිපුච්ඡථ,
නක්ඛත්තං පරිපුච්ඡිත්වා, බ්‍රහ්මදත්තස්ස පාහිණි.
දදාහි දානි මෙ භරියං, නාරිං සබ්බඞ්ග සොභිනිං,
සුවණ්ණඤ්ච පටිච්ඡන්නං, දාසීගණ පුරක්ඛතං.

මහණෙනි, ඒ ඉක්මන් රජ 'අද නකත් යහපත; සියලු සත්‍රී ලක්ෂණ යෙන් ශොභනවූ දුවනියන් පරිවාර සහිතව වහා එව්ව මැනවැ'යි කියා යැවිය'යි වදාළසේක.

බ්‍රහ්මදත්තරජ නැවත කියා යවන්නේ 'සියලු බිසෝ පලදනාවෙන් හොබනාවූ මාගේ දියනියන් සියලු පිරිවර හා සමග මහ පෙළහරින් දැන්ම එවමි' බොරු කියා ආ දූතයන් යවා, එක්සියයක් රජදරුවන්ට කියා යවන්නාහු, 'එදවස් මියුලුතුවරට ගියාසේ අටලොස් අක්ෂෞහිණී මහාසේනාවහා පඤ්චායුධ සන්නාහව උපකාරී තුවර බලා නික්මෙන්ට කියව; සතුරන් දෙන්නා ඉස් කපා සෙට ජයපානය බොමි' කීහ. රජතු කී පරිදෙන් චතුරඞ්ගිණී සේනාව ගෙණයන්නාහු, මැණියන් තලතාදේවීන්ද අඹමෙහෙසුන් නන්දාදේවීන්ද පුතතුවන් පඤ්චාල චණ්ඩි කුමාරයන්ද දුවනියන් පඤ්චාලචණ්ඩිකුමාරිකාවන්ද යන මේ සතරදෙනා මාලිගාවේ රදවා සුරක්ෂිතකොට රැකවල් ලවා උපකාරී තුවරට ගියහ.

බෝධිසත්වයන්වහන්සේ වේදේහරජ්ජුරුවන් හා කැවිව ආ මහා සේනාවට බොහෝවූ සත්කාර කළසේක. ඉන් සමහර කෙණෙක් රා බොන්නාහ, සමහර කෙනෙක් මච්ඡ මාංස කන්නාහ, සමහර කෙණෙක්

ඉක්මන්ව එන රජ්ජුරුවන් හා කැවිව නොහැනපී දිව දිව ආ හෙයින් ශ්‍රාන්තව නිදන්නාහු, වේදේහරජ්ජුරුවෝ සේනකාදී පණ්ඩිතවරුන් හා අමාත්‍ය මණ්ඩලයා පිරිවරා සරහනලද මාලිගාවේ මහු මහලේ ශ්‍රී යහන් මුදුනෙහි මිහිරි කථා කෙරෙමින් උන්නාහ.

ඉක්බිති චූලනිරජ්ජුරුවෝ එක්සියයක් රජදරුවන් හා අවලොස් අමාත්‍යාභිණේ සඬ්ඛ්‍යාත සේනාව ගෙණවුත් එදවස් මියුලුතුමර වටලුමා සේ තුන්සක්‍රියකින් හා සතර වලල්ලකින් කිසි තෙතකිතුන් සිදුරක් නොපෑ වටලාගත්තාහ. විලක්කු සියදහස් ගණනින් යුක්තව 'අරුණු නොනැගෙණතෙක්ම නාල්ලම්හ'යි සන්ධාන්කොට සිටගත්හ.

අඹිමතාපී සාධකවූ චින්තාමාණික්‍යයක් බඳුවූ මාගේ සවාමිදරුවූ ශ්‍රීමහා බෝධිසත්වයන්වහන්සේ බ්‍රහ්මදත්තරජ්ජුරුවන් ආ බව දැන සහ ජාත යෝධයන් තුන්සියයක් දෙනා තෝරාගෙණ "තෙපි හැම සුළු උමඟින් ගොස් බ්‍රහ්මදත්තරජ්ජුරුවන්ගේ මැණියන්ද අහමෙහෙසුන් කිසවුන්ද දරුවන් දෙන්නාද යන මේ සතරදෙනා මාලිගාවෙන් බා ගෙණ එම උමඟින් ගෙණවිත් මහ උමඟට බාලා ඉන් ගෙණගොස් උමඟින් පිටත්නොකොට පියා ඇතුළු උමඟ රඳවාගෙණ අප එන තෙක් මහ විසල් මළුවේ සිටුව"යි වදාළසේක. යෝධයෝ මහතානන්ගේ ඔස් මුදුනෙන් පිළිගෙණ සුළු උමඟින් ගොස් කිණිපාමුල අතුළ පෝරුවේ යටපිට නිලකර පෙරඅඟුළු හැර උඩට නැඟි, කිණිපාමුලය කිණිඉසය මාලිගාවේ ඒ ඒ ස්ථානයෙහි රැකවල සිටියවුන්ද, පිරිවර සිටි කුරුන් කුදුන් ආදින්ද අල්වාගෙණ දැන් දෙපා එක්කොට තරවා බැඳ බැණ නොනැගෙණ පරිද්දෙන් කට කඩරෙදි ගන්වා මුවාව තිබෙන්නාවූ ඒ ඒ ස්ථානයෙහි කොකුවල එල්වා රාජඝෝජනයට සකස්කොට සපයාතුබූ නොයෙක් වර්ගයේ අනර්ඝවූ කැවුම්ජාති කෑම් මුළුල්ල සමඟරක් අනුභවකොට පියා සමඟරක් සුළුසුළු කොට පියා මාලිගාවේ මතුමාලට නැංගාහ. එදවස් තලතාදේවි යෙහෙළ නියන් හා මුතුබුරන් දෙන්නා හා සතරදෙන එක යහනට නැගි ඔවු නොවුන් වැළඳගෙණ 'සටන්නම් චපල දෙයක, කවුරු දනිද්ද? ජය පරාජයනම් කාටවේයයි සිතියහැකිදැ'යි සිතා වැදහොත්තාහ.

එවේලෙහි යෝධයෝ ඔවුන් උන් ගබඩාවෙහි දොරකඩ සිට බැණ වූහ. එබස් අසා තලතාදේවි යහනින්නැගිසිට 'කිමෙක්ද දරුවෙනි'යි කියමින් දොරකඩට ආහ, යෝධයෝ ඔවුන්ට කියන්නාහු "දේවීන් වහන්ස අපගේ රජ්ජුරුවන්වහන්සේ වේදේහරජුන් මහෞෂධ පණ්ඩිත යාත් අල්වාගෙණ මරාපියා සියලු දඹදිව රාජ්‍යය එක්ඝත්කොට එක්සිය යක් රජුන් පිරිවරා මහපෙළහරින් ජයපාන්‍ය බොන්නාහු ඒ මගුලට නුඹ සතරදෙනාත් කැඳවා එවූහ, වැඩිය මැනවැ"යි කිහ. එබස් අස මින් අතිශයින් සතුටුවූවාහු දොර ඇර සතරදෙනා මාලිගාවෙන් බැස කිණිපාමුලට ගියාහ. යෝධයෝ ඔවුන් ඇරගෙණ උමඟට වන්හ.

එවිට රජදරුවෝ කියන්නාහු "අපි මෙතෙක්කල් මෙහි වසන්නමෝ එක දවසකුත් මේ විපියට නොබවිරුමිහ. මේ විපිය කිනමිද"සි කිහ. එබසට යෝධයෝ කියන්නාහු 'කුමක් කියන්නේද? මේ විපියට ඇමදුම බව නොදැක්ක, මේ මඩකලවිපි නම, අද ජයපානය බොන දවස් මගුල් හෙයින් රජ්ජුරුවෝ නුඹ සතරදෙනා කැඳවා එවූ හ'සි කිහ. 'එබස දැබවැ'සි ගිවිස උමඟ විසතර බලමින් සෙළිමින් සෙමින් සන්තෝෂයෙන් යන්නාහ. යෝධයන්ගෙන් සමහර සෙණක් රඳ, නැවත රජගෙට ගොස් රුවන් ගබඩාවල දෙරවල් ඇණ බිඳපියා තම තමන් ගෙණයන පමණ සාරවූ අනර්ඝවූ රුවන් පොදි බැඳගෙණ උමඟට වැද තෙර අගුළු ගෙණ පැළඟහ.

රජදරුවන් සතරදෙනා පළමු ගෙණ යන යෝධයෝ දිව්‍යපුරයක් මෙන් සරහණලද මහ උමඟට බාගෙණ නමාගත්හ. ඔහු සතරදෙන සිහිනෙනුත් නුදුටුවිරු ඒ විසතර බලා 'රජ්ජුරුවන්ට මගුලටම කළ හ'සි සිතූහ. යෝධයෝ උන් සතරදෙනා උමඟින් පිටත්නොකොට ඇතුළු උමඟ සරහණලද එක් ප්‍රියඟන් ගබඩාවෙක ඉඳුවා සමහරකෙ ණෙකුත් රැකවල සිටුවා සමහර කෙණෙක් උන් ගෙණබව බෝධි සත්වයන්වහන්සේට ගොසින් කිහ, උන්ගේ බස් අසා ජනානන්දකරවූ මාගේ සහෝදරුවානෝ 'මෙවිට මාගේ මනදෙළ මුදුන්පත්විය'සි ඔද වැඩි සතුටුව රජ්ජුරුවන් සමීපයට ගොස් වැඳ එකත්පස්ව සිටිසේක.

රජ්ජුරුවෝ කෙලාශයන් විසින් මඩනාලද අදහස්ඇතිව උන්බැවින් 'දුවනියන් දැන් එවති දැන් එවති' සිත සිතා උන්නාහු වහා නුනස් ගෙන් නැගි සිව්මැදුරුකවුළුව හැර පවුරෙන් පිටත බලන්නාහු, දිලි ගෙන්නාවූ විලක්කු සියදහස් ගණනින් යුක්තවූ අසඤ්ඤාපරිමාණ චතු රඞ්ගිණීසේනාව නුවර වවලා සිටියවුන් දැක ලය ඉපිළ අතිශයින් සැ කව, සේනක ආදී ප්‍රඥාසම්පන්න පණ්ඩිතවරුන් හා සමඟ මන්ත්‍රණය කරන්නාහු "ඇත් අස් රථ ආදිවූ සන්නාහ සන්නබවූ 'ගණුවු මරව කොටම' යනාදි යුද්ධයෙහි කිව මනා බස් බණන්නාවූ සේනාවය, ශරදෘ ඝාශයෙහි තාරකාවන් පරිද්දෙන් බබලන්නාවූ 'විලක්කු ආලෝක යෙන් මේ නුවර හිරු නැගි කලක්මෙන් අතිශයින් බබලා හිඳිය, චූලනීරජ්ජුරුවෝ මරසෙනඟක් පරිද්දෙන් මේසා සේනාවක් ගෙණ වාහු අපගෙරේ සතුරින් අව්ද? නොහොත් රැකැණිම අව්ද? පණ්ඩිත වරුණි 'මේ කුමකැ'සි සිතද්දැ'සි මේ ගාථාවෙන් කිහ:—

කච්චි අස්සා රථා පත්ති, සෙනා තිට්ඨන්ති විම්මිතා,
උදකා පදිත්තා ඛායන්ති, කිං නු මඤ්ඤන්ති පණ්ඩිතා.

ඒ අසා සේනකපණ්ඩිතයන්දැ "මහරජ නොසිතා වතුලමැනව, බොහෝ විලක්කු ආලෝක පෙණෙසි; නැසත් වේලා නොවරදවා සරණදෙන පරිද්දෙන් දුවනියන් හැරගෙණ බ්‍රහ්මදත්තරජ්ජුරුවෝ ආහ'සි සිතමි" කිහ. නැවත පුනකුසසා කියන්නේ "මහරජ

නුඹවහන්සේට සත්කාර පිණිස නොරට ආ හෙයින් රැකවල් හෙණ සිටිනා නියාය''සි කිහ. ඒ අසූන පණ්ඩිතයෝ සතරදෙන යමක් සිතූ වෝවිනම් නන්දෙඩන්නවුන් මෙන් කටට ආවාක්ම කිහ.

වේදේහ රජ්ජුරුවෝද ''මේ මේ සථානයේ මෙතෙක් මෙතෙක් සේනාව බැඟින් සිටින්වා, මේ සථානයෙහි සුරක්ෂිතකොට රැකවල් කණුව, පමානොවව, නොනිදව'' යනාදි කියන්නාවූ බස්ද අසමින් සන්නාහසන්නඛව යුඛයට සැරහි සිටින්නාවුන්ද දැක, මරණ ඛයින් තැතිගෙණ බෝධිසත්වයන්වහන්සේගේ බයක් ප්‍රාර්ථනාකරන්නාහු මෙසේ කියන්නාහ. ''ඇත් අස් රථ පදික අනන්තාපරිමාණවූ චතුරඞ්ගිණී සේනාව සන්නාහසන්නඛව සිටිනිය, අනන්තවූ විලක්කු ආලෝකය, මහොෂධපණ්ඩිතයෙනි තෙපි මේ කිමෙකැ'සි සිතව්ද? මේ සේනාව අපට කුමක් කරන්නිදැ''සි කිහ. එබස් අසා කල්පද්‍රැම යක් වැනි තිලෝගුරු බෝධිසත්වයන්වහන්සේ සිතනසේක් ''මේ අඥානවූ රජු මදක් මරණ ගින්නෙන් තවා, පසුව මාගේ බල දක්වා අස්වසාලම්'' සිතා වදාරණසේක් ''අර්ථබල කායබල ආදිවූ පඤ්චප්‍රකාර බලයෙන් අසමානවූ බ්‍රහ්මදත්තමහාරජ්ජුරුවෝ ''වේදේහරජ්ජුරුවෝ මේ නුවරට ඇවිත් පැමිණියෝය, දුකසේ මැන්කොට ගතිම්, පලාගිය නම් නපුරැ'සි අද මේ වේලෙහි පවන් තුන්යම් රාත්‍රියෙහි සුරක්ෂිත කොට රැකවල් ලවා රැකසිට පාන්වූකල නුඹවහන්සේ අල්වාගෙණ මරතිස් මදකුත් දුවනියන් සරණදෙන්ට හා හිතකමට ආ ගමනක් නොවෙ'සි වදාළසේක.

එබස් අසමින්ම සේනකයා ආදිවූ සියල්ලෝම මරණඛයින් තැති ගෙණ කිසිවකුත් කියන්ට අසමර්ථවූහ. රජතු උගුර වියලී කෙළ සිදී ගියේය, ඇඟින් ඩා සෙල්වී කොස් මරණඛයින් වලප්නාහු මෙසේ කියන්නාහ:–''ඉතා මෘදුවූ ලා අඹදලුවක් පරිද්දෙන් මාගේ ලය වෙව්ලන්නේය, මුඛයෙහි කෙළ සිදිගියේය, ගින්නෙන් පැළඹිගිය එකක්කු අව්වේ ලූ කලක් පරිද්දෙන් මේ ඛයින් ගැලවීමක් නොදන්නේ සැන. සිලි නොලබම්, තවද කඹුරන්ගේ උදුනෙහි ගිනි ඇතුලෙන් දවන්නේය, පිටතව නොපෙණෙන්නේය, ඒ පරිද්දෙන්ම මාගේ ලෙහි ගිනිගත් හෘදය මාංසය ඇතුලෙන් දවන්නේය, පිටතට නොපෙණෙන්නේය''සි කියා ඇඬූහ. බෝසතාණන්වහන්සේ රජුගේ බැගෑ පත්ම වලප්නා හඬ අසා 'මේ නුවණින් අඩුවූ රජ පළමු මා කිවා නොකෙළේය, මතු කිකරුවනලෙස නිග්‍රහකොට අදුන්වාලම්' සිතා වදාරණසේක් ''මහරජ නුඹවහන්සේ කාමයෙන් අඩුවූසේක් මෝහයෙන් මුළාවූසේක් හමන් විචාල තෙන මාගේ ප්‍රඥාවෙන් මතු මේ නියා හයෙක් වෙයි කියව කියවා 'ඒ නපුරැ'සි නොගිවිස, සේනකාදීන්ගේ බස් 'යහපතැ'සි ගිවිස හිතනවූ මන්ත්‍රණයෙන් මෙයා මහත්වූ හයකට පැමිණියේසේක, ඒ මහාමන්ත්‍රීවූ සේනකාදී පණ්ඩිතවරුන්

සතරදෙනාගේ බසින් සරණ සිදුවා රජ්ජුරුවන් හා නැ සම්බන්ධය කළා ඉතා යහපත, නුඹවහන්සේගේ සිත හිනහකොට තුබූ ඇමති ඉතසඩක් පිඩක් ලැබගණුමහ'යි ලොභ චෙතනාවෙන් කසිවාරු කොට කෙණවෝ මේ දුකින් කුමකට ගලවා නොගණිද්ද? වත් නාට උන් ගලවාගන්නාත් දකිමි, උන්ගේ බලත් දක්නෙමි වේදැ'යි වදාළසේක.

මෙසේද කියා "මෙලොවින් පරලොවින් වැඩක්ම වන්නා කැමති සියල්ලෙන්ම උතුම් අමාත්‍යව සිටි මාගේ බස් නොගිවිස, කාමයෙන් ඇලුනු සිත්ඇතිව, යම් කිසිවෙක්හි ලෝභයෙන් මුවෙකු අවුත් දුනි මලෙක බැඳුනාසේ 'පඤ්චාලචණ්ඩිකුමාරිකාව ලබමි' යන ලෝභ යෙන් අවුත් මරුමුවෙහි අසුවූසේක. එදවස්ම 'පඤ්චාලදේශයට ගමන් යහපත්දැ'යි විචාළ නුඹවහන්සේට මෙම උපමාකොට කියෙමි වේදැ"යි වදාළසේක. මෙසේද කියා නැවතත් වදාරණසේක් "ජන ප්‍රධානවූ රජ්ජුරුවන්වහන්ස 'අනාචාර සවරූප ඇති අසත්පුරුෂයා හා මිත්‍රධම්මයක් නොකළ මැනව, ඉදින් ඔහුගේ බස් ගිවිස සරණ සොයා ගියසේක් වීනම් මෙලොවින් පරලොවින් වන වැඩක් නම් නැත, දෙලොවින්ම ඔහට දුක්ම වන්නේය'යි කියව කියවා මා කිවා නොකොට ඔහු කිවාම කළසේක, ඉදින් මා කිවා කළසේක් වීනම් අද මේසා දුකෙක්වත් භයෙක්වත් නැත්තේවේදැ'යි වදාරා, නැවත සිතන සේක් මේ රජහු මතුන් නොකිකරු නොවනලෙස තරකොට කික්මවා නිග්‍රහයට පමුණුවම්, පළමු කිවාම කියා භය හා ලජ්ජාවට පමුණුවම්, සිතා වදාරණසේක් "මහරජ එදවස් 'ගමන් නොකිය මැනවැ'යි කිවාවූ මට නුඹවහන්සේ කියන්දැ 'කේවට්ට පණ්ඩිතයන් ආදිවූ පණ්ඩිත වරුය රජකෙසි අසළයෝත් රජදරුවන්ගේ අදහස දන්නෝත්, මගුලට නිසි බස් දන්නෝත් උමය. මේ කොවියාපුත් නිමුත්මිට එලි කෙණ සිසා කන සේ දන්නාබව මුත් රජකෙසි කාරිය හා මගුල්කාරණ බැවහාර දනිදැ'යි මට කිපි, කොල කොවියාපින් බොටුව අල්වාකෙණ මාගේ විජිතයෙන් ඇත ලව'යි වදාළසේක් නොවේද? එදවස් එසේ කී නුඹවහන්සේ දැන් එසේවූ ප්‍රඥාසමුද්‍රයන් සිටියදී මා නොවියා පුතු අතින් ඇලවෙන උපාය විචාරණසේ ඉතා නොයෙදෙන්නේය, මා අතින් උපාය විචාරණ නුඹවහන්සේමය, කෙළනොලුසේකුත් නුවණ නැතිසේකුත්; මා දන්නේ සිසා කන පමණ්මය, උවමනාසේක් වීනම් සිසාසා මාන විචාරාගත මැනව; නුවණැත්තෝත් පණ්ඩිත වරුත් මේ මරින් ඇලවෙන උපාය දන්නෝත් සේනකාදි පණ්ඩිත වරුය, නුඹවහන්සේ මට කිව මනා වීනම් එදවස් කිවා සේ, කර අල්වා පිටත ලන්ට කිව මැනව, අවලොස් අසෝකිණ්ඩඛ්‍යාත මේ සේනාව අතුරෙන් සේනකාදිහු ගලවාගණිත්වා, මම කුමක් දනිම්දැ"යි වදාළසේක.

ඒ අසා රජ්ජුරුවෝ සිතන්නාහු "පණ්ඩිතයෝ පළමු කී අපරාධයම කියන්නාහ, මපුතනුවෝ මේ මතු වන්නාවූ භය තමන්ගේ ප්‍රඥා චක්ෂුසින් මනාකොට දුටුවහ, එබැවින් මා තරම නිග්‍රහයට පමුණුවති; අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න යන තුන්කල් දන්නාවූ වජ්‍රබුද්ධිවූ ජනකිත නිරතවූ මාගේ පුතනුවෝ 'අනාගතයේ මෙබඳුවූ භයෙක් වන්නේය'යි දැන 'භාරමයක් මුළුල්ලෙහි කිඳිනාහු නිකම් නොයිඳිනාහ; ඒකාන්තයෙන් ගැලවෙන උපායක් කෙරෙත්මය; එයින් මා විසින් පරීක්ෂාකළ මැනවැ''යි සිතා කියන්නාහු "පුත මහෞෂධ පණ්ඩිතයෙනි, නුවණැත්තාහු ගිය දවස කළ දැඩිකම් හා නොදැන කියාපි බස් පමණක් සිත තබාගෙණ කිය කියා දුකට පැමිණියන්ට නිග්‍රහ නොකරන්නාහ, තෙපත් මහත්වූ නුවණැත්තෝය, අනුව ණින් කියාපි වරදම කියව, සතුරු සේනාවක් වටලාගත් කල්හි පිට කිදුවාගෙණ නැගියන්ට තරම් ජවසම්පන්න සඳුසිවි අසෙකුට තියුණු කැහැටකින් විදුනා කලක් පරිද්දෙන් කුමට විදුද? ඉදින් කියව් නම්, ගැලවී නැගියන උපායක්වත් සතුරන්ට අසුනොවී නැගියන තෙනක් වත් දනුනම්, ඉන් මට අනුශාසනාකරව, ගිය දවස මා නුවණ නැතිව කී කථා සිහිකොට තොපගේ බස් නැමති හියෙන් මා නොවිදුව, තර කොට බැඳි අසු කැවිටින් විදිනා සේ මා නොවිදුව, ගැලවෙන උපා යක් කියව"යි කීහ.

———so———

පණ්ඩිත සම්මතය.

එබස් අසා කරුණාවට ආකරවූ සහාමිදරුවාණෝ සිතනසේක් "මේ රජහට මා විනා අනික් පිටිවහලෙක් නැත්තේය, මේ රජ ඉතා අඹ බාලය, තමා නුවණ නැතිනෙයින් පුරුෂ විශෙෂය මදකුත් නොදන්නේය, තවත් මදක් බලා පසුව අස්වසාලමි'' සිතා වදුරණසේක්:—

අතීතං මානුසං කම්මං, දුක්කරං දුරභි සම්භවං,
නතං සකෙනාමි මොචෙතුං, තම්පි ඤාතසු ඛත්තිය.

"මහරජ මේසා සේනාවක් වටලාගෙණ සිටි කල ඉන් මිදී යන තරම් උපායක් කොටගැන්ම මනුෂ්‍යයන්ට ඉතා බැරිවන්නේය, මිනිසුන් කළමනා යම්දෙයක් ඇත්නම්, ඒ සියල්ල ඉක්ම ගියේය, දැන් මෙච්ච ගැලවෙන උපායක් කරන්නා තබා සිතන්ටත් නොපිළිවන, දැන් කරණ උපායකින් නුඹවහන්සේ ගලවාගන්ට මම අසමර්ථයෙමි; මහරජ නුඹවහන්සේම ගැලවෙන උපායක් දතමැනවැ''යි මේ කාථාවෙන් වදුරණසේක:—

සන්ති වෙහාසයා * නාගා, ඉඞ්ඝමෙත්තා යසස්සිනො,
තෙපි ආදාය ගච්ඡෙය්‍යුං, යස්ස හොන්ති තථාවිධා.

---

* අනිකුදු ගාථා තුණටද ඉහත දැක්වූ අන්දමටම "නාගා" යන්න වෙනුවට:—අස්සා, පක්ඛි, ඝණ්ඨා, යන වචනයන්ය හොදැ, අශව, පක්ෂි, ඝණ්ඨ යන සේරෑම ගතයුතුයි.

"සමඟර රජදරුවන් මෙසේවූ දුකෙනිදි ගලවා ආකාශයෙන් ඇර ගෙණ යන්නාවූ උපොසථය ශ්‍රද්ධානය යන සාඞ්ගමපන්නවූ ඇත්කෙ ණෙක් ඇත්තාහ, එසේවූ ඇත්කෙණෙක් නුඹවහන්සේට ඇත්නම් මේ දුකින් ගලවා ආසෙන් ගෙණයෙන්වා; නැවත සමඟර රජදරු වන්ගේ සාඞ්ගමත්වූ වලාහක අශ්වයෝ ඇත, එසේවූ අස්කෙණෙක් නුඹවහන්සේගේ ඇත්නම් උසිත් නුඹවහන්සේ ආකාශයෙන් ගෙණ යෙත්වා; තවද සමඟර රජදරුකෙණෙකුන්ගේ ආකාශචාරිවූ ගරුඬ වාහනත් ඇත්තේය, තවද සමඟර රජදරුවන්ගේ එසේම යක්ෂිවාහ නත් ඇත්තේය, තවද සාඞ්ගමත්වූ යක්ෂකෙණෙක් ඇත්තාහ; එසේවූ වාහනයෙක් නුඹවහන්සේට ඇත්නම් මේ දුකින් ගලවා ගණිත්වා. මම ආකාශචාරිවූ ඇත් අස් පක්ෂි යක්ෂ ගරුඬාදීන් පරිද දෙන් නුඹවහන්සේ ආකාශයෙන් ගෙණගොස් මියුලුනුවර ලාලන්ට අසමර්‍ථයෙමි" වදාළසේක, එබස් අහා රජ්ජුරුවෝ මුවෙන් නොබැණ උන්හ.

එවිට සේනකයා සිතන්නේ "රජ්ජුරුවන්ටත් අපටත් පණ්ඩිතයන් විනා අනික් කිසි සරණෙක් නැත්තේය, රජ්ජුරුවෝ පණ්ඩිතයන්ගේ බස් අහා හයින් තැතිගෙණ කිසිවකුත් කියන්ට අසමර්‍ථයහ, මෙවිට මමන් තමා දතපත නියා යාචිඤ්ඤාකොට බලමි" සිතා කියන්නේ මේ ගාථාවෙන්:—

අතිර දඝ්ඝි පුරිසෝ, මුහත්තා උදකණ්ණවෙ,
යත්ථ සෝ ලභතෙ ගාධං, තත්ථ සෝ විඳතෙ සුඛං;
එවං අමෙඝක්ඛ රඤ්ඤෝච, තවං පතිට්ඨා මහොසධ,
තවං නොසි මන්තිනං සෙට්ඨෝ, අමෙඝ දුක්ඛා පමොචය.

"යම්සේ සයුරෙක නුහු පුරුෂයෙක් දුකසේ ගොඩක් දුවුවේනම් ගොඩ දුවු වේලෙහි පවන් ඕහට මහා සැපවන්නේය, එපරිද්දෙන් අපටත් රජ්ජුරුවන්ටත් නුවණින් හා මන්ත්‍රීකමින් උතුම්සේක් නුඹ වහන්සේවේද, එබැවින් මේ දුකින් මුදා අප ගලවා ගතමැනව"යි කීහ. එසේ කී සේනකයාට තරව භය උපදවා නිග්‍රහකරණසේක් මේ ගාථාවෙන් වදාරණසේකි:—

අත්‍ථිතං මානුසං කම්මං, දුක්කරං දුරභි සම්භවං,
නතං සත්තොස්මි මොචෙතුං, තම්පි ජානාසු සෙනක.

එම්බල අඥානය, එදවස් 'මේ ගමන් නොකැමැත්තේය'යි මා කිය තුත් රජුට නොයෙක් කාරණා කියා උගන්වාගෙණ ආයෙහිත් තෝ මය, නෙණවුත් මේසා දුකකට පමුණුවා, මේසා අනර්‍ථයක් යෙදුයෙ හින් තෝමය, එම්බල අසත්පුරුෂය, මනුෂ්‍යයන් විසින් ගැලවෙන්ට කවයුතු යම් උපදේශයක් ඇත්නම්, මෙවිට මේ ඇසිල්ලෙහි කරන්නා තබා සිතන්නත් නොපිළිවන, ඒ සියල්ලම ඉකුත්ව ගියේය,

මා විසින් දැන් කොට සාදුගතනැකි කිසිවකුත් නැත්තේය, මට නො පිළිවන, තෙපිත් පෙර 'අපමුන් නැතැ'සි බැහැවෙන පණ්ඩිතවරු වව, තොපගේ නුවණින් මිට උපායක් සිතා තෙපිත් හැලව් රජ්ජුරු වනුත් ගලවාගන්ව''සි වදාළසේක. මෙසේද කියා නැවත 'තෙපි සපතිනම් ආකාශයෙන් හෙණ හොස් මියුලුනුවර ලාපියව'සි වදාළසේක.

රජ්ජුරුවෝ හැලවෙන්නට උපායක් සිතන්නාහු මරණ භයින් තැතිගෙණ බෝධිසත්වයන් හා සමග කිසිවකුත් කියන්ට අසමර්ථව ''යම්සේ මේ සේනකයාත් පණ්ඩිතයෙකු වව, කිසිම උපායක් දනී නම් විචාරමි'' සිතා 'සේනකය මේ උපන් භයින් හැලවියන්ට සුදුසු උපායක් දනිනම් කියව'සි මේ ගාථාවෙන් කිහ:—

සුණෙණි එතං වචනං, පඤ්ඤෙතං මහබ්භයං,
සෙනකං දානි පුච්ඡාමි, කිංකිච්චං ඉධ මඤ්ඤසි.

මේ ගාථාවෙන් විචාළ රජ්ජුරුවන්ට සේනකයා ''යම්සේ මසක් මං මුළාවූ එකෙක් සමසක් මංමුළාවූ එකෙකු අතින් මං විචාළේද එපරිද්දෙන් මේ රජ්ජුරුවෝ මා අතින් හැලවෙන උපාය විචාරන්නාහ, යහපත් උවත් නපුරු උවත් මා කරට ආවික්ම කියමි' සිතා එක් උපායක් සලකාගෙණ මේ ගාථාවෙන් කියා:—

අඤ්ඤං දුවාරතො දෙම, ගණ්හාමසෙ විකන්තනං;
අඤ්ඤමඤ්ඤං විධිබාන, ඛිපපං නෙසසාම ජීවිතං;
මානො රාජ බ්‍රහමදත්තොසා, චිරං දුකෙඛන මාරයී.

මේ ගාථාවේ අර්ථයනම්, ''මහරජ කරණසේක් විනම් මා කියන උපාය යහපත, මේ අප හැම උන් මාලිගාවට අපි හැම වැදලා දොර පිටතින් බන්දලා ගිනිගස්වාලා තියු අඹු මුවහත් ඇති කඩුවක් බැගින් නමකට එක එක කඩුව හෙණ ඔවුනොවුන් කොටා මියමිහ; එසේ මළාවූ නුඹවහන්සේ හා අප හැමදෙනාට සැරහූ මාලිගාව එක් දර සැයක් වන්නේය, බ්‍රහමදත්තයෝ අල්වාගත්තුනම් ජන්මාන්තර වෙරි කෙසින් වධකොට බොහෝ දවසකින් දුක්දී මරන්නාහ; එබැවින් වහා මියයාම උත්තමය''සි කිහ.

ඒ අසා රජ්ජුරුවෝ 'තව හා තාගේ අඹුදරුවන්ව මෙබඳු දරසැඟකුත් මෙසේ මරකුත් වේව'සි 'මට මෙවැනි මරක් නොවේව'සි කියා පුකකුස ආදි තුන්දෙනා විචාළහ. එසිත් නුවණ නැතිව කරට ආවක්ම කිහ. එසේකෙසින් කියනලදි:—

සුණෙණි එතං වචනං, පඤ්ඤෙතං මහබ්භයං,
පුකකුසං දානි පුච්ඡාමි, කිං කිච්චං ඉධ මඤ්ඤසි.

මේ ගාථාව අසා පුකකුසයා කියන්නේ ''මහරජ බ්‍රහමදත්තයෝ අල්ලාගත්තුනම් ජන්මාන්තර වෙර කෙසින් නොයෙක් වධකොට චිරාත් කාලයක් දුක් දී මරන්නාහ, කෙසේ කොටත් මරණ නොනමත්නා

බැවීන් අපි කැමදෙනම උගුරු විශයක් කා පියා මියම්හ''යි කියය. උගේ බස් අසා නොසතුටුව ''තාගේ අඹුදරුවන් කා සමඟ තෝ වහා මියයව මට මෙවැන්නක් නොකියය''යි කියා කාළිඳුයා විචාළහ.

''කාළිඳුයාත් පණ්ඩිතයෙකු උව, මින් ගැලවෙන්නට උපායක් දනීනම් කියව''යි කියා මේ ගාථාවෙන් කීහ:—

සුණෝහි එතං වචනං, පඤ්ඤවතං මහබ්භයං;
කාළිඳං ඤති පුච්ඡාමි, කිං කිච්චං ඉධ මඤ්ඤසි.

ඒ අසා කාළිඳුයා කියන්නේ ''මහරජ බ්‍රහ්මදත්තරජතෙම අප අල්වා කෙණ බොහෝ වධ කරවා මහද්‍රක් දී බොහෝ දවසකින් මරන්නේය, ඔහු අතින් වධ විඳ මියන්නා බලාත් නමකට ලතුවක් බැඟින් ඇර කෙණ මාලිකාවේ මතුමාලට නැඟි සිව්මැදුරු කවුළුවෙන් පිටත කොබෝගෙඩි වළල්ලේ රැණ බැඳලා මල ඉදිකොට කරලාගෙණ පැනපියම්හ, නොහොත් කර වැල්ලාගෙණ මියම්හ, නැත නැඹිරු ප්‍රපාතයකට පැනපියා වහා මියම්හ''යි කීය. ඒ අසා රජ්ජුරුවෝ 'එසේ කර වැල්ලාගෙණ මියන මරෙක් තාගේ අඹුවන්වහා තට වේව'යි 'එසේවූ දෙයක් මට නොවේව'යි කියා ''දේවිඳය මේ උපන් භය තොසින් දුටු යෙහිවේද? ඉදින් තොසිත් උපායක් දනීනම් කියා බල'යි මේ ගාථාවෙන් කීහ:—

සුණෝහි එතං වචනං, පඤ්ඤවතං මහබ්භයං,
දෙවිඳං ඤති පුච්ඡාමි, කිං කිච්චං ඉධ මඤ්ඤසි.

මේ ගාථාව අසා ඒ පැනනැඟි අතිකක් සොයාගන්ට අසමර්ථව 'සේනකයා කී ලෙසම කියමි' සිතා ''මහරජ බ්‍රහ්මදත්තයා අල්වා ගතීනම් තමා කැමති වධයක් කරවා බොහෝ දුක්දී කලාතුරකින් මරන්නේය එසේ දුක් විඳ සතුරන් අත මියන්නා බලාත් මේ මාලිකාවේ දෙර පිටතින් අයා බන්කුලා ගිනි ගස්වාලා අපි සමකට කඩුවක් බැඟින් ඇර ගෙණ ඔවුනොවුන් කොටා මියම්හ, මේ විසිතුරු මාලිකාව බ්‍රහ්මදත්තයාට ප්‍රයෝජනවත් නොව අප කැමදෙනාට එකම දරුයක් වන්නේය, මේ විනා මා දන්නා අතික් උපායෙක් නැත, පොළොව පැකලූනන්ට එම පොළෝ පිඹිට වන්නාසේ මේ දුකින් අප කැමදෙනා සුවසේ මුදාපියන්නම් කරුණාසිඩාසවූ ජනඝිත තිරතවූ මහෞෂධ ඝොමින් විනා අපසේ නුවණින් අන්‍යයන්ට ඒ විශය නොවෙයි, ඇව්ලෙන ගිනි නඹා කණිවැදිරියන් පිම්බාසේ ප්‍රඥා නැමැති මහනිසකණ්ඩෙන් සමස්තලොකය ඒකාලොකකර බබලවන මේ උත්තමයානන් සිටියදී අප සතරදෙනාසේ නුවණින් අන්‍යයන් අතින් ගැලවෙන උපාය විචාරන්නේ අපටත් වඩා නුවණ නැති නියාද? කරණ යාච්ඤාවක් අපි කැමදෙනම පණ්ඩිතයන්වහන්සේට කරම්හ''යි මෙසේද කියා ''අපි කැමදෙනම එක්ව බැඟැපත්ව හඬා දෙඩා 'අප කලවාහට මැනවැ'යි යාච්ඤාකරම්හ, සතුරන් කෙරෙහිත් මිතුරන් කෙරෙහිත් සද

රැස්වන් කිරිමුහුදසේද සක කිරි වත්කළාසේද සමවූ මෛත්‍රී ඇති මේ උත්තමයානෝ තමන්ට විෂය විනම් මෙතෙක් දෙනා අනාථ මරණින් මියයා නොදෙන්නාහ, උන්වහන්සේත් තරව 'නොපිළිවනැ'හි කිව හොත් සේනකපණ්ඩිතයන් කී ලෙස දෙර බැඳ ගිනි ගස්වා උතුන් කොටා මියම්හ''යි කීය.

ඒ අසා රජ්ජුරුවෝ පෙර තමන් බෝධිසත්වයන්ට කළ කී අපරාධ සඳහන්කොට ඔබ හා සමග කිසිවකුත් කියන්ට අසමර්ථව මහතානන් අසඅසා සිටියදී ඔබ ලය කම්පාවන පරිද්දෙන් බැණැපත්ව හඬන්නාවූ රජ්ජුරුවෝ මේ ගාථාවෙන් කීහ.

යථා කදලිනො සාරං, අනෙවසං නාධිගච්ඡති,
එවං අනෙවසමානානං, පඤ්ඤං නාජ්ඣ ගමාමසෙ.
යථා සිම්බලිනො සාරං, අනෙවසං නාධිගච්ඡති,
එවං අනෙවසමානානං. පඤ්ඤං නාජ්ඣ ගමාමසෙ.

මේ ගාථායෙහි අභිප්‍රායනම්:—''යම්සේ කෙහෙල්ගස් හර ඇතැසි වරදවා සිතාගත් නුවණ මද පුරුෂයෙක් කැපෙන යකඩයක් නැව තත් හා මුවහත සියුම්කොටගෙණ මහත් රඹවනයකට වැද මහත් මහත් කෙහෙල්ගස් කපා බඩ දක්වා බිඩලු හැරත් එහි කිසි හරයක් නොදකිද, එපරිද්දෙන් මින් ගැලවෙන උපාය සොයන්නාවූ මම කිසි කෙණෙකුන්ගෙතුත් නුවණ නැමති සාරයක් නොදුටුයෙමි; තවද ඉඹුල්හරයකින් ප්‍රයෝජන විඳිනා කැමති පුරුෂයෙක් කෙහෙල්වන හරසෙවූ පුරුෂයාසේ ඉඹුල්වනය කොටා එක ගසකත් හර නොදකිද, එපරිද්දෙන් මේ දුකින් ගැලවීමන්හා උපායක් සොයන්නාවූ මම හර නැති ඉඹුල් රුකක්සේවූ මොවුන් හැමදෙනා කෙරෙහි ප්‍රඥා නැමති සාරයක් මදකුත් දුටුදැ නැත්මි; පැන් නැති මහ වනයෙක්හි විසූ මහ ඇතෙක් ගිම්හමයෙහි ඝර්මයෙන් පීඩිතවූවහුසේ දුකට පැමිණිකල්හි දුකින් මුදා ගලවා ගන්නට තරම්වූ උපායක් නොදන්නා අඥානයන් සමීපයේ අනේ මා විසූ තියාවක් ඉතා නපුරුය, දැන් මාගේ ලය සුට හට වෙව්ලන්නාවූ ලද පලලවයක් සේ කම්පිතවන්නේය, කට කෙළ සිඳී උගුර වියලී ගියේය, ගින්නෙන් තැවුනු එකක්හු අව්වේ ලූ කලක් පරිද්දෙන් කිස් අස්වැසිල්ලක් නොලැබෙයි; තවද කඹුරු උදුනෙහි ඇතුලෙන් දැවී, ඒ ගිනි පිටතට නොපෙණෙයි, එපරිද්දෙන් දැන් මාගේ ලෙහි මරණගිනි ඇතුලෙන් දවන්නේය, පිටත නොපෙණෙන්නේය, මේ පණ්ඩිතවරුන් අමාත්‍යාධිපරයෙහි නුවණට හා මන්ත්‍රී කමට තබාගෙණ විසූ තියාව පැන්නැති මහ වනයෙහි ඇතු විසුවාක් වැන්න, නුවණැති පුරුෂයා කෙහෙල්හර සෙව්වා වැන්න, ඒ නිරුදක වනයෙහි විසූ ඇත් උදකයෙන් පීඩිතවූයේ නොබෝකලකින් සතුරන්ගේ හස්තප්‍රාප්තවේද, එපරිද්දෙන් නුවණ නැති පණ්ඩිතවරුන්ගෙන් එකෙකුත් මේ දුකින් මුදාලන්ට සමර්ථ නොවෙ''යි බැණ පත්ව ඇඬුහ.

මෙසේ ඇසූවන් ලය කම්පාවන පරිදෙන් අඬන්නාවූ රජ්ජුරුවන් ගේ බස් අසා සරණගත වත්‍රපඤ්ඤරයක් වැනිවූ මාගේ සවාමිදරුවූ බෝධිසත්වයන්වහන්සේ "මේ රජ මරණ භයින් ඉතා කලාන්තවිය, හාපි පාසා ඇත්තවුන්ට අන්නපාන දෙක පිවිමහල් වන්නාසේ ගිලනුන්ට වෙදුන් පිවිමහල් වන්නාසේ මේ රජහට මාමුත් අනික් පිවිමහලෙක් නැත, මෙවිට මොහු අස්වසානොලා තවත් තදවිනම්, ශොකයෙන් ලය පැළී ගිය නම් නපුර, සාරමසක් මුළුල්ලේ මා හත් දුක් නිමවී වන්නේය, එබැවින් අස්වසාලමි" සිතා අස්වසා වදාළසේක.

ඒ බව ප්‍රකාශකොට වදාරණ බුදුරජානන්වහන්සේ මේ කථාවෙන්:- "එම්බා මහණෙනි, ඒ රජතෙමේ මහෞෂධපණ්ඩිතයන් නොකැමැති කරවා සරණ සොයා ගොස් ඉන් උපකාරිනුවර බ්‍රහ්මදත්තයා එක්සිය යක් රජුන් සහිතව මහාසේනාව ගෙණවුත් වටලාගත් කල්හි, අබ්‍රුවන් තබා, තමා හැලවීගත නොහි මිදෙන උපාය විචාළේය, ඔහුට මහෞෂධයන් 'ඔබ නොගිය මැනව' ගියහොත් මහා විනාශයට පැමිණෙන්නේය නොයාහැක්කැ'යි කිම්, 'ඒ මා කථ්‍යතු නොදනිති'යි වරදවා බැණ නිග්‍රහයෙන් පිටත ලවා, ඔබ ගියමැනව ගියහොත් මහත් වැඩ වන්නේය'යි කියනලද සේනකාදීන් බසින් නුඹවහන්සේ ආසේක් වේද, දැන් ඒ පණ්ඩිතවරුන් අතින් උපාය විචාරා ගතමැනවැ"යි කී කල්හි සේනකාදිවූ සතරදෙනාත් විචාරා, උන් හැමදෙනා කියනලද මරණෝපාය අසා නොසතුටුව, මහෞෂධ පණ්ඩිතයන්ට කියනොහී භය ඇතිව උන්ට ඇසෙන පරිදෙන් අඬන්නාවූ වේදේහරජු බස් අසා 'මෙවිට අස්වසා නොලීවිනම් ලය පැළී නැසිගියහොත්, මා දිවා රෑ හත් දුක් මුළුල්ලම විඳී වන්නේය, තවද මතු බොහෝවා දහස් මුළුල්ලෙහි සදවඩල ඇන්දා සේ පෙණෙන්නාවූ මාගේ ප්‍රඥාශෝභය ජලරේඛාවක් පරිදෙන් කුචිඡවන්නේය"යි සිතා රජහු අස්වසන්නාහු:

තතෝ සෝ පණ්ඩිතෝ ධීරෝ, අස්සදස්සී මහොසධෝ,
වෙදේහං දුක්ඛිතං දිස්වා, ඉදං වචනමබ්‍රවී.

මා භවං භායි මහාරාජ, මා භවං භායි රථෙසභ,
අහං තවං මොචයිස්සාමි, * පඩිකා සත්තානංව කුඤ්ජරං.

*(ඉන්පසු පණ්ඩිතවූ හෙවත් අර්ථානර්ථ දන්නාවූ නුවණැති නිතී කාරිවූ වැඩ අවැඩ දක්නා ඒ මහෞෂධතෙමේ දුකින් පෙළෙන වේදේහරජු දැක මේ වදන් කිය:—

"මහරජ නහමක් බියවේවා, රථසභාමිය නහමක් බියවේවා, මඩකිඹුරු ඇතෙකු (ගොඩහන්නා) පරිද්දෙන් මම ඔබ මුදන්නෙමි."

---

* අනිකුදු ගාථානුශෙෂිම:—රාහු ගහිතංව චන්දිමං, රාහු ගහිතංව සූරියං, පෙළා බධංව පන්නගං—යන්තු ශොදෑ කියවත්තු.

අතීතානාගත ප්‍රත්‍යුත්පන්න යන කාලත්‍රයවසීන්වූ සියලු පදාර්ථයන් සර්වඥඥානයෙන් පරෝපදේශ රහිතව තමන්ම දන් හෙයින් ඉතා නුවණැතිවූ මහෞෂධපණ්ඩිතයෝ වේදේහයා මරණ භයින් පීඩිතව වලප්නවුන් මෙසේ කියා සන්සිඳුවමින්, 'මහරජ නොබව මැනව, මේ එක්සියයක් රජුන් හා අවලොස් අනෙකාකාර සඞ්ඛ්‍යාත සේනාව වටලා ගෙණ සිවියදී රාහු මුඛයට වන් සඳමඬල ගලවා ගන්නාසේ ගලවා ගණිමි; තවද මහ මඩෙහි එරී ගිය ඇතක්හු ගොඩගන්නාසේ ගලවා ගණිමි; තවද මේ සේනාවෙන් කිසි කෙණකුත් නොදන්නා පරිද්දෙන් පේළාවක හසුවූ නයෙකු ගලවාගන්නාසේ බ්‍රහ්මදත්තරජ නැමති අභිගුණ්ඩිකයාගෙන් සේනා නැමති පේළාවෙහි හසුවූ වේදේහ නැමති නාගරාජයා ගලවා ගෙණගොස් මියුලුනුවර ලාලමි; තවද මැදිරියේ හසුවූ පක්ෂීන් ගලවා හරණසේ සුවසේ ගලවාගණිමි; තවද දැල බැඳි මසුන් ගලවාගන්නාසේ ගලවාගණිමි; තවද මහරජ නොබව මැනව, නුඹවහන්සේ මතු තනිව ගලවාගණිති නොසිතුව මැනව; නුඹවහන්සේ හා කැවිව ආවාවූ ඇත් අස් රථ පදාතිවූ සේනාවෙන් එකක්හවත් මේ සතුරාගෙන් කිසි උපද්‍රවයක් වියනොදී සුවසේ ගලවාගෙණ ගොස් මියුලුනුවර ලාලමි; තවද මහරජ නොබවමැනව, ඉදින් සිතිමිනම් එක්සියයක් රජදරුවන් හා අවලොස් අනෙකාකාරයක් පමණ රාජසේනාව අනික් කෙණකුන්ගේ උපදේශයක් හා යුධ ප්‍රයෝගයක් නැතිව මාගේ ප්‍රඥාබලයෙන්ම කැටක් අල්වාගෙණ දමා කපුටු සමූහයක් නෙරණසේ පලවා පියන්නටත් බැරිනොවන්නේය; නුඹවහන්සේ නොබව මැනවැ''හි 'අස්වැසූය'සි වදාළසේක.

ඒ එසේමැයි—සෙස්සවුන්ගේ නුවණින් ප්‍රයෝජන කිමිද? අමාත්‍යයෝ නමුත් නුවණැත්තෝ නමුත් මෙසේවූ දුකෙයිදී පිටිවහල්ව ඒ දුකින් මුදාලන්නෝ උත්තමයෝ වෙද්ද? තවද බෝධිසත්වයන්වහන්සේ වදාරණසේක්, ''මහරජ නුඹවහන්සේ පළමු මා කුමක් පිණිස ආහයි සිතුසේක්ද? මතු නුඹවහන්සේට මෙවෙනි භයෙක් වේය කියා ප්‍රඥානැමති දිවසින් දුටුවාවූ මම නවතාලීමි, ඒත් නොනවත්නා හෙයින් ඒ බව දැන නුඹවහන්සේ නැසී යාදී ඉඳීම මට තරම්නොවෙයි සිතා මට උදහස් උවත් ඒ මා සිත නොතබා නුඹවහන්සේට පළමු අවුත් සාරමසක් මුළුල්ලෙහි මෙහි හිඳ කුමක් කළහයි සිතුසේක්ද? මහරජ නොබව මැනව, මේ භයින් මුදා සුවසේ ගලවා ගෙණගොස් මියුලුනුවර ලාලමි'' වදාළසේක; බෝධිසත්වයන්වහන්සේ ශඞ්කාරහිත අනිත සේශරසිංහරාජයෙකුසේ කිසි භයක් නැතිව කියන්නාවූ බස් අසා 'මෙච්ච මාගේ ජීවිතය ලදිමි'හි අතිශයින් සතුටුව අස්වැසී ගත්ත. බෝධිසත්වයන්වහන්සේ මෙසේ සිංහනාදකළ කල්හි සේන කයා ආදිවූ බොහෝදෙන සතුටුව ගියහ. බෝධිසත්වයන්වහන්සේ 'නොබව තොප හැමත් සුවසේ ගලවාගණිමි' කියත්ම සේනකයා

ආශ්චර්‍යයට පැමිණියේ 'ස්වාමිනි මේසා සේනාවක් අවුත් තුන්සතක් යකින් හා සතර වළල්ලකින් අතුරු සිදුරු නැතිව වටලාගෙණ සිටියදී කවර උපායකින් ගලවාගෙණ යනසේක්ද'යි කීය. එම්බල සේනකය, මේ සතුරන් ලුහුබඳුවාපියා වාසලින් පිටත්ව සතුරන් බලවලා සිටියදී යන්නෙමි විනමුත් මට බැරිනොවෙයි. එතකුදු උවත් උන් හැම නොදන්නා පරිද්දෙන් සරහනලද උමඟින් කෙණයමි" වදාළ සේක.

මෙසේද කියා 'සේනකය තෝ ගමනට සැරහිහණැ'යි වදාරා, උමඟ දොර හරණට තමන්වහන්සේගේ යෝධයන්ට විධානකරණසේක්, "කුඩාවරුනි වහා නැගිඉඟාසින් උමඟ දොර හරුව, වේදේහ රජ්ජුරු වන්වහන්සේ අමාත්‍ය සමූහයා සිසින් පිරිවරණලදුව උමඟින් වඩනා සේකැ"යි වදාළසේක. ඔහු කොසින් උමඟ දොර හැරපිහ. සියලු උමඟ සරහනලද සුධර්මා නම් දිව්‍ය සභාවසේ අතිමනොහරවිය, බෝධි සත්වයන්වහන්සේගේ විධානයෙන් යෝධයන් උමඟ දොර හළ හියාව ප්‍රකාශකොට වදාරණ බුදුරජාණන්වහන්සේ මේ ගාථාවෙන් වදාරණසේක්:—

එථ මාණව උට්ඨේථ, මුඛං සොධේථ සත්ථිනෝ;
වෙදේහෝ සඞ්ග මච්චෙති, උම්මග්ගෙන ගමිස්සති.

"එම්බා මහණෙනි, මහෞෂධ පණ්ඩිතයන්ගේ සුශික්ෂිත කිකරු යෝධයෝ ඒ පණ්ඩිතයන්ගේ තීක්ෂණවූ ප්‍රඥාවෙන් කරණලද උමඟ ඝනත්‍රයෙන් යුක්තවූ දොර හැර ඒ බව බෝධිසත්වයන්ට කිහ"යි වදාළ සේක; ඒ බව අසා බෝධිසත්වයන්වහන්සේ 'වැඩියමනා කලැ'යි වේදේහ රජ්ජුරුවන්ට කල් දන්වූසේක. රජ්ජුරුවෝ මාලිකාවෙන් බටහ. එවිට සේනකයා එදවස් අමරාදේවීන්දැ නිසා තමා ලත් ඉස් පසිය ඉසින් ගලවා කෝනමක් තරව හැඳ කඩ හකුළුවා තමා සිත වන් සය සේ පොට්ටනියත් එල්වාගෙණ ඇත්මැත් බලබලා ඉඟිකරුව සලෙසිකඩ ඉරා දණ වැලම්ව නලළ් ආදිවූ සථානයෙහි නොබැන්දූසි නොසිතම්. මොහු මේ කරන්නාවූ විකාර මුළුල්ල බෝධිසත්වයන් වහන්සේ දැක නුවණ නැත්තව තෙලෙ කුමක් කෙරෙසිදැ'යි වදාළ සේක. "පණ්ඩිතයන්වහන්ස උමඟින් යන කල නම් කෝනමක් හැඳ ගෙණ හන්පලන් වසන්නාකරණාදී සියලු අලඞ්කාර තබා දණ නමාගෙණ වේද යන්නේ, එසේනෙසින් මමත් උමඟින් යන්නට සැරහෙමි"යි කීය. ඔහුට වදාරණසේක් "එම්බල සේනකය, තෝ වැලින් උමඟට වදනා කල දණ බිම ඔබා නැඹුරුවගෙණ කොයෙකු සේ බඩගාමයෙමි"යි නොසිතා, තෝ ඉදින් ඇතෙකු පිටින්වත් අසෙකු පිටින්වත් රථයකින්වත් යන්නා සැමැත්තෙහි විනම් ඉන් හා සැමති වාහනයකට නැඟි යව, මා විසින් කරණලද උමඟ උසින් අටලොස් රියනක, ඉතා

උස්වූ පළල්වූ වාසල් හා දොරටු ඇත්තේය, එබැවින් තෝ උමඟින් යන්ට කෝනමක් නොහැඳ දණ කඩරෙදි නොබැඳ, හා සැරහෙන යම් අලඞ්කාරයකින් සැරහි කැමති වාහනයකට නැඟි රජ්ජුරුවන්ට පළමු නික්මෙවයි'' වදාළසේක.

බෝධිසත්වයන්වහන්සේ ඒ ඉතා භයපත්වූ සේනකයා පළමුව යන්ටත් රජ්ජුරුවන් මධ්‍යයෙහි යන්ටත් නිලකොටලා තමන්වහන්සේ පසුව ගමන්ගත්සේක. කුමක් නිසාද යත්! සේනකයා සතුරන් දැක තරව බාගියේය, කිසිවෙකත් ආලය නොකොට පසු නොබලා දිවන්නේය, රජ්ජුරුවෝ තමන් ඝිණිගසනුත් නුදුවුවිරූ විසිතුරුකොට සරහනලද උමඟ විසතර බලා නොයන්නාහ, එබැවින් තමන්වහන්සේ ''මහරජ වහා වැඩියමැනව වහා වැඩියමැනවැ''යි සන්කම්කොට කොට යන පිණ්ඩිස රජහට පසුවූ සේකැ'යි දතයුතු. ඒ උමඟ ඇතුළේ මහජනයාට බොහෝ බත් මාළු කන බොනඳ මෙතෙකැයි පමණ නැතිවිය, එහිවන් මනුෂ්‍යයෝ කන්නාහු බොන්නාහු උමඟ විසතර බලමින් මහත්වූ සන්තෝෂයෙන් යන්නාහ. බෝධිසත්වයන් වහන්සේ 'මහරජ වහා වැඩිය මැනවැ''යි කම්සන් කෙරෙමින් පස්සෙහි වඩනාසේක, රජ්ජුරුවෝ සුදම් දෙව්සභාවසේ ඉතා සිත්කළුවූ උමඟ බලමින් යන්නාහ. උමඟින් යන පරිදි වදාරණ බුදුරජාණන් වහන්සේ මේ ගාථාව වදාරා:—

පුරතො සෙනකො යාති, පච්ඡතො ච මහොසධො,
මජ්ඣෙ ච රාජා වෙදෙහො, අමච්ච පරිවාරිතො.

''එම්බා මහණෙනි, එදවස් උමඟින් යන ගමනේ සේනකයා පළමු යෙයි, මහෞෂධ පණ්ඩිතයෝ පස්සෙහි යන්නාහ, දෙදෙනා මධ්‍යයෙහි වේදේහරජ අමාත්‍ය මණ්ඩලයා පිරිවරා නික්මිනා''යි වදාළ සේක.

රජ්ජුරුවන් හා පණ්ඩිතයන්වහන්සේ ආ බව දැන, රූකවල සිවියෝ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ මැනියන් ආදිවූ රජදරුවන් සතරදෙනා උමඟින් පිටත්කොට මහව්සල්මඵවේ සිටුවාලූහ. රජ්ජුරුවෝත් බෝධිසත්වයන් හා සමඟ උමඟින් පිටත්වූහ. ඔහු සතරදෙන බෝධිසත්වයන් දැන් රජ්ජුරුවනුත් දැක ''ඒකාන්තයෙන් සතුරන් අන්පත්වූම්හ, අප ගෙණවන් පණ්ඩිතයන්ගේ යෝධයන් සැටිය''යි මරණ භයින් තැතිගෙණ මහ හඬින් හැඬූහ. ඔහු සතරදෙනා ඇඬූ වේලෙහි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් 'වේදේහරජ පලායෙ'යි යන ක්‍රොධයෙන් ඒ නුවරට කුන්ගව්වක් මානයේ රූකවල් බලා අවුත් ගංතෙරට නුදුරු තැනෙක්හි සිවියානු නියඟබදව තුබූ මධ්‍යම රාත්‍රියෙහි ඒ හැඬූ ශබ්දය අසා 'නන්දාදෙවීන්ගේ කටහඬ වැන්නැ'යි කිම්නම් ''කොයින් නන්දාදේවිය යිය යම්ම තැනක නන්දාදේවි සඳහන් නොකොට කිඳුනා දවසෙක්

නැහැ''යි කියන බසට ලජ්ජාවෙන් කවුරුන්වත් නොකියහ; බෝධි සත්වයන්වහන්සේ උමඟින්ම ගෙණියෙන් රුවන්රැසක් පිට සිටුදා පඤ්චාලචණ්ඩි කුමාරිකාවන් අභිශේකයට පමුණුවා ''මහරජ නුඹ වහන්සේ මේ කුමාරිකාව ගෙණයන්ට අව්දින් මේසා භයකට පැමිණේ සේක; එබැවින් නුඹවහන්සේට අහමෙනෙසුන් වන්නියයි වදාළසේක.

එඳේලෙහි තුන්සියයක් නැව් ගෙණවුන් නොට තබාලුව, මහවිසල් මළුවෙන් හොස් රජ්ජුරුවෝ සරහනලද නැවකට නැංහාහ, බ්‍රහ්ම දත්තරජ්ජුරුවන්ගේ මැණියන් ඇතුළුවූ රජදරුවෝ සතරදෙනාත් එම නැවට නැංහාහ. ඒබව ප්‍රකාශ කොට වදාරණ බුදුරජානන් වහන්සේ මේ ගාථාවෙන් වදාරා:—

උම්මග්ගා නික්ඛම්මාන, වෙදෙහො නාව මාරුහි;
අභිරූළ්හකඤ්ච තං ඤත්වා, අනුසාසි මහොසධො.
අයං තෙ සසුරො දෙව, අයං සස්සු ජනාධිප;
යථා මාතු පවිපත්‍යා, එවං තෙ හොතු සස්සුයා.

එම්බා මහණෙනි, එදවස් වේදේහරජ උමඟින් පිටත්ව නැවට නැංගේය. ඕහට මහෞෂධ පණ්ඩිතයෝ 'මහරජ මේ පඤ්චාලචණ්ඩ කුමාරයෝ නම් සුසුරුබඩුනුවූවෝය, මේ නන්දාදේවි නම් නුඹවහන්සේගේ නැනැනියෝය, ඒ නැනැනියන් කෙරෙහි වැදූ මැනිකෙණෙකුන්ට කරණ ආදරයක් පරිද්දෙන් පිළිපැදිය මැනව, පඤ්චාලචණ්ඩ කුමාරයන් සුසුරුබඩුනුවෝයයි ආලිස්සන් නොකොට එක කුසින් උපන් මල්බෑ කෙණෙකුන් පරිද්දෙන් දයා කටයුතුය; මේ පඤ්චාල චණ්ඩි කුමාරිකාවෝ නම් උභයකුල පරිශුද්ධ ක්ෂත්‍රිය කන්‍යාවෝය, උන් නුඹවහන්සේ කැමති පරිද්දෙන් රාජ ඓශ්වර්‍යයෙහි පිහිටුවා රකුණුකළ මැනවැ'යි කියා අවවාද කළහ''යි වදාළසේක.

මෙසේ අනුශාසනා කළේ කුමක් පිණිසද යත්? ''සරණ දෙම්හයි අප මායමින් නෙන්වා ගෙණ මේසා භයකට පමුණුවා හෙට කල රජු ගේ මව මරව, අඹුදරුවන් මරවයි මැරුණේ විනම් නපුරැ''යි සිතාත්, ''දුවනියන්ට වඩා නන්දාදේවීන් අධික රූ ඇති හෙයින් අඩුවූ මුළාවූ රජ්ජුරුවෝ දුවනියන් තබා මැනියන් කෙරේ ලෝභ උපදවා නැකම් වරදවාපි නම් නපුරැ''යි සිතා පළමුකොට රජ්ජුරුවන් අතින් ප්‍රතිඥ ඇරගන්හයි දතයුතු. රජ්ජුරුවෝත් 'පුත නොප කී ලෙසින් කිසිවකුත් නොවරදවා කෙරෙමි' ඔබගේ අවවාද සිතින්ම පිළිගන්හ. එසේ අව වාදකරණසේක් රාජමාතාවන් තලතා දෙවින්ගේ නමකුත් නොවදාළසේක. කුමක් පිණිසද යත්? උන් මැහැලි හෙයින් කිසිවකුත් නොවතුළසේක. මේ සියලු කථාව මහාබෝධිසත්වයන්වහන්සේ ගොඩ සිටම වදාළසේක. ඉක්බිති රජ්ජුරුවෝ නැවින් වහා යනුකැමතිව 'පුත තෙපි ගොඩ සිටම දෙඩව්ය, වහා නැවට නැගෙව, කුමක් නිසා

ගොඩ සිටුද? සතුරන් අතින් දුකසේ මිදුනම්හ; එබැවින් වහා යම් හ''යි රජ්ජුරුවෝ මේ ගාථාවෙන් කිහ.

ආරුය්හ නාවං තරමානො, කිඤ්චු තීරම්හි තිට්ඨසි;
කිච්ඡා මුත්තාමය දුක්ඛාතො, යාම 'කුනි මහොසධ.

ඒ අසා දේවයන්වහන්ස, නුඹවහන්සේ හා එක්ව නැගියාම යුක්ත නොවෙයි' කියා ගාථා දෙකකින් වදාරණසේක්:—

නෙස ධම්මො මහාරාජ, යොහං සෙනාය නායකො;
සෙනඤ පරිහාපෙත්වා, අත්තානං පරිමොචයෙ.

නිවෙසනම්හි තෙ දෙව, සෙනඤ පරිහාපිතං,
තං දිනනං බ්‍රහ්මදත්තෙන, ආනසිස්සං රථෙසභ.

"මහරජ, සේනාවට නායක කෙණෙක් සේනාව සතුරන්ට අත් පත්වූ කල තමා දන්නා යම් උපායකින් ඒ සේනාව ඝලවාගෙණ යාමක් වත් නොකොත් එක්ව නැසියාමක්වත් නොකෙළේ වීනම් උන්ගේ සේනානායක කමින් ප්‍රයෝජන නැත්තේය. ඒ තමාම ධම්මිෂ්ඨ කමකුත් නොවන්නේය, දැන් මමත් සේනානායකව සේනාව සතුරන්ට හසුනාප්‍රාප්තව ඇතුළු නුවර සිටියදී [යෙමිද?] අප වැන්නෝත් තනිව දිවි රැකගැන්මක් කෙරෙද්ද? මහරජ නුඹවහන්සේ හා කැටිව සාර සියයක් ගව් ගෙවා ආ සේනාවගෙන් සමහර කෙණෙක් මාගියයෙහි කමතින් ශ්‍රානතව නිදන්නාහ, සමහර කෙණෙක් අනන පානාදියෙන් සන්තුෂ්ටව මේ ගමන් තමා නොදන්නාහ, තවද මා හා කැටිව ආවා වුන්ගෙන් සාරමසක් මුළුල්ලෙහි උමඟ හා අඟල පවුරු ආදි සියලු කර්මාන්තකොට රෑ පාන අනවරතයෙන් දුක් ගෙණ විඩාවූවාහු මේ එන තියාව උසින් නොදන්නාහ. එබැවින් ඇම මට උපකාරව සිටියන් හෙන් එකෙකුත් ඇරපියා ඊම මට තරම් නොවෙයි, ඒ සියලු සේනා වම බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් ජයගෙණ උන් දුන් සේනාවක් පරිද්දෙන් නැවත කැරගෙණ එමි; මහරජ නුඹවහන්සේ අනතරා මාගියයෙහි ඇසිල්ලකුත් නොරඳා වහා වැඩිය මැනව, පළමු මා විසින් නුඹවහන්සේට යොත්නකට ගමක් බැගින් ගම් කරවා ඉඩම් ලවා අතරමඟ ගම් සියයකින් වස්ත්‍රාභරණ අනනපානයෙන් සමෘඩ කරවා ඇත් අස් ආදි වාහන සරහා සිටුවනලද, ගමින් ගමට පැමිණි කල කැටිව යන වාහනයෙන් දුර්ලයන් එසි රදවා එසි තුබූ වාහනයකට නැගි වහා මියුලුතුවරට වැඩිය මැනවැ"යි වදාළහස්ක.

ඒ අසා රජ්ජුරුවෝ මේ ගාථාවෙන් කිහ:—

අප්පසෙනො මහාසෙනං, කථං විය්හය්හ ඨස්සසි
දුබ්බලො බලවන්තන්ත, විභඤ්ඤිස්සති පණ්ඩිත.

මෙහි අභිප්‍රායනම්:—"මහෞෂධ පණ්ඩිතයෙනි, තොපගේ සේනාව

මදවුම, බ්‍රහ්මදත්තයන්ගේ මහසේනාව කෙසේ ජයගණ්හිද? බලව නුතයෝ දුර්ලයන් නසාපියා මහා විනාශයට පමුණුවාපියති"යි කියා, ඒ අසා බෝධිසත්වයන්වහන්සේ මේ ගාථාවෙන් වදාරණසේක්:—

අප්පසෙනොපි චෙ මන්ති, මහාසෙනං අමන්තිනං;
ජිනාති රාජ රාජානං, ආදිච්චා වොදයං තමං.

"මහරජ ඇසුව මැනව, මහාසේනාව ඇතිවත් අමාත්‍ය තැනැත්තවූ අල්ප සේනාව ඇති මහා මන්ත්‍රියා ජයගන්නේය, එබැවින් අමාත්‍යවූ බ්‍රහ්මදත්තරජුගේ එක්සියයක් රජුන් හා අටලොස් අක්ෂෝහිණී සඞ්ඛ්‍යාත මහසේනාව මහාමාත්‍යවූ මම මාගේ ප්‍රඥාබලයෙන් ජයගණිමි. තවද අමාත්‍ය කේවට්ටයා ඇති මහාසේනාව සහිතවූ බ්‍රහ්මදත්තරජතු මහා මන්ත්‍රිවූ මා කැනි එක් ඇමතියෙක් ඇති මද සේනාව සහිතවූ නුඹ වහන්සේ ජයගන්නා සේක. ඒ කුමක් වැනිදයත්? සමස්ත ලොකයෙහි එකපැතිර පවත්නාවූ මහා අන්ධකාරය ඉර උදාකළ කල්හි එක පැහැර දුරුව ආලෝක වන්නේය. එබැවින් සේනාව මදවුවත් ජයගන්නේනම් මම්මය, නුඹවහන්සේ සැකයක් නොසිතා වැඩිය මැනවැ"යි වදාරා රජ්ජුරුවන් වැඳ රුදුනුසේක.

ඉක්බිති රජ්ජුරුවෝ 'සතුරන් අතින් මිදුනම්හ, සොයා අප බිසවුනුත් ලදුම්හ, අපගේ මනදෙළ මුදුන් පැමිණියේය'යි බෝධිසත්වයන්ගේ ගුණ සිහිකොට උපන්නාවූ පස්වණක් ප්‍රීතින් පිණ ඔබගේ ගුණ සේනකයාව කියන්නාහු:—

සුසුඛං වත සංවාසො, පණ්ඩිතෙහීති සෙනක;
පක්ඛිව පඤ්ජරෙ බද්ධෙ, මච්ඡ ජාලගතෙ රිව;
අම්හා භත්‍ථඤ්ඣගතෙ, මොචයී නො මහොසධො.

"සේනකය, නුවණැත්තහු හා එක්ව විසීම උතුම, මෙලොවිනුත් පරලොවිනුත් සැපවන්නේය, මැදිරියෙහි හසුවූ ලිහිණියන් සෙයින්ද දැල බැඳි මසුන් පරිද්දෙන්ද සතුරන්ට අත්පත්වූ අප හැමදෙනාම මහෞෂධපණ්ඩිතයෝ ගලවා ඇරපිහ; එබැවින් නුවණැත්තවුන් හා එක්ව විසීම උතුමැ"යි මුඛ තොසැහෙන පර්‍යදෙන් කිහ. ඒ අසා සේනකයා තමා ඇතිවක් පවන් මහනානන්ගේ ගුණයක් කියන්නේ මේ ගාථාවෙන් කිහ:—

එවමෙතං මහාරාජ, පණ්ඩිතාහි සුඛා වහා;
පක්ඛිව පඤ්ජරෙ බද්ධෙ, මච්ඡ ජාලගතෙ රිව;
අම්හාභත්‍ථඤ්ඣගතෙ, මොචයී නො මහොසධො.

"මහරජ, ඒ සැබව ඉතා සැබැමය; නුවණැත්තවුන් හා එකතැන විසීම ඉතා සැපවන්නේය, මැදිරියෙහි හසුවූ ලිහිණියන් සෙයින්ද දැල බැඳි මසුන් පරිද්දෙන්ද සතුරන් අත්පත්වූ අප හැම මහෞෂධ පණ්ඩිතයෝ සුවසේ ගලවා ඇරපුහ"යි කිහ.

ඉක්බිති වේදෙහ රජ්ජුරුවෝ ගඟින් එතරව බැස බෝධිසත්වයන් වහන්සේ විසින් යොදනෙන් යොදන කරවනලද ගම්වලට පැමිණ ඔබ විසින්ම පළමු විධාන අසාගත් අමාත්‍යයන් සපයා එවනලද ගජස්කන්ධාදී වාහන හා අන්න පානාදියෙන් හා නොයෙක් වස්තුහයේ කැවුම් හා කැඳබොනදෙයින් සන්තුෂ්ටව ගමන්විඩාවු සෑහන එකිරඳවා නවවු වාහනයකට නැගි යන්නාහු ගමින් ගමට පැමිණ මහඝනාසන්ගේ විධාන පරිද්දෙන් මාගිහ විධා සන්ඝිදුවා නොපමාව යන්නාහු සාරසිය යක් ගව් ගෙවා දෙවන දවස් පෙරවරු බතට මියුලුනුවරට වන්හ.

බෝධිසත්වයන්වහන්සේ රජහු යවා උමඟ දෙරට වැඩ තමන්වහන්සේ උරෙහි එල්වාගිය කඩුව කොපුමෙන් මැත්කොට උමංදොර මඟ විසල්මළුවේ වැලිපිරා යට සඟවා තබා උමඟින් ගොස් උපකාරිනුවරට වැද සොළොස් කළයක් සුවඳපැනින් ඉස සෝධා නහා නොයෙක් රසයෙන් අනඤ්ඤ භෝජනය අනුභවකොට සහන් මුදුනේ සැතපුනු සේක් 'මාගේ මනදෙළ මුදුන් පැමිණියේය'යි සිතා පස්වණක් ප්‍රීතින් පිණ සුවසේ සැතපුනුසේක.

ඒ රාත්‍රිය පහන්වූ ඇසිල්ලෙහි චූලනිරජ්ජුරුවෝ සේනාව මෙහෙයන්නාහු නුවරට සමීපවූහ. ඒ රජහු සේනාවට විධාන කෙරෙමින් සැරහි ආ නියාව ප්‍රකාශකොට වදාරණ ඛුදුරජාතක්වහන්සේ:—

> රත්තිඤ්ඤා කසිතං රත්තිං, චූලනෙයෙය්‍ය මහබ්බලෝ;
> උදෙන්තෙ අරුණඝටමහි, උපකාරිං උපාගමී.
> ආරුය්හ පවරං නාගං, බලවන්තං සට්ඨිහායනං;
> රාජා අවොච පඤ්ඣාලෝ, චූලනෙයෙය්‍ය මහබ්බලෝ.
> සන්නද්ධෝ මණිවම්මෙන, සරමාදාය පාණිනා;
> පෙසසියෙ අජ්ඣභාසිත්ථ, පුථු ගුමෙහ සමාගතෙ.

"එම්බා මහණෙනි, බලවාහන සහිතවූ බ්‍රහ්මදත්තාරජ තුන්යම් රාත්‍රියෙහි තුන්සන්ධියකින් හා සතර වළල්ලකින් අතුරු සිදුරු නොපැ ඒ ඒ ස්ථානයෙහි බලඇණි සිටුවා තුමූ රැකවල් බලා ඇවිද අරුණුනැගි පහන්වන්නාහාම උපකාරිනුවරට ආහ. තවද පඤ්චප්‍රකාර බලයෙන් යුක්තවූ බ්‍රහ්මදත්තාරජ සැවඅවුරුද්දෙන් මදනැගි බලඝිඳුනාවූ කම්පට තුන්තැනකින් පැළිතිබෙන්නාවූ සටන්ඝි ජයබිම් හඳුනන්නාවූ ගිය ගිය තැන සතුරන් බිඳ ජයගන්ට සමර්ථවූ මහබල ඇති සර්ව ලක්ෂණ සම්පන්න සියලු හස්ත්‍යාලඞ්කාරයෙන් සරහනලද මඟුලැතක්හු පිටට පැනනැගි මැණික් ඔබා කරණලද රුවන් සන්නාහ සන්නබව ඝිසක් නියපිට ලා ධනුශාස්ත්‍රයෙහි දක්ෂවූ සන්නාහ සන්නඬ අනේක ප්‍රකාර යෝධයන්ට මෙසේ විධානකෙරෙමින් නුවරට සමීපවිය"යි වදාළසේක.

ඒ රජහු සේනාව මෙහෙයූ පරිදි මේ ගාථාවෙන් වදාළසේක;—

හත්ථාරොහෙ අණීකට්ඨේ, රථිකෙ පත්ත්තිකාරිකෙ,
උපාසනමහි කතහත්ථේ, වාලවේධෙ සමාගතෙ.

''ඇතුන් නැඟෙන්නාවූද අසුන් නැඟෙන්නාවූද රථ නැඟෙන්නාවූද පඤ්චායුධ සන්නාඩම්ව ආවාවූ මහාසේනාවද, ඉතුත් ධනුශ්ශිල්පයෙහි දක්ෂවූ කෘතහස්තාවූ එක්වන් කරණලද අභ්‍යාස ඇති එසේකෙයින්ම, කළු හස්ලොම කරබටුවක් බැඳ දබ්බස්නා මානයේ දෙදණ්ඩක් හිඳුවා එහි සරඝ බැඳි වියලි දණ්ඩෙ බැඳ එල්වූ කරබටු විදුලිය ආදිවූ යම් කිසි ආලෝකයකින් බටුව එල්වූ කළු අස්ලොම පළා විදපියන්ට සමර්ථවූ යෝධයෝ වහා සන්නාඩම් එත්ම''සි කියාද; තවද චූලනීරජ්ජුරුවෝ ''වේදේහරජ නොමරා අල්වාහන්මිසි කියමින් සැට අවුරුද්දෙන් මදහෙන්නාවූ මට සිඵවුවූ දළ ඇති කුඤ්ජරයයි කියනලද බලසම්පන්න යෝධ ඇත්සමූහයන් සියදහස්කණින් මෙහෙයා මෙම වේදේහ රජු නිසා මහෞෂධපණ්ඩිතයා විසින් කරණලද මේ උපකාරි නුවර අවලොස්රියන් පවුර මිරිකාපියව''සි කියාද; ''තවද බාල වස්සන්ගේ දත් සේ ඉතා සුදුවූ නියුණු මුවහත් ඇති විදිනා කල ඇවපළා විදපියත් මුත් මැහෙ නොරඳවන්නාහු ධනුශ්ශිල්පයෙහි දක්ෂ යෝධයෝ මහා වළිඟුවක් පරිද්දෙන් ශරවර්ෂා වස්වත්වසි තවද සූරවීරිය ඇති තරුණ යෝධයෝ අනේකප්‍රකාර විචිත්‍රවූ පඤ්චායුධ සන්නාඩම සඬ්ග්‍රාමයෙහි එඬි පසුනොලා ඉදිරියටම දිවන්නාවූ තමන් ඉදිරියෙහි ඇතුන් දුටත් දළ අල්වාගෙණ වෙවුල්මාපියන්ට සමර්ථවූ යෝධයෝ වහා එත්වසි; තවද ආයුධම බලකොට ඇත්තාවූ නොකොත් බලවත් ආයුධ හත්තාවූ සන්නාහ සන්නාඩම්වූ සටනෙහි පිටපා නොයන්නාවූ මාගේ යෝධයන් අතින් වේදේහරජ කෙසේනම් මිදී පලායන්නේද? ඉදින් යම්කිසි භාග්‍යයෙකින් පක්ෂියෙකු පරිද්දෙන් ආකාශයෙන් යේ නමුත් මාගේ දුනුවා යෝධයෝ යා නොදෙන්නාහ. තවද මාගේ තිස්නව දහස්ක් පමණ බලසම්පන්නවූ අසමාන යෝධයෝ සඬ්ග්‍රාමයව සිස්අතින් ගියාහු වීනමුත් සතුරන් අත ආයුධම උදුරාගෙණ සතුරන් සාධාහන්නාහ, උන් සමාන එකෙකුත් දිඹදිව එක රජක්හු සමීපයෙහිත් මා දකින්නේනැත, එබදුවූ යෝධයන් ඇත්තෙත් මමය, උසිත් සන්නාහ සන්නාඩම වහා එත්වසි. තවද රන් සන්නාහයෙන් සරහනලද බල සම්පන්න ඇතුන්පිට උන්නාවූ මනාවූ දැකුම් ඇති රාජකුමාරවරු වහා ඇතුන් මෙහෙයත්වසි. තවද රන්වන් පිළි ඇඳ සවණ්ණාලඞ්කාරයෙන් සැරසී රන්වන් අඞ්කුශ ගල්වා පඤ්චායුධ සන්නාඩම රන්සැත් රන්පොරොවු ආදී සවණ්ණාලඞ්කාරයෙන් සරහනලද ඇතුන් නැගී නදුන්වන උයන්හි දෙවතා සමූහයක් මෙන් අසමානවූ යෝධයෝ සිය දහස්කණින් මහා එත්වසි, තවද පෙවියන් බඩපැහැ සමාන වර්ණ ඇති සකස්කොට ධාරා නහණලද නුවණැති පුරුෂයන් විසින් සුවිනීතකොට තුන්සණ හා නිමවනලද ඉදින් සුලඟින් මුවහතට සම්ප්‍රාප්තවූ පුළුන්රැල උවත් කැපී සිදී යන තරම්වූ තියුණු මුවහත් ඇති

මඩ්‍යාහ්නයෙහි සූර්‍යමණ්ඩලය මෙන් බබලන්නාවූ යහපත්කොට කරණලද කඩුගත්තාවූ (හේ කෙසේවූ කඩු ජාතියක්ද යත්? ජාති වාණේ කැටපිහිරින් හා සුණුකොට ඒ සුණු දඩමස් හා එක්කොට අනා ඒ මස් කොස්ලිහිණියන් කවා උන්ලූ වසුරු දවා වාණේ ගෙණ, නැවත හා හතා පළමු පරිද්දෙන්ම ඒ පක්‍ෂීන් කවා එම පරිද්දෙන් සත්වාරයෙක කවා දවාගත් වාණයෙන් කළ කඩු ජාතියෙකැයි දත යුතු) යෝධයෝ සතුරන්ට නොවරදවා පහර දෙන්නාහු කොපුවෙන් අදනාලද කඩු ගෙණ වහා එත්වසි, තවද මාගේ අසමානවූ තිස්නව දහසක් පමණ පතාක යෝධයෝ වහා එත්වසි (ඔහු කෙසේවූ යෝධ කෙණෙක්ද යත්? යම්සේ මාර සේනාවක් බලවූ සතුරු සේනාවක් අහල පවුරු අට්ටාල බලකොටු වාසල් සහිතවූ අයොධ්‍යාපුරය හා සමාන එක් නුවරෙක උන්නාවූ් නමුත් මේ මාගේ පතාක යෝධයෝ ඉන් පිටත සිවියාහූ එබඳු අවිෂයසථානයෙහි සිටි සතුරන් 'සාදම්භ'සි සිතූ නම් පිටත සිටි තැනම සිට ආකාශයට කරණම් පැන එසේ උඩපිනූ කරණමින්ම නැවතත් බිම නොහි නැවත නැවත කරණම් පනන්නාහු ආකාශයෙන් ගොස් අතතුබූ ආයුධයෙන් ඇතුළු නුවර උන් සතුරන් සාදු නැවත එපරිද්දෙන්ම කරණම් පැන පැන ආකාශයෙන් අවුත් තමන් පළමු සිටි තැන සිටිනට පෝසත්හ. ඒ යෝධයෝ ඉදින් ඇත්කඳ වී නමුත් තමන්ගේ කඩුවෙන් එකපහරින් මැදින් පොළු ගසන්නට සමර්‍ථයහ, එම්බල වේදේහ කොල්ල පළමු තාගේ ගොවියා පුතුගේ මාත්‍රිකමින් හා ඔහුගේ ප්‍රඥානුභාවයෙන් ගැලවිහ, දැන්වූ කලි නට මිදියාමෙක් නම් කොසින්ද? දැන් තාගේ රාජානුභාවයත් තානේ මන්ත්‍රිකමුත් මින් ගැලවී මියුලුනුවරට යාමත් බලන්නෙම් වේද? දැන් තෝ කරප හෙළාගත් මසෙකු පරිද්දෙන් අසුවූයෙහි වේ දැ''සි කියා වේදේහරජහට තනතනමින් 'දැල්හි අසුවූ මසෙකු මෙන් දැන් අල්වම්' වජ්‍රාඛකුශයෙන් ඇතු මෙහෙයන්නාහු 'ගණුව විදුව'සි කිය කියා සෙනග මෙහෙයන්නාහු උපකාරිනුවර මැඩ වතුරක් ගලන්නාක් පරිද්දෙන් අවුත් වන්හ.

ඉක්බිති බෝධිසත්වයන්වහන්සේගේ චරපුරුෂයෝ තමන් තමන්ගේ ආණුබල පිරිස හා සමග ''කවුරු දනිද්ද කිම්ද ඉදින් පවුරු බිඳ නුවර මිරිකාගෙණ වදින් නම් ඒසියයක් රජ්‍ජුන් හා බ්‍රහ්මදත්තයන්ගේ ඉස් හසාලා අපගේ පණ්ඩිතසවාමීන්ගේ පාපිට දමාලම්හ''සි තමතමන් සිවින්නාවූ රජදරුවන් පිරිවරාගත්හ. එවේලෙහි තුන්ලෝ තිලකවූ ත්‍රිලොකෙක ගුරුවූ පරශත්‍රු මර්දනවූ ප්‍රතාප හා ගම්භීර ප්‍රඥාවිශෙෂ ඇති සකල ඉර්ෂ්‍යක්‍ෂ මර්දනයට හාස්වර ක්ෂේරසිංහ රාජවික්‍රමඇති මාගේ සවාමිදරුවූ ශ්‍රීමහා බෝධිසත්වයන්වහන්සේ රූ සැතපුනු ශ්‍රියහ තින් නැගි සිට ශරීරකෘත්‍ය සපයා පෙරවරු බත කල්තබා අනුභවකොට, රන්පට රුවන් සෝළු කණීණ කුණ්ඩල තාඩඞ්ක නාගවඩම් කාදු කාප්පු මුතුපට පවිටොඩම් බාහුදණ්ඩි මිණිවලළු යිගිරිවලළු මණි

කසිවඩම් පස්රූ රුවන්වැල රන්සවඩි පාදසඹලා පාදාභරණ පාස ලඹ පාද කිඹිණි ඈක පාදජාලා මේආදිවූ ආභරණයෙන් සැරහී ලකුණයක් වටනා කසිසළුවත් ඇඳ ලකුණක් වටනා රත් පලඟක් ඒකාංශකොට පෙරවා සතරන්මය රුවන් කම්මාන්තයෙන් මිසිතුරුවූ සෝළියක් අතින්ගෙණ රන් මිරිවැඩි සඟලක් පයලා දෙවඟනන් පරදවන රූ ඇති සවිසඟරණයෙන් සැරහුනාවූ තරුණ සත්තු දෙදෙනෙකු ලවා සුදුවාමර දෙකක් සල්වනසේක් සිත්කළුකොට සරඟනලද තමන් වඟන්සේගේ මාලිකාවේ සිව්මැදුරු කවුළුව හරවා චූලනී රජ්ජුරුවන්ට තමන්වඟන්සේ පෙණෙන පරිද්දෙන් ශක්‍ර ලීලාවෙන් ඇන් මැන් බලා සක්මන් කරණසේක. චූලනිරජ්ජුරුවෝ ඒ මඟනා නන්වඟන්සේගේ රූපශ්‍රී බලා සිත පහදවාගතනොහී 'දැන්ම මොහු අල්වාඟණිමි' සිතා වඟ වහා ඇතු මෙහෙයන්නාක.

ඒ දැක පණ්ඩිතයන්වඟන්සේ සිතනසේක්, "මේරජ ඒකාන්තයෙන් වේදේහයා මා විසින් අසුකරණලදැ'යි සිතා වහවහා ඇතු මෙහෙය මින් එන්නේය, තමන්ගේ අඹුදරුවන් ඇරගෙණ අපගේ රජ්ජුරුවන් මියුලුනුවර ගිය නියාව "නොදන්නාඟ"යි සිතා, "සකස්කොට ඔප් නැගූ රන් කැටපතෙක පැහැ සමානවූ මාගේ මුහුණ මේ රජුට දක්වාලා රජු හා සමඟ කථාකරමැ"යි සිතා සිව්මැදුරු කවුළුවෙන් රජහු මුහුණ බලා මධුරස්වරයෙන් රජහු හා කථාකරණසේක් මෙසේ වදාරණසේක:—

කිනනු සන්තර මානොව, නාගං පෙසෙසි කුඤ්ජරං
පහට්ඨරූපෝ ආපහාසි, ලඛ්ඡොසම්හි මඤ්ඤසි.

ඔහරෙතං ධනුං චාපං, බ්‍රූරපඤ්ච පටිසංහර,
ඔහරෙතං සුහං වම්මං, වෙළුරියමණිඤ්ච සන්ථතං.

"ඇයි මහරජ, ඉක්මන් ඉක්මන්ව ඇතු මෙහෙයනසේක් තමාගේ අභිමතාර්ථය ඉඩවීයයි සිතනසේක්ද? එක විටෙකත් එසේ නොසිතුව මැනව, මහරජ නුඹවහන්සේ සිත ඇත්ත තබාපියා මෙච්ච මා කිවක් කළමැනව, ඊයේ දවස් පස්වරු දුනුමිට තරව අල්වාඟත් අත තව දක්වා ඉට මිරිකා ගැන්මෙන් සිරිඟිගියයි සිතමි, එසේහෙයින් තෙල දුනු ඊතල දමාපුව මැනව, එසේ නැත අනික්කඟට හෝ දෙවාපුව මැනව, තවද වෛද්‍යයෝ මාණික්‍යමය කොට කරණලද ඉකා සෝඟ මානවූ තෙල සන්නාහයත් ඊයේ පස්වරුම ලාඟත් ගෙයින් ශරීරය ඉදී නුඹවහන්සේට බොහෝ පීඩායයි සිතමි, නොකොත් ශරීරය පඩුවන් පැහැවියයි සිතමි, තවද ඊයේම පස්වරු පවන් නුන්යම් රාත්‍රියෙහි නිදිමරා විඩාවඟියසේක, තවද ඉරඅවුදා කලාන්තනොව් නිදා නැඟි නුඹවහන්සේගේ නුවරට පලාගොස් මාලිකාවේ සුවසේ සැතපී වදාළ මැනවැ"යි රජු හා කෙළනසේ වෙහෙසුඟ.

රජ ඔබගේ බස් අසා 'හොඳියාපිත් මාහා කෙළනේය'සි බෝධිසත්ව යන්වහන්සේට ගර්ජනාකොට 'තට කළමනාදැ දන්නෙම්දැ'සි සැහෙන්නාහු මේ ගාථාවෙන් කියා:—

පසන්න මුඛ වණ්ණාසි, මිහිතපුබ්බං ව භාසසි;
හොතිඛෝ මරණෙ කාලෙ, නාදිසී වණ්ණ සම්පදා.

මේ ගාථායෙහි අභිප්‍රාය කෙසේදයත්:—"තාගේ මුඛය හෙවත් තාගේ මුහුණ ඔප්නැගූ රන් කැටපතක්සේ යහපත්ව බබලන්නේය, සිනා පෙරදුරිකොටම බස් කියයි; ඒ තට මතු නොවෙයි, සමහර කෙණෙකුන් මරණාසන්නයෙහි මෙබඳු මිහිරි බස් හා මුහුණ පැහැ ඇතිවන්නේය; දැන් නොසිත් නොබෝකලකින් මියෙයි; එබැවින් මෙබඳු රූපශ්‍රීන් බබලයි; දැන් දැන් තා මරා ඉස කපා ජයපානය බොමි"සි කිහ. මෙසේ රජහු බෝධිසත්වයන් හා දෙඩන වේලෙහි මහතානන්ගේ රූපශෝභාව දුටුවාවූ මහසේනාව "අපගේ රජ්ජුරුවන් හා ඔහෙ ඝඩපණ්ඩිතයන් හා දෙන්න කථාවක් කෙරෙති, ඒ කුමක් බවත් නොදනුම්හ; කොල අසන්ට යම්හ"සි එක්සියයක් රජුන් හා සේනාව රජහු සමීපයට ගියහ. මහතානෝ සිතනසේක් "මේ රජ තවම මා මහෞෂධ පණ්ඩිත බව නොදනී, මම මා මරාගත නොදෙමි"සි වදාරණසේක් "මහරජ යම් දවසක් නුඹවහන්සේ හා කේවට්ටයා හා දෙන්න සිනින් එකක් සිතා බසින් එකක් කියා කළ මන්ත්‍රණයෙක්විද එසිත් සිතින් සිතුවා නොවිය බසින් කිවාම වීය"සි ප්‍රකාශ කරමින්:—

මොඝංතෙ ගජ්ජිතං රාජ, භින්න මඤ්ඤාසි ඛත්තිය;
දුග්ගාණ්හා හි තයා රාජ, සඳ්ධෙකතෙව සිඤ්චථා.

මෙසින් වදාරා, "මහරජ නුඹවහන්සේ හා කේවට්ටයා හා දෙන්න මතුමාලේ තනිව ශ්‍රී යහන් ගබඩාවේ හිඳ රහස්මන්ත්‍රණයක් කරන්නාහු'අප දෙන්නාමුත් අනික් දන්නෝ නැතැ'සි සිතා කළ මන්ත්‍රණය නොදනිති සිතුසේක්ද? එසේ නොසිතුව මැනව; ඒ මන්ත්‍රණය මට කියාලූ දෙයක්සේ ඉදුරාම දනිමි, නුඹවහන්සේගේ මන්ත්‍රණය භින්නව ගියේය, එසේහෙයින් අපගේ රජ්ජුරුවෝ තමන්ගේ නුවරට පලාගියෝය. ඉදින් 'ලුහුබඳවා ඝාතිම්' සිතනසේක් වීනම් එසිත් නොපිළිවන, අපගේ රජ්ජුරුවෝ ජාතිසෙඤ්ඤවයෙකු නැගි බලවත් අශ්වාවාහයකු වැන්නාහ, නුඹවහන්සේ කොටලුවෙකු නැගි ඉතා බාහුසුලුවූ පුරුෂයෙකු වැන්නාහ, එසේහෙයින් ලුහුබඳවා අල්වාගන්ට නොපිළිවන, කේවට්ටයා කොටළුවා වැන්න, නුඹවහන්සේ කොටළුවා නැගි පුරුෂයා වැනිසේක, මම ආජානීය සෙඤ්ඤවයා වැන්නෙමි, අපගේ රජ්ජුරුවෝ ඒ සෙඤ්ඤවයා නැගි පුරුෂයා වැන්නාහ"සි උපමාකොට වදාළසේක. "මහරජ වැලිත් ගඟින් එතර යන්නාහු තනිව ගියාහු නොවෙති, සේනා වාහන සහිතව අමාත්‍ය මණ්ඩලයා පිරිවරා මහපෙළ කරින් වැඩිසේක, ඉදින් නුඹවහන්සේ 'ලුහුබඳවා අල්වා ඝාතිම්'සි

සිතා දිවනසේක් වීනම් අල්වාගත නොහී අතරමඟ නස්නාසේක, කුමක් මෙන්දයත්? සවණ්ණණංසයෙකු ලුහුබඳවා දිවන කොතෙකු මෙනැ''සි කියා.

නැවතත් අසම්භින්න කේශර සිංහරාජයෙකු පරිද්දෙන් උපමාවක් දක්වමින්:—

සිඟාලා රත්ති භාණසම්ං, ථුල්ලං දිස්වාන කිංසුකං,
මංසපෙසිති මඤ්ඤන්තා, පරිබ්බුළ්හා ඕහාඩමා.
එවමෙව තුවං රාජ, වෙදෙහං පරිවාරිය,
ආසච්ඡිනෙනා ගමිස්සසි, සිඟාලා කිංසුකං යථා.

''මහරජ නුඹවහන්සේ මේසා සේනාවක් ඇරගෙණ තුන්යම් රාත්‍රියෙහි නිදිමරා සිතූ අර්ථයෙන් සවලප මාත්‍රයකුත් සාදාගත නුහුනුනියාව කුමක් මෙන්ද යත්? යම්සේ හොදුරු සොයා ඇවිදිනා සිවල් මුළෙක් සුපුෂ්පිතවූ කැලවෘක්ෂයක චන්ද්‍රාලෝකයෙන්වත් තාරකාලෝකයෙන්වත් විද්‍යුල්ලතාදියෙන්වත් යම්කිසි ආලෝකයකින් එලෙන් නාවූ මල්කැන් දැක 'මේවූකලි ඒකාන්තයෙන් මස්වැදලිය'සි වරදවා සිතාගත්තාහු අනික් හොදුරක් සොයා නොගොස් 'දඩමස් කම්හ'සි ගස් වටකොට ඔද අරුණු නැගි පහන්වූ කල සුපුෂ්පිතවූ කැලමල් දැක ඒ ශෘගාලයෝ ඔවුනොවුන්ට 'කොල මස්වැදලි නොවෙයි කැලමල් කැනැ'සි නියම දැන එහි ආලය හැරපියන්නාහ, එපරිද්දෙන් මහරජ නුඹවහන්සේ 'වේදේහරජ අසුකෙලෙමි' සිතා රාත්‍රිය මුළුල්ලෙහි නිදිමරා ඇවිද අධමවූ කැනහිලුන් පරිද්දෙන් අපගේ රජ්ජුරුවන් කෙරෙහි ආලය හැර යනසේක්වේදැ'සි විතුළසේක.

රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්වහන්සේ කිසි චකිතයක් නැතිව නිර්භයතව කියන්නාවූ බස් අසා සිතන්නාහු ''මේ ගොවියාපිත් ඛුත්තිවිම 'රජහු පැළහ'සි කියන්නේය, මොහු විසින් රජහු යවාපුයේ සැබෑ සැටිය''සි අභිශඞ්කා කිපී 'පෙරත් අපි මේ ගොවියාපුතුම නිසා මොහුගේ තුවරව ගියමෝ හන්කඩට උතුරුඇළවටත් අසාමිකව දමාපියා ආම්හ, දැන් ඇසතප්‍රාප්තවූ පසමිතුරා පළවාපියනලද, මූ තරම් අනාර්‍යකාරී එකෙක් නැත, රජුටත් මූටත් කළුවනා ඉස්සිඳීම් ආදිවූ යම් වධයක් ඇත්නම්, මොහුටම කෙරෙමි'' විධාන කරන්නාහු ''මේ මහෞෂධයා මා හසත ප්‍රාප්තවූ සතුරු වේදේහරජහු ගලවා යවාපිය, ඒසේ කළාවූ මොහුගේ දැස් දෙපා කන් නාසාකපා හරුව,ඇඟමස් කපා ලියා උල අවුනා ගින් මන්ලා පලකාපියව,තවද සිංහ ව්‍යාඝ්‍ර වෘෂභ මෘග ආදින්ගේ සම් බිම වනාවට කණු ගසා වියලන්නාහ,එපරිද්දෙන් මේ මහෞෂධයා බිම හොවා සතර අතට කණු ගසා වධ කරව, තවද මොහු බිම හොවා තිස්සණු මුවහත් ඇති කඩුවෙන් කොටා පළා, ව්‍යාඝ්‍ර මෘග සූකරාදීන්ගේ මාංස පරිද්දෙන් ඉරා ලියා වධ කරව''සි කිහ.

මේ එක් රජෙකු තබා දසදහසක් සක්වළ රජදරුවෝ එක්වත් මාගේ සැවාමිදරුවාණන්ට එවැන්නක් කරන්ට අසමර්ථයහ, ඒ රජුහුගේ බසමුත් කිවාසින් කිසිවකුත් කළ නොහෙන්නාහ. බසින්වූ බස් අසා බෝධිසත්වයන්වහන්සේ සිතා පහළකොට වදාළසේක, ඒ රජහු කිපෙත් කිපෙත් මාගේ සැවාමිදරුවාණන් මූණ පෙම් වඩනා නියාව කුමක් වැනිද යත්? බ්‍රහ්මදත්තරජහුගේ ඉතා රළුවූ ක්‍රොධ නැමැති සුන්නෙන් උලා ඔප්නැගූ රන් කැටපතක පැහැ සමානව වඩවඩා ශෝභාමත්ව අතිශයින් බබලන්ට වන. එවිට සිතසේක්"මේ නුවණ නැති රජ තමාගේ නැයන් ආගියබැව් නොදුන මට වධ විධානකරන්නේය, මැනියනුත් අඹුදරුවනුත් නෙන්වාගෙණ, මියුලුනුවරට යැවූ නියාව නොදුන මට සැහෙන්නාහ, මේ රජ මහා ඓශ්වර්‍යයෙහි පිහිටා සිටියේ 'මා කළ දෙයක් කෙළේය'යි සිතා ක්‍රොධ විශයෙන් අත නිබූ හයෙන් විදපි නමුත් අන් කිසි උපක්‍රමයකින් නසාපි නමුත් නපුර, මේ රජහු ශොකයෙන් මූර්ඡාකරවා උන් ඇතුපිටම විඤ්ඤ කරවාපියා නැවත අස්වසාලම්" සිතා වදාරණසේක්:—

සචෙ මෙ හත්ථ පාදඤ්ච, කණ්ණඤ්ච නාසඤ්ච ඡෙදයි,
එවං පඤ්චාල චණ්ඩස්ස, වෙදෙහො ඡෙදයිස්සති.
සචෙ මෙ හත්ථ පාදඤ්ච, කණ්ණඤ්ච නාසඤ්ච ඡෙදයි,
එවං නන්‍දස්ය දෙවියා, වෙදෙහො ඡෙදයිස්සති.

"මහරජ ඉදින් නුඹවහන්සේ මාගේ අත් පා කන් නාසා කප්පවා වධ කරවූසේක් වීනම් නුඹවහන්සේ මට කරවූ වධ මුළුල්ල නුඹවහන්සේගේ පුතනුවන් දියණියන් නන්‍දදෙවින් නුඹවහන්සේ වැදූ මැනියන් යන සතරදෙනාට අපගේ රජ්ජුරුවෝ අත් පා කන් නාසා කපා වධ කරවන්නාහ. මහරජ මාගේ ඇහමස් ලියා උල අවුනා වධකරවූද්‍ය වීනම්, අපගේ රජ්ජුරුවෝත් නුඹවහන්සේගේ නැයන් සතරදෙනාට මට කළ වධයට දිවුණක් කරවන්නාහ. තවද සිංහ ව්‍යාඝ්‍ර මෘග වෘකාදීන්ගේ සම් බිමවනා කණ්ඨ ඝසා වියලන්නාසේ මට වධකර වූද්‍ය වීනම්, නුඹවහන්සේගේ නැයන් සතරදෙනාටත් අපගේ රජ්ජුරුවෝ නොයෙක් චිත්‍ර වධ කරවන්නාහ. තවද මහරජ, සම්කරුවන් ලවා සම් සියක්පවින් සකස්කොට කරවා වැළඳගන්නාලද සන්නාහය තමහට බැහැරින් වදනා සැර ආදි උපද්‍රව නිවාරණයකොට ආත්ම රක්ෂාව පිණිස වන්නේද, එපරිද්දෙන්ම මම මාගේ රජ්ජුරුවන්ට සම් සියක් පවින් කළ සන්නාහයක් පරිද්දෙන් ඉදිරිව සිට කිසි භයක් නොවැද්දදි සැප එලවම්" වදාළසේක.

මෙසේද කියා නැවත වදාරණසේක්, "මහරජ වැලිත් මේ නිකම් කියන දෙයෙකැයි නොසිතුව මැනව, නුඹවහන්සේගේ අඹුදරුවන් හා මැනියන් අපගේ රජ්ජුරුවන්ට පාවාදී මියුලුනුවරට යවන්නෙම්, මහරජ ඉදින් චූලනීරජ්ජුරුවෝ 'නුඹවහන්සේ තමන්ට සොරා යවාපි හ'යි මා අල්වාගෙණ කන් නාසා අත් පා කප්පවා වධකරවූ නම් කුමක්

කරණ්ඩේය්දැයි කී හෙයින් ''මහෞෂධ පණ්ඩිතයෙනි තොපට සැබවින් වධයක් කළේවිනම් ඒ තොපට කළ වධ මුළුල්ල ඒ රජ තමා මහබල ඇතිහෙයින් ඕනට කළනොහෙතත් ඔහුගේ අඹුදරුවන් මැනියන් යන සතරදෙනාට, තොපට කළ වධයට දිවුණක්ම කරවමි' කිහ. සැබවින් මහරජ නුඹවහන්සේ මා එක තැනැත්තවුට එක් වධයක් කරවූසේක් වීනම් නන්දාදේවින් හා දරුවන් දෙන්න ඇතුළුවූ නැයන් සතරදෙනාට අපගේ රජ්ජුරුවෝ තමන්ට පිළිවන් වධබන්ධන කරවන්නාහ''යි වදාළසේක. මෙසේද කියා ''මහරජ නුඹවහන්සේගේ ප්‍රඥා නැමති ඖෂධ සම්භාරයක්පවින් කළ ඝනනාහයක්ව ඉදිරිව සිට මාගේ රජ්ජුරුවන්ට ඒ සැරයෙන් වන්නාවූ උපද්‍රව දුරුකොට සැපයක්ම කෙරෙමි'' වදාළසේක.

ඒ අසූ චූලනිරජ්ජුරුවෝ සිතන්නාහු ''මේ ගොවියාපුත් කුමක් කියාද? මම යම් වධයක් තමාට කරවමි කිම් නම් මේ තෙමේ තමාගේ රජ මාගේ අඹුදරුවන්ට කරවති කියයි. මම ඊයේ එන්නෙමි මාගේ අඹුදරුවන්ට සුරක්ෂිතකොට රැකවල් ලවාලා ආ හියාව නොදන්නා වන, නොබෝ කලකින් මේ මියන්නේය, එබැවින් මරණ විකලයෙන් නන්දෙඩත්''යයි කියා මහතානන්ගේ බස් රජ්ජුරුවෝ නොඇසූහ.

පරසිත් දන්නා නුවණැති මාගේ බෝධිසත්වයන්වහන්සේ රජ සිතුවා දැන ''මේ රජ මා ඔසින් නන්දෙඩති සිතයි, සැබවින්ම අඹුදරුවන් මියුලුනුවරට යැවූ හියාව දන්වාලම්'' සිතා වදාරණසේක් ''මහ රජ මා මරණඔසින් නන්දෙඩති සිතුබැවින් මාගේ බස් අදහන පිණිස මිනිසුන් යවා මාලිගාව බැලවුව මැනව, නන්දාදේවින් හා දරුදෙදෙනා හා නුඹවහන්සේගේ මැනියන් ඇතුළුවූ නැයන් සතරදෙනා සුලු උමඟින් බාහිරණ වේදේහ රජ්ජුරුවන්ට පාවාදී මහළුමඟින් මියුලුනුවරට යවා පියනලද, මෙතනට සාරසියයක් ගව් ගෙවා මියුලුනුවරට යන්නාහ''යි වදාළසේක.

එවිට රජ්ජුරුවෝ සිතන්නාහු ''පණ්ඩිතයෝ ඉතා ඛුහුවිවම කියත්නාහ, මා විසින් මධ්‍යම රාත්‍රියෙහි ගංතෙර රැකවල් බලා ඇවිදිනෙමි. නන්දාදේවින්ගේ වැනි ශබ්දයක් අසනලද, මේ පණ්ඩිතයෝත් එසේ මෙසේ කෙණෙක් නොවන්නාහ, මුන් හා සමාන ප්‍රඥා ඇති කෙණෙක් කොයින් නැත්තාහ, එබැවින් මුන්ගේ බස් සැබෑ සැටිය''යි උපන්නාවූ බලවත් සෝක ඇත්තාහු රාජධෙය්‍ය උපදවාගෙණ නිස්සෝකි එකක්හු මෙන් එක් අමාත්‍යයෙකු කැඳවා මාලිගාව බලවන්නාහු ''එම්බා දරුව, මේ මහෞෂධපණ්ඩිතයෝ කියන්නෝ 'මාගේ අඹුදරුවන් ආදිවූ අවශ්‍යබන්ධුන් සතරදෙනා උමඟින් කෙන්වා තමා රජ්ජුරුවන්ට පාවාදී මියුලුනුවරට යවාපිම්' කිවුය. උන්ගේ බස් සැබෑද බොරුද පරීක්ෂාකොට පියා වහා එව''යි කිහ.

ඒ අසා අමාත්‍යයා සේනාව පිරිවරා ගොස් දෙර කැර නෙට වැද, ඒ

රජ්ජෙහි අත්පා බැඳ කට කඩරෙදි ඔබා හිත්‍යා කොකුවල එල්වාපියා තුබූ පුරරකින්නන් කුදුන් කුරුන් ආදිවූවන්ද, බදුන් කිඳ ඒ ඒ ස්ථාන යෙහි විසුරුවාපියා තුබූ කනබොන දෑද, රුවන් ගබඩාවල දෙර හැර බිඳපියා රුවන් උකාගත් තැන ඉහපියා තුබූ රුවන් සමූහද, දෙරහැර තුබූ ශ්‍රියහන් ගබඩාද, එසේම ඇරපියා තුබූ සිව්මැදුරු කවුළුවෙන් ඇතුළට වැද උතුන් කවින් පූ උදුරා කන්නාවූ කා රැස්බැඳ ඇවිදිනාවූ කාක සමූහයාද, මූදුබඩ කෙවුළන් හැරපියා ගිය සැඩගමක්සේද, අමු සොහොනක්සේද, ඉතා නිශ්‍රීකවූ රාජභවනය බලාපියා ඇවිත් කියන්නේ:-"මහරජ, යම්සේ මහෞෂධපණ්ඩිතයෝ කිව්ද, උන් කිවාසින් එක බසකුත් බොරුදෙයක් නැත,ඒ සැබෑමය,පෙර නුඹවහන්සේගේ මාලිගාව දිවපුරයක් වැන්නැයි සිතමි, එසේවූ රජගෙය දැන් මූදුතෙර කෙවුළන් ඇරපියා ගිය ගමෙක මස්ගඳට හැසිරෙන්නාවූ කාක සමූහයක් සෙයින් ඒ මාලිගාව කපුටු සමූහයන්ගෙන් අතුරු සිදුරු නැතිව තුබුයේය, ඒ රජගෙයි නුඹවහන්සේගේ අඹිදරුවන් මැනියන් මා දුටුවේත් නැත, ආගිය තෙනක් ඇසුදුත් නැතැයි පණ්ඩිතයන් කියේ සැබෑමය"යි කිහ. රජ්ජුරුවෝ නැයන් සතරදෙනාගේ වියෝ දුකින් කම්පිතව වෙව්ලන්නාහු මේ දුකඛය හොවියා පුතු නිසාම මට වූයේය'යි දණෙඩන් පහරණලද ආශීවිෂයෙකු පරිද්දෙන් බෝධිසත්ව යන් කෙරේ පළමු තරමටත් වඩා ක්‍රෝධ ඉපදවූහ.

බෝධිසත්වයන්වහන්සේ රජුගේ ආකාරයෙන්ම දැනලා සිතනසේක් "මේ රජ්ජුරුවෝ මහා යශස් හා ඍද්ධි හා පරිවාර ඇත්තාහ, යම්සේ ක්‍රෝධ වශයෙන් තමාට මතු මා නිසා වන්නාවූ අනිවාඛි නොසලකා රාජමානයෙන් 'මොහුගෙන් මට ප්‍රයෝජන කිම්ද'යි නොසොයා මට කිංසාවක් කෙළේවිනමුත් නපුර, නුවණනම් මෙසේවූ තැනට වේද, උපායකින් මේ රජු මා කරා නමාගණිමි සිතා නන්දෘදේවීන් පෙර මේ රජු නුදුවුවිරූ කෙණෙකුන්මෙන් ඒ බිසවුන්ගේ රූපශ්‍රී වර්ණනා කෙළෙම්නම් බිසවුන් සඳහන්කරන්නහුට 'මේ මහෞෂධ පණ්ඩිතයන් මරුපිම්නම් එබඳු මාගේ ස්ත්‍රීරත්නය ඕනාලබමි, උන් මැරීම්නම් ඒකා නතයෙන් නැයන් සතරදෙනා නොලබමි, සිතා තමන්ගේ බිසවුන් කෙරේ කළ සෙනහයෙන් මට කිසි අපරාධයක් නොකරන්නාහයි සිතා, තමන්වහන්සේගේ ආත්මරක්ෂාව පිණිස මාලිගාවේ මතුමහලේම සිටි සේක්, සන්ධ්‍යාවලාපවලයක් හස්සෙන් හැසුවිදුලියක් පරිද්දෙන් පෙරව සිටියාවූ රත්පලස යටින් රන්වන්වූ ශ්‍රීසනය මැන්කොටගෙණ නන්දෘදේවීන් ගිය මග මේයයි කියන්නාසේ උන්ගේ රූප වර්ණනා කරණසේක් මෙසේ වදාරණසේක:—

ඉතෝ ගතා මහාරාජ, නාරී සබ්බඞ්ග සොභනා,
කොසුම්භ ඵලක සුස්සොණී, හංස ගග්ගර භාණිනී.
මහාරාජ ඉතෝ නීතා, නාරී සබ්බඞ්ග සොභනා,
කොසෙය්‍ය වසනා භාමා, ජාත රූප සුමේඛලා.

මෙසින් මදුරා ''රජ්ජුරුවන්වහන්ස සිව්සැටක් පමණ සත්‍ර ලක්ෂණයෙන් විරාජමානවූ නන්දාදේවී මෙසේ යියාක. කෙසේ යියාදයත්? මා ළඟින් උමඟකින් පිටත්කරවා, වේදේහරජ්ජුරුවන් හා කැටිව මියුලු නුවරට යවාපියනලදැ;තවද මහරජ නුඹවහන්සේ ඒ බිසවුන් 'කෙසේවූ රූ ඇති කෙණෙකුදැ'යි සිතසසේක්ද, උන්ගේ උපමා රහිතවූ රූප ශ්‍රීවිලාසය මා අතින් අසාගතමැනව, ගණිරන් පෝරුවක් බඳුවූ ඉතා මට සිලුටුවූ ශ්‍රොණීප්‍රදෙශ ඇත්තාහ, බාල හංස පෝතකයන්ගේ ශබ්දය හා සමානවූ මිහිරිවූ ලදබොලඳ ප්‍රියතෙපුල් දන්නාහ, කසිදේශයෙහි රන්කම්කළ තිහිරිපිළි ඇන්දාහ, සවභාවයෙන්ම රන්වන් ශරීර ඇත්තාහ, ජාතරූපයෙන් කරණලද මිණිමෙවුල්දම් පැලැන්දාහ. මෙසේ සම්‍යාඩ්ඛ සුන්දරවූ මේ නන්දාදේවී මා ළඟින් මෙසේ යවාපියන ලදැ''යි වදාළසේක.

තවද අලතා පිරියම්කළාක් වැනිවූ රත්වූ පතුල් ඇත්තාහ, ලද මුව පොල්ලන්ගේ ඇස් හා සමානව, කණට රහස් කියන්ට යියාක් වැනිව දික්ව, කෘෂ්ණමණ්ඩලය පරෙවියන්ගේ ඇස්මෙන් ඉතා වටව, නිලුපුල් පෙති පරයන්නාවූ පස්පැ දිස්නා නෙත් සඟලක් ඇත්තාහ, මනාව විලිකුන් බිඹුවැලසේ රත්වූ අඩර පල්ලව ඇත්තාහ තවද දූඹුල් පල්ලෙක්හි හා වැද්දූ සක්කැබලි පෙළක්සේ සොභමානවූ දන්තපන්ති ඇත්තාහ, තවද මනාව හටගත් කළුවැල් ලතාවක්මෙන් ඉතා චාරුවූ නාත්‍ර ඇත්තාහ, ඔඹින්වූ මධ්‍ය ප්‍රදෙශ ඇත්තාහ, තවද ඉතා නිල්වූ දික්වූ සිහිදුවූ අක්බිඹුරුවූ කේශකලාප ඇත්තාහ, තවද අභිනව මෘගාඛනාවක්සේ ඉතා යහපත් බැලුම් ඇත්තාහ, තවද හෙමන්තකාලයෙහි ගිනි කඳක්සේ ඉතා පැහැපත්ව බබලන්නාහ, හෙවත් හෙමන්ත කාලයෙහි ගිනිකඳක්මෙන් බැලුබැලුවන් ඇසට ප්‍රිය ඵලවන්නාහ;ඇයි ගිනිකඳක් දැකන් ප්‍රිය වෙද්දයත්? ඒ මෙසේයයි දතයුතු:—ඒම සමයෙහි ගින්නක් දුටුකල්හි එහි අත තවාපියන්නට නොසිතන කෙණෙක් නැත්තාහ; එසේ පැහැපත්වූ වහනිරාශියක්මෙන් සියලු රූපශ්‍රීන් බබලන්නාවූ ඒ නන්දාදේවීන් යම් පුරුෂයෙක් දුටුයේනම් උන් ප්‍රාර්ථනානෙකරණ එකද පුරුෂයෙක්ම නැත; තවද පවිත්‍ර ප්‍රාණතයෙන් හුනු ගඩොලාවක් දෙහිත්තියෙන් දියට හී එකපිට ගමන්කෙණ සිටි සිඟින් නළකොළ සමූහයෙන් හොබනිද, එපරිද්දෙන්ම ඒ බිසවුන් ඇඟ තුනුවූ නොදික්වූ නිල්වූ එකහී සිරියාවූ රෝම රාජියෙන් හෙබියාහ.

තවද ඒ නන්දාදේවී ඡවිකලාණය මාංසකලාණය වයඃකලාණය දන්තකලාණය අට්ඨිකලාණය යන ඉතා ආශ්චර්‍යවූ පඤ්චකලාණයෙන් යුක්තයාහ. තවද ඉතා යහපත් සඛාදිම ඵලයෙක්හි තබාලූ රන්තිඹිරිඵල දෙකක්සේ ඉතා සන්තෝෂකරවූ දරුවන් කෙතෙක්ලදත් ආයුෂ කෙතෙක් ගියත් සොළොස් ඇවිරිද්දෙහි පියයුරු මෙන් ඉතා දැඩිවූ පයොධර සඟල ඇත්තාහ; ඒ බිසවුන්ගේ තන දැඩි නියාව කියන්ට කාරණ කිම්දයත්? යම් ස්ත්‍රියක් දිවාඛ්‍යනාවක්සේ යහපත්වූ රූ ඇති

නමුත් එසේවූ සත්‍රිය නඛාග්‍රයෙහි පවත් කේශාග්‍රය දක්වාත් ඇගේ සර්වාඩ්ගයෙහි ඒ ඒ ස්ථානයෙහි සැරහුවමනා විචිත්‍රවූ නොයෙක් පළඳ නාවෙන් අනූනව සැරහී සිටියා නමුත් ඇගේ සතන මෙලෙක් විනම් පුරුෂයන් ඇ කෙරෙහි කරන්නාවූ සසාසුඛත් මෙලෙක් වන්නේය, එබැවින්''බිසවුන්ගේ රූවත් සිත්කළුය,පයොධරවයත් ඔවුන් දුටු පුරුෂ යන්ගේ සෙනහස පරිද්දෙන් ඉතා දැඩිය,එසේවූ සිව්මැලි බිඳව් මෙසේ මියුලුනුවර බලා ගියහ''යි ශ්‍රීකඨතය ඔසවා පෑ වදුලසේක.

මෙසේ ඒ මහතානන්වහන්සේ නන්දාදේවීන්ගේ රූපවර්ණනා කරන් කරන් රජ්ජුරුවෝ නන්දාදේවීන් පෙර තමන් නුදුටුවිරූ කෙ ණෙකුන් පරිද්දෙන් බලවත් සෙනහ ඉපදවූහ. රජතුගේ සෙනහය ආකාරයෙන් දැන වදාරා ''මහරජ මෙබඳු රූපත් බිසවුන් මියයාමෙහි සතුටුසේක්ද, උන් මළකල නුඹවහන්සේට කිසි අප්‍රයෝජනයෙක්ම නැද්ද? තවත් උන් මළහොත් මට සන්තෝෂකරය, කාරණ කිම්ද යත්? නුඹවහන්සේ මා මොබදී මරාපුනම් මාගේ රජ්ජුරුවෝ ඔබින් නන්දාදේවීන් මරාපියති, එකල නන්දාදේවීන් මම්ත් දෙන්නාම යම රජු වෙනට යම්හ,ඉතා ධර්මිෂ්ඨවූ යමරජ අප දෙන්නා බලාපියා කියන, කල'පුරුෂයන්ගෙන් මහෞෂධ පණ්ඩිතයන් වැනි කෙණෙකුත් නැත ස්ත්‍රීන්ගෙන් නන්දාදේවීන් වැනි කෙණෙකුත් නැතැ'යි කියා 'නන්දා දේවී මහෞෂධ පණ්ඩිතයන්ට තරම්හ'යි නන්දාදේවීන් මට පාවාදිපි යති, එබැවින් මා මියත් එබඳු ස්ත්‍රීරත්නයක් ලබනකල සෙසු කුමක් නම් මට සිඛනොවේද, එබැවින් මා මියත් මෙහි කිසි හානියක් නැතැ''යි වදාළසේක. බෝධිසත්වයන්වහන්සේ මෙපරිද්දෙන් නන්දා දේවීන්ම වර්ණනාකළසේක. සෙස්සවුන්ගේ නම කුත් නොකිසේක. කුමක්නිසාදයත්? පුරුෂයෝනම් තමන් ප්‍රිය භාර්‍යාවන් කෙරෙහි මෙන් සෙස්සවුන් කෙරෙහි සෙනහ නැත්තාහ. ඒ නන්දාදේවීන් සඳ හන්කරන්නෝ දරුදෙන්නාත් සඳහන්කරන්මය''යි සිතා, නන්දා දේවීන්ම වර්ණනා කළසේක;තලතාදේවි මැලිඛෙයින් උන්ගේ නම කුත් නොවදාළසේක. ප්‍රඥාසම්පන්න ඒ මාගේ සොම්දරුවානන් නුව ණින් යෙදී මධුරස්වරයෙන් වර්ණනා කරන් කරන් නන්දාදේවී අවුත් තමා ඉදිරියේ පෙනීයියාසේ වැටහිනි.

එවිට රජ්ජුරුවෝ සිතන්නාහු 'මේ මහෞෂධ පණ්ඩිතයන් හැර අනික් කෙණෙක් නන්දාදේවීන් ගෙණවුත් මට දෙන්ට සමර්ථ නැතැ'යි බිසවුන් සිතන්නාවූ රජහට බලවත් සෝක උපන්නේය. ඒබව තමන් වහන්සේ දැන ''මහරජ නොසිතා වදාළ මැනව; නන්දාදේවීත් පුතනු වෝත් මැනියන්වහන්සේත් තුන්දෙනම එන්නාහ, උන් මිට එන්නට බාධානම් මා නොයන පමණෙක්මය, මා යියවිටම එති වදාළසේක. මෙසේද කියා නැවත වදාරණසේක්''මහරජ මා ඉන්දදී මෙපමණකට සෝක නොකළ මැනව, අස්වැසුන මැනවැ''යි රජහු අස්වසා වදාළසේක. එවිට රජ්ජුරුවෝ සිතන්නාහු ''ඉතා ආශ්චර්‍ය්‍ය හියාය,

මාගේ නුවර සුරක්ෂිතකොට රැකවල් ලවා මහත්වූ බලඇණි පිරිවරා අවුත් මේ නුවර මෙසේ රැකවල් ලාගෙණ සිටියදී මේ පණ්ඩිතයා නුවරින් නන්දැදේවින් ඇතුළුවූ මාගේ නැයන් සතරදෙනා කිසිකෙණකුන් නොදන්නා පරිද්දෙන් ගෙන්වාගෙණ වේදේහරජුට පාවාදී අප කැම තමා කුන් මේ නුවර තුන්යම් රාත්‍රියෙහි නිදිමරා රැකවල් ගෙණ සිටියදී අපගෙන් කාන් නොදන්නා පරිද්දෙන් වේදේහරජු හා සේනාව නුවරින් පිටත්කොට යවාපිය; දිව්‍යමායමක් දනිද, නොහොත් ඉන්ද්‍රජාලයක් දනිද්දෝ කෝ විචාරමි'' සිතා කියන්නාහු මේ ගාථාවෙන් කීහ:—

දිබ්බං අධියසෙ මායං, අකාසි චක්ඛු මොහනං,
යො මෙ අමිත්තානං හත්ථගතං, වෙදෙහං පරිමොචයී.

''මේ කිමෙක්ද පණ්ඩිතයෙනි, මේසා රාජසේනාවක් වටලා සිටියදී එසේ රැකවල උන් මාගේ නැයන් සතරදෙනා ගෙන්වා මාගේ සතුරු වේදේහරජුත් එක්කොට නුවරින් පිටත්කොට යවාපු තෙපි දිව්‍යමායමක් දනිද, නොහොත් ඇයට ඉන්ද්‍රජාලයක් දනුවදෝහෝ''යි විචාළහ. ඒ අසා මහතානෝ වදුරණසේක් ''මහරජ මම දිව්‍යමායමුත් දන්මි, ඉන්ද්‍රජාලයත් නොදන්නෙමි නොවෙමි, නුවණැත්තාහු දිව්‍යමායමී ඉඤ්ඤණ යම්සේ තමහට භයක් පැමිණිකල ඒ භයින් තුමූත් හැලව් ආශ්‍රයකළවුනුත් ගලවන්නෝ වේදැ''යි වදුරා මේ ගාථාවෙන් කීහ:—

අධියනෙන මහාරාජ, දිබ්බමායිධ පණ්ඩිතා,
තෙ මොචයන්ති අත්තානං, නිසසිතෙ මන්තිනො ජනෙ.
සන්ති මාණවපුත්තා මෙ, කුසලා යන්ති ජෙදකා,
තෙසං කඤ්ඤන මඤ්ඤන්ති, වෙදෙහො මිථිලං ගතො.

මහරජ මා විසින් කළ මායමකුත් නැත, ඇයට ලූ ඉන්ද්‍රජාලයකුත් නැත, එසේකල කෙසේ නියෝදයක්ද? උමං බිද්දෙහි දැනුවූ මාගේ තරුණ යෝධයන් විසින් විසිතුරුකොට සරඟ තලද උඟඟක්වේදේහ රජ්ජුරුවෝ නුඹවහන්සේගේ නැයන් ඇරගෙණ මුදුපුතුවාට පලා ගියහ''යි වදුලසේක.

ඒ අසා රජ්ජුරුවෝ සිතන්නාහු ''එකෙකු දෙන්නෙකු පවා උමඟින් යනකල මහා ව්‍යසනයෙන් දුකෙහි පිටත්වන්නේය, මේ පණ්ඩිතයෝ සේනා සහිතව රජ්ජුරුවන් උමඟන් පැලවස් කියත්, ඒ උමඟ කෙබඳු ද්දෝහෝ''යි උමඟ දක්නා කැමතිවූහ. බෝධිසත්ත්වයන්වහන්සේ රජ්ජුරුවන්ගේ ආකාරයෙන්ම ''උමඟ දක්නාකැමති කැවිය, උන්ගේ මන පිරුළු පුරා උමඟ දක්වාපියමි'' සතා රජුට වදුරණසේක:—

ඉධෙව පස්ස මහාරාජ, උම්මඟ්ගං සාධු මාපිතං,
කත්ථනවුති අස්සානං, රථානඤ්ච පත්තියානං;
ආලොකභූතං තිට්ඨන්තං, උම්මඟ්ගං සාධු නිට්ඨිතං.

මෙසේ වදාරා "මහරජ මා විසින් කරණලද උමඟ, චිත්‍රකාරයන් විසින් සරහා සිටුවනලද ඇතුන් අසුන්ද, එසේම රථාලඞ්කාරයෙන් සරහා සිටුවනලද රථවාහනද, යුද්ධයට සැරසී සිටියාක්මෙන් සජීවයක් මුත් අජීවයහි වහා නොදතඤ්ඤාකාවූ නොයෙක් ආයුධයන් අන්ඇතිව සිටි මහත්වූ පාබල සේනාවද යන සියලු අලඞ්කාරයෙන් දිව්‍යසභාවක් මෙන් දසදහසක් සක්වළ එකද තෙනකත් මෙබඳු ආශ්චර්‍යයක් නැත, එබඳු උමඟ බලා වදාළමැනවැ" සි කියා නැවත වදාරණසේක්:—

"මහරජ මාගේ ප්‍රඥා නැමැති චන්ද්‍රයා හා උපාය නැමැති සූර්‍යයා එක්ව නැංඟාවූ ස්ථානයෙහි සරහනලද උමඟ අසූවක් පමණ මහදෙර ඇත්තේය, සිව්සැටක් පමණ සුළුදෙර ඇත්තේය, එක්සියයක් ශ්‍රියහන් හබඩා ඇත්තේය, නොයෙක් සියගණන් පහන්හබඩා ඇත්තේය, මේ සියල්ලම දක්නා පිණිස වඤ්චා සිතක් නැතිව සතුටු සිතින් අවෙරිව අව මැනව, එක්සියයක් රජදරුවන් හා අමාත්‍යමණ්ඩලයා පිරිවරා මේ උපකාරිනුවරට වැඩිය මැනව,

ඉදින් එසේනොව ගිය රජහු ගියත් 'අහිංසක් ලද්දේ පණ්ඩිතය'සි කිවාසේ මා කෙරේ මායමින් කිත සිත් හඟවා නොසතුරුලෙසින් නුඹ රට වැද, දෙන්නාට කරණ දෙය මූටම කෙරෙම්' සිතා මා අල්ලා ගන්ට මායම් සිතකින් ආසේක්වීනම් මේ එක දසදහසක් යොදුන් දඹදිව එක්සියයක්රජුන් හා අටලොස් අක්ෂෝභිණීඝඩබ්‍යාත චතුරඞ්ගිණී මෙපමණ සේනාවක් තබා සාඞ්ගමපන්න චක්‍රවර්ත්තිරජෙක් තමාගේ ආනුභාවයෙන් සතරමහා විජයෙහි සේනාව ඒ ඒ රජදරුවන් සහිත ව ගෙණයේ විනුමුත් මාගේ එකදු උපන් ඖධයන්හෙන් එක් යෝධයෙක්ම ඒ සේනාව මා ලුහුබඳවා ජයගෙණ මා රැකගන්ට පොහොසත්වන්නේය, එබැවින් මහරජ මා කෙරේ වරණ වෛරයක් සිත ඇත්නම් එසේවූ දුර්ජනයක් නොසිතා වහා වැඩිය මැනවැ" සි උපකාරිනුවර වාසල් කරවා වදාළසේක.

චූලනිරජ්ජුරුවෝ එක්සියයක් රජුන් හා අමාත්‍යමණ්ඩලයා පිරිවරා නුවරට වන්හ. අභිවතාපීඨාධික චින්තාමණිකාර්‍යයක් බඳුවූ ජනනේත්‍ර රසායනවූ මාගේ ස්වාමිදරුවූ තිලෝගුරුබෝධිසත්වයන්වහන්සේ ඇත්සේනාවක් ලඟට නොබා ත්‍රික්මුඛ කේශරසිංහරාජයෙකුසේ මාලිකාවෙන් බැස රජ්ජුරුවන් වැඳ බ්‍රහ්මදත්තරජ්ජුරුවන් ඇතුළුවූ එක්සියයක් රජදරුවන් හා මහසේනාව පිරිවරා උමඟට වන්සේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ රාජමඞ්ගල්‍යයට සරහනලද මාඟැඹිවූ නුවරක් බඳුවූ ඉතා ආශ්චර්‍යමත්වූ උමඟ දැක බෝධිසත්වයන්ගේ ගුණ කියන්නාහු "ඒබා රජදරුවෙනි, යම් රජක්හුගෙ ජනපදයෙහිද එක රටද එක නුවරද එක රජගෙයිද මේ මහාභාග පණ්ඩිතයන් වැනි කෙණෙක් වෙසෙත්නම් ඒ රටටත් ඒ ජනපදයටත් ඒ රටුටත් ලාභයෙක්මුත් අලාභයක් නැත්තේය; එසේකෙසින් පණ්ඩිතයන් හා සමඟ

වසන්නාවූ වේදේහ රජතට එසේම මහා ලාභයකැයි" බෝධිසත්වයන්ට සතුතිකරන්නෝ වේදේහරජුකෙරේ විශ්වාසයෙන් "ඉදින් මහොෂධ පණ්ඩිතයෝ මා සමීපයෙහිවත් මාගේ නුවරවත් මාගේ ජනපදයෙහිවත් මාගේ ආඥාපවත්නා රට දනිවැඩිහිවත් වසෙත්නම් මවත් වන්නේ මහවැඩක්මය මහා අභිවෘධියෙක්මය"යි මහාපහාරයෙන් කියති දනයුතු.

ඉක්බිති බෝධිසත්වයන්වහන්සේ එක්සියයන් ශ්‍රියහන්ගබඩා දැක්වූ සේක, ඉන් එක් ගබඩාවෙහ දෙර හළ මුළුල ගබඩාවලම දෙර හැරෙන්නේය; එකක් පිහි කල මුළුල දෙර පියන්නේය මෙසේ ආශ්වයෘමන්වූ උමඟ විසතරබලඟින් රජ්ජුරුවෝ පළමු යන්නාහ, පණ්ඩිතයන්වහන්සේ පසුව යෙති, එක්සියයක් රජදරුවන් හා රජ්ජුරුවන්ගේ අඟම්පඩි සේනාව උමඟට වන්නාහ; මහලුමඟ දෙකඩවක් පමණ ගෙවාගෙණ ගොස් රජ්ජුරුවෝ උමංතෙර එළිපතින් පිටවූහ. බෝධිසත්වයන්වහන්සේ රජතු පිටවූබව දැන, තමන්වහන්සේ පිටත් වනසේක් අනිතක්‍ෂු පිටත්විය නොදී උමඟ දෙර පියන්නෝ නොහඬා ඇණයක් මැඩලූසේක. ඒ ඇසිල්ලෙහි අසූ මහ දෙරය, සිව් සැටක් සුළු දෙරය, එක්සියයක් ශ්‍රියහන්ගබඩාවල දෙරය, සියදහස් ගණන් පහන්ගබඩාවල දෙරය, යන සියලු දෙරවල්ම ඒ ක්‍ෂණයෙහි පිහි අගුලූහි ගියේය. ඒ ඝියලුම උමඟ ලෝකාන්තරික නරකයමෙන් අන්ධකාරව ගියේය. මහ ජනයා හඝින් හැතිගෙණ ගියේය. උමඟ හසුවූවෝ ඔවුනොවුන්ගේ ශබ්දයමුත් 'මූ මූය'යි නොදන්නාහ. බෝධිසත්වයන්වහන්සේ ඊයේ ඔබ්‍යම රාත්‍රියෙහි සරණපාවාදි වේදේහරජ්ජුරුවන් යවා නැවත උමඟට වදිමින් තමන්වහන්සේගේ මගුල්කඩුව වැල්ලේ සඟවා තුබූසේක් ඒ කඩුව තුබූතෙනින් වහාම අතට ගෙණ අවලොස්රියනක් පමණ තැන් ආකාශයට පැනනැඟි බිමට බැස වම තින් රජතු අත අල්වාගෙණ කඩුව බොටුවට පැ අමෝරා හයගන්වා, 'මහරජ මේ සියලු දඹදිව රාජ්‍යය කාගේදැ'යි විචාළසේක.

රජ්ජුරුවෝ හඝින් හැතිගෙණ 'පණ්ඩිතයෙනි තොපටය තොපට ය'යි තුන්විටක් කියා 'මා නොමරා මට අභයදෙව'යි කීහ. එබසට බෝධිසත්වයන්වහන්සේ වදාරණසේක් "මහරජ නොබව මැනව, නුඹ වහන්සේ මරණ පිණිස කඩුව එසවුයෙම් නොවෙමි, මාගේ ප්‍රඥාවේ ආනුභාව දක්වන පිණිස කඩුව එසවීම්"කියා රජ්ජුරුවන් අතට කඩුව දී වදාරණසේක් "මහරජ ඉදින් මා මරණ්‍ඨ කැමතිසේක්වීනම් මේ කඩුවෙන් දැන්ම මා මැරුව මැනව, නොමරණසේක් වීනම් අභය දුන මැනවැ"යි වදාළසේක. ඒ අසා රජ්ජුරුවෝ "මා විසින් තොපට අභය දෙනලද්දේමය, තෙපි මා කෙරෙහි සැක නොකරව"යි මතන් ඔවුනොවුන්ව නොවරදනා ලෙස කඩුව ගෙණ සපථකළහ. ඉක්බිති රජ්ජුරුවෝ කියන්නාහු "පණ්ඩිතයෙනි තොපගේ මෙබඳු ප්‍රඥාබල හා

කාසබල ඇතිව කුමක් පිණිස රජ්ජය නොගණ්හිදැ''යි කීහ. මහරජ ඉදින් කැමැත්තෙම්නම් සියලු රජදරුවන් මරා රජ්ජය ගණ්හිමි. අනුන් මරා යසස් ගැන්ම නුවණැත්තන් විසින් නින්දාසහගතය''යි වදාළ සේක. රජ්ජුරුවෝ එබසට සතුටුව කියන්නාහු 'පණ්ඩිතයෙනි උම ඔබ හසුවූ මහජනයා උමංඇර නොහරණෙන් වලපන්නාහ, දැරහැර ඒ සත්වයන්ට ජීවිතදානය දෙව'යි කීහ.

පියකළ ජනානන්දකරවූ නිලෝගුරුවූ අනාථනාථවූ කරුණා නිධානවූ මාගේ සැමියාදරුවානෙනි එවේලෙහි උමඟ දැර හළසේක. සියලු උමඟ හිරු නැංගාසේ ඒකාලෝකවිය,මහාජනයා අස්වැස්ලදින් සැපසේ සිටියහ. එක්සියයක් රජදරුවෝ තමතමන්ගේ අගමැතිඩි සේනාව හා සමඟ උමඟින් පිටත්ව බෝධිසත්වයන්වහන්සේ සිටි තැනට ගියහ. ඉක්බිති රජදරුවෝ කියන්නාහු ''තොප නිසාය පණ්ඩිතයෙනි අප ජීවිත ලද්දේ, මද ඇසිල්ලක් දැර නොහළුවෝනම් අපි හැම උමඟ මළමිනි''යි කීහ. සැමියාදරුවානෙනි වදාරණසේක් ''ඇයි රජදරුවෙනි දැන් මතු නොවෙයි තොපහැම මා නිසා රැකුණේ, පළමුත් රැක්කෙම්වේදැ''යි වදාළසේක. පළමු තමන් ඔබ නිසා රැකුණු නියාව නොදන්නා රජදරුවෝ 'ඒ කවර කලකද පණ්ඩිතයෙනි' කීහ. සැමියාදරුවානෙනි උන්හැම ගිවිස්වා සලකුණු වදාරණසේක් ''රජදරුවෙනි අපගේ මියලුනුවර තබා සියලු දඹදිව රාජ්‍යය ගෙණ මේ උතුරු පඤ්චාලනුවරට අවුත් මගුල්උයනදී 'ජයපානය බොම්බ'යි රා මස් ආදි සියල්ලක් සැරහූ දවස් සිහිකරව්දැ''යි වදාළසේක. එසේය පණ්ඩිතයෙනි සිහිඇත'යි කීහ. ''එසේවිනම් මේ රජ්ජුරුවන්හා කේවට්ටයා කළ නපුරු මනුෂ්‍යණයකින් කේවට්ටයාගේ බස් ගෙණ විෂ මිශ්‍ර රා හා මච්ඡමාංස කවා තොප හැම මරණ පිණිස කළාවූ මනුෂ්‍යණය මම දැන 'මා ජීවත්ව ඉන්දදී මා බලබලා මේ රජදරුවෝ අනාථ මරණින් නොමියෙත්ව'යි සිතා මාගේ සහජාත යෝධයන් එවා රා සැලවල් බිඳුවා මොවුන් දෙදෙනාගේ මනුෂ්‍යණය බිඳ තොප හැමදෙනාටම ජීවිතදානය දුන්නෙම්වේදැ''යි වදාළසේක.

ඒ රජදරුවෝ කලකිරුණු සිත් ඇතිව 'සැබෑද මහරජ එසේ කෙළේද'යි කීහ. 'කේවට්ටයන්ගේ බස් ගෙණ එසේ කෙළේ සැබෑය. පණ්ඩිතයන් කි බස් සැබව'යි කීහ. ඒ රජදරුවෝ සැමදෙනම බෝධිසත්වයන් සිපගෙණ ''පණ්ඩිතයෙනි අප හැමදෙනාට පිහිටව සිටියාහු තෙපිමය,තොප නිසාය අප දිවිලද්දේය'යි තමන් තමන් පළන් වොටුනු සහිතවූ සිව්සැට ආභරණයෙන් බෝධිසත්වයන්ට පූජාකළහ. ඒ පූජා විඳගෙණ සිට චූලනී රජ්ජුරුවන්ට උපන් කණස්සල්ල හරණසේක් ''මහරජ නොසිතුව මැනව නුඹවහන්සේගේ වරදෙක් නොවෙයි, තෙල දුෂ්ටවූ කේවට්ටයාගේ පාපමිත්‍ර සංසර්ගයෙන්වූ දෝෂය. 'මතු මෙවැන්නක් නොකෙරෙම්' මේ රජදරුවන් ඇම ක්ෂමාකරව''යි

විදළසේක්. රජ්ජුරුවෝ කියන්නාහ 'රජදරුවෙනි මාගේ නුවණින් නොප හැමදෙනා කෙරෙහි ජනමානාන්තර වෛරයකින් මා කළ දෙයක් නොවෙයි. තෙල ඉතා දුර්ජනවූ ගුණමකු ලාමකවූ කෙලෙහි ගුණ නොදන්නාවූ අලජ්ජිවූ අනාර්‍ය්‍ය සුරූප ඇති අවලක්ෂණවූ කේවට්ටමේ ජඩයා නිසා මා නොදත කළ අපරාධය ක්ෂමාකරව, නැවත මා පණ තබා මෙවැන්නක් කරන්නේ නැතැ''යි ක්ෂමාකරවිය. මෙසේ රජදරුවන් ඔවුනොවුන්ගේ වරද දෙසා කැම එක්සිත් වීමෙන් සමාගම්වූහ.

ඉක්බිති බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ බොහෝ කතබොනදූ හා මල්ගද විලවුන් ගෙන්වා සියලු රජදරුවන් හා උත්තරපඤ්චාලය වේදේහය යන දෙරට සේනාවඑක්ව සත්දවසක් උමඟ ඇතලෙහිම සෙළ ඉන් නෑගි උපකාරීතුවරට වැද බෝධිසත්වයන්වහන්සේට බොහෝ සත්කාර සම්මානකොට එක්සියයක් රජදරුවන් පිරිවරා මාලිගාවේ මතමහල් තෙලෙහි හුන්නාහු බෝධිසත්වයන් තමන්සමීපයෙහි රඳවනුකැමතිවූහ.

මහෞෂධ පණ්ඩිතයෙනි, දවස්පතා ජීවිත වෘත්තියට දෙනලද ඵල දම් ආදියද ගම්බිම් ගවමහිෂ ඇත්අස් ආදීන් හා වාහනසමූහද. මුතු මැණික් පබළු වෛදූර්‍ය්‍ය මසාරගල්ල ලෝහිතඞ්ක රජත සුවර්ණාදි දශවිධ රත්නසමූහයද, දෙමි. ඒ ඒ දේශයෙහි අනෙකප්‍රකාර වස්තු සමූහයෙන්ද, දැසිදස ආදිවූ නොයෙක් කම්මකාරයන්ගෙන්ද, මාගේ රාජාභිෂේඛයට දෙවනු කොට සිටුවාලමි. වේදේහ රජ්ජුරුවන් තබා දුන් වෘත්තියට කැම දෙසින්ම කිසිවකුත් නොවරදවා ඒගුණකොට දෙවා ලමි. එක දේශයට නායක වේදේහරජ්ජුරුවන් තොප රැකලියහෙන කල, දසදහසක් යොදුන් දඹදිවට නායකවූ මම රක්නට අපොහොසත් වෙම්ද? තවද තෙපි මියුලුනුවර එක වේදේහ රජ්ජුරුවන්ට හා වේදේහ රටට සෙනෙවිරත්කම් කරණ පමණක්වේද, මා සමීපයෙහි රැඳුනාවූද්‍ය වීනම්, දසදහසක් යොදුන් දඹදිවටත් එක්සියයක් රාජධානියෙහි රජ දරුවන්වත් මටත් තොප තනිව සෙනෙවිරත්ධුරය කරණ කෙසින් රජ්ජු එක්සියයක් දෙනය, එක සෙනෙවිරදදුයෑ රජදරුවන් මුළුල්ලට වඩා තොපගේ ආඥාවත් තේජසත් ප්‍රඥාවත් කීර්තියත් සිටින්නේය; ඉදින් ඉඟි තෙපි රඳා උනුනම් එක්සියයක් රාජධානිවල අමාත්‍ය මණ්ඩලයා සහිතවූ මනුෂ්‍යයෝ තොප මුත් අප ඇතැ''යි කියා නොදන්නාහ. තවද අවශෙෂවූ මනුෂ්‍යයන් හා එක්සියයක් රජදරුවන් තබා මමත් තොප කිවාමුත් සිහින් සිතා කිසිවකුත් නොකරමි, රඳව''යි කිහ.

රජුගේ සම්පත බෝධිසත්වයන්වහන්සේ ප්‍රතික්ෂේප කරණසේක් මෙසේ වදාරණසේක:—''මහරජ, යම් පුරුෂයෙක් බොහෝ දවසක් බොහෝ සම්පත්දී හතීනඃඛොමීව රඤ්ඤා කළක්හු 'දුන් සම්පතට වඩා සැපත් දෙමි' අතිනෙක් කිතයි ඒච්‍ඡන් කාලයක් රැක්කහු හැර අමුතු සම්පත්හි ලෝභයෙන් හියේවිනම් ඕහට තමා විසිනුත් නින්දාමය

අනුන් විසිනත් නින්දුමය''යි වදාළසේක. හේ කෙසේදයත්? තමා බාල අවස්ථාවෙහි පවත් කාරණ කාරණ උගන්වා සියලු සම්පත්තීන් සමාඛෙනාට මෙහෙ තනතෙරෙක තබා රකිමින් සිටි රජතු හැර ''සැපත් වඩා දෙමිහ'යි කී පමණින් මෙතෙක් දවස් කළ උපකාර ජලරේඛාවක් පරිද්දෙන් කෙළේනම් නැවත අන් රජතවත් මෙතෙක් වේද අනුන්ගෙනුත් නින්දු ලබම්. අනුන්ගෙන් ලබන නින්දා මේය.

තමා විසින් ලබන නින්දා නම් ''රජ්ජුරුවෝ තමහට සෙසු නැසිය කමක් නැතිව සත් අවුරුද්දෙහි පවත් තමා සමීපයෙහි රඳවා මා නිසා මාගේ දෙමව්පියන්ට ඒසා උපකාරයකුත් කොට මා මෙහෙ තනතුරෙක තබා මෙසා ඓශ්වර්‍යයෙක්හි පිහිටුවා රකිමින් සිටි රජතු අත් ඇර 'වඩා සැපත් දෙමි' කිවසි මාකළ දැ නපුරැයි නින්දාකරණ හෙයින් දෙතැනින් නින්දායෙන් මට නැලවීමෙක් නැත. එබැවින් මාගේ රජ්ජුරුවෝ යම් තාක් ජීවත්ව ඉඳිද්ද ඒතාක් කල් මුළුල්ලෙහිම 'වේදේහ රජ්ජුරුවන්ගේ මහෞෂධ පණ්ඩිතයෝය'යි කිවාවුන් ලවා 'බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ මහෞෂධ පණ්ඩිතයෝය'යි නොකියවමි. මියැලුනුවර මහෞෂධ පණ්ඩිතයෝය'යි කිවාවුන් ලවා 'උත්තරපඤ්චාල දේශයෙහි මහෞෂධ පණ්ඩිතයෝය'යි නොකියවමි, මේ මාගේ රජ්ජුරුවන් ජීවත්ව ඉන්දදී මා රඳන්නේ නැතැ''යි වදාළසේක.

නැවත රජ්ජුරුවෝ කියන්නාහු ''එසේවි නම් පණ්ඩිතයෙනි, තොපගේ රජ්ජුරුවන් සවිඤ්ඤාණවූකල 'එම්' කියා මට ප්‍රතිඥා දෙව''යි කීහ. මහරජ ජීවිතය නම් මහලුය බාලය'යි නියමයෙක් නැත, එතකොට මම රැකී උනිම් නම් එමි' වදාළසේක. ඉක්බිති රජ්ජුරුවෝ බෝධිසත්ව යන්වහන්සේට ප්‍රමාණනිෂ්ක්‍රාන්ත මහාසත්කාර කරවූහ, සත් දවසක් ඉකුත්කල්හි මහතානෝ ගමනට සමු ඉල්ලුසේක. නැවත රජ්ජුරුවෝ ''පණ්ඩිතයෙනි තොපට මේ මේ දෙය දෙමි, ඒ ගන්ව'යි ප්‍රසාද කියන්නාහු මේ ගාථාවෙන් කියත්:—

දම්මි නිකඛ සහස්සඤ්ච, ගාමාසීතිච්ච නාසිසු;
දාසී සතානි චත්තාරි, දම්මි භරියා සතඤ්ච තෙ;
සබ්බසෙනඞ්ග මාදාය, සොත්ථිං ගච්ඡ මහොසධ.

මේ ගාථාවෙහි අභිප්‍රාය නම්:—''මහෞෂධ පණ්ඩිතයෙනි, තොපට නික් දහසක් දෙමි, හෙවත් රන් පස්විසිදහසක් දෙමි, තවද තොපගේ වේදේහරටට ආසන්නවූ කසිදෙශයෙන් එකිඑකී ගමකින් අවුරුද්දකට ලක්ෂයක් අය නිමන්නාවූ මෙසෙසින් අවුරුද්දකට අසූලක්ෂයක් නිම වන උත්තම තරමේ උතුරු සළඟම් අසූවක් දෙමි, තවද නොමැලිවූ බාලපරායෙහි සිටි කෙල්ලන් සාරසියයක් දෙමි, තවද නොයෙක් බිසෝ පළඳනාවෙන් සරහා නිමවනලද ශරීර ශොභා ඇති සම්පූර්ණ සමපන්නවූ බිසෝවරුන් සියයක් බිරින්දන්කොට පාවා දෙමි, තවද මාගේ ඇත් අස් රථ පාඤ්ඤි සේනාව තොපට නින්දේම ප්‍රසාද

සේනාවක්කොට දෙමි, තොපගේ සේනාවත් මාකෙන් දුන් සේනාවත් ඇරගෙණ සුවසේ තොපගේ රටට යව''සි සමුදුන්හ.

ඉදින් නන්දෘදේවීන් හා නැයන් සතරදෙනා වේදේහ රජ්ජුරුවෝ නේවත් නමුත් පණ්ඩිතයන්වහන්සේ තමන්ගේ යාච්ඤාවට රුදුනුදු වී නම් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් චක්‍රරත්නය හස්තප්‍රාප්තවූ සක්විති රජ්ජු මෙන් සතුටුවත් මුත් ''පිටත මාගේ බිසවුන් හා නැකෙණෙක් ඇත්තේ වේදූ''සි කියන්නා තබා සිතිනුත් නොසිතන්නාහ.

බෝධිසත්වයන්වහන්සේට සමු දුන් රජ්ජුරුවන් අස්වසා වදාරණ සේක්:—''මහරජ තුඹවහන්සේගේ නැයන් 'මාගේ නැකෙණෙක් සාරසියයක් හව්වෙන් පිටත වේදූ'සි නොසිතුව මැනව, මම මාගේ රජ්ජුරුවන් නික්මෙන දවස් මෙසේවූ සම්මතයක් කෙළෙමි. කෙසේදයත්? මහරජ තෙල නන්දෘදේවීන් මව් තනතුරේ තබා දුවමැනව, පඤ්චාල චණ්ඩකුමාරයන් මල්තනතුරේ තබා දුව මැනවැ'සි කියා පඤ්චාල චණ්ඩිකුමාරිකාවන් අභිෂේකයට පමුණුවා සොළොස් දහසක් බිසෝවරුන්ට නායක කොට ඔටුනුපළඳවා රජකට පාවාදී යැවීමි, නුඹ වහන්සේගේ නැයන් මැනියන්වහන්සේත් බිසවුන්වහන්සේත් පුතනුවණ දැන් මා ගිය නොබෝදවසකින් වහා එවාලම්''සි වදාළසේක.

''යකඩපත පණ්ඩිතයෙනි කියා තමන්ගේ දුවනියන්ට දුකමනා දෑයාදයට දෑසිදැස වඤ්ඡාඟරණ අලඞ්කාර මුතු මැණික් ආදී දඟවිඩ රුවන් සමූහද, රත්නාලඞ්කාරයෙන් සරහනලද ඇත් අස් රථ ආදිවූ වාහන සමූහද, යන මේ දෑයාද මුළුල්ල කිසිවෙකුනුත් අඩුනොකොට තමන්ගේ නායක තනතුරට හා 'රජවමුත් වෙසේ දිය ඇකිදූ''සි කට කට කයිවාරුකරණ පරිද්දෙන් යොයෙක් සම්පත් මුළුල්ල 'මාගේ දුවනියන්ට දෙව'සි බෝධිසත්වයන්ට පාවාදී, බෝධිසත්වයන් හා කැටිව යන සේනාවට දියයුතු වියදම් ආදී සියල්ලට විධානකරන්නාහු එකී ස්ත්‍රීකතායන්ට වෙසේ කියත්. කෙසේදයත්:—

''එම්බා සඟයෙනි, වේදේහ රජ්ජුරුවන්ගේ සොළොස්දහසක් ඇත් ඇණිය සොළොස්දහසක් අස්ඇණිය සොළොස්දහසක් රථ ඇණිය ඒ තරමට නොමදවූ සේනාවය යන සියල්ලෝම වේදේහ රජ්ජුරුවන් හා කැටිව පළමු පලාගියහ. පණ්ඩිතයන් කැටිව සිටියාහු බොහෝ දෙනෙක් නොවන්නාහ. උන් තමන්ට අගම්බිඹ සිටින්නාහු, සොළොස් දහසක් ඇත් ඇණිය සොළොස් දහසක් අස් ඇණිය සොළොස් දහසක් රථ ඇණිය ඒ තරමට එඛා සිටියාවූ මහසේනාවය, උන්උන්ට දෙන්නේ වැඩියෙක් නොවෙයි, උන්උන්ට පළමු දෙන තරම් පණ්ඩිතයන්ගේ වියදම් කැමියන් අතින් නියම දැන පළමු උන්හෙන් දෙන්නාට දෙන වියදම් දැන් එකෙකුට බැගින් සියල්ලන්ට දෙන ලෙස්සිය උත්තමයන් කෙරේ පවන් අධමයන් දක්වා ඇතුන් පවන් හයයන් දක්වා පළමු වියදම් කා සිටියවුන්ට කිසිවෙකිනුත් රිකැණේ නොකරවා අනන්‍යාන

විසඳුවාගැනීම ආදිවූ සියල්ලකිනුත් අඩුනොකොට වහා දෙව්, එසේකල සාරසියයක් හඬගෙවා යන්නාහු මහ සුවසේ නිදුකින් කලාතතොවී යන්නාහ''යි විධානකළාහ.

නැවත බොධිසත්වයන්වහන්සේට සමු දෙන්නාහු මෙසේ කියත්:—

හත්ථි අස්සා රථා පත්ති, ඉච්චේවාදාය පණ්ඩිත;
පස්සතු තං මහාරාජ, වෙදේහො මිථිලං ගතං.

මෙසින් කියා''මහෞෂධ පණ්ඩිතයෙනි ඇත් අස් රථ පදාති සේනාව පිරිවරා මහා සන්තෝෂයෙන් 'අසුර විජයකොට ජයලත් ශක්‍ර දේවේන්‍රයා' පරිද්දෙන් වහා නික්මෙව්, තොප සුවසේ මිථිලාපුරවරට යියවුන් දකින්ට පුලුපුලා උන් වේදේහ රජ්ජුරුවන් හා පෙරමග බලබලා ඉඳිනා නුවර වාස්තු තොප යියවුන් දැක සතුටුවෙත්ල''යි කිහ. ඒ සියළු රජදරුවෝද බෝධිසත්වයන්වහන්සේට බොහෝ සත්කාරකොට බොහෝ පඬුරු දුන්හ.

ඒ ඒ රජදරුවන් අතරේ සිටි චරපුරුෂයෝ ඒ සියලු දෙන තමන්ගේ පමිත් හා සමග අවුත් පණ්ඩිතයන්වහන්සේ පිරිවරාගත්හ. ඒ මහ තානන්වහන්සේ ප්‍රමාණාතික්‍රාන්තවූ තොකොන් මෙතෙකැයි පමණ නැත්තාවූ චතුරඞ්ගිණී සේනාවෙන් යම්සේ ගොඩ ගෙන්ගත මහා සමුද්‍රය පරිද්දෙන් නික්මුණුසේක, අතරමග සිට බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් දුන් සඳහම් අසූවෙකි අය කෙණෙල'යි මිනිසුන් යවා තමන්වහන්සේ වේදේහ රටට සම්ප්‍රාප්තවූසේක.

එදවස් 'උමඟින් ගන්නය'යි කී බසින් දණ තලළ වැලම්ම කඩරෙදි බැඳ කෝනමක් හැඳ සැරහුනු ප්‍රඥාසමුද්‍රවූ ඉතා කැටලා සේනකයා මතු වන්නා දැන, අතරමග එක පුරුෂයෙකු සවුලන්නේ මෙසේ කීයා:— ''එමබා කුඩෙන්, චූලනීරජ්ජුරුවන් මැත එන්නක්වත් අනික් කිසි කෙණෙකුන් මැත එන්නක්වත් වහා අවුත් මට කියල''යි කියා සිටුවය. ඒ පුරුෂයා මිථ්‍රුනුවර දෙගොඩොස් ගව්වඇත් ඔබ්බේ වඩනා මහබෝධිසත්වයන්වහන්සේ දැක ''මේ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ මහ පෙළ කරින් වඩිමින් සිටිසේකැ''යි අවුත් සේනකයාට කීය. ඒ අසමින් සේනකයා වහා රජගෙට ගොස් එපවත් රජහට කීය. රජ්ජුරුවෝ සවිමැදුරු කවුළුවෙන් පිටත බැලුවාහු, එන්නාවූ සේනාව දැක මෙසේ කියත්:— ''සේනකය කුමක් කියයිදැ? අපගේ පණ්ඩිතයන්ගේ සේනාව මදය, එසේකෙසින් මේ ඉතා භයානක සඬරූප ඇත්තේය''යි කියන් තැත ගෙණ සේනකයා අතින් විචාරන්නාහු:—

හත්ථි අස්සා රථා පත්ති, සෙනාඤ්ච දිස්සතෙ මහා,
චතුරඞ්ගිණී භිංසරූපා, කින්නු මඤ්ඤස පණ්ඩිත.

''ඇත් අස් රථ පදිකයයි කියන බියකරු චතුරංගිණී මහාසේනාව පෙණෙයි, සේනකයෙනි උන් කවුරුනැයි කියා සිතුවදැ''යි කිහ.

එවිට සේනකයා රජු සැක කරවා තත්වූ පරිද්දෙන් කියන්නේ "මහ රජ නොබා වදාළ මැනව, නුඹවහන්සේට උතුම් සන්තෝෂයෙක් වන්නේය. ඊට කාරණ කිමිද යත්? එක්සියයක් රජදරුවන්ගේ සේනාවය බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ සේනාවය මියුලුතුවරින් යිය සේනාව යයි යන චතුරඞ්ගිණී සේනාව පිරිවරා සුවසේ එනසේක්, අපට යස දායකවූ අපගේ ලයක් වැනි අපගේ ඇසක් වැනි අපගේ ජීවිතයක් වැනි අපගේ සැමිදරුවූ ජනාසන්දකරුවූ ලෝකස්වාමිවූ තිලෝගුරුවූ තිලොකෙක තිලකවූ ප්‍රඥාසම්පන්නවූ සරණගත වජ්‍රපඤ්ජරවූ ප්‍රඥාප්‍රදීප වූ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ වඩාසේකැ" යි කිය.

"සේනකය කුමක් කියයිද? පණ්ඩිතයන්ගේ සේනාව මදය, මේ සේනාව එදවස් බ්‍රහ්මදත්තාරජ්ජුරුවන් ආ නියාවෙක් මෙන් මහසේනාවකැ" යි කිහ. නැවත සේනකයා කියන්නේ "මහරජ නොසිතාවදාළ මැනව, අපගේ සැමිදරුවානන්ගේ ඉතා මිහිරිවූ කණ්ණිරසායනයක් බඳුවූ ධර්මාන්විතවූ මධුර කථාවෙහි බැඳුන රජ්ජුරුවන් විසින් ඔබ කෙරෙහි පැහැද ඔබට ප්‍රසාදයෙන් දුන් සේනාවය, සැකනොකොට වදාළ මැනවැ" යි කිය.

ඒ අසා රජ්ජුරුවෝ ඉතා සතුටුව නුවර බෙර ලවන්නාහු "මේ මාගේ සත්යොදුන් මියුලුතුවර දිව්‍යපුරයක් මෙන් සදා පණ්ඩිතයන්ට පෙරගමන් කෙරෙත්ව" යි කියා බෙර ලැවූහ. නුවර වාසිහු දැක්මට පුලුපුලා උන්නාහු එබස් අසමින්ම අවසි ඝව්වක් පමණ එසා මහත් නුවර අසුර විජයකොට ජය ලදින් එන ශක්‍රදේවෙන්ද්‍රයාට සරහා තිම වනලද ශක්‍රභවනය මෙන් අතිමනෝහරකොට ධජ පතාක පුන්කලස කදලිතෝරණ ආදියෙන් හා සුදුවැලි ලදපස්මල් ආදියෙන් විසිතුරු කොට සරහා, නුවරවාසිහු සව්වාභරණයෙන් සැරසී සැමිදරුවන්ට පෙරගමන්කොට වඩා ගෙණාහ. පණ්ඩිතයන්වහන්සේ ඒ නුවර වාසිවූ සත්‍රීපුරුෂයන්ගේ නේත්‍ර සමූහයන් සතුටු කඳුලෙන් පුරා තුහාර යෙන් ආර්ද්‍රවූ නිලුපුල්පෙති සේ කෙරෙමින් ඇස් සිත් නිවා තමන්ම හන්සේ පස්මඟක් මුළුල්ලෙහි නුදුටුවන්ගේ ශෝක සන්හිඳුවා ලෙහි අමාදිය ඇසට රසාඤ්ජන දෙන්නක්හු මෙන් අනන්තයා සේ දහඅක් බුබ මවා ඉදින් කිවහොත් ඒ මහතානන්ගේ ශ්‍රීවිලාසයෙන් සුවල්ප මාත්‍රාවකුත් කියන්නට අසමර්ථවූ අනෝපමෙයවූ ශ්‍රීවිභූතින් රජගෙට වැද රජ්ජුරුවන් දුටුසේක.

රජ්ජුරුවෝ බෝධිසත්වයන් දැක, බුදුඇසපිරිසිදු බණේකපිරිසිදු උදෙදැසිකපිරිසිදු අව්‍යාකෘතිඇපිරිසිදු එරණපිරිසිදු යන පස්වණක් පිරිසිදින් පිණා කියාහු, වඳා උනස්තෙන් නැගී ඉදිරියට අවුත් සපතෙණ ඉහ සිඳී සනහා නැවත හොස් ආසනයේ ඉඳ, සිඟිතමයුතුවූ මිහිරිකථා කරමින් මේ ගාථාවෙන් කීහේ:—

යථා පෙතං සුසානස්මිං, ඡඩ්ඩෙත්වා චතුරෝ ජනා;
එවං කම්පිල්ලියෙ තම්හ, ඡඩ්ඩයිත්වා ඉධා ගතා.
අථඤ්ඤං කෙන වණ්ණෙන, කෙන වා පන හෙතුනා;
කෙන වා අත්ථ ජාතෙන, අත්තානං පරිමොචයී.

එම්බා පණ්ඩිතයෙනි, මළ මිණිසෙකු සතරඳදනෙක් කුරුලයකලා උසුලාගෙණ ගියාහු අමුසොහොනේ දමා පියා ඔහු කෙරේ කිසි අපේක්ෂාවක් නැතිව නැගි එද්ද, එපරිද්දෙන්ම,අපිත් තොප කම්පිල්ල දේශයේ ලා පියා අපගේ පණ ගලවාගෙණ තොප කෙරේ කිසි අපේක්ෂාවක් නැතිව නැගි ආම්හ; දැන් තෙපි කවර කාරණයෙකින් කවර උපායකින් කවර නුවණකින් කවර හේතුවකින් තෙමේත් රැකි සේනාවත් රැකගෙණ සුවසේ අව්දැ''සි විචාළහ.

ඒ අසා පණ්ඩිතයන්වහන්සේ මේ ගාථාවෙන් වදාරණසේක්:—

අත්ථං අත්ථෙන වෙදෙක, මන්තං මන්තෙන ඛත්තිය;
පරිවාරසිස්සං රාජානං, ජම්බුදීපංව සාගරෝ.

"මහරජ, බ්‍රහ්මදත්තරජ්ජුරුවන් සිතූසිතූ යම් අර්ථයෙක්, මාගේ තීක්ෂණවූ ප්‍රඥාවෙන් අනික් අර්ථයක් සිතා,ඔහු සිතූ යම්ම අර්ථයක් ජය ගතිමි. ඒ රජ යම් මන්ත්‍රණයක් සිතූයේනම්, එයින් මාගේ මන්ත්‍රණයෙන්ම ජයගතිමි, තවද දඹදිව පිරිවරා සිටි සාගරය පරිද්දෙන් දඹදිවට අධිපතිවූ එක්සියයක් රජුන් හා සේනාව මාගේ ප්‍රඥාබලයෙන් මා පාපිටගස්වා මම චක්‍රවර්ති රජක්හු සේ, සියලූ රජුන් හා සේනාව පිරිවැරූයෙම්වේද්ද''සි වදාළසේක.

මෙසේද කියා නැවත වදාරණසේක්, බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් සවනට මෙහෙයූතැන් පටන් නුවර මාඝල් කරණතුරු කී කළ දෙයත් උමඟට වන් තැන් පටන් උමගින් රජු ගෙණගොස් මහ විඝල්මඨවේදි කඩුව සැඟවූ තැන් දක්වාන් එතනදී සපථකොට රජුගේ යාචිඤ්ඤාවෙන් උමඟ අසුවූ රජුන් සහිතවූ සේනාවම දොරකැර මරණින් මුදා නැවත සන්දවඝක් උමංකෙළියෙන් දවස්යවා ඉක්බිති රජදරුවන් හැමදෙනා සන්දවඝක් තමන්වහන්සේට දුන් පඬුරු හා නැවත බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් දුන් නොයෙක් ප්‍රසාද හා නැවත එම රජහු දුවනියන්ට දුන් දායාද හා නැවත චූලනීරජ්ජුරුවන් ඇතුළුවූ සියලූ රජදරුවන් තමන්වහන්සේට දුන් ප්‍රසාදන් 'මේ මේය'සි වදාරණසේක්:—

දින්නං නීකඛ සහස්සං මෙ, කාමාසීතිඤ්ච කාසිසු,
දාසිසතානි චත්තාරි, දින්නං භරියා සතඤ්ඤමෙ,
සබ්බසෙනඞ්ග මාදාය, සොත්ථිනම්හි ඉධාගතො.

මෙසින් වදාරා ''මාඋපන්නරන්ට පස්විසිදහසක් දුන්හ; සජීවාභරණයෙන් සැරසූ ශරීරශොභා ඇති තන සිටි බාල කෙල්ලන් සාරසියයක් දුන්හ; නොයෙක් පළඳනාවෙන් සැදී බිසෝවරුන් සියයක් මට

බිරින්දෙකොට පාවාදුන්නා; අපගේ මේ වේදේහරටට අසනන තමන්ගේ කසිඉදශයෙන් ගමකින් අච්රුද්දකට ලක්‍ෂයක් බැගින් අය නිමන්නාවූ ගම් අසූවක් දුන්හ, බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා සියලු රජදරුවෝත් තමන්ගේ චතුරඩ්ගිණී සේනාව කෙරෙහි නිරපේක්‍ෂව ප්‍රහාද සේනාවක් කොට මටම දුන්හ, ඒ සියලු සේනාව පිරිවරා උකටලියක් නැතිව මහාසන්තෝෂයෙන් යුක්තව නැගිආමි'' වදාළසේක.

ඒ අසා ප්‍රීතින් පිණිපියා රජ්ජුරුවෝ බෝධිසත්‍වයන්ගේ ගුණ කියන්නාහු මේ ගාථාවෙන් කීහ:—

සුසුඛං වත සංවාසො, පණ්ඩිතෙහිති සෙනක;
පඤ්ඩිව පඤ්ඤරෙ බඬෙ, මච්ඡ ජාලඟතෙරිව;
අමිත්‍ත හත්‍ථප්පඨඨතෙ, මොචයී තනා මහොසධො.

"සේනකය, නුවණැත්තන් හා එක්ව විසීම ඉතා යහපත් වන්නේය, ඉතුත් මේ මහෞෂධපණ්ඩිතයන් හා එක රටෙක එක නුවරෙක එක තෙනක යමෙක් වෙසෙත් නම්, මේ ලොව සොර සතුරු බියෙක්වත් පරලොව අපාය භයෙක්වත් නැත්තේය, ඊට කාරණ නෝම දුටු යෙනි ඈවිද, අටලොස් අක්‍ෂෞහිණී සඩ්ඛ්‍යත ඒසා මහත් සතුරුසේනාවක් මැද මැදිරියෙක බැඳි සියොතුන්සේද, දැල බැඳි මසුන්සේද හසුවූ තොප දෙමුරයෙක ගලවාගත් බැවින් තොපටම දැනෙන්නේ වේද, එසේහෙයින් නුවණැත්තවුන් හා එක්ව විසීම ඉතා යහපතැ''යි ගුණ වර්ණනා කළහ. සේනකයාත් රජතු බස මුදුනෙන් පිළිගෙණ සැබෑයැකියා තමා ඇතිවක් පටන් සමසිතින් බෝධිසත්‍වයන්ගේ ගුණ කියන්නේ ''මහරජ ඒසැබවි නුවණැති පණ්ඩිතවරුනම් මෙලොවින් පරලොවින් ඉෂ්ටයක්මුත් අනිෂ්ටයක්වය නොදෙන්නාහ, මැදිරියෙහි හසුවූ පක්‍ෂීන් පරිද්දෙන් දැල හසුවූ මසුන් පරිද්දෙන් සතුරන්ට අත්පත්ව ජීවිත විනාශයට පැමිණ සිටියාවූ අප .හැමදෙනා ගලවා සැපයෙහි පිහිටුවාලූසේක, සමස්තලෝකයෙහි නුවණැත්තාවූ සියලු සත්වයන්ට ශතසහස්‍ර ගුණයෙන් වඩනාසේක්, අපගේ මේ මහෞසධ පණ්ඩිතයන්වහන්සේය''යි තමාගේ මුඛතොසැහෙන පරිද්දෙන් වෙනසක් නැතිව සිතින්ම ගුණ වර්ණනා කෙළේය.

ඉක්බිති රජ්ජුරුවෝ නුවර බෙරලවන්නාහු ''සත්දවසක් සැණකෙළි කෙළව, යම්කෙණෙක් මට භිතයෝනම්' ඒ සියල්ලෝම පණ්ඩිතයන්ට නොයෙක් පඩුරෙන් සත්කාර සම්මාන කෙරෙත්ව''යි විධාන කළහ, එබව ප්‍රකාශකොට වදාරණ බුදුරජාණන්වහන්සේ මෙසේ වදාරණසේකි:—

ඔරොධා ච කුමාරා ච, වෙසියා නොච බ්‍රාහ්මණා;
බහුං අන්නඤ්ච පානඤ්ච, පණ්ඩිතස්සාහි කාරයුං.
හත්‍ථාරුහා අණ්ණකථා, රථිකා පත්ති කාරිකා;
බහුං අන්නඤ්ච පානඤ්ච, පණ්ඩිතස්සාහි කාරයුං.

සම්මතා ජානපදා, නෙගමා ච සමාගතා;
බහූ අනනකඤ්ච පානකඤ්ච, පණ්ඩිතසසාභි කාරයුං.

"එම්බා මහණෙනි, ඒ වේදේහරජ්ජුගේ විධානයෙන් සියලු විණිවාදය ඉතා සිත්කළුකොට ගායනාකළහ, තවද කරඝක් විජයඝක් ජයතුරඝක් ආදිවූ පඤ්චප්‍රකාර ඝඩ්ඛනාද පැවැත්වූහ, ආතතය විතතය විතතා තතය ඝනය ශුෂිරය යන පඤ්චාඩ්ගික තූර්‍යනාද පැවැත්වූහ, නුවර වාසීන් හා ජනපදවාසීහු සඞ්ගාවයෙන්ම සවාමිදරුවානන්ට සත්කාර කරන්ට සිතන්නාහු බෙරහඬ අසමින් වඩ වඩා සන්තෝෂව තමන් තමන්ගේ විභවානුරූපකොට මහත්වූ සත්කාර සම්මාන කළහ, උදුම්බරා නම් අගමෙහෙසුවන් ආදිවූ බිසෝවරුද රාජකුමාරයෝද වාණිජයෝද බ්‍රාහ්මණයෝද යන සියල්ලෝම කනබොනදැ හා බොහෝ පඬුරු ගෙණගියහ, තවද ඇත් අස් රථාදි වාහන නැගෙන්නෝද පාබල මහා සේනාවද ජනපදවාසීහුද නියම්ගම් වැස්සෝද බොහෝ කන බොනදැහා පඬුරුගෙණ පණ්ඩිතයන්ගේ ගෙට ගියහ"යි වදාළසේක.

"එම්බා මහණෙනි, එක්සියයක් රජදරුවන් හුන් තෙනට තමන්ගේ රටින් සාරසියයක් ගව් ගෙවා ගොස් තමන් මරන්ට වටලාගත් රජදරුවන් හා ඒසාමගත් චතුරඞ්ගිණී සේනාව තමන්ගේ ප්‍රඥාබලයෙන් තනිව ජයගෙණ උත්තර පඤ්චාල දේශයෙන් ශ්‍රියුලුතුවරට ආ දවස් රැස්වූ බොහෝ ජනයෝ සුවසේ ආවාවූ පණ්ඩිතයන් දැක 'බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් ඇතුළුවූ එක්සියයක් රජුන් ජයගෙණ ආ සේකැ"යි ඉතා ප්‍රසන්නව ඔදවැඩිව සතුටුවූවාහු ඒ පණ්ඩිතයන්ගේ කීර්තිය පැතිරෙන්නාක් පරිද්දෙන් සත්දවසක් මුළුල්ලෙහි පිළි ඝිස සිසාරා නෙයියාඩන් කෙළියහ"යි වදාළසේක.

මෙසේ බෝධිසත්වයන්වහන්සේ සත්දවසකින් සැණකෙළි අත්තවූ කල්හි රජගෙට ගොසින් "මහරජ චූලනිරජ්ජුරුවන්ගේ මැනියන් පුතනුවන් බිසවුන් වහා යැවිවමැනවැ"යි වදාළසේක. "යහපත පුත මම කියන්නේ කිම්ද යවාපියව"යි කීහ. බෝධිසත්වයන්වහන්සේ තුන්දෙනාට වෙනවෙනම බොහෝ සත්කාර සම්මාන කොට එක්සියයක් රජදරුවන් හා බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් තමන්ට ප්‍රසාදයේ දුන් චතුරඞ්ගිණී මහාසේනාවට බොහෝ ප්‍රසාද දිමෙන් සත්කාර සම්මාන කරවා ඒ මහාසේනාවත් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් තමන්ට පාවාදුන් සියයක් ස්ත්‍රීන් ඇතුළුවූ සාරසියයක් කෙල්ලන්ද†නන්දෘදේවීන්ට පාවාදී, ප්‍රසාද සේනාවත් උන් ඇරලාලා එන පරිද්දෙන් උන්වම පාවාදී මහ පෙළහරින් යැවූසේක.

ඒ රජදරුවෝ තුන්දෙන අපමණවූ රජපෙළහරින් යන්නාහු සියක් යොදුන් මහගෙවා උත්තරපඤ්චාල නුවරට පැමිණියහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මැනියන් විචාරන්නාහු "කිමෙක්ද මැනියන්වහන්ස

†කම්මිත්තනන්ද.

වේදේහරජ්ජුරුවෝ 'සතුරාගේ මැනියෝය'යි මාකෙරේ කළ වෛර යෙන් නුඹවහන්සේ කෙරෙහි නොසතුටුව විසූදැ? නොකොත් සඩ්ඝක කලෝදූ''යි කීහ.

දේවී ''පුතණඩ කුමක් කියන්නෝද? මා දේවතා තනතුරෙහි තබා දුටහ, නන්දාදේවීන් මව් තනතුරෙහි තබා දුටහ, පඤ්චාලචණ්ඩකුමා රයන් එකකුසින් උපන් මල්තනතුරේ තබා දුටහ, බොහෝ සත්කාර සම්මානයෙන් බොහෝ ආචාර සමාචාරයෙන් සඩ්ඝකකළහ'යි මැනැළි වහන්සේ තමන් මුඛ නොසැහෙන පරිද්දෙන් ගුණ කීහ. රජ්ජුරුවෝ එබස් අසා වඩවඩා සන්තෝෂයට පැමිණ බැණතුවන්ට බොහෝ පාක්කුඩම් හා පඬුරු යැවූහ.

වේදේහරජ්ජුරුවන් කළඝඩ්ඝක මැනියන්අතින් විශ්වාරන්ටත් නන්දා දේවීන් අතින් නොවිචාරන්ටත් කාරණා කිමදයත්? නන්දාදේවි තරම් රූඇති කෙණෙක් මුළුදඹදිව අතික් නෙතක නැතැ, මා සම්පයෙන් ගොස් සාරසියයක් ගව්වේ උන් නැනැත්ති මා කෙළෙක් කෙළේය''යි සිතා මා කෙරෙහි ආදරයක්වත් භයක්වත් නැතිව අසාචාරසිලිව තමා සින්වූ පරිද්දෙන් වැසපුනම් විචාළකල නැත්තක් මුත් ඇත් තක් නොකියන්නීය නැන්දෑ නම් යෙහෙළියන්ට කුකුළන් හා බළ ලුන්සේ කෙණෙක,ඇත්තක් තබා නැත්තක් කියා බිඳුවන්ට නිස්සෙ, එසේනෙයින් බිහවුන් අතින් නොවිචාරා මැනියන් අතින් විචාළහයි දතයුතු. එතැන් පටන් දෙපසසේ ඇත්තෝම ඔවුනොවුන් සමඟ සුවසේ විසූහ.

මහා උම්මග්ග කාණ්ඩය නිමි.

———o———

උදකරාක්ෂස ප්‍රශ්නය.

පඤ්චාලචණ්ඩ බ්‍රහ්ම වේදේහ රජ්ජුරුවන් ප්‍රිය සිත් ගෙණවසන් කාශ්‍ය දෙවන අවුරුදු [යෙහි] පුතකු කෙණෙකුන් වැදූහ. ඒ කුමාරයන් වැඩි දසඅවුරුදුකල වේදේහ රජ්ජුරුවෝ සඟහිහසඵවූහ. බෝධිසත්වයන්වහන්සේ දසඇවිරිදි කුමාරයන්, ධවලචත්‍රනගා රාජ්‍යයෙහි පිහිටුවා "දේවයන්වහන්ස නුඹවහන්සේගේ මුතුන් රජ්ජුරුවන් සමීප යෙට යෙමි" වඳුලසේක. කුමාරයෝ "මා බාල තැනැත්තවු ඇරපියා නොයව, තොප පියතනතුරේ තබා රකිමි, සියල්ලෙන්ම ආදර කෙරෙමි" කීහ. ඒ අසා පඤ්චාලචණ්ඩබ්‍රහ්ම කියන්නාහු "මාගේ මව් පියහු ඇතත් මවුපියතනතුරේ සිට මේ සාරසියයක් ගව්වට සරණ දුන්දැත් නුඹදැමිය, ජනමාන්තර වෛරී රජදරුවන් කිරඹසේ එක්සිත් කරවා අවෛරී කළදැත් නුඹදැමය, එසේහෙයින් මටත් මපුතනුවන්ටත් අභිවාඬදැ නුඹදැමය, නුඹ මේ නුවරින් ගියකල අපට කිසි පිරිවහලෙක් නැත නොගියමැනව, දරුවන්ගේ පියරජ්ජුරුවන් සිටියා සේ සියලු සම්පත් වළඳා රාජ්‍යය කළමැනවැ"යි කීහ.

එබසට වදාරණසේක්"ඒ එසේමය,එදවස් මා එන ගමනේ වේදේහ රජ්ජුරුවන් මළ කල එම්සි, නුඹවහන්සේගේ පියරජ්ජුරුවන්ට ප්‍රතිඥ දී එනලද, එසේහෙයින් නොගොස් රඳන්ට නොපිළිවනැ"යි කියා මියුලුනුවර බොහෝ ජනයන් කරුණෙවෙන් බැගැව හඬමින් සිටියදී අමරාදේවීන්දැ හා සහජාත යෝධයන් හා අවශෙෂවූ දැසි දැස් ආදීන් හෙන් කැවිව එතුකැමැත්තන් ඇරගෙණ නික්මුණුසේක්, සියක් යොදුන් මග හෙවා ගොස් උත්තර පඤ්චාලනුවරට පැමිණිසේක. "මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ එනසේකැ"යි යනු චූලනී රජ්ජුරුවෝ අසා චතුරඞ්ගිණී සේනාව පිරිවරා පෙරගමන්කොට ඉදිරියට අවුත් මහපෙළහරින් ගෙණගොස් ඉදිනට මාහැඟි මාලිගාවක් දුන්හ; පළමු දුන් සඵගම් අසූව විනා අමුතුව දුන් කිසිවකුත් නැත්තේය. එසේ උවත් එහි කිසි කණස්සල්ලක් නොව කළමනා රාජසේවය පමානොව කරණසේක.

එසමයෙහි ඉතා නුවණැත්තාවූ කිමෙහි බිණිමෙහි දැනවූ කාරණකාරණ දන්නා ඉතා ඛම්මිඤවූ තෙරි නම් පරිබ්‍රාජිකා කෙණෙකුන්දැ එක්වන් රජගෙයිදී වළඳා මගුල් උයන ඉඳිනාසේක. "මෙබඳු ගුණ ඇති කෙණෙකුන්දැ රජගෙයි වළඳනසේකැ"යි බෝධිසත්වයන්වහන්සේ අසා දන්නාසේක. "මහෞෂධ පණ්ඩිතයෝ"යයි යන කෙණෙක් රජ්ජුරුවන්ට සේවය කෙරෙත්ල, උන් හා සමාන කෙණෙක් නැත්ල"යි පරිබ්‍රාජිකාවන්දැ නමින් අසා දන්නාසේක, එක දවසකුත් ඔවු නොවුන් දුටුවිරූදැ නැත්මය.

නන්දාදේවිත්"එසේ උමගින් සොරාගෙණගොස් මසක් වන ගණන් රජ්ජුරුවන් කෙරෙන් මා වියෝකකොටපිහ"යි තමන්ගේ එපමණ

ප්‍රියප්‍රයෝගයට බෝධිසත්වයන් කෙරෙහි නොපහන් නැනැත්තෝ වෛරයෙන් තුමූත් කිසිවකුත් කොටගන්ට අසමර්ථව තමන්කෙරේ වලඳන ස්ත්‍රීන් පස්දෙනෙකුන්ට කියන්නාහු "තෙපි ඇම මහෞෂධ පණ්ඩිතයාගේ අපරාධ පරීක්ෂාකොට රජ්ජුරුවන්ට කියා බිඳුවාපියව"යි කීහ. ඔහු පස්දෙන මහතානන්ගේ වරද සොයන්නාහු ඔබ යන එන තෙන අනුන්ට කිසිවකුත් නොහඟවා පරීක්ෂාකොට ඇවිදිනාහ. එද වස් පරිබ්‍රාජිකාවන්දැ රජගෙයි වළඳ තමන්වහන්සේගේ ආශ්‍රමයට වඩනාසේක් බෝධිසත්වයන්දැ රාජසේවයට වඩනාවුන් රාජඛතයෙහි මිදුලෙහි දුටුසේක. මහතානෝ පරිබ්‍රාජිකාවන්දැ වැඳලා සිටිසේක. එවිට පරිබ්‍රාජිකාවන්දැ සිතනසේක් "මේ පණ්ඩිතයෝ නුවණැත්තෝල, එබැවින් මුන්ගේ නුවණ පරීක්ෂාකෙරෙම්" සිතා "ඔසිත් කිවා කවුරු නොදනිද්ද? ඤාණමුද්‍රාණම් බැරිදෙයක, එබැවින් ඤාණමුද්‍රාවෙන් ප්‍රශ්නයක් විචාරම්" සිතා බෝධිසත්වයන්දැ මූන බලා අත්ල විදහා පෑසේක.

ඒ කුමක් කී නියාදයත්? "කිමෙක්ද පණ්ඩිතයෙනි, රජ්ජුරුවෝ තොපගේ රවින් මෙරටට ගෙන්වාගෙණ අත විදැ සම්පත් දිපියා සුව සේ රකිද්දැ"යි ඔසිත්සිතා ඔසින් නොකියා අත්ල විදහා පෑ නියාය. බෝධිසත්වයන්දැ සිතනසේක් මා අතින් ඤාණමුද්‍රාවෙන් ප්‍රශ්නවිචාරණ සේක් වනැ"යි ඒ ප්‍රශ්නය විසඳනසේක් තමන්වහන්සේගේ මිට හකුලුවා පෑසේක. කුමක් කී නියාද යත්? "මා සමීපයට එව'යි ප්‍රතිඥ ගෙණ මාගේ රවින් මා ගෙන්වාගෙණ මිටින් තරවඟත් දෙයක් අනුන්ට නොදෙන්නාසේ, කිසිවකුත් මට නොදෙන්නාහ"යි සිතා අතින් ප්‍රශ්නය විසඳුනියාය. පරිබ්‍රාජිකාවන්දැ ඔබ දැනඟත් නියාව දැන අත ඔසවා තමන්දැගේ ඉස පිරිමැඩලූසේක. කුමක් කී නියාද යත්? ඉදින් උකටලි වූනම් අපසේ මහණුව නොඟඤ්ඤදැයි කැඟවූ නියාය. එහිත් දැනලා තමන්වහන්සේගේ බඩ පිරිමැඩලූසේක. ඉන් කැඟවූයේ "මා විසින් රකිනා බඩවල් බොහෝය, එබැවින් පැවිදිවන්ට නොපිළිව නැ"යි කී නියාය. එසේ ඒ පරිබ්‍රාජිකාවන්දැ ඤාණමුද්‍රාවෙන් ප්‍රශ්න විචාරා තමන්වහන්සේගේ ආවාසයට වැඩිසේක. බෝධිසත්වයන්දැ පරිබ්‍රාජිකාවන් වැඳ රාජසේවයට ගියසේක.

ඒ වූනියාව නන්දදේවින්ගේ වල්ලඟස්ත්‍රීහු රජගෙයි සිව්මැදුරු කවු එවෙන් පිවත බැලුවාහු මේ ක්‍රියාව දැක, රජ්ජුරුවන් සමීපයට ගොස් "දෙවයන්වහන්ස මහෞෂධ පණ්ඩිතයෝ පරිබ්‍රාජිකාවන් හා එක්ව නුඹවහන්සේ සතු රාජ්‍යය ප්‍රාර්ථනා කරන්නාහ. නොබෝ කලකින් නුඹවහන්සේ මරා රාජ්‍යය ගන්නාහ"යි බිඳවාපිහ.

ඒ අසා රජ්ජුරුවෝ කියන්නාහු 'කිමෙක්ද තොප දුටු දෙයක්ද ප්‍රත්‍යක්ෂකොට ඇසූ දෙයක්දැ'යි කීහ. "අසා වදාළමැනව පරිබ්‍රාජිකාවන්දැ ඊගේ රජගෙයිදී වළඳන්නවුන්දැ මහෞෂධ පණ්ඩිතයන් දැක බොහෝ

දෙනා හෙයින් බසින් මනුෂ්‍යයට භය ඇතිව ඉඳි පාතාඤ්ඤු 'පණ්ඩිත යෙනි තෙපි නුවණැති තැනැත්ත උව, දඹදිව සියලු රාජ්‍යය අතුල් තලයක් මෙන්ද නොඅොත්, කලම්බලක් මෙන් තනාගෙණ රාජ්‍යය තොප අත්පත් නොකරණ්හුය'යි තමන්ගේ අත්ල විදහා උපමාකොට පැදූය. පණ්ඩිතයෝ ඒ දැනගෙණ 'කඩුව ශිරිකාගතිමිනම් කිපදවස කින් රජතු මරා රාජ්‍යය අත්පත්කොට ගණිමි' කඩුව ගන්නාලෙස මිට භකුලුවා පැහ. පරිබ්‍රාජිකාවෝ 'එසේ වීනම් රජතු ඉස කපාහැර පියව'යි තමන් ඉස පිරිමැඩලූහ. එවිට පණ්ඩිතයෝ 'ඉසට හැසු පහර මාගේ භයින් අත වැරද මුදුනෙන් ඉස පලාගියේ නම් නපුර, බඳ මැදින් පොළකෙරෙමි' සිත තබා බඩ පිරිමැදලීය. මහරජ ඇසූ දෙයක් කුමට කියමෝද? අප ඇස් පුරා දුටුම්හ''යි කියා නැවතත් කියන්නාහු ''අප්‍රමාදව මහොසධ පණ්ඩිතයා මරාපිය මැනවැ''යි කීහ.

රජ්ජුරුවෝ උන්ගේ බස් අසා මෙසේ සිතූහ, මා විසින් පණ්ඩිතයන් කෙරේ වරදනට නොපිළිවන, පණ්ඩිතයන් කිවයි කියන කාරිය පරිබ්‍රාජිකාවන්ද අතින් විචාරා දැනපියමි'' සිතා දෙවන දවස් පරිබ්‍රාජිකාවන්ද වළඳා අන්තයෙහි උන්ද විචාරන්නාහු 'කිමෙක්ද පණ්ඩිතයෝ දුටුදැ'යි කීහ. ''මහරජ ඊයේ රජගෙයි වළඳා යන්නමෝ අතරමගදී දුටුම්හ''යි කීසේක. 'උන් හා කළ කථාවෙක් ඇද්දැ''යි කීහ. 'මහරජ 'උතු නුවණැත්තහ'යි යනු අසා 'ඉදින් නුවණැත්තාහු වීනම් දැනගන්නාහ'යි සිතා පරීක්ෂාකරණ පිණිස භසභමුද්‍රාවෙන් ප්‍රශ්නයක් විචාළම්හ, අප විචාළ ප්‍රශ්නය දැන අප සිත්වූ පරිද්දෙන් විසඳූහ''යි වූ නියා යෙන් වදාළසේක, 'ස්වාමිනි පණ්ඩිතයෝ නුවණැත්තෝද'යි කීහ. ''මහරජ නුවණැත්තෝය, උන් හා සමාන කෙණෙක් එකතෙනකත් නැත්තාහ''යි වර්ණනා කළසේක. රජ්ජුරුවෝ පරිබ්‍රාජිකාවන්ගේ බස් අසා වැද පන්හලට සැපූහ.

උන්වහන්සේ ගිය ඉක්බිති බෝධිසත්වයන්ද ආසේක, පරිබ්‍රාජිකාවන් විචාළ නයින්ම 'කළ කථා කිමිද'යි කීහ. ඔබ ''මා හා බසින් කී දෙයක් නැත භසභමුද්‍රාවෙන් ප්‍රශ්නයක් විචාළසේක, ඔබ විචාළ ප්‍රශ්න මමත් නොවරදවා භසභමුද්‍රාවෙන්ම විසඳිමි''පරිබ්‍රාජිකාවන්ද කී පරිද්දෙන් නොවරදවාම වදාළසේක.

එදවස් රජ්ජුරුවෝ මහතානන් කෙරෙහි පැහැද දසදහසක් යොදුන් දඹදිව මුළුල්ලට නායකකොට සෙනෙවිරත්නය පාවාදී පටබැඳ වූහ. ''සියලු රාජ්‍යය මුළුල්ල පණ්ඩිතයන් කිවක් කෙළේමය, මේ වක් පවත් උන් කිවක්මය මා කරන්නේය'යි යනාදීන් සියලු දඹදිව මුළුල්ලම උන්වහන්සේට පාවාදුන්හ. සිවාලගෙන් භූතු පඤ්චමහා ඛඩ්ගාවන් එක්ව මහමුහුදට වදනා කලක් පරිද්දෙන් බෝධිසත්වයන් වහන්සේගේ ගෙට සියලු සම්පත් හා ඓශ්වර්යය මහමුහුදට වඩ බාදිය සේ ප්‍රමාණාතික්‍රාන්තව ඉතා බොහෝ විය.

රජ්ජු තමන්වහන්සේට යසස්දුන් ඉක්බිති නුවණැති මහතාතන් වහන්සේ මෙසේ සිතූසේක, කෙසේදයත්? "රජ්ජුරුවෝ එකව්ටම මේසා මහත් තනතුරක්දී තමන් හැර මා මුත් සියලු සම්පත්තින් තැති නියාවට මේසා මහත් ඓශ්වර්‍යයෙහි පිහිටුවාලුව, රජදරුවෝ යමක්හු කෙරෙහි වෛරවූනම් පස්වරු නසත් නම් පෙරවරු මහාසම්පත් දෙන්නාහ, දැන් මටත් මෙතෙක් දවස් කිසිවකුත් නොදී මහොඝයක් සේ මේසා මහත් සම්පත් එකපැහැර දීපිහ, රජ්ජුරුවන් මා කෙරෙහි ඉත ඕතින් දුන්බවත් අහිත සිතින් දුන්බවත් නොදනිමි. කල්නොයවා එයින් දැනපිම් නම් යහපතැ"යි සිතා "රජ්ජුරුවන්ගේ අදහස් තත්වූ පරිද්දෙන් දැනපියන්නට අන් කෙණෙකුන්ට නොපිළිවන, ඉතිරි පරිබ්‍රාජිකාවන්වහන්සේ මහානුභාවසම්පන්නසේක, උන්වහන්සේ එක් උපායකින් ඒ දැනපියන්ට තරම්සේකැ"යි බොහෝ සුවඳ මල් හා ගිලාන ප්‍රත්‍යයෙන් කිසිවකුත් නෙත්වාගෙණ පන්සලට ගොස් සුවඳින් මලින් පූජාකොට "ස්වාමිනි නුඹවහන්සේ මාගේ ගුණ කිවක් පටන් රජ්ජුරුවෝ තමන් හැර සම්පත්තින් මා මුත් අනික් කෙණෙකුන් නැති නියාවට මහවතුරක් පරිද්දෙන් මාගේ මාලිගාව නොයෙක් ඉසුරෙන් සමෘඩ්ධ කොටපිහ, ඒ මා කෙරෙහි සම්සිතින් දුන් බවත් මා නසාපියන සිතින් දුන් බවත් නොදන්මි, රජ්ජු මා කෙරෙහි ඇති සමාධි ගුණය තත්වූ පරිද්දෙන් දැනපිය මැනවැ"යි වදාළසේක.

පරිබ්‍රාජිකාවන්දැත් 'යහපතැ'යි ගිවිස දෙවන දවස් රජගෙට යන ගමන් **'දීඝරකුසු පැණය'**යි එක් ප්‍රශ්නයක් සිතා නැවත මෙසේ සිතනසේක් පණ්ඩිතයන් හා එක්ව කථාකළ චරපුරුෂයෙකුගේ නොවී, උපායකින් ප්‍රශ්නය විචාරා, රජ්ජුරුවන්ගේ හිත අහිත දෙස දැනපියම්හ"යි වළඳා අන්‍යයෙහි රජ්ජුරුවන් ඇවිත් වැඳ උන් කල්හි පරිබ්‍රාජිකාවන්දැට මෙසේවූ අදහසෙක් වූයේය. කෙසේදයත්? "ඉදින් මේ ප්‍රශ්නය බොහෝදෙනා මැදෙහි විචාළෙම් නම් රජ්ජුරුවෝ පණ්ඩිතයන් කෙරෙහි වෛරීවූ නම් බොහෝදෙනා මධ්‍යයෙහි වෛරීබව කිවු නම් යුක්තනොවෙයි" සිතා "මහරජ තනිව රහස්කථාවක් කියනු කැමැත්තමහ"යි වදාළසේක. රජ්ජුරුවෝ සම්පයෙහි මිනිසුන් පිටත් කරවූහ. එවිට පරිබ්‍රාජිකාවන්දැ කියන්දැ 'මහරජ තොප අතින් ප්‍රශ්නයක් විචාරමි' වදාළසේක. 'විචාළ මැනව දනිම් නම් කියමි' කිහ. එවිට ගෙරී නම් පරිබ්‍රාජිකාවෝ කියන්නාහු මේ දීඝරකුසු පැණයෙහි පළමුවන ගාථාව වදාරණසේක්:—

> සවෙඛෝ වුය්‍යමානානං, සත්තානානං උදකණ්ණවෙ;
> මනුස්සාබලි මෙසානං, නාවං ගණ්හය්‍ය රක්ඛසෝ;
> අනුපුබ්බං කථං දත්වා, මුඤ්චෙසි දකරක්ඛසෝ.

මේ ගාථාවෙන් කියේ, එසේවිනම් මහරජ තොපගේ වැදූ මැනියන් තලතාදේවිය තොපගේ නායක බිසව් නන්දාදේවිය තොපගේ

මලනුවෝ තිදෙණ මෙනෙ කුමාරයෝය තොපගේ යහලුවූ ධනුශෙඛර කුමාරයෝය අග්‍රපුරෝහිත කේවට්ට බ්‍රාහ්මණයෝය මහෞෂධ පණ්ඩිතයෝය තෙපිය, යන මේ සත් දෙනා මහා සමුද්‍රයෙහි එක නැවකින් යව්නම්, මිනිසුන් කා ඇවිදිනා උදක රාක්ෂසයෙක් මිනිස්බිල්ලක් හොයා ඇවිදිනේ, තොප සත් දෙනා නැගියන්නාවූ නැව දුන ඒ රාක්ෂසයා මුහුදු දිය දෙබැකොට ගෙණ අවුත් නැව අල්වාගෙණ තොපට කියනකල 'මේ තොප හා කැටිව එක නැවෙන් යන සදෙනා පිළිවෙළින් දුනහොත් මුත් නැවනාරිමි'කි නම් ඒ සදෙනාගෙන් කවුරුන් පළමුව දෙව්ද දෙවැනිව තුන්වැනිව සතරවැනිව පස්වැනිව දී කවුරුන් අන්තකොට බිලිදී ඒ ජලරාක්ෂසයා අතින් ගැලවෙව්ද''යි විචාළහ.

ඒ අසා රජ්ජුරුවෝ තමන් සිත වඤ්ඣා නැතිව අදහස්වූ පරිද්දෙන් කියන්නාහු:—

මාතරං පඨමං දජ්ජං, භරියං දුතිය ඤාතරං;
තතෝ සඛායං දත්වාන, පඤ්චමං දජ්ජ බ්‍රාහ්මණං;
ඡට්ඨාහං දජ්ජ මත්තානං, නෙව දජ්ජං මහොසධං.

මේ ගාථාවෙහි අභිප්‍රාය නම්:—''භවාමිනි සැබවින් ජලරාක්ෂසයා නැව අල්වාගෙණ 'සදෙනා මට පිළිවෙළින් බිලිදී තෙපි ගැලවෙව'යි කී නම් ඕනට පළමුකොට මාගේ මැනියන් දෙමි, දෙවැනිව නැණදේවින් දෙමි, තුන්වැනිව මාගේ මලනුවන් දෙමි, සතරවැනිව මාගේ යහලුවා දෙමි, පස්වැනිව කේවට්ටයා දෙමි. පස්දෙනා දී මහෞෂධපණ්ඩිත යන් හා මාහා දෙන්නාම මතු සිවිකල්හි, තවත් බිලි ඉල්වා නම්, පිළිතරව හැඳගෙණ කැසපට කවාගෙණ දසඳහසක් යොදුන් දඹදිව මා කරන්නාවූ රාජ්‍යශ්‍රී නොසිතා 'එම්බල මා කාපියව'යි කියා මහෞෂධ පණ්ඩිතයන් මා පිටිපස්සට දමාපියා ඒ රාක්ෂසයා කට දල්වාලූ කල්හි පණ්ඩිතයන් මාරුවෙහි ඔහු කටට පැන ඕනට බිලිවෙම් නමුත් මා පණ ඇතිව ඉඳ මා ඇසින් බලබලා මාගේ පණ්ඩිතයන් රාක්ෂසයාට නොදෙම්මය''යි කිහ.

මේ ප්‍රශ්නය මෙතෙකින්ම නිමියේය. එතකුදු උවත් ''රජ්ජුරුවන් පණ්ඩිතයන් කෙරේ ඇති ඉත සිතත් මා විචාළ ප්‍රශ්නයත් මා ඇසූ පමණින්ම ප්‍රසිඛවන්නේ නොවේ; එබැවින් මුහුදු දියපිට ඉඳලූ තෙලින්තක් මුළුල්ලෙහි විහිද යන පරිද්දෙන් කෙලෙම්නම් යහපතැ''යි සිතා ''මහරජතු සමඟින් මාලිකාවෙන් බැස ජනසමාගමය කරවා එතනත් රජතු අතින් විචාරම්, රජ්ජුරුවෝ මට පළමු කී ලෙසම 'පස්දෙනා පිළිවෙළින් දී පණ්ඩිතයන් රකිම්' කියති, එතන මම මැනියන් ආදී පස්දෙනාගේ ගුණ බොහෝ දෙනා මැදයේ කියම්, පණ්ඩිතයන්ගේ නුගුණ කියම්, රජ්ජුරුවෝ උන් හැමදෙනා නුගුණ බොහෝකොට කියා පණ්ඩිතයන්ගේ ගුණ කියති, එසේකල්හි බොධිසත්වයන්ගේ ගුණ ආකාශයෙහි පූර්ණචන්ද්‍රයා පරිද්දෙන් ප්‍රසිඛවන්නේය''යි සිතා

"මහරජ තොපගේ අන්තඃපුරවාසීන්ද රාජකුමාරවරුන්ද මේසාමහත් තුමර ප්‍රසිඛ ජනයන් එකතෙලා රැස්කරවා, රාජඛනයෙකි මාඤ්ඤ ආසනයක් පණවා විසිතුරු කරව"යි අතර්‍ථවූ ආසන පණවා එහි උන් පරිබ්‍රාජිකාවන්දැ රජතු අතින් පළමු තනිව විචාල පරිද්දෙන් ප්‍රශ්නය ආදියෙහි පටන් විචාරා රජ්ජුරුවනුත් තමන් පළමු කී පරිද්දෙන්ම ඒ රාත්‍රියෙහි "පළමු මැනියන් හා සවෙනිව තමන් පිළිවෙළින් බිලිදී මහෞෂධ පණ්ඩිතයන් රකිම්මය, මා පණ තබා ඇසිල්ලකුත් මාගේ පණ්ඩිතයන් කෙරෙන් වියෝව විසිය නොහෙමියි කිකල්හි පරිබ්‍රාජිකාවන්දැ කියනසේක්:—

"මහරජ ඕන ඇත්තක් තබා ඔසින් එකක් නොකියව, අප වැන්නන්ටත් මායම් කියද්ද? තොප කියන්නේ කවුරුන් අදහාගන්නා බවෙක්ද 'දියරකුසා නැව අල්වාගත්කල වැදූ මැනියන් පටන් තොප සදෙනා පිළිවෙළින් බිලිදී පණ්ඩිතයන් රකිමි' කිව, බැලූ කල මහෞෂධ පණ්ඩිතයන් තරම් තොපට සතුරෙකුත් නැත, වැදූ මවුන් තම් සත්‍වයන්ට උන් විසා උපකාරී කෙණෙකුත් නැත, ඉතුත් තොපගේ මැනියන් සෙස්සවුන්ගේ මවුන් සේ අල්පවූ ගුණ ඇති කෙණෙකුත් නොවෙත්; තොපට බොහෝ උපකාරීලව, එසේවූ ගුණ ඇති මැනියන් කුමක් පිණිස දෙව්ද"යි රජතට ප්‍රත්‍යක්ෂකොට දැනෙන පරිද්දෙන් කියනසේක් මෙසේ වදාරණසේක්: —

පොසෙතා ත‍ෙ ජනෙත්‍ති ච, දීඝරත්තා තුකම්පිකා;
ඡබ්බෙ තයි පදුට්ඨම්හි, පණ්ඩිතා අත්ථ දස්සිනී;
අක්ඛුදං උපනිසං කත්වා, වධාතං පරමොච සී.
තං තාදිසිං පාණදයිං, ඔරසං ඔඛ්‍ය බාරිණිං;
මාතරං කෙන දෙසෙන, දජ්ජාසි දකරක්ඛසො.

———oo———

චූලනීරාජ චරිතය.

මෙහි අජ්ජ කෙසේදයන්? මේ චූලනී රජ්ජුරුවන්ගේ පියානන් සමයෙහි චූලනී කුමාරයන් බාල කල ඒ රජතු පිරිවරා සිටි ඡබ්බ නම් පුරෝහිත බමුණා හා මේ තලතාදේවීන් ලොකාසාදරතියෙන් සතු වුව සමඟව වසන්නාතු විෂ මිශ්‍ර භෝජනයකින් රජතු මරා බමුණට ධවලච්ඡත්‍ර නංවා ඔහට අගමෙහෙසුන්ව බමුණ රාජ්‍යය කරණ සමයෙහි, එක් දවසක් චූලනී කුමාරයෝ 'මැනියන්වහන්ස බඩගාය'යි කීහ. ඔහට සකුරු ආදී පැනියක් හා කැවුම් දෙවූහ. එහි මැස්සෝ පිරිවරාගත්හ. කුමාරයෝ රන්තැවියෙන් මිඹිනු බිම හෙලා තැවියේ උන් මැස්සන් ඇසා නෙරපිහ. ඒ මැසි සමූහයා ගොසින් බිම මිඹිනු වල වසාගත්හ. එවේලෙහි මැස්සන් නෙරා කැවිම් හා අතකව ගුඩ ගොඩ කෙළියට ගියහ.

බමුණු මේ ක්‍රියාව දැක සිතන්නේ "මේ ඉස නොනැගිම තමා කන කැවුමේ මැස්සන් පලවා කැවුම් කැය, ඉදින් නොනැසී වැඩිනී නම් මට රාජ්‍යය නොදෙන්නේය, මොවුන්ද මරා පියමි" සිතා එපවත් තලතාදේවින්ට කීහ. බිසව් කියන්නාහු "දේවයන්වහන්ස මම නුඹ කෙරෙහි කළ ශෝභනයෙන් මාගේ එවැනි රජ්ජුරුවන් පවා විශ්වාස කරපිමි, එබැවින් මට මුන්ගෙන් ප්‍රයෝජන කිම්ද, සැළනොකොට සොරා මරා පියමිහ"යි කියා බමුණු අස්වසාලා, ඉතා නුවණැති බිසව් උපායක් සෙණයෙකි සිතා අරක්කැමියා කැඳවා "දරුව මපුතනුවෝ චූලනීකුමාරයෝත් තොපගේ පුතා ධනුශෙඛර කුමාරයාත් එකඳ, උපතහ, සමානවූ කුමාරපෙළහරින් වැඩියාහ; එබැවින් ප්‍රාණය සමාන යහ ලුවහ, දැන් ජබබ නම් බ්‍රාහ්මණයා මපුතනුවන් මරණු කැමැත්තේය, තෙපි මදරුවන් දිවි රැක දෙව"යි කීහ.

"යහපත දේවින්වහන්ස කුමක් කෙරෙම්ද'යි කී කල්හි "එසේ වී නම් මාගේ පුතනුවෝ එක්වන් තොපගේ ගෙයිම වෙසෙත්වා, කවුරු ණුත් සැකනොකරණ පරිද්දෙන් හා කැමදෙනාම දන්නා පරිද්දෙන් හා කිපදවසක් තුන්දෙන තනිව මහ මුළුතැන්ගෙයි වැදගෙව 'චූලනී කුමාරයන් හා අරක්කැමියා හා පුතු ඇතුළුවූ තුන්දෙනා මුළුතැන්ගෙ සිමය'යි සැක නැතිවූ කල තොප වැදගොත් තැන එලුවන්ගේ ඇට ඇදලා පියා, මිනිසුන් රෑ නිදිගත්කල මුළුතැන්ගේ ගිනි ලා පියා, කිසි කෙණෙකුන්වත් නොහඟවා දරුදෙන්නා කැරගෙණ මේ නුවර හළ පැලැල්ලෙන් පළමු නික්ම පසල් දනව්වෙහි අතික් නුවරකට පලායව,මපුතනුවන් රාජකුමාරබව නොහඟවා දිවි රැකදෙව"යි කීහ.

"ඒ යහපතැයි ගිවිස්සේය. මුතු මැණික් ආදිවූ රුවනින් යම්තාක් දෙයක් දුන්හ, ඒ අරක්කැමියා ආදී තුන්දෙනම මුළුතැන්ගේ ගිනිලා යන්නාහු ක්‍රමයෙන් ගොස් මදුරට සාගලපුර නුවරට වැද රජ්ජුරුවන් වැඳ තමන්ගේ ජාති ඇඟවූහ.

මදුරජ්ජුරුවෝ තමන්ගේ පරණ අරක්කැමියා ඇර ඔහුගේ මුළු තැන්ගේ රක්නා භූරය ඕනට පාවා දුන්හ. කුමාරවරු දෙදෙන ඔහු සමඟ එක්වන් රජගෙට යන්නාහු රජ්ජුරුවෝ "කුමාරවරු කාගේ දරුවෝදැ"යි විචාළහ, "මාගේ දරුවෝය"යි කී කල්හි "මේ එක්වණ, මේ වෙනස්ය"යි කී කල්හි "මාගේ බිරින්දන් දෙන්නාගේ දරුවෝ දෙන්නාහ, එබැවින් මේ මා වැනිය මේ මැනියන් වැනිය"යි කීහ. එසේ කල් යත් යත් යහලුව ගොස් මදුරජ්ජුරුවන්ගේ දුවනියන් හා එක්ව රජකෙසිම කෙළනාහ. නැවත චූලනීකුමාරයන් හා කුමාරිකාවන් හා දෙදෙන එක්වන් දැක්මෙන් ඔවුනොවුන් කෙරෙහි පිළිබඳවූ අදහස් ඇතිවූහ. කෙළිමඬලේදී චූලනී කුමාරයෝ තමන් කෙළනා පලස්නුවමත් ලනුවත් කුමාරිකාවන්ලවා 'තෙලේ ගෙණව'යි යසාදින්

තමන් සිටි තැනට ගෙන්වන්නාහුය, සමඟර විටෙක නොගෙණවිත් තරව ඔලුවේ ඇණලන්නාහ. කුමාරයා තමාගේ රාජමානයෙන් තරව කැසූ පහර සමඟරවිට සෙනඟයෙන් ඉවසා පියති, සමඟරවිට ඉතාම රිදියන්නා ඉවසියනොහී අත්ගගා ඇඹන්නාහ, ඒ අසා රජ්ජුරුවන් 'මාගේ දරුවන්ට ඇසුවෝ කව්රුදැ'යි කී කල කිරිමව් ගොස් විචාරන්නාහ 'ඉදින් මම 'මේය මා ඇසූයේ''යයි කිම්නම් මපියානෝ ඕනට රාජ්‍ය කරන්නාහ''යි සිතා ඔහු කෙරේ සෙනඟයෙන් එබව වලහා, "කුමක් කියව්ද? මා කවුරු මරද්ද නිකම් අඬාපිම්''යි යටකරන්නීය.

නැවත එක් දවසක් මරන්නවුන් රජ්ජුරුවෝ තුමූම දැක මෙසේ සිතූහ:—''මේ කුමාරයා මූ හා එක සැවියන් නොවෙයි' සඟණිණ ප්‍රතිබිම්බයක් මෙන් ඉතා ප්‍රියවන්නේය' 'මේ රජගෙයකැයි' වත් 'රජ්ජුරුවන්ගේ දුවකැ'යි වත් 'මම නොරටින් ආමි' වත් අරක්කැමියාගේ පුතෙකැයි' වත් කිසි භයක් නැත්තේය, මට වලහා කී බව මුත් මේ අරක්කැමියාගේ පුතෙක් නොවෝ''යි කියා එවක්පටන් විමසන්නාහ, කිරිමව් කුමාරිකාවන් කෙළනා තැනට කැවුම් ගෙණ යන්නාහ. කුමාරිකාවෝ ඇසු බාල දරුවන්ට බෙදාදෙන්නාහ. සෙස්සෝ දික්කළ කැවුම් ගන්නාකල දන වක නමාගෙණ නැඛුරුව ඉඳුන් දික්කොට ඇරගෙණ කන්නාහ. චූලනී කුමාරයෝ කෙළිමින් සිට අතින් උදුරා ගෙණ කන්නාහ. එයින් රජ්ජුරුවෝ දුටහ

නැවත එක් දවසක් චූලනීකුමාරයන් කෙළනා බමර දමාලුව, රජ්ජුරුවන්ගේ කුඩා යඤ්ඤ යට වැදගියේය. ඒ ගන්නා කුමාරයෝ තමන්ගේ රාජමානයෙන් 'මේ ප්‍රත්‍යන්ත රජුගේ ඇද යටට ඉස නැමීම් නම් ඔහුට වැන්දාට අඩුදැ'යි මානයෙන් දණඩකින් මැත්කොට ගත. රජ්ජුරුවෝ ඒ ක්‍රියාව දැක ඒකාන්තයෙන් අරක්කැමියාගේ පුතෙක් නොවෝ'යි සිතා, අරක්කැමියා කැඳවා 'මේ කාගේ පුතෙක්දැ'යි විචාළහ. 'මාගේම පුතාය'යි කීහ. ''එම්බල තාගේ පුතාත් මම නොද නිමිද? බොරු නොකියා ඇති සැවියේ කිය, බොරු කියෙහි නම් දන් නෙම්වේදැ''යි කඩුව අමෝරා භයගැන්වූහ. ඒ මරණභයින් තැති ගෙණ 'තනිව දන්වාලම්' කී කල්හි රජ්ජුරුවෝ මිනිසුන් දුරුකළහ. එවිට අඤ්ඤ ඉල්වාගෙණ මහළු චූලනී රජ්ජුරුවන් බෙහෙවින් මැරූ තැන්පටන් රජ්ජු විචාළ තැන් දක්වා තමන්කොට ආපවත් කථාවවූ පරිද්දෙන් නොවලහා කීය. රජ්ජුරුවෝ තත්වූ පරිද්දෙන් අසා දැන තමන්ගේ දුවනියන් බිහෝ පළඳනාවෙන් සරකා චූලනී කුමාරයන්ට පාවාදුන්හ. **මේ චූලනීකුමාරයන් මදුරට විසූ නිසාවය.**

අරක්කැමියා හා කුමාරවරුන් හා ගිය දවස් "අරක්කැමියාන් පුතාන් චූලනීකුමාරයෝත් තුන්දෙන මුළුතැන්ගෙයි ගත් ගින්නෙන් ඇතුළු ගෙයිම දැ මළහ''යි කෝලාහලවිය. තලතාදෙවි එපවත් අසා බමුණන්ට කියන්නාහු "තුඹ හා අප හා සිත ඇත්ත මුදුන්පත්විය, ඒ

තුන්දෙනා එක ගෙයි දා මළහ''යි කී කල්හි බමුණු ඔදවැඩි සතුටුවිය. ඒ තලතාදෙවි 'චූලනීකුමාරයන්ගේ ඇවයයි එලුඇට ගෙන්වා බමුණට පැ ගිවිස්වූහ. මේ නිසා පරිබ්‍රාජිකාවන්දෑ ''අනික් උපක්‍රමයක් තමන්ගේ නුවණින් දක්වා නොප මරණින් මුදා රැක්කිය'' කියා 'ඒසා අපමණ සැපත් දුන් එවැනි මැනියන් කවර වරදකින් ජල රාක්ෂසයාට දෙව්දැ''යි කිහ.

ඒ අසා රජ්ජුරුවෝ කියන්නාහු ''මාගේ මැනියන්දැගේ ගුණ බොහෝ බවත් දනිමි, නුඹවහන්සේ වදාළ ගුණයට වඩා මා දන්නා නුගුණ බොහෝය''යි කියන්නාහු ''සොමිනි උන්දැ නුගුණ හැම කියන්ට නොපිළිවන, යම්තම් දෙයක් කියමි අසා වදාළමැනව.

දහරා විය අලඞ්කාරං, ධාරෙති අපිලන්ධියං,
දෙවාරිකෙ අණ්ණ කටෙඪ, අතිවෙලං පජඤති.
තතොපි පවිරාජනං, සයං දූතානි සාසති;
මාතරං තෙන තෙසෙන, දජ්ජාහං දකරක්ඛනො.

තමන්දැ ඉතා වයස්ගතව සිව බාලස්ත්‍රීන් පළඳනාවූ මිණි මෙවුල් දම් ආදී නොපළඳනා පැළඳ මා අමාත්‍යමණ්ඩලයා පිරිවරා සිංහාසනාරූඪව උන් කල්හි බොහෝ දෙනාට පෙණෙන පරිද්දෙන් සක්මන් කොට ඇවිදිනාදැ ද, පැළැන්දූවූ මණිමෙඛලා දාමාදියෙහි ශබ්දය සියලු රජගෙය එකතින්නාද කරමින් සිටිනේය. අමාත්‍යමණ්ඩලයා මැද උන් මම 'මුන්වහන්සේ පැළඳි ආභරණයෙහි ශබ්දය නියා දැන ලජ්ජාවෙන් කරබාමි, අමාත්‍ය සමූහයා ඔවුනොවුන් මුහුණ බලන්නාහ. තවත් නොකවයුත්තක් බලා වදාළමැනව, මා සතු ප්‍රත්‍යන්ත රජදරුවන්ට මා යැව්වාකොට පත් ලියා යවන කල 'මාගේ මැනියන්දැ මැහැලි නොවන්දැය, යොලොස් ඇවිර්ද්දෙහි සිටියන්වත් මුන්දැ වඩා නාදැය, මෙනම් රජ්ජුරුවෝ අවුත් තමන්ට කිරින්දකොට යෙත්ව'යි මා යැව්වාකොට මට හොරු පත් යවන්දැය, රජ්ජුරුවෝ පත් බලාපියා ඔසින් තැතිගෙණ නැවත මට පත් එවන කල 'අප තමන්වහන්සේගේ සේවකයන් උව, මෙසේ නොතරම් කටයුතු කියා එව්වේ ඇයි දැ'යි පත් එවන්නාහ. ඒ ගෙණ පත් සඔයෙහි කියවන්ට වන්කල මා ඉස්වද්දන තැනක් නැත්තාසේ මහාලජ්ජාවෙන්, පොළොව පැළී නොයන සේය'යි සිතමි. සොමිනි මේ වැරදි නිසා මැනියන් ජලරාක්ෂසයාට දෙමි'' කිහ.

''මැනියන් මේ වරදින් ජලරාක්ෂසයාට දෙව, නන්දෘදේවීන් තරම් ගුණ ඇති කෙණෙකුත් නැතැ''යි උන්ගේ ගුණ කියනසේක් මෙසින් වදාරණසේක්:—

ඉත්ථිගුම්බස්ස පවරා, අච්චන්තා පිය වාදිනී;
අනුගතා සීලවතී, ඡායාව අනපායිනී.

අනෙකාඛනා පභූදවති, පණ්ඩිතා අත්ථදස්සිනී;
උච්චරං තෙන දෙසෙන, දජ්ජාසි දකරක්ඛතෙ.

මෙසින් කියා "මහරජ මේ නන්දාදෙවි නම් තොපගේ සොළොස් දහසක් බිසෝවරුන්ට නායකව පඤ්චකල්‍යාණයෙන් හා සියලු රූප ශ්‍රීන් විරාජමානව බාලයෙහි පටන් සචකියවූ ශාසාවක් පරිද්දෙන් තොප අත්නොහැර පවත්නීය. උන්ගේ ගුණ කියත් නම් මදුරව සාගල නුවර තොප වහන සමයෙහි තොප තමා මැරූ කල ගෙඩි කත් මුත් තොපගේ ආඥා මරුන්තු නොකොට තොප කෙරේ සෙනහයෙන් දෙමව්පියන්ටත් නොකිවුය, මෙබඳු ගුණ ඇති නොකිපෙණසුලු ඉතා නුවණැති අභිප්‍රාය දන්නා තොප සිත්වූ පරිද්දෙන් වැස තොප සේ පිණැති දූදරුවන් වතු රාජාභිෂේක වඩා දුන් ඒ නන්දාදෙවින් කවර වරදකින් රාහුසයාට දෙව්දැ"යි කිහ.

ඒ අසා උන්ගේ නුගුණ කියන්නාහු මෙසින් කිහ:—

ඛිඩ්ඩා රතිසමාපන්නං, අනප්පව සමාගතං;
සා මං සකෘතං පුත්තානං, අයාචං යාචතෙ ධනං;
සොහං දදාමි සාරත්තො, බහුං උච්චාවචං ධනං;
සුදුච්චජං චජිත්වාන, පච්ඡා සොචාමි දුම්මනෝ;
උච්චරි තෙන දෙසෙන, දජ්ජාමි දකරක්ඛතෙ.

මෙසින් කියා "සවාමිනි මේ නන්දාදෙවින් රහසිගතව ලොකස්වාද රතියෙන් සතුටුව මා තමා වසඟවයට පමුණුවා මා අතින් නොඉල්ලියයුතු ආභරණාදිය ඉල්වසි, මාගේ සෙසු බිසෝවරුන්ට හා උන් ගෙන් උපන් දූදරුවන්ට මා විසින් සෙනහයෙන් කරවා පළඳවනලද නොඉල්ලියයුතු පළඳනා මා අතින් ඉල්වසි, මම 'ඒ දුන්කල මතු ඒ නිසා වන පසුතැවිලියෙක් ඇතැ'යි නොසිතා, කාමරාගයෙන් දවන ලද අදහසින් 'අරගනුව'යි ඉල්වූ පළඳනා දෙමි; මෝ 'රජතු විසින් මට දෙනලදැ'යි දරුවන් හඬද්දීම ඇලවා ඇරගෙන 'දරුවන්ට දුන් පළඳනා උදුරාගත්මි' අදහසින් සතුටුවෙයි. එකල බිසෝවරුන් හා දරුවෝ අවුත් මේ කිවා දුන්නෙත් ඇසිද? නැවත උදුරා ගත්තෙත් ඇසිදැ'යි සඛාවේ උන් මට ඇ මැදහත් නියාය'යි මැසිවිලි කියති; බාල දරුවන් අඬන් අඬන් මවත් සෝක උපදනේය, 'මා කළ දැ නපුරැ'යි පසුතැවිලියට පැමිණ නැවත භාණ්ඩාරයෙන්, ඇරගත්තාට දිවුණක් දින් උන් හැම සන්සිදුවාගත නොහෙමි. මේසා දොම්නසක් වන්නේ උන්නිසා වේද? මේ වරදින් ජලරාහුසයාව දෙමි'කිහ.

"ඒ වන්නා මේ වරදින් බිසවුන් බිලිදෙව, තොපගේ මලනුවන් මහාඋපකාරිවුව, උන් කවර වරදින් රාහුසයාට දෙව්දැ"යි කියනසේක් මෙසින් වදාරණසේකි:—

යෙනොච්කා ජනපදා, ආනීතාච පවිඤ්ඤහං;
ආහතා පර රජ්ජෙහි, අභිහට්ඨාය බහුං ධනං.

ධනුග්ගහානං පවරං, සූරං නිබ්බිණ මන්තිනං;
භාතරං කෙන තෙසෙන, දජ්ජාසි දකරක්ඛනෝ.

ලමසින් වදාරා "මහරජ තොප සබදෙශයෙන් කොස් අන්‍යදේශයෙහි උන්නවුන් තමන්ගේ උපායෙන් ගෙණවුන් සියලු සම්පත්තින් සමෘබවූ රාජ්‍යයෙහි පිහිටුවා, තවද දසදහසක් යොදුන් දඹදිව දුනුවායන්ට අග්‍රවූ වැරසැරවූ තීක්ෂණමන්ත්‍රීවූ එක කුසින් උපන් මලනුවන් කවර වරදකින් බිලිදෙව්දැ"යි විචාළසේකි. ඒ තීක්ෂණමන්ත්‍රීවූ කුමාර යෝනම් මැතියන් තලතාදෙවීන් මහළු චූලනීරජ්ජරුවන් විශ ලා මරා බමුණා කා එක්ව වසනකල උපන්හ. එසේ බව මුත් උපන්නේ මහළු චූලනී රජ්ජුරුවන්ටය. ඒමන්ත්‍රී කුමාරයන් වැඩුනුකල කඩුවක් අතටදිලා "මේ ඇරගෙණ එක්වන් මා ලඟ සිටුව"යි කීය. ඒ කුමාර යෝත් 'බමුණා තමාගේ පියාසෝමය'යි සිතා සේවය කරන්නාහ. [එකලත් දැන් සේම වියරුවෝ ඇතිවන්හ.] එක් අමාත්‍යයෙක් සෙමෙන් කියන්නේ "කුමාරයෙනි තොපි මොහුගේ කුමාරකෙණෙක් නොවව, තොප මව්කුස වඩන සමයෙහි තොප මව් මේ බමුණා පිණිස තොප පියානන් මරා මොහු රාජ්‍යයෙහි පිහිටුවූහ, තොපි මහා චූලනී රජ්ජුරුවන්ගේ පුතනුවෝය"යි කීහ.

ඒ කුමාරයෝ දණෙඩන් ගැසූ නයෙකු සේ කිපී 'එක් උපායකින් මේ බමුණා මරමි' සිතා, රජගෙට කොසින් වදනේ ඒ බමුණු තමන්ට දුන් කඩුව තමන් ලඟ සිටි එකක්හට දී අනිකක්හට කියන්නේ තෝ 'තෙලෙ කඩුව මාගේ කඩුවය'යි වාදකොට කළහ වඩව"යි කියා රජගෙට වන්හ. ඔහු දෙදෙන "මේ මාගේ කඩුවය තට දුන්නෝ කවුරුදැ'යි කලහ කළහ. කුමාරයෝ පළමු නොදන්නා වන්ව 'කොල කුමන කලහයෙක්දැ'යි එකෙකු බලන්ට යැවූහ. ඒ අවුත් "නුඹවහන්සේගේ කඩුව අනිකෙක් 'තමාගේ කඩුවය'යි උදුරා කලහ කෙරෙති" කීය, බමුණා ඒ අසා 'කුමක්දැ'යි විචාළකල්හි 'නුඹවහන්සේ මට දුන් කඩුව අනික් කෙණෙකුන්ගේ කඩුවදැ'යි කීහ. "කුමක් කියව්ද? මාගේ භාණ්ඩාරයෙහි සිය දහස්ගණන් කඩු තිබියදී තොප එක පුතනුවන්ට අනුන්ගේ කඩුවක් කුමකට දෙම්දැයි කීහ. "එසේ වී නම් නුඹවහන්සේ මට දුන් කඩුව ඇඳිනගත හෙනසේක්ද? පරීක්ෂාකරවන පරිද්දෙන් හෙන්වමෝදැ"යි කීහ 'ඇයි පුත මාදුන් කඩුව මම නොහඳුනම්ද? එහා හෙන්වව'යි කීය. කුමාරයෝ කඩුව හෙන්වා කොපුවෙන් මැන්කොට බැලුව මැනවැ"යි කඩුව පානා එකක්හු පරිද්දෙන් වමතින් කොපුවඟෙණ විදුලියක් ගැසූ ඇසිල්ලක් මෙන් එක පහරින් බමුණා හිස කපා පාපිට ඇලූහ. එවේලෙහි මළ බමුණා රජගෙන් පිටත්කොට ගෙය පවිත්‍ර කරවා කුමාරයන්ට ඛවලචඡත්‍ර නංවා සිටි කල්හි මැතියෝ චූලනීකුමාරයන් සාගලනුවර වසන තියාව කීහ. ඒ අසා තීක්ෂණමන්ත්‍රී කුමාරයෝ චතුරඞ්ගිණීසේනාව පිරිවරා කොස්

බැණුන් ගෙණවුන් රාජාභිෂේකකරවා රජකළහ. ඒ කුමාරයෝ ක්‍ෂණයෙහි ස්තාපියත බුඩි ඇත්තාහ; එයින් තිදෙණ මන්ත්‍රීකුමාරයෝයහි, දඹදිව ප්‍රසිඩවූහ. පරිබ්‍රාජිකාවන්දැ 'මෙවැනි කුමාරයන් කවර වරද කින් රාක්‍ෂසයාට දෙව්දැ'යි වදාළසේක.

ඒ අසා මලනුවන්ගේ නුගුණ කියන්නාහු මෙසින් කිහ:—

මයොචිතා ජනපදා, ආනීතාච පරිඝණෑ;
ආඝතං පර රජ්ජම්හි, අභිඝට්ඨාය බන්ධුං ධනං.

ධනුග්ගහානං පවරෝ, සූරෝ තික්ඛිණ මන්ත්‍රියෝ;
මායා සෝ සුඛිතෝ රාජා, අතිමඤ්ඤති දූරතෝ.

උපට්ඨානම්පි මේ අය්‍යෝ, න සෝ එති යථා පුරෑ;
ඝාතරං තෙන දෙසෙන, දජ්ජාහං දකරක්ඛතෝ.

මේ ගාථාව කියා "නිඛීතිව විසූ මොහු මේ නුවරට ගෙණවුන් මට පැමිණි රාජ්‍යයෙහි පිහිටුවාලිමි"යි කියාත් 'තද දුනු ඇදීම් විදීම්හි සියලු ධනුශශිල්පයෙහි දඹදිව මටවඩා දක්‍ෂයෝ කවුරුදැ'යි කියාත් සෙස්ස තබා පෙර රාජ්‍යේවයට එන කල බොහෝදෙනාට කල්තබා එන්නාහ, දැන් මෙම නිමා අභිමානයෙන් කල්යවාත් එන්නේය, සම හර දවස් නොම නොඑන්නේය, මේ වරද නිසා රාක්‍ෂසයාට බිලි දෙමි"යි කිහ.

"මලනුවන් ඒ වරදින් දෙව' ධනුසෙඛර කුමාරයන්ගේ ගුණ කියස සේක්:—

එකරත්තං ව උභයෝ, ඔසක්ඛාපි ධනුසෙඛරෝ;
උභෝ ජානෙය්‍ය පඤ්ඤාලා, සඛායා සුසමාවසා.

චරියායං අනුබන්ධෙය්‍යෝ, එක දුක්ඛ සුඛෝ තව;
උසසුකෙකා තෙ දිවාරත්තං, සබ්බකිච්චෙසු ව්‍යාවටෝ;
සඛායං කෙන දොසෙන, දජ්ජාසි දකරක්ඛතෝ.

මේ ගාථාවෙන් වදාරා "මහරජ ධනුසෙඛරයා නම් තද දුනු ඇදීම් විදීම් ආදි ධනුශශිල්පයෙහි ඉතා දක්‍ෂය, මේ පඤ්ඤාලනුවර තොප හා එක දවස් උපන, තොපගේ ශාසාව පරිද්දෙන් සුවදුක් දෙක එක්ව විඳ ආය, තවද තොපගේ රාජකෘත්‍යයෙහි රැ දෙවෙහි අප්‍රමාදව වසන්නේය, එසේවූ බන්ධුසමාන යාලුවා කවර වරදින් යකුට දෙව්දැ"යි කිහ.

ඒ අසා නුගුණ කියන්නාවූ රජ්ජුරුවෝ මේ ගාථා නුණ කියත්:—

චරියායං අයං අය්‍යෝ, පජ්ඣායිතෙවා මයා සඛ;
අජ්ජාපි තෙන වණ්ණෙන, අතිවෙලං පජ්ඣායති.

උබ්බරියාපි මෙ අය්‍යෝ, මන්නය්‍යාමි රහොගතෝ;
අනාමන්තෙතාව පවිසති, පුබ්බ අපපවි වෙදිතෝ.

ලද්ධවාරො කතොකාසො, අහිරිකං අනාදරං;
සහායං තෙන දෙසෙන, දජ්ජාහං දකරක්ඛනො.

"ස්වාමිනි මාගේ යාලුවා කුමාර කල පටන් එක්ව කා බී සිට එක්ව කෙළ බොහෝ දවසක් මා කෙරෙහි භය රහිතව මිසු පමණකින් දැන් මා රජව සිටි කලත් පළමු පරිද්දෙන්ම මා කෙරෙහි ගෞරව ආදර නැත්තේය. තවද තමාට රැකවල් නැති හෙයින් කවර වේලකත් බිසවුන් හා රහස් කථාවක් කෙරෙමි නමුත් සිරි රැකවලුන් නැවතුවත් උන්ට පරෘෂ බැණ උන් භයගන්වා නිර්භිතව තනිව උන්තැනට කොස් වදනේය, අනාදර කරන්නේය, මා ඉදිරියෙහි අත්පොළා සෙන් නේය, මා දුක්පත් සමයසේ දැනුත් සිතන්නේය, පළමුව කියා නේවාම මා උන් යම්ම තෙනකට වහා එන්නේය, මේ වරදින් යාලුවා දියරකුසාට දෙමි"සි කීහ.

"යාලුවා ඒ වරදින් දෙව කේවට්ටයානම් තොපට බොහෝ උපකාරී ය"සි ඔහුගේ ගුණ කියනසේක් මේ ගාථාවෙන් වදාරණසේකි:—

කුසලො සබ්බනිමිත්තානං, රුදඤ්ඤු ආගතාගමො;
උපපාදෙ සුපිනෙ යුත්තො, නියාමෙව පවෙසනෙ.
පණ්ඩා භූමමන්තාලික්ඛසම්, නක්ඛත්ත පද කොවිදෙ;
බ්‍රාහ්මණං තෙන දෙසෙන, දජ්ජාසි දකරක්ඛනො.

මේ ගාථාවෙහි අභිප්‍රායනම්:—"මහරජ මේ කේවට්ටයානම් බසින් නොකියා අනුන් සිතූ දෙයක් තමා ඇසූ දුටු දෙයක්සේ ශාස්ත්‍ර බල යෙන්ම දන්නාවූ රාජනීති ආදි ලොකව්‍යවහාරයෙහි දක්ෂවූ දුටුවාවූ සිහිනයෙහි වැඩ අවැඩ දන්නාවූ ගමනාගමනයෙහි අභිඥ මේයයි නොවරදවාම දන්නාවූ චන්ද්‍රග්‍රහණ සූර්‍යග්‍රහණ ආදිය තත්වූ පරිද්දෙන් නොවරදවා දන්නාවූ ඉදින් සිතිනම් අහස පොළව දෙක ඇටලනතරම් සියලු උපායෙහි දක්ෂවූ සිතූ අර්ථයක් සාධාගන්නා තරම් නුවණ හා මන්ත්‍රී කමින් අග්‍රවූ බ්‍රාහ්මණයා කුමක් පිණිස රකුසාට දෙව්ද"සි වදාළසේක. ඒ අසා ඔබුණාගේ වරද කියන්නාවූ රජ්ජුරුවෝ මේ ගාථාවෙන් කියත්:—

පරිහායපි මෙ අය්‍යෙ, උම්මිලතා උදික්ඛති;
තස්මා අජ්ජාහමුං ලුද්දං, දජ්ජාහං දකරක්ඛනො.

මේ ගාථාවෙන් කියේ, "මම අමාත්‍යමණ්ඩලයා පිරිවරා සිංහාසනා රූඪව උන් නමුත් මේ තමාගේ බැම රැලියෙන් වැසිතිබෙන්නාවූ ඇවි කුළන් ඇස්මෙන් පිහුවූ ඇසින් බැමය නහාලා කිපි බලන එකෙකු මෙන් එක්වන් මා මුහුන බලන්නේය, සිනෙන් දුටුවත් බානතරම් මොහුගේ රූපවිලාසය හා කඩදත් හා මූන හා රත්වූ ඇස් ඇති රාක්ෂස යෙකු දුටුවාසේ ඉතා භයපත්ව මොහු දකිනාසේයයි සිතමි, එසේ වීරූ පවූ ඔබුණා මෙසෙයින් දියරකුසාට දෙමි"සි කීය.

ඒ අසා පරිබ්‍රාජිකාවන්දැ "වැදූ මැනියන් ආදිවූ පස්දෙනා රකුසාට

බිල්ලටදී මේසා රාජ්‍යසම්පත්තියක් හා ශ්‍රීවිභූති අලුයම දුම්බ කෙළපිඬක් සේ නොසිතා තොපගේ ජීවිතය මහෞෂධ පණ්ඩිතයන්ට දෙමිසි කිව. ඒ පණ්ඩිතයන්ගේ පෙරයිය දවසත් මතු එන දවසත් කවර ගුණයක් දැක එවැන්නක් කරව්ද'සි රජ්ජුරුවන්ගේ යසස හා කීර්ති වර්ණනා කරණ පරිබ්‍රාජිකාවන්දැ:—

ස සමුද්ද පරියායං මහිං සාගර කුණ්ඩලං,
වසුන්ධරං ආවසසි, අමච්ච පරිවාරිතො.

චාතුරන්තා මහාරට්ඨා, විජිතාවී මහබ්බලෝ;
පථව්‍යා එකරාජාසි, යසො තෙ විපුලං ගතො.

සොළසිත්ථි සහස්සානි, ආමුත්ත මණිකුණ්ඩලා;
නානා ජනපදා තායෝ, දෙවකඤ්ඤා සමා පභා.

එවං සබ්බඞ්ග සම්පන්නං, සබ්බකාම සමිද්ධිනං;
සුඛිතානං පියං දිසං, ජීවිතං ආහු ඛත්තිය.

අථ වං කෙන වණ්ණන, කෙනවා පන හෙතුනා;
පණ්ඩිතං අනුරක්ඛන්තෝ, පාණං චජසි දුච්චජං.

මෙසින් කියා, "මහරජ තෙපි බූකලි සතරදිගින් මුහුදදිය කෙළවර කොට ඇති දසදහසක් යොදුන් දඹදිවට අගරජව, තොපට සේවකවූ සෙසු රජදරුවන්ට අනුශාසනාකරව, අමාත්‍යසමූහයා පිරිවරා බල වාහනයෙන් යුක්තව සියල්ලවුන් ජයගනුව; ශක්‍රදේවේන්ද්‍රයා මෙන් යසස් හා කීර්ති ඇතිව, තවද ඔබා පළඳනාලද මාණික්‍ය කුණ්ඩලා ධරණිදිවූ නොයෙක් බිසෝ පළඳනායෙන් විභූෂිතවූ සොළොස් දහසක් පුරස්ත්‍රීන් පිරිවරණලදුව; මෙසේවූ ජනපද ගම් නියම්ගම් රාජධානි ගෘහ උද්‍යාන ක්ෂෙත්‍ර වස්ත්‍රාභරණ අන්න පාන දැසි දස් පුත්‍ර දාර ඔව මහිෂ රන්රූවන් ආදියෙන් හා ඇත් අස් රථ පෙළිකුනම් ආදියෙන් හා චතුරඞ්ගිණී සේනාව ආදී නොයෙක් බලවාහනයෙන් හා පසඳකාම යට නිවාසස්ථානයක් බඳුවූ මේ තොපගේ ආත්මභාවය, නුවණැත්ත වුන් විසින් 'තමාගේ ජීවිතය සේ තමාට ප්‍රිය වස්තුයෙක් නැතැ'සි වර්ණනාකරණලද ආත්මය කුමක් නිසා මේ මහෞෂධ පණ්ඩිතයන් මාරුවේ මනුෂ්‍යයන් විසින් නොකටගත හැකි ප්‍රාණ පරිත්‍යාගය කරව්දැ"සි වදාළසේක.

ඉක්බිති රජ්ජුරුවෝ "ස්වාමිනි කුමක් වදාරණසේක්ද? පණ්ඩිතයන්ගේ ගුණ මා තබා දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්ම නාග සුපර්ණාදිවූ දෙවියෝද ඒ ඒ සක්වළ අන්න නම් නාගරාජයෝද තමන් එකි එකි දෙනා දහසක් දහසක් මුඛ මවා එකි එකි මුඛයකින් කී ගුණ අතික් මුඛයකින් නොකියා, එකි එකි මුඛයෙන් එකි එකි ගුණයක්ම කියන්නම් මපුතනුවන් මහෞෂධ පණ්ඩිතයන්ගේ ගුණ තමතමන් ආයු පමණින් කියාත් උන් උන්ගේ ආයුෂය ගෙවෙත් මුත් ගුණෙහි නිමාවක් වත් කෙළවරක් දැක්මක්වත් හැක්කැයි නොසිතමි; එසේවූ ප්‍රමාණාතික්‍රාන්ත

ගුණ කා නුවණැති පණ්ඩිතකෙණෙක් මුත් විනා යිය දවස උපන්නෝත් නැත, එන දවස උපදින්නෝත් නැත, මෙදවස තමාත් නැත; එබැවින් උන්ගේ අඤ්ඤපවූ ගුණයෙන් සුවලපමාත්‍රයක් ඉදිකටු මලින් ආකාශය පානා සේ කියම්'' කියා:—

යථාපි ආගතෙ අය්‍යෙ, මම ඤත්ථං මහොසධෙ;
නාභිජානාමි ධීරස්ස, අණුමත්තමපි දුක්කටං.
සචෙ ච කිඤ්චි කාලෙ, මරණං මෙ පුරෙ සියා;
පුත්තෙ ච මෙ පපුත්තෙ ච, සුඛාපෙය්‍ය මහොසධෙ.
අනාගතං පච්චුපන්නං, සබ්බමත්ථං විපස්සති;
අනාපරාධ කම්මන්තං, නෙව දජ්ජං මහොසධං.

"සොමිනි මේ මහෞෂධ පණ්ඩිතයන් මොබ ආවක් පටන් අද මේ වේලාව දක්වා සුවල්පමාත්‍රයක් පමණ මා නුරුස්නා වරදක් දුටුදැ නැත, ඇසුදුන් නැත, ඉදින් තමන්ට පළමු මාගේ නම පිරිහුනුයේ විනම් මාගේ දරුවන්ද මුනුබුරන්ද තමන්ගේ ප්‍රඥාබලයෙන් උන් හැම දෙනාටම කිසි දුකක් නොවැද්දදී සැපයෙහි පිහිටුවා ලන්නාහ; තවද අතීතානාගත ප්‍රත්‍යුත්පන්න යන තුන් කල්හි පවත්නාවූ ඉෂ්ටානිෂ්ට අර්ථානර්ථී දෙක ලොවුතුරා සර්වඥකෙණෙකුන් මෙන් තමන්ගේ ප්‍රඥාබලයෙන් ඉදුරාම දන්නාහ; නිරපරාධකාරී අසම්ඛ්‍යාවූ පණ්ඩිතයන් මා පණ නබා මම රැකි උදක රාක්ෂසයාට බිල්ලට නොදෙම්මය''යි බෝධිසත්වයන්ගේ ගුණ සඳමඬල අඳනාසේ තමන් සිත්වූ පරිද්දෙන් නොසඟවා නොවලහා සියලු ජනයාට ඇසෙන පරිද්දෙන් කිහ.

රජතු සිත දෙවලයක් නොකොට තමන් සිත්වූ පරිද්දෙන් නොවලහා කී කල්හි පරිබ්‍රාජිකාවන්දැ ඒසා මහා ජනසමාගමයෙහි රැස්වූ බොහෝදෙනාහට ඇසෙන පරිද්දෙන් තවත් තරකොට ප්‍රසිඩවන ලෙස වදාරණසේක්:—

ඉදං සුණෝථ පඤ්චාලා, චූලනීයස්ස භාසිතං;
පණ්ඩිතං අනුරක්ඛන්තා, පාණං චජති දුච්චජං.
මාතු භරියාය භාතුච්ච, සඛිනො බ්‍රාහ්මණස්සච;
අත්තනොචාපි පඤ්චාලෝ, ජනානං චජති ජීවිතං.
එවං මඤ්ඣිකා පඤ්ඤා, නිපුණා සාධු චින්තනී;
දිට්ඨධම්ම ඝිතත්ථාය, සම්පරාය සුඛාය ච.

මෙසින් වදාරා "එබඳා පින්වන්නී මා කියන්නක් අසව, චූලනීරජ්ජු රුවෝ තමන්ගේ වැදූ මැනියන් ඇතුළුවූ අවශ්‍ය බන්ධූන් පස්දෙනාත් තුමූ තමන්ගේ ජීවිතයත් සදෙන ජලරාක්ෂසයාට බිලිවත් මේ මහෞෂධ පණ්ඩිතයන් රකින්ලා, එබව පින්වන්වූ නුවරවාසී හැමදෙනම ඉදුරා අසා සිත තබත්වා''යි කිහ.

"මෙසේ ප්‍රඥාතොමෝ සිතුසිතූ අර්ථ සාධක බැවින් මහා සංඛ්‍යාත්‍යය,

සියක්වර පැළඳ අස්රොම් අඟක් සෙසින් ඉතා සියුම්, ඓහලෞකික සකලාර්ථජනක පිණිසත් එසේම පාරලෞකික සකලාර්ථය පිණිසත් අන්‍යයන්ගේ උපකාර බැවින් කෙවල ප්‍රශස්තය'යි සිතියයුත්තය" කියා පරිබ්‍රාජිකාවන්ද සත්රුවන් මාලිගාවක මැණික් කොතක් පළඳවන්නාක් මෙන් බෝධිසත්වයන්වහන්සේගේ ප්‍රඥා ගුණ සමූහය තමන්වහන්සේගේ නුවණින් දෙශනාකොට කුළුගන්වා දියරකුසු පැණයෙන් මේ උම්මඟජාතකය නිමවා වදාළසේක.

මෙසේ ඒ මාගේ තිලෝගුරු බුදුරජාණන්වහන්සේ, දුඃඛසත්‍යය, සමුදයසත්‍යය නිරොධසත්‍යය මාර්ගසත්‍යය යන චතුරාර්ය්‍යසත්‍යය ප්‍රකාශකොට ධර්මශාලාවෙහි රැස්වූ පිරිසුන්වහන්සේ මධ්‍යයෙහි තමන් වහන්සේගේ ප්‍රඥාපාරමිතාව හඳුනිඹුල අදනාසේ දෙශනාකොට ජාතකය නිමවා වදාළසේක. ඒ ධර්මදේශනාව බොහෝ මනුෂ්‍ය දිව්‍ය නාග සුපර්ණියන්ට අභිසමයඵලදායක විය. මෙසේ ජාතකය නිමවා වදාරා අන්‍යයෙහි මහෞෂධ පණ්ඩිතයන් ආදිවූ එවක් ප්‍රසිද්ධයන් වෙන වෙනම තෝරා වදාරණ බුදුරජාණන්වහන්සේ මෙසේ වදාරණසේකි:-

> හෙම් උපපල වණ්ණාසි, පිතා සුඛෝදනෝ අහු,
> මාතා ආසි මහාමායා, අමරා බිම්බසුන්දරී.
> සුමෝ අහොසි ආනන්දෝ, සාරිපුත්තෝආසි චුලනී,
> මහොසධෝ ලොකනාථෝ, එවං ධාරෙථ ජාතකං.

මේ ගාථායෙන්:—"එම්බා මහණෙනි, එසමයෙහි පරිබ්‍රාජිකාවන්දෑ නම් මාගේ සස්නෙහි උපුල්වන් මහාසථවිරිය. පණ්ඩිතයන්ගේ පියා නෝ සිරිවඩ්ඪන සිටාණෝ නම් සුඛෝදන මහරජ්ජුරුවෝය. පණ්ඩිතයන්ගේ මැනියෝ සුමනාදේවී නම් දැන් මහමායා දේවිය. පණ්ඩිතයන්ගේ බිරින්ද අමරාදේවී නම් දැන් මෙවක එක්ලක්ෂ සයාතු දහසක් බිසෝවරුන්ට නායකව මප්‍රතාපවත් රාහුල කුමාරයන් වැදූ යශොධරාදේවිය. පරිබ්‍රාජිකාවන්ට රහස්මේඑර කොට සියලු වැඩ සාදා දුන් ගිරානෝ නම් මාගේ සස්නෙහි බුදුන්ට උපස්ථාන කරන්නවුන්ට අග්‍රවූ ධර්මභාණ්ඩාගාරිකවූ සිඟිනුවණ ඇත්තවුන්ට අග්‍රවූ බුදුන්කෙරේ වලලකවූ මාගේ බුදුසසුන් නැමැති ආකාශයෙහි පූර්ණ චන්ද්‍රයා වැනිවූ මාගේම මල්වූ ජනානන්දකරුවූ ආනන්ද සථවිරයෝය. එසමයෙහි පණ්ඩිතයන් හුන් නුවරට අවලොස් අසූහාර්ණියක් පමණ සේනාව සෙණවුන් පැරද බිඳී පැලවූ චුලනී බ්‍රහ්මදත්ත රජ නම් දැන් මට දකුණන් සව් මා විනා නුවණැත්තවුන්ට අග්‍රවූ සාරිපුත්‍ර සථවිරයෝය එසමයෙහි සත්අවුරුද්දෙහි පමන් සේනකය පුකුසය කාවින්දය දේවින්දය ඇළවට්ටය යන ප්‍රඥාසම්පන්න පණ්ඩිතවරුන් නුවණින් ජය ගත්තාවූ මහෞෂධ පණ්ඩිතයෝ නම් දැන් ලොවුතුරා බුදුවූ මම්ම ය'යි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

— සිද්ධිරස්තු —

උම්මඟ්ග ජාතකය.

ගුඩාර්ථ විවරණය.

අ.

අක්ඛඔඛරූ–අඟින් වක්වූ; අඟින් රැළි කැසුනු කෙමත් වැකරැලිවූ.

අක්ඛෝහිණීය–12,870ක් හසති සේනාවෙන්ද, 65,610 ක් අශ්ව සේනාවෙන්ද, 12,870 ක් රථ සේනාවෙන්ද, 109,350 ක් පා බල සේනාවෙන්ද යුත් මහා සටසේනාවක්.

අකක්–දෙවියට සමාරක බර.

අකුසු–හෙණ්ඩු; අඬකුශ.

අඟම්පඩි සේනාව–පඬි පිණිස මෙහෙකරණ හේවාපිරිස.

අඟලමැඩහැස්මා–අඟල පාඟා සම කොට.

අඟය නැතැයි–මිළඟළ නොඅැකියයි.

අඟනා–වටිනා.

අඟරාග–විලවුන්; ඇඹ කාන සඳුන් ආදී දේ; ශරීර වර්ණ කිරීම් වශයෙන් කරණ ආලේපය.

අඟාතිය–මස් විකුණන සථානය.

අගිදුයි–වටිනේදුයි.

අඟුවුම්පියා–ලකුණටකයා; අවයව ලුහුඬු කුරූ මිනිහා; මිව්වා.

අඩ්ඨන–මිදුල.

අචින්තෘ–සිතිය නොඅැකි.

අජීව–ජීවිත රහිත; ප්‍රාණය නැති.

අඩ්වාල–මුරකොටුව; සොල්දර කෙය.

අඩ්ඩිකලක්ඛණ–පඤ්චකලක්ඛණ යන්න බලනු.

අඩතුරාසිය–(අඩ—උතුරු—සිය) අඤ්ඤොත්තර ශතය; අටක් අධික සිය; එකසිය අට.

අඩලොස–අඨාරස; අෂ්ටාදශ; දහ අට.

අඩසාළිස–ඇතළිස් අට.

අඩවිසි–විසි අට.

අඹඇසාඇත යන්නාවූ–කැඇසාඇත යන්නාවූ කෙමත් "ඹ" යන අනුකරණයෙන් හඬාඇතයන්නාවූ.

අඬයටි–ආයුධ විශෙෂයක්.

අණසක–ආඥාචක්‍රය; මුලුරටේම පවතින ආඥාව.

අත්පොළසන්–අත්දෙක ඇසීමෙන් ශබ්ද පැවැත්වීම; අප්පිඬිඇසීම.

අන්ලෙන් අන්ලඟසා–අප්පිඬිඇසා.

අන්පත්ඇාලන්–අතපයඇා ලඇාඇත්

අන්‍යන්‍යොපකාර–අතිශයින් උපකාර.

අනවැස්සානන්ට–අන්‍යෙ මා සිඇ හට; ශිෂ්‍යයානන්ට; ගෝලයා හට.

අන විදෑ සමපත් දී–අන දිඇඇැර සැපත්දී.

අනලන්ටත්–අල්ලන්ටත්.

අනින් පිරිමැදමුන්–අතඟා බලා මිස

අනිජාත–පියාට වඩා අධික ගුණ ඇතිවූ පුත්‍රයා.

අති–අධික; බොඤ්.

අතීත-පසුගිය; ඉක්මුණූ; (අතීත කාලය-පසුගිය කාලය.)

අතුල්තල-ඝසනානතස්තලය; අල්ල.

අතුරුවිවිය-අනන්තර විදිය; හරස් විදිය; උභයපාර්ශ්වයේ කෙවලින් යුත් විවිය.

අතුරුවා-ආස්තරණයකරවා; එලවා

අතුරු සිදුරු-අතරෙහි අවකාශය

අත්-අවිරුඬකොට ලාභිවූ වසතුව, වැඩ; තේරුම; කාරණය; කිත; (තොපට අත්‍ය පිණ්ඩ වේ-තොපට කිත පිණ්ඩ වන්නේය.)

අත්ප්‍රගුණයෙසින්-අදහස කැනෙන බැවින්.

අත් විකාශය-අත්‍යවිනිශ්චය; අමාරු වචනවල තේරුම; ප්‍රකාශ විස ජ්ජනය.

අත්වයස්‍රාව-වැඩ සිදුකරදීම; යහ පතෙහි නියුක්තවීම.

අත්වානත්-වැඩ අවැඩ.

අත් බලය-වසතු බලය.

අත් සාධක-යහපත හෝ අභිප්‍රාය සිඩකොටදෙන.

අත්යෙන්-මෙලොව වැඩපිණ්ඩවූ කාරණයෙන්.

අදහව්දැයි-විශ්වාසකරව්දැයි; සිතව්දැයි.

අද වකට-අද දවසට.

අදැල-නියමකරණලද; කිවාවූ.

අධම්මිෂ්ටවූ-ධර්මිෂ්ට නොවූ; අපරාධ කාරිවූ.

අධමවූ-නීචවූ.

අධරපල්ලව-තොල් කැමැති ද්‍රව්‍ය.

අධමයන්-නීචයන්; පහත් අය.

අධිකෘතිත-වැළඳගත්; අරක්ගත්; මාසයකරණ.

අධිකරණ නායකයා-විනිශ්චයකාරයා; නඩුකාරයා.

අධිෂ්ඨානකොට-(ස්ථිර වශයෙන්) කල්පනාකොටගෙණ.

අධිකරණය-නීතිඥ ශාලාව, නඩු ශාලාව.

අනී මාෂක-මස්සකින් භානය.

